මූල්‍ය ස්ථායීතා විවරණය

2026



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මූල්‍ය ස්ථායීතා විවරණය
2026



ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රකාශනය :

ශ්‍රී ලංකා මහ බැංකුව
නො.30, ජනාධිපති මාවත
කොළඹ 01
ශ්‍රී ලංකාව

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 70(1) වන වගන්තිය ප්‍රකාරව මහ බැංකුව විසින් සෑම වසරකම ඔක්තෝබර් මස 31වන දින හෝ එදිනට පෙර මූල්‍ය ස්ථායීතා විවරණය සකස් කර එළි දැක්විය යුතුය. මෙම වගකීම ඉටු කරනු වස්, 2026 වසරේ මූල්‍ය ස්ථායීතා විවරණය මගින් මූල්‍ය පද්ධතියේ වර්ධනයන්, හඳුනාගනු ලැබූ අවදානම් සහ දුර්වලතා මෙන්ම මහ බැංකුව සහ අනෙකුත් නියාමන ආයතන විසින් සලකා බලන කාලපරිච්ඡේදය තුළ එම අවදානම් කළමනාකරණය කිරීම පිණිස ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඉදිරිපත් කරන අතර, මෙම දත්ත මූලිකවම 2026 වසරේ ජුනි මස අවසානය දක්වා කාලය ආවරණය කරනු ලබයි. කෙසේ වුවද, මෙම ප්‍රකාශනය තුළ වඩාත් යාවත්කාලීන කරන ලද තෝරා ගත් ප්‍රවර්ධනයන් ද වාර්තා කර ඇත. විවිධ මූලාශ්‍ර මගින් උකහා ගත් තොරතුරු මත පදනම් වූ, මෙම ප්‍රකාශනය සඳහාම විශේෂිතව සකසන ලද ගණනය කිරීම් මෙහි සඳහන් දත්ත තුළ ඇතුළත් විය හැකිය.

විමසීම්, අදහස් සහ ප්‍රතිචාර සඳහා:
සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො.30, ජනාධිපති මාවත, කොළඹ 01.
විද්‍යුත් ලිපිනය: msd@cbsl.lk

ISBN 978-624-6764-33-3

පටුන

සමස්ත සාරාංශය

විශේෂාංග

පරිච්ඡේද

1. **සාර්ව මූල්‍ය තත්ත්වයන්** 1
   - 1.1 ජාත්‍යන්තර ආර්ථික පරිසරය සහ මූල්‍ය තත්ත්වයන් 2
   - 1.2 දේශීය සාර්ව මූල්‍ය තත්ත්වයන් 7

2. **මූල්‍ය වෙළෙඳපොළ සහ ගෙවීම් පද්ධති යටිතල පහසුකම්** 21
   - 2.1 කොටස් වෙළෙඳපොළ 22
   - 2.2 රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ 26
   - 2.3 දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ 29
   - 2.4 දේශීය මුදල් වෙළෙඳපොළ 32
   - 2.5 ගෙවීම් සහ පියවීම් යටිතල පහසුකම් 35

3. **මූල්‍ය ආයතන** 39
   - 3.1 බැංකු අංශය 40
   - 3.2 මුදල් සමාගම් අංශය 60
   - 3.3 රක්ෂණ අංශය 68
   - 3.4 මූල්‍ය ආයතනවල සයිබර් තර්ජන සහ මෙහෙයුම්වල ශක්තිමත්භාවය 75

4. **කුටුම්බ සහ සමාගම් අංශ** 77
   - 4.1 කුටුම්බ සහ ආයතනික අංශවල අවදානම් ඇගයීම 78
   - 4.2 ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල අවදානම් ඇගයීම 82

5. **මූල්‍ය ස්ථායීතාව සඳහා වන ප්‍රතිපත්ති** 87
   - 5.1 ස්ථායීතාව සඳහා වන සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති 88
   - 5.2 බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ ප්‍රතිපත්ති 90
   - 5.3 මුදල් සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් සඳහා අදාළ ප්‍රතිපත්ති 92
   - 5.4 ගෙවීම් හා පියවීම් සම්බන්ධ ප්‍රතිපත්ති 93
   - 5.5 තැන්පතු රක්ෂණය සහ මූල්‍ය ආයතනවල නිරාකරණ සම්බන්ධ ප්‍රතිපත්ති 93
   - 5.6 මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධ ප්‍රතිපත්ති 94
   - 5.7 මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යයනය මැඩපැවැත්වීම හා සම්බන්ධ ප්‍රතිපත්ති 94
   - 5.8 මූල්‍ය අන්තර්ගතභාවය සම්බන්ධ ප්‍රතිපත්ති 95
   - 5.9 මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව 96
   - 5.10 තිරසර මූල්‍ය පිළිබඳ ප්‍රතිපත්ති 96

මූල්‍ය අංශය සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් සහ නියාමන ක්‍රියාමාර්ග 97

විශේෂ සටහන්

1. ඉහළ යන දේශගුණික අවදානම්: මූල්‍ය පද්ධති ස්ථායීතාවය කෙරෙහි වන වර්ධනීය බලපෑම 16
2. පද්ධතිමය අවදානම් පිළිබඳ සමීක්ෂණය 36
3. ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය තුළ කෘත්‍රිම බුද්ධිය භාවිතයට ගැනීම 71

පරිශිෂ්ට 107

රූප සටහන්

1 සාර්ව මූල්‍ය තත්ත්වයන්

රූප සටහන 1.1	ගෝලීය අවිනිශ්චිතතාව	2
රූප සටහන 1.2	ගෝලීය මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය	3
රූප සටහන 1.3	ගෝලීය නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය	3
රූප සටහන 1.4	ගෝලීය වෙළෙඳ භාණ්ඩ වෙළෙඳාම ආශ්‍රිත වර්ධනය	3
රූප සටහන 1.5	ගෝලීය උද්ධමනය	4
රූප සටහන 1.6	ගෝලීය වෙළෙඳ භාණ්ඩ මිල දර්ශක	5
රූප සටහන 1.7	මූල්‍ය තත්ත්ව දර්ශකය	5
රූප සටහන 1.8	ප්‍රතිපත්ති පොලී අනුපාතික පරාසය (2021 ජනවාරි සිට 2026 ජූලි දක්වා)	6
රූප සටහන 1.9	දිගු කාලීන රාජ්‍ය බැඳුම්කර ඵලදා: වසර 10	6
රූප සටහන 1.10	MSCI කොටස් මිල දර්ශක	7
රූප සටහන 1.11	බැංකු සහ මුදල් සමාගම්වල සමස්ත ණය වර්ධනය	8
රූප සටහන 1.12	බැංකු සහ මුදල් සමාගම්වල ණය නිරාවරණය	9
රූප සටහන 1.13	බැංකු අංශයේ ණය-තැන්පතු අනුපාතය	9
රූප සටහන 1.14	බැංකු අංශයේ ණය-තැන්පතු අනුපාතය සහ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය	10
රූප සටහන 1.15	ණය සැපයුම් සමීක්ෂණ දර්ශකවල වෙනස්වීම	10
රූප සටහන 1.16	පෞද්ගලික අංශයේ ණය චක්‍රය	10
රූප සටහන 1.17	ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සහ තෝරාගත් වෙළෙඳපොළ පොලී අනුපාතික	11
රූප සටහන 1.18	බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ මූර්ත බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය	11
රූප සටහන 1.19	රජයේ සුරැකුම්පත්වල ද්විතීයික වෙළෙඳපොළ ඵලදා වක්‍රය	12
රූප සටහන 1.20	කාර්තුමය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය	12
රූප සටහන 1.21	මතුපිට උද්ධමනය සහ දේශීය තෙල් මිල ගණන්	12
රූප සටහන 1.22	විරැකියා අනුපාතය සහ වැටුප් අනුපාත දර්ශක	13
රූප සටහන 1.23	මූර්ත දේපළ වෙළෙඳාම් මිල ගණන් සහ ණය අනුපාතික	13
රූප සටහන 1.24	දේපළ වෙළෙඳාම් අංශය කෙරෙහි බැංකු අංශයේ නිරාවරණය	14
රූප සටහන 1.25	රන් මිලෙහි වෙනස්වීම්	14
රූප සටහන 1.26	විදේශීය ගිණුම් ශේෂයන්	15
රූප සටහන 1.27	රාජ්‍ය මූල්‍යකරණය	15

2 මූල්‍ය වෙළෙඳපොළ සහ ගෙවීම් පද්ධති යටිතල පහසුකම්

රූප සටහන 2.1	මූල්‍ය ආතති දර්ශකය	22
රූප සටහන 2.2	කොටස් මිල දර්ශක	22

රූප සටහන 2.3	මාසික කොටස් වෙළෙඳපොළ පිරිවැටුම සහ මූර්ත ප්‍රතිලාභ	22
රූප සටහන 2.4	අනුමානිත කොටස් අවදානම් අතිරික්තය සහ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ණය නිරාවරණය	23
රූප සටහන 2.5	කොටස් මිල දර්ශකවල උච්චාවචන	23
රූප සටහන 2.6	වෙළෙඳපොළ තක්සේරුකරණ දර්ශක	24
රූප සටහන 2.7	කොටස් වෙළෙඳපොළෙහි ආංශික දර්ශක වෙනස්වීම්	24
රූප සටහන 2.8	අංශ අනුව ස්ථානගතවීම් (2020 ජනවාරි සිට 2026 අගෝස්තු)	25
රූප සටහන 2.9	ද්විතීයික කොටස් වෙළෙඳපොළ තුළ විදේශීය සහභාගීත්වය	25
රූප සටහන 2.10	රජයේ සුරැකුම්පත්වල ද්විතීයික වෙළෙඳපොළ ඵලදා අනුපාතික	26
රූප සටහන 2.11	ප්‍රාථමික වෙළෙඳපොළ ඵලදා අනුපාතික, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය	26
රූප සටහන 2.12	රජයේ සුරැකුම්පත් සඳහා ප්‍රාථමික වෙළෙඳපොළ ඉල්ලුම	26
රූප සටහන 2.13	භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල ගතිකත්වය	27
රූප සටහන 2.14	රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු	27
රූප සටහන 2.15	රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු - ඵලදා අනුපාතික සහ කල් පිරීමේ කාලසීමාව	27
රූප සටහන 2.16	රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළෙඳපොළ ඵලදා වක්‍රය	27
රූප සටහන 2.17	ද්විතීයික වෙළෙඳපොළ ඵලදා අනුපාතිකවල විචලනය	28
රූප සටහන 2.18	රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ විදේශීය ආයෝජන ප්‍රවාහ	28
රූප සටහන 2.19	මාසික විදේශීය ආයෝජන ප්‍රවාහ, විනිමය අනුපාතිකය සහ මාසික ඵලදා අනුපාතික	29
රූප සටහන 2.20	එ. ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම	29
රූප සටහන 2.21	ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ප්‍රධාන විනිමය අනුපාතික	30
රූප සටහන 2.22	ගැනුම්-විකුණුම් අනුපාත අතර පරතරය (එ. ජ. ඩොලරය/ ශ්‍රී ලංකා රුපියල්)	31
රූප සටහන 2.23	අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු	31
රූප සටහන 2.24	එක් මාසයක් සඳහා ඉදිරි විනිමය අධිමිල	32
රූප සටහන 2.25	දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම් සහ දළ නිල විදේශ විනිමය සංචිත	32
රූප සටහන 2.26	දේශීය මුදල් වෙළෙඳපොළ ගනුදෙනු පරිමාව	33
රූප සටහන 2.27	ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ සහභාගීවන්නන්	33
රූප සටහන 2.28	ප්‍රතිමිලදී ගැනුම් වෙළෙඳපොළ සහභාගීවන්නන්	33
රූප සටහන 2.29	බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය	33
රූප සටහන 2.30	බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය	34
රූප සටහන 2.31	මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතා ව්‍යාප්තිය	34

රූප සටහන 2.32	ඉහළ වටිනාකම් සහිත ගෙවීම් පද්ධතිය - තත්කාලීන දළ පියවුම් පද්ධතියේ ගනුදෙනුවල පරිමාව	35
රූප සටහන 2.33	2026 වසරේ පළමු භාගය සඳහා සුළු පරිමාණ ගෙවීම් පද්ධති/උපකරණ	38

3 මූල්‍ය ආයතන

රූප සටහන 3.1	බැංකු පද්ධතියේ සාධනීයත්ව දර්ශකය	40
රූප සටහන 3.2	බැංකු අංශයේ සාධනීයත්ව සිතියම	40
රූප සටහන 3.3	ණය සහ ලැබිය යුතු දෑ	40
රූප සටහන 3.4	මුදල් වර්ගය මත පදනම් වූ ණය ප්‍රමාණයේ කාර්තුමය වෙනස් වීම	41
රූප සටහන 3.5	බැංකු කාණ්ඩය මත පදනම් වූ ණය ප්‍රමාණයේ කාර්තුමය වෙනස් වීම	41
රූප සටහන 3.6	2026 වසරේ දෙවන කාර්තුවෙන් අවසන් වන වසර තුළ ණය වෙනස් වීම සඳහා ආංශික දායකත්වය	42
රූප සටහන 3.7	ප්‍රධාන ආර්ථික අංශවල ණය සංයුතිය	42
රූප සටහන 3.8	පරිභෝජනය සඳහා වන ණය	42
රූප සටහන 3.9	පරිභෝජන ණයවල සංකේන්ද්‍රණය	42
රූප සටහන 3.10	විදේශීය ආයතන වෙත ලබා දුන් ණය	43
රූප සටහන 3.11	මූල්‍ය සේවා අංශය වෙත ලබා දුන් ණය	43
රූප සටහන 3.12	අදියර 3 සහ අදියර 2 යටතේ පවතින ණය අනුපාත	43
රූප සටහන 3.13	අදියර අනුව ණය සංයුතිය	43
රූප සටහන 3.14	බැංකු අනුව අදියර 3 යටතේ පවතින ණය අනුපාතය	44
රූප සටහන 3.15	ණය හානිකරණ ආවරණ අනුපාත	44
රූප සටහන 3.16	අදියර 3 යටතේ පවතින ණය සහ අදියර 3 යටතේ පවතින ණය හානිකරණය	44
රූප සටහන 3.17	බැංකු අනුව අදියර 3 යටතේ පවතින ණය සහ අදියර 3 යටතේ පවතින ණය සඳහා වන ණය හානිකරණ ආවරණ	45
රූප සටහන 3.18	පළමු ස්ථර පොදු හිමිකම් ප්‍රාග්ධනයට සාපේක්ෂව ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය	45
රූප සටහන 3.19	ඉහළ අදියර 3 යටතේ පවතින ණය අනුපාත සහිත ආර්ථික අංශ	45
රූප සටහන 3.20	ණයගැනුම්කරුවන්ගේ කාණ්ඩය අනුව ණය සංයුතිය	46
රූප සටහන 3.21	2026 වසරේ දෙවන කාර්තුව අවසන් වනවිට ණයගැනුම්කරුවන්ගේ කාණ්ඩය අනුව ණය පැහැර හැරීමේ අවදානම	46
රූප සටහන 3.22	ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ලබා දුන් ණය අංශ අනුව සංකේන්ද්‍රණය සහ ණය පැහැර හැරීමේ අවදානම	46
රූප සටහන 3.23	රජය සහ රාජ්‍ය සතු ව්‍යවසායන් වෙත පවතින නිරාවරණය	47
රූප සටහන 3.24	රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය	47
රූප සටහන 3.25	සියලු මුදල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය	48
රූප සටහන 3.26	ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය	48

රූප සටහන 3.27	ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම් සංයුතිය	48
රූප සටහන 3.28	විදේශ මුදල් වත්කම්වල සංයුතිය	49
රූප සටහන 3.29	විදේශ මුදල් ආයෝජනවල සංයුතිය	49
රූප සටහන 3.30	විදේශ මුදල් වගකීම්වල සංයුතිය	49
රූප සටහන 3.31	ශුද්ධ විදේශ මුදල් වත්කම්	49
රූප සටහන 3.32	පෞද්ගලික සහ ආයතනික අරමුදල්	50
රූප සටහන 3.33	බැංකු කාණ්ඩය අනුව පෞද්ගලික සහ ආයතනික අරමුදල්	50
රූප සටහන 3.34	කල්පිරීම් පරතරය	51
රූප සටහන 3.35	කෙටි කාලීන කල්පිරීම් පරතරය සහ ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම්	51
රූප සටහන 3.36	ශේෂ පත්‍රයෙන් පරිබාහිර මෙහෙයුම්	51
රූප සටහන 3.37	බදු පසු ලාභය (අර්ධ වාර්ෂික)	52
රූප සටහන 3.38	බදු පසු ලාභයේ සංරචක	52
රූප සටහන 3.39	බැංකු කාණ්ඩය අනුව බදු පසු ලාභය	52
රූප සටහන 3.40	බැංකු කාණ්ඩය අනුව ශුද්ධ පොලී ආදායම	53
රූප සටහන 3.41	පොලී නොවන ආදායම	53
රූප සටහන 3.42	වත්කම් මත නව ණය හානිකරණ ගාස්තු	53
රූප සටහන 3.43	ලාභදායීත්ව දර්ශක	54
රූප සටහන 3.44	බැංකු අනුව ශුද්ධ පොලී ආන්තිකයේ සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතයෙහි ව්‍යාප්තිය	54
රූප සටහන 3.45	ශුද්ධ පොලී ආන්තිකයේ විශ්ලේෂණය	54
රූප සටහන 3.46	පොලී ආදායමේ සංයුතිය	55
රූප සටහන 3.47	සමුච්චිත පොලී ගෙවිය යුතු වත්කම් සහ වගකීම්	55
රූප සටහන 3.48	නියාමන ප්‍රාග්ධනයට සාපේක්ෂව ශුද්ධ විදේශ මුදල් නිරාවරණය	55
රූප සටහන 3.49	මුදල් ඒකක වශයෙන් ශුද්ධ විදේශ මුදල් නිරාවරණය	56
රූප සටහන 3.50	හිමිකම් ආශ්‍රිත ආයෝජන	56
රූප සටහන 3.51	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත	56
රූප සටහන 3.52	බැංකු කාණ්ඩය අනුව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත	57
රූප සටහන 3.53	බැංකු කාණ්ඩය අනුව සමස්ත ප්‍රාග්ධනය සහ අවදානම් මත බර තැබූ වත්කම්	57
රූප සටහන 3.54	නියාමන ප්‍රාග්ධනයේ වෙනස්වීමට බලපෑ සාධක	58
රූප සටහන 3.55	ණය අවදානම් සඳහා වන අවදානම් මත බර තැබූ වත්කම් සංයුතිය	58
රූප සටහන 3.56	බැංකු කාණ්ඩය අනුව අවදානම් මත බර තැබූ වත්කම් ඝනත්වය	58

රූප සටහන 3.57	සමස්ත අවදානම් මත බර තැබූ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ණය අවදානම සඳහා වන අවදානම් මත බර තැබූ වත්කම්	59
රූප සටහන 3.58	පළමු ස්ථම්භය යටතේ අවම නියාමන අවශ්‍යතාවය ඉක්ම වූ ප්‍රාග්ධනය	59
රූප සටහන 3.59	තෝලන අනුපාතය	59
රූප සටහන 3.60	බැංකු කාණ්ඩය අනුව තෝලන අනුපාතය	60
රූප සටහන 3.61	මුදල් සමාගම් අංශයේ සාධනීයත්වය පිළිබඳ සිතියම	60
රූප සටහන 3.62	දළ ණය සහ අත්තිකාරම්	60
රූප සටහන 3.63	2026 වසරේ දෙවන කාර්තුවෙන් අවසන් වූ වසර තුළ ණය ප්‍රසාරණය සඳහා ණය කාණ්ඩය අනුව දායකත්වය	61
රූප සටහන 3.64	දළ ණය සහ අත්තිකාරම් සංයුතිය	61
රූප සටහන 3.65	අදියර 3 යටතේ පවතින ණය අනුපාත	62
රූප සටහන 3.66	ණය කාණ්ඩය අනුව ණය වර්ධනය සහ අදියර 3 යටතේ පවතින ණය අනුපාතය	62
රූප සටහන 3.67	අදියර අනුව ණය සංයුතිය	62
රූප සටහන 3.68	ණය හානිකරණ ආවරණ අනුපාත	63
රූප සටහන 3.69	බාහිර අරමුදල් සහ සමස්ත වත්කම්වලට සාපේක්ෂව නියාමන ද්‍රවශීල වත්කම්	63
රූප සටහන 3.70	ද්‍රවශීල වත්කම්වල සංයුතිය	63
රූප සටහන 3.71	තැන්පතු සහ ණය ගැනීම්	64
රූප සටහන 3.72	අරමුදල් ව්‍යුහය	64
රූප සටහන 3.73	ණය ගැනීම්වල සංයුතිය	64
රූප සටහන 3.74	බදු පසු ලාභය (කාර්තුමය)	65
රූප සටහන 3.75	බදු පසු ලාභයේ සංරචක	65
රූප සටහන 3.76	ශුද්ධ පොලී ආදායමේ සංයුතිය	65
රූප සටහන 3.77	පොලී වියදම්වල සංයුතිය	65
රූප සටහන 3.78	ලාභදායීත්ව දර්ශක	66
රූප සටහන 3.79	ශුද්ධ පොලී ආන්තිකය සහ වත්කම් පදනම	66
රූප සටහන 3.80	පොලී අනුපාත සංවේදී වත්කම් සහ වගකීම්	66
රූප සටහන 3.81	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත	67
රූප සටහන 3.82	සමස්ත නියාමන ප්‍රාග්ධනයේ වෙනස්වීම	67
රූප සටහන 3.83	ණය අවදානම සඳහා අවදානම් මත බර තැබූ වත්කම්	68
රූප සටහන 3.84	අතිරික්ත ප්‍රාග්ධනය	68
රූප සටහන 3.85	දළ ලියාහළ වාරිකයේ වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)	68
රූප සටහන 3.86	උප අංශ අනුව දළ ලියාහළ වාරිකය	69

රූප සටහන 3.87	වත්කම්වල වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)	69
රූප සටහන 3.88	2026 වසරේ පළමු භාගය අවසානයේ සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ වත්කම්වල සංයුතිය	69
රූප සටහන 3.89	උප අංශය අනුව ගෙවන ලද හිමිකම්	70
රූප සටහන 3.90	2026 වසරේ පළමු භාගයේ ගෙවන ලද හිමිකම්	70
රූප සටහන 3.91	2026 වසරේ පළමු භාගය අවසන් වන විට කාණ්ඩය සහ තත්ත්වය අනුව දිට්වා සුළිකුණාටුවට අදාළ හිමිකම්	70
රූප සටහන 3.92	වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය	70
රූප සටහන 3.93	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය	74
රූප සටහන 3.94	රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ආයතන සඳහා බැංකු අංශයේ ණය ලබාදීම	74
රූප සටහන 3.95	බැංකු සමඟ ඇති රක්ෂණ අංශයේ තැන්පතු	75
රූප සටහන 3.96	ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධති ස්ථායීතාව කෙරෙහි බලපාන සයිබර් තර්ජන පිළිබඳ සාරාංශය	75

4 කුටුම්බ සහ සමාගම් අංශ

රූප සටහන 4.1	කුටුම්බ අංශයේ ණය	78
රූප සටහන 4.2	කුටුම්බ අංශයේ ණය සංයුතිය (%)	78
රූප සටහන 4.3	කුටුම්බ අංශයේ ණය (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)	79
රූප සටහන 4.4	කුටුම්බ අංශයේ ණය - පළාත් අනුව ව්‍යාප්තිය (2026 ජූනි අවසන් වන විට, %)	79
රූප සටහන 4.5	කුටුම්බ අංශයේ ණය ගුණාත්මකභාවය	79
රූප සටහන 4.6	කුටුම්බ අංශයේ ණයගැනුම්කරුවන්ගේ සාමාන්‍ය ක්‍රිබ් අගය	80
රූප සටහන 4.7	සමස්ත බරිත සාමාන්‍ය ක්‍රිබ් අගය	80
රූප සටහන 4.8	2025 දෙවන කාර්තුව හා 2026 දෙවන කාර්තුව අතර ක්‍රිබ් අගයන්ගේ විචලනය	80
රූප සටහන 4.9	කුටුම්බ ණයගැනුම්කරුවන්ගේ ණය අවදානම් ව්‍යාප්තිය (2026 ජූනි අවසන් වන විට)	81
රූප සටහන 4.10	ආයතනික අංශයේ ණය	81
රූප සටහන 4.11	ආයතනික අංශයේ ණය සංයුතිය (%)	81
රූප සටහන 4.12	ආයතනික අංශයේ ණය ගුණාත්මකභාවය	82
රූප සටහන 4.13	ආයතනික ණයගැනුම්කරුවන්ගේ ණය අවදානම් ව්‍යාප්තිය (2026 ජූනි අවසන් වන විට)	82
රූප සටහන 4.14	මූල්‍ය නොවන සමාගම්වල පිරිවැටුම සහ පිරිවැටුමෙහි වර්ධනය	82
රූප සටහන 4.15	පිරිවැටුමෙහි වර්ධනයක් වාර්තා කළ මූල්‍ය නොවන සමාගම් ප්‍රතිශතය	83
රූප සටහන 4.16	පිරිවැටුම් වර්ධනයට විවිධ ක්ෂේත්‍රයන් හි දායකත්වය	83
රූප සටහන 4.17	මූල්‍ය නොවන සමාගම්වල ශුද්ධ ලාභය හා ශුද්ධ ලාභයෙහි වර්ධනය	83

රූප සටහන 4.18 ශුද්ධ ලාභයේ වර්ධනයක් වාර්තා කළ මූල්‍ය නොවන සමාගම් ප්‍රතිශතය 83

රූප සටහන 4.19 මූල්‍ය නොවන සමාගම්වල පොලී, බදු, ක්ෂයවීම් හා ක්‍රමක්ෂයට පෙර ඉපැයීම් සහ එහි වර්ධනය 84

රූප සටහන 4.20 ශුද්ධ ලාභයේ විචලනයන් සඳහා බලපෑ සාධක 84

රූප සටහන 4.21 ලාභදායීත්ව දර්ශක 84

රූප සටහන 4.22 ණය සාමාන්‍යයෙහි ප්‍රතිශතයක් ලෙස මූල්‍ය පිරිවැය 85

රූප සටහන 4.23 මූල්‍ය නොවන සමාගම්වල ප්‍රධාන මූල්‍ය කාර්යසාධන දර්ශක 85

රූප සටහන 4.24 පොලී ආවරණ අනුපාතය අනුව මූල්‍ය නොවන සමාගම්වල ව්‍යාප්තිය 85

රූප සටහන 4.25 ක්ෂේත්‍ර අනුව පොලී ආවරණ අනුපාතය 86

රූප සටහන 4.26 ක්ෂේත්‍ර අනුව මූල්‍ය නොවන සමාගම්වල මූල්‍ය කාර්යසාධන දර්ශක 86

5 මූල්‍ය ස්ථායීතාව සඳහා වන ප්‍රතිපත්ති

රූප සටහන 5.1 මූල්‍ය අංශයේ සමස්ත ණය වර්ධනය 88

රූප සටහන 5.2 මූල්‍ය අංශයේ මෝටර් රථවාහන ආශ්‍රිත ණය සහ රන් ඇපකරයක් මගින් සුරක්ෂිත කළ ණය සංකේන්ද්‍රණය 88

රූප සටහන 5.3 මූල්‍ය අංශයේ මෝටර් රථවාහන ආශ්‍රිත ණය සහ රන් ඇපකරයක් මගින් සුරක්ෂිත කළ ණය වර්ධනය 88

රූප සටහන 5.4 ගෝලීය රන් මිලෙහි සිදු වූ වෙනස්වීම් 89

රූප සටහන 5.5 මෝටර් රථවාහන සම්බන්ධ වටිනාකම් මත ණය රාමුව ක්‍රමයෙන් දැඩි කිරීම සහ සරල කිරීම 90

සමස්ත සාරාංශය

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය විවිධ කම්පන මධ්‍යයේ වුව ද, 2026 වසරේ පළමු භාගයේ දී ස්ථායීව පැවතුණු අතර, ආර්ථිකය අඛණ්ඩව යථා තත්ත්වයට පත්වීම, බැංකු සහ මුදල් සමාගම්වල ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක අඛණ්ඩව ප්‍රමාණවත් පරිදි පැවතීම සහ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු වීම ඒ සඳහා හේතු විය. දේශීය සාර්ව මූල්‍ය තත්ත්වයන් ස්ථායීව පැවතිය ද ගෝලීය අවිනිශ්චිතතාවන් තීව්‍ර වීම හේතුවෙන් දේශීය ආර්ථිකයට අහිතකර බලපෑම් එල්ල වීමේ අවදානම ඉහළ ගියේය. සලකා බැලෙන කාලසීමාව තුළ දී ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව යථා තත්ත්වයට පත්වීම, රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් වැඩිදියුණු වීම සහ මූල්‍ය අංශයේ ශක්තිමත් කාර්යසාධනය මූල්‍ය පද්ධති ස්ථායීතාව සඳහා සහාය විය. මෙම වර්ධනයන් මගින් බාහිර අවිනිශ්චිතතාවන් හමුවේ ශක්තිමත් ආරක්ෂාවක් සැපයූ අතර, එය මූල්‍ය පද්ධතියේ සමස්ත ස්ථායීතාවට ද සහාය විය. කෙසේ වුවද, බාහිර පරිසරය අභියෝගාත්මකව පැවතුණි. භූදේශපාලනික ආතතීන් උත්සන්න වීම, ගෝලීය උද්ධමන පීඩන යළි ඉහළ යෑම, බලශක්ති සහ වෙළෙඳ භාණ්ඩ මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම, වෙළෙඳ කටයුතු බිඳවැටීම්, දේශගුණය ආශ්‍රිත අවදානම් ඉහළ යෑම සහ දැඩි ගෝලීය මූල්‍ය තත්ත්වයන් මගින් දේශීය ආර්ථිකය කෙරෙහි අඛණ්ඩව බලපෑම් ඇති විය. ශ්‍රී ලංකාව වෙළෙඳාම, සංචාරක ඉපැයීම්, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්, ප්‍රාග්ධන ප්‍රවාහ, බාහිර මූල්‍යකරණ තත්ත්වයන් සහ විනිමය අනුපාතිකයේ වෙනස් වීම වැනි සාධක මත සැලකිය යුතු ලෙස රඳා පැවතීම හේතුවෙන් අහිතකර බාහිර වෙනස්වීම්වලට විශේෂයෙන්ම නිරාවරණය වී පැවතුණි. දේශීය තත්ත්වයන් සලකා බැලීමේ දී, විශේෂයෙන් වාහන මූල්‍යකරණය සහ රන් ඇපකර මත ලබා දෙන ණය ඇතුළු කුටුම්බ ණය වර්ධනය වීම හේතුවෙන් පෞද්ගලික අංශයේ ණය පරතරය අඛණ්ඩව පුළුල් වූ අතර, එමගින් පද්ධතිමය අවදානම් ගොඩනැගීමට ඇති හැකියාව පෙන්නුම් කෙරිණි. තවද, මූල්‍ය අංශය, රාජ්‍ය අංශය වෙත නිරාවරණය වීම අඩු වුව ද, එය තවදුරටත් සැලකිය යුතු මට්ටමක පැවතීම මගින් මූල්‍ය අංශය සහ රාජ්‍ය අංශය අතර තවදුරටත් පවතින සැලකිය යුතු සහසම්බන්ධය අවධාරණය විය. ඉහළ යන කුටුම්බ අංශයේ ණයගැතිභාවය, ඇපකර මත ලබා දෙන ණය ඉහළ යන අතරම එම ඇපකරවල වටිනාකම උච්චාවචනය වීම, දේපළ මිල ගණන් අඛණ්ඩව ඉහළ යෑම සහ උද්ධමන පීඩන හේතුවෙන් මතු වෙමින් පවතින අවදානම් තවදුරටත් ඉස්මතු විය. මෙම තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන්, ආර්ථිකය තුළ අවදානම් ගොඩනැගීම පාලනය කිරීමේ අරමුණින්, මහ බැංකුව 2026 වසරේ මැයි මාසයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ඉහළ නැංවූ අතර, වාහන සහ රන් ඇපකර මත ලබා දෙන ණය සඳහා වන වටිනාකම මත ණය අනුපාතික සීමාවන් ඇතුළුව සාර්ව විචක්ෂණ ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී.

මෙම කාලසීමාව තුළ දේශීය මූල්‍ය වෙළෙඳපොළ බොහෝ දුරට ස්ථායීව පැවති අතර මූල්‍ය ආතති දර්ශකය සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පැවතුණි. ඉහළ ගිය ගෝලීය අවිනිශ්චිතතාව, දේශීය උද්ධමනය පිළිබඳ ගැටලු සහ දැඩි මුදල් තත්ත්වයන් මූල්‍ය වෙළෙඳපොළ තත්ත්වයන් කෙරෙහි බලපෑවේය. ආයෝජක විශ්වාසය මන්දගාමී වීම මධ්‍යයේ කොටස් වෙළෙඳපොළ කාර්යසාධනය මන්දගාමී වූ අතර, වෙළෙඳපොළ ද්‍රවශීලතාව දුර්වල වී වෙළෙඳපොළ උච්චාවචන ඉහළ ගියේය. සලකා බැලෙන කාලසීමාව තුළ වෙළෙඳපොළ අපේක්ෂාවන් විකාශනය වීම සහ ඉන් අනතුරුව සිදු වූ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම හේතුවෙන් සියලුම කල්පිරීම් සහිත රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික ඉහළ ගියේය. ද්විතීයික වෙළෙඳපොළ ද්‍රවශීලතාව සාපේක්ෂ වශයෙන් මන්දගාමී මට්ටමක පැවති අතර එමගින් දේශීය ණය සුරැකුම්පත් වෙළෙඳපොළේ ධාරිතාව සහ වෙළෙඳ ක්‍රියාකාරකම්වල සීමිත බව පෙන්නුම් කළේය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදයේ අවසාන භාගයේ දී මෙම වෙළෙඳපොළ තුළ විදේශීය ආයෝජකයින්ගේ සහභාගීත්වය යම් වැඩි වීමක් දක්නට ලැබුණ ද එය තවදුරටත් අඩු මට්ටමක පැවතුණි. විශේෂයෙන් මැදපෙරදිග ආතතීන් උත්සන්න වීමත් සමඟ ඉහළ ආනයන වියදම්, බලශක්ති මිල ගණන් ඉහළ යෑම සහ ආයෝජක විශ්වාසය වෙනස්වීම හේතුවෙන් විදේශ විනිමය සඳහා වන ඉල්ලුම ඉහළ යෑම පිළිබිඹු කරමින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ, පීඩනකාරී කාලපරිච්ඡේදයන්ට මුහුණ දුන්නේය. මෙම තත්ත්වය එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමට දායක විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, සංචාරක කර්මාන්තය හා අපනයන මගින් නොකඩවා ලද විදේශ විනිමය ගලා ඒම් සහ වරින් වර තෙල් මිල ගණන් පහත වැටීම මෙන්ම ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන්

වෙළෙඳපොළ තත්ත්වයන් පසුව වැඩිදියුණු විය. මෙම කාලසීමාව තුළ මුදල් වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ශක්තිමත් වූ අතර, සමස්ත ද්‍රවශීලතාව අතිරික්තයක් වාර්තා කරමින් පොලී අනුපාත ද මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව පැවතුණි. ඩිජිටල්කරණය සහ පියවීම් යටිතල පහසුකම්වල වැඩිදියුණු කිරීම් හේතුවෙන් ගෙවීම් සහ පියවීම් පද්ධතීන් හි මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව පෙන්නුම් කළේය. ඩිජිටල් මූල්‍ය සේවා අඛණ්ඩව ව්‍යාප්ත වීම මගින් ඵලදායීතාව සහ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ ගිය ද සයිබර් තර්ජන, තෙවන පාර්ශ්වීය අවදානම් සහ මෙහෙයුම් අවදානම්වලට මූල්‍ය පද්ධතිය නිරාවරණය වීම ඉහළ ගියේය. ඩිජිටල් සම්බන්ධතා වඩාත් පුළුල් වෙමින් සහ තාක්ෂණය වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතින පසුබිමක, මූල්‍ය ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා සයිබර් තර්ජනවලට මුහුණ දීමට ප්‍රමාණවත් හැකියාවක් සහ සූදානමක් පවතින බව සහතික කිරීම අත්‍යවශ්‍ය වේ.

සලකා බලන කාලපරිච්ඡේදය තුළ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම, ශක්තිමත් ලාභදායීත්වය සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීල ස්වාරක්ෂක මගින් ලද සහාය හේතුවෙන් මූල්‍ය ආයතන සමස්තයක් වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව පෙන්නුම් කළේය. පෞද්ගලික අංශයේ ණය ඉල්ලුම ශක්තිමත් වීම හේතුවෙන් බැංකු අංශයේ ණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර පරිභෝජනය, වෙළෙඳාම, මූල්‍ය සේවා, ඉදිකිරීම් සහ අක් වෙරළ යන අංශ වෙත ණය ලබාදීම් කැපී පෙනෙන ලෙස වර්ධනය වීම දක්නට ලැබුණි. අදියර 3 යටතේ පවතින ණය අනුපාතය පහත වැටීම සහ එම අදියර යටතේ පවතින ණය හානිකරණ ආවරණ අනුපාතය වැඩිදියුණු වීම මගින් බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ යෑම පෙන්නුම් කළේය. කෙසේ වුවද, 2026 වසරේ දෙවන කාර්තුවේ දී අදියර 2 යටතේ පවතින ණය ප්‍රමාණය ඉහළ ගිය අතර, ඉහළ ණය වර්ධනයක් පවතින පසුබිමක ණයගැනුම්කරුවන් සම්බන්ධයෙන් ණය අවදානමක් ඇති වීමේ ප්‍රවණතාවක් එමගින් පෙන්නුම් කෙරේ. සලකා බලන කාලසීමාව තුළ, බැංකු අංශයේ ද්‍රවශීලතා අනුපාත පහළ ගිය ද, ඒවා නියාමන අවශ්‍යතාවලට වඩා සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතුණි. විශේෂයෙන් රජයේ සුරකුම්පත් වැනි ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම්වල සිට පෞද්ගලික අංශයට ණය ලබාදීම් වෙත බැංකු අංශයේ වත්කම් සංයුතිය වෙනස් වීම මෙමගින් පිළිබිඹු විය. මේ අතර, බැංකු අංශයේ කෙටි කාලීන වත්කම් සහ වගකීම්වල කල්පිරීම් තුළ වූ නොගැළපීම පුළුල් වූ අතර, එමගින් අනපේක්ෂිත ආතති තත්ත්වයකදී බැංකු අංශය තුළ ප්‍රතිමූල්‍යකරණ සහ ද්‍රවශීලතා අවදානම් මතු වීමේ හැකියාව ඉහළ ගියේය. තවද, බැංකු අංශයේ ලාභදායීත්වය අඛණ්ඩව වර්ධනය වුව ද එහි වර්ධන වේගය 2025 වසරේ පළමු භාගයේ වාර්තා වූ මට්ටමට සාපේක්ෂව තරමක් මන්දගාමී විය. ලාභදායීත්වය ඉහළ යෑම හේතුවෙන් ප්‍රාග්ධනය අඛණ්ඩව ගොඩනැගුණ ද, අවදානම මත බර තැබූ වත්කම්වල වර්ධන වේගය, ප්‍රාග්ධනය එක්රැස් වීමේ වේගය ඉක්මවා ගිය බැවින් බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත යම් ප්‍රමාණයකින් පහළ ගියේය. මෙම මන්දගාමී වීම හමුවේ වුව ද, ප්‍රාග්ධන ස්වාරක්ෂක නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළ මට්ටමක පැවති අතර, ඇති විය හැකි අහිතකර කම්පන අවශෝෂණය කර ගැනීමට ඒවා ප්‍රමාණවත් වනු ඇත.

වාහන මූල්‍යකරණය සහ රන් ඇපකර මත ලබා දෙන ණය සඳහා පැවති ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් මුදල් සමාගම් අංශය තුළ සැලකිය යුතු ණය වර්ධනයක් වාර්තා විය. අදියර 3 යටතේ පවතින ණය අනුපාතය වැඩිදියුණු වුව ද, අදියර 2 යටතේ පවතින ණය තියුණු ලෙස ඉහළ යෑම මගින් මුදල් සමාගම් අංශය තුළ ණය අවදානම ඉහළ යමින් පවතින බව පෙන්නුම් කළේය. මේ සඳහා දිට්වා සුළි කුණාටුවේ සහ මැදපෙරදිග ගැටුම් හේතුවෙන් ඇති වූ අහිතකර බලපෑම්වලට ණයගැනුම්කරුවන් ලක් වීම හේතු වූ අතර වත්කම්වල ගුණාත්මකභාවය ආශ්‍රිත වර්ධනයන් සහ ආංශීය අවදානම් තත්ත්වයන් ගොඩ නැගීමට ඇති හැකියාව අඛණ්ඩව අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාවය එමගින් අවධාරණය කරයි. තවද, ණය හානිකරණ ආවරණ අනුපාතය පහත වැටුණු අතර, එමගින් අංශය තුළ අලාභ අවශෝෂණය කර ගැනීමට ඇති හැකියාවේ පිරිහීමක් පෙන්නුම් කළේය. මුදල් සමාගම් අංශයේ ද්‍රවශීලතා ස්වාරක්ෂක ප්‍රමාණවත් මට්ටමක සහ නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළ මට්ටමක පැවතිය ද, ණය ප්‍රසාරණය මධ්‍යයේ ද්‍රවශීලතා අනුපාත පහළ ගියේය. මේ අතර, තැන්පතුවලට සාපේක්ෂව ණයගැනීම් වේගයෙන් වර්ධනය වීම මගින් මුදල් සමාගම් සහ බැංකු අතර පවතින අන්තර්

සම්බන්ධතාව වර්ධනය වීම පෙන්නුම් කළේය. ශුද්ධ පොලී ආදායම හේතුවෙන් මුදල් සමාගම් අංශයේ ලාභය අඛණ්ඩව ඉහළ ගිය ද, 2026/27 මූල්‍ය වර්ෂයේ පළමු කාර්තුව තුළ ලාභය වර්ධනය වීමේ වේගය අඩු විය. ණය ප්‍රසාරණය හේතුවෙන් අවදානම මත බර තබන ලද වත්කම් ඉහළ යෑමත් සමඟ මුදල් සමාගම් අංශයේ ප්‍රාග්ධන ස්වාරක්ෂක පහළ ගියේය. රක්ෂණ අංශයේ ලාභදායීත්වය අඩු වුව ද ප්‍රාග්ධනීකරණය ප්‍රමාණවත් මට්ටමක පැවතුණි. දිට්වා සුළි කුණාටුවෙන් පසුව රක්ෂණ හිමිකම් ඉල්ලීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ප්‍රතිරක්ෂණ ආදායම් ඉහළ ගිය අතර ප්‍රාරක්ෂණය, ද්‍රවශීලතාව සහ ප්‍රතිපාර්ශ්වීය අවදානම් ඉහළ ගියේය.

2026 වසරේ පළමු භාගය තුළ දී, කුටුම්බ සහ ආයතනික යන අංශ[1] දෙක සඳහා ලබා දුන් ණය ඉහළ ගියේය. කුටුම්බ අංශයේ ණය වර්ධනය ඉහළ මට්ටමක පැවතිය ද, එම කාලසීමාව අවසානයේ දී එහි සුළු මන්දගාමී වීමක් දක්නට ලැබුණි. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කුටුම්බ අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය 2026 වසරේ පළමු භාගයේ දී තවදුරටත් ඉහළ ගිය ද, කුටුම්බ අංශය සඳහා ණය ලබා දෙන ප්‍රධාන මූලාශ්‍රය ලෙස බැංකු අංශය අඛණ්ඩව පැවතුණි. තවද, සමස්ත ණය ශ්‍රේණිගත කිරීම් මගින් පෙන්නුම් කෙරෙන පරිදි, කුටුම්බ අංශයේ ණයගැනුම්කරුවන්ගේ අවදානම් තත්ත්වය 2026 වසරේ පළමු භාගය තුළ බොහෝ දුරට ස්ථාවර මට්ටමක පැවතුණි. ආයතනික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය ද වේගවත් වර්ධනයක් පෙන්නුම් කළ අතර, එම අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණයෙන් වැඩිම ප්‍රතිශතය බැංකු අංශය මගින් ලබා දෙන ලදී. මේ අතර, 2026 වසරේ පළමු භාගය තුළ ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශය[2] ඉහළ පිරිවැටුම් වර්ධනයක් වාර්තා කළ ද, සමස්ත ලාභදායීත්වය දුර්වල විය. විකුණුම් පිරිවැයෙහි සහ මෙහෙයුම් වියදම් ඉහළ යෑම හේතුවෙන් සමස්ත ලාභය පහත වැටුණි. සමස්ත ලාභදායීත්වයේ සහ ණය සේවාකරණ හැකියාවේ යම් පහත වැටීමක් පෙන්නුම් කරමින් ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශයේ ණය විශ්වාසනීයත්වය තරමක් අඩු විය.

මූල්‍ය අංශයේ ඇති වූ වර්ධනයන් සහ මතු වෙමින් පවතින අවදානම්වලට ප්‍රතිචාර වශයෙන්, සලකා බලන කාලසීමාව තුළ විවිධ ප්‍රතිපත්තිමය පියවර ගන්නා ලදී. වාහන මූල්‍යකරණය සහ රන් ඇපකර මත ලබාදෙන ණය වේගයෙන් ප්‍රසාරණය වන පසුබිමක් තුළ, අධික ණයබර පාලනය කිරීමට සහ මතු වෙමින් පවතින අවදානම් අවම කිරීමට ණයගැනුම්කරු පාදක කරගත් සාර්ව විචක්ෂණ ක්‍රියාමාර්ග දැඩි කරන ලදී. විචක්ෂණශීලී ණය ලබාදීමේ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ පද්ධතිමය අවදානම් වර්ධනය වීම සීමා කිරීම අරමුණු කරගනිමින් මෝටර් රථ මූල්‍යකරණය සඳහා වන වටිනාකම මත උපරිම ණය අනුපාතය පිළිබඳ රාමුව සරල කිරීම හා එම සීමා දැඩි කිරීම මෙන්ම, රන් ඇපකර මත පදනම් වූ ණය සඳහා වටිනාකම මත උපරිම ණය සීමාවක් හඳුන්වා දීම මෙම පියවරවලට ඇතුළත් විය. රන් ඇපකර මත පදනම් වූ ණය සඳහා වන වටිනාකම මත ණය සීමාවන්ට අමතරව, අදාළ අවදානම මත බර තැබීම් ද සලකා බලන කාලසීමාව තුළ දැඩි කරන ලදී. දිට්වා සුළි කුණාටුවේ අහිතකර බලපෑම්වලට ප්‍රතිචාර වශයෙන්, පීඩාවට පත් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට සහන සැලසීම සඳහා පියවර ගන්නා ලෙස නියම කරමින් මහ බැංකුව විසින් බැංකු සහ මුදල් සමාගම් වෙත චක්‍රලේඛ නිකුත් කරන ලදී. බැංකු සහ මුදල් සමාගම් අංශවල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම අරමුණු කරගත් ඒකාබද්ධ කිරීමේ මුලපිරීම්වලට සමගාමීව, එම ආයතන සඳහා වන ප්‍රතිසාධන සැලසුම් පිළිබඳ විධාන ද නිකුත් කරන ලදී. ඩිජිටල් ගෙවීම් මාධ්‍ය ආශ්‍රිත මූල්‍ය වංචා සහ රැවටිලි ක්‍රියාවන් ඉහළ යෑමත් සමඟ, ඩිජිටල් ගෙවීම් ක්‍රමවල ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ ඒ ආශ්‍රිත අවදානම් පිළිබඳ මහජන දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්තිමය මුලපිරීම් මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. තවද මූල්‍ය ආයතන සඳහා වන නිරාකරණ රාමුව, මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යයනය මැඩපැවැත්වීමේ රාමුව ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබීය. ඒ සමඟම මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියානු පැසිෆික් කණ්ඩායම (Asia Pacific Group on Money Laundering - APG) විසින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම,


1 ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙන් ලබාගත් සමස්ත ණය දත්ත මත පදනම්ව ඇත.
2 කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම් 204ක මූල්‍ය කාර්යසාධනය මත පදනම්ව ඇත.

ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යයනය මැඩපැවැත්වීමේ රාමුව පිළිබඳ තෙවන අන්‍යෝන්‍ය ඇගයීම සඳහා සූදානම් විය. මීට අමතරව මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී.


ඉදිරි දැක්ම

මූල්‍ය ස්ථායීතාව සඳහා වන ඉදිරි දැක්ම බොහෝ දුරට ධනාත්මකව පවතින අතර ඒ සඳහා ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඉදිරියට ගෙන යෑම සහ විචක්ෂණශීලී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යන කරුණු අඛණ්ඩව සිදුකිරීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, භූදේශපාලනික සහ මූල්‍ය වෙළෙඳපොළ අවිනිශ්චිතතා ඇතුළු බාහිර තත්ත්වයන් මෙන්ම, ඉහළ ණය වර්ධනය හා ඇතැම් අංශ තුළ ණය කේන්ද්‍රගතවීම හේතුවෙන් ඇති විය හැකි දේශීය අවදානම් සහ වර්ධනය වන සයිබර් අවදානම් මත මෙම ඉදිරි දැක්ම රඳා පවතී. එබැවින්, මූල්‍ය ස්ථායීතාව ආරක්ෂා කරගැනීම සඳහා අඛණ්ඩ අධීක්ෂණය සහ කාලෝචිත ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ඉදිරියටත් වැදගත් වනු ඇත. භූදේශපාලනික ආතති සහ බලශක්ති මිල ඉහළ යෑම් දිගුකාලීනව පැවතීම හේතුවෙන්, විදේශීය ගිණුමේ ශේෂයන් දුර්වල වීම සහ උද්ධමන පීඩන ඉහළ නැංවීමට හේතු විය හැකි අතර, එමගින් ණයගැනුම්කරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව කෙරෙහි අහිතකර බලපෑම් ඇති වනු ඇත. මෙම බලපෑම් මගින් කුටුම්බ අංශය වෙත ඇපකර මත ලබා දෙන ණයවල ඉහළ වර්ධනය, අදියර 2 යටතේ පවතින ණය ඉහළ යෑම සහ ද්‍රවශීලතාව හා ප්‍රාග්ධන ස්වාරක්ෂක පහළ යෑම ඇතුළු දැනට පවතින දේශීය අවදානම් තත්ත්වයන් තවදුරටත් තීව්‍ර කළ හැකිය. ආයෝජකයන්ගේ විශ්වාසය ශක්තිමත් කිරීමට, වෙළෙඳපොළ ද්‍රවශීලතාව වැඩිදියුණු කිරීමට, දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ පුළුල් කිරීමට සහ වඩා ස්ථාවර සහ පුළුල් විදේශීය ආයෝජක පදනමක් ආකර්ෂණය කර ගැනීමට ඇති හැකියාව මත මූල්‍ය වෙළෙඳපොළෙහි ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවෙනු ඇති අතර, එමගින් කම්පන අවශෝෂණය කර ගැනීමට සහ කාර්යක්ෂම වත්කම් මිල ගණන් සොයා ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහාය වීමට වෙළෙඳපොළ සතු හැකියාව වැඩිදියුණු වනු ඇත. සමස්තයක් ලෙස, මූල්‍ය ස්ථායීතාව පවත්වා ගෙන යෑම සඳහා, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල අඛණ්ඩ ප්‍රගතිය මගින් සහාය ලැබෙන, විචක්ෂණශීලී මුදල්, සාර්ව විචක්ෂණ හා නියාමන ප්‍රතිපත්තිවල මනා සංයෝජනයක් අවශ්‍ය වනු ඇත. ඒ අනුව, මූල්‍ය ආයතන තුළ ශක්තිමත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වා ගැනීමට, දේශගුණික හා සයිබර් අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමට, නිරාකරණ හා අර්බුද සඳහා සූදානම් වීමේ රාමු වැඩිදියුණු කිරීමට, සහ පවතින ආර්ථික ක්‍රියාකාරකම් හා අවදානම් තත්ත්වයන්ට අනුව ණය වර්ධනය වීම සහතික කිරීම සඳහා මූල්‍ය අංශයේ අවධානය යොමු කළ යුතුය. මෙම උත්සාහයන් පද්ධතිමය අවදානම් ගොඩනැගීම අවම කිරීමට, මූල්‍ය පද්ධතියේ කම්පන අවශෝෂණය කරගැනීමේ හැකියාව ශක්තිමත් කිරීමට සහ මැදිකාලීනව මූල්‍ය ස්ථායීතාව ආරක්ෂා කරගැනීමටත් අත්‍යවශ්‍ය වනු ඇත.

සාර්ව මූල්‍ය තත්ත්වයන්




මූල්‍ය වෙළෙඳපොළ



බැංකු අංශය

බැංකු අංශයේ සාධනීයත්වය



ණය


ණය වර්ධනය
(වාර්ෂික ලක්ෂ්‍යමය)

23.6% 2026 දෙවන කාර්තුව

2025 දෙවන කාර්තුව : 11.4%

මුළු පීඩක අනුව ණය වර්ධනය
(වාර්ෂික ලක්ෂ්‍යමය)

2026 දෙවන කාර්තුව
රුපියල් ණය : 25.4%
විදේශ මුදල් ණය : 17.2%



ද්‍රවශීලතාව


රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය

272.5% 2026 දෙවන කාර්තුව

2025 දෙවන කාර්තුව : 328.5%

ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය

2026 දෙවන කාර්තුව : 148.1%
2025 දෙවන කාර්තුව : 162.7%



වත්කම්වල ගුණාත්මකභාවය

දළ අදියර 3 යටතේ පවතින ණය අනුපාතය:


9.1% 2026 දෙවන කාර්තුව

2025 දෙවන කාර්තුව : 11.9%

අදියර 2 යටතේ පවතින ණය වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය):

7.8% 2026 දෙවන කාර්තුව

2025 දෙවන කාර්තුව : -18.0%



ලාභදායීත්වය


බදු පසු ලාභයේ වර්ධනය
(වාර්ෂික ලක්ෂ්‍යමය)

12.9% 2026 පළමු භාගය

2025 පළමු භාගය : 67.2%

ශුද්ධ පොලි ආදායමේ වර්ධනය
(වාර්ෂික ලක්ෂ්‍යමය)

2026 පළමු භාගය : 11.3%
2025 පළමු භාගය : 26.4%



ප්‍රාග්ධනය

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය


18.2% 2026 දෙවන කාර්තුව

2025 දෙවන කාර්තුව : 19.4%

වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)
2026 දෙවන කාර්තුව

නියාමන ප්‍රාග්ධනය : 15.9%

අවදානම් මත බර තැබූ වත්කම් : 23.8%



මුදල් සමාගම් අංශය


ණය

ණය වර්ධනය
(වාර්ෂික ලක්ෂ්‍යමය)

2026 දෙවන කාර්තුව: 45.0%
2025 දෙවන කාර්තුව: 35.1%

දළ අදියර 3 යටතේ ණය අනුපාතය

2026 දෙවන කාර්තුව: 5.1%
2025 දෙවන කාර්තුව: 8.3%




ද්‍රවශීලතාවය



බාහිර අරමුදල් වලට ද්‍රවශීල වත්කම් අනුපාතය

2025 දෙවන කාර්තුව 15.0%
2026 දෙවන කාර්තුව 10.9%




ප්‍රාග්ධනය

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය

2026 දෙවන කාර්තුව: 19.3%
2025 දෙවන කාර්තුව: 22.0%

වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)
2026 දෙවන කාර්තුව



නියාමන ප්‍රාග්ධනය: 20.8%
අවදානම් මත බර තැබූ වත්කම්: 37.6%


ලාභදායීත්වය

බදු පසු ලාභයේ වර්ධනය
(වාර්ෂික ලක්ෂ්‍යමය)

2026 දෙවන කාර්තුව: 16.4%
2025 දෙවන කාර්තුව: 59.3%

ශුද්ධ පොලි ආදායමෙහි වර්ධනය
(වාර්ෂික ලක්ෂ්‍යමය)

2026 දෙවන කාර්තුව: 27.6%
2025 දෙවන කාර්තුව: 28.3%



තැන්පතු සහ ණය ගැනීම්


තැන්පතු වර්ධනය

2026 දෙවන කාර්තුව: 22.9%
2025 දෙවන කාර්තුව: 16.3%

ණය ගැනීම් වර්ධනය

2026 දෙවන කාර්තුව: 124.0%
2025 දෙවන කාර්තුව: 75.9%

ණය ගැනීම් වර්ධනය
(වාර්ෂික ලක්ෂ්‍යමය)




රක්ෂණ අංශය

දළ ලියාහළ වාර්කයේ වර්ධනය


20.3% 2026 පළමු භාගය (වාර්ෂික ලක්ෂ්‍යමය) ⬆

දිගු කාලීන ⬇ **19.3%** 2026 පළමු භාගය (වාර්ෂික ලක්ෂ්‍යමය)

සාමාන්‍ය ⬆ **21.8%** 2026 පළමු භාගය (වාර්ෂික ලක්ෂ්‍යමය)




ලාභදායීත්වය



ගෙවන ලද හිමිකම්


2026 පළමු භාගයේ දී මෝටර් රථ වාහන රක්ෂණ හිමිකම් **40.8%** කින් ඉහළ යාම නිසා, සාමාන්‍ය රක්ෂණ හිමිකම් වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් **21.4%** කින් වර්ධනය විය.



ප්‍රාග්ධනය

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය **2026** දෙවන කාර්තුව අවසානයේ අවම අවශ්‍යතාව ඉක්මවා පැවතුණි

දිගු කාලීන **313.1%** ⬇ සාමාන්‍ය **286.2%** ⬇



කුටුම්බ සහ සමාගම් අංශ

ණය වර්ධනය

25.4% 2026 දෙවන කාර්තුව

14.8% 2025 දෙවන කාර්තුව



කුටුම්බ අංශය

පිරිවැටුම් වර්ධනය

22.0% 2026 පළමු භාගය

7.6% 2025 පළමු භාගය




ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශය

කුටුම්බ අංශයේ සාරාංශය

ණය මූලාශ්‍ර

බැංකු අංශය, ප්‍රධානතම ණය මූලාශ්‍රය විය.



ණයගැනුම්කරුවන්ගේ ණය ශ්‍රේණිගත කිරීම

538.2 2026 දෙවන කාර්තුව

බරිත සාමාන්‍ය ක්‍රිඩි අගය

511.6 2025 දෙවන කාර්තුව

ද. දේ. නි. % ලෙස කුටුම්බ අංශයේ ණය **අඛණ්ඩව වර්ධනය විය**



මූල්‍ය අංශයේ සමස්ත ණය ලබාදීම්වලින් **48.9%** බස්නාහිර පළාත

මූල්‍ය නොවන සමාගම් අංශයේ සාරාංශය

ශුද්ධ ලාභ වර්ධනයන්ගේ මධ්‍යස්ථ අගය 2026 පළමු භාගය

7.7%

+7.3% 2025 පළමු භාගය

සමාගම් බහුතරයක් ශුද්ධ ලාභයේ වර්ධනයක් වාර්තා කළේය.


ප්‍රධාන ලාභදායීත්ව දර්ශක

වත්කම් මත ප්‍රතිලාභය		හිමිකම් මත ප්‍රතිලාභය		පොලී ආවරණ අනුපාතය	
10.2%	9.0%	14.5%	11.9%	4.2	3.7
2025 පළමු භාගය	2026 පළමු භාගය	2025 පළමු භාගය	2026 පළමු භාගය	2025 පළමු භාගය	2026 පළමු භාගය

ණයසේවාකරණ හැකියාව

★ කුටුම්බ අංශයේ අවදානම් ඇගයීම් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ දත්ත මත පදනම් වේ.

1 පරිච්ඡේදය
සාර්ව මූල්‍ය තත්ත්වයන්



2026 වසරේ පළමු භාගයේ දී, බාහිර අභියෝග තීව්‍ර වුව ද ශ්‍රී ලංකාවේ සාර්ව මූල්‍ය පරිසරය ස්ථායීව පැවති අතර, එය මූල්‍ය ස්ථායීතාවය තහවුරු කිරීම සඳහා සහාය විය. ගෝලීය සාර්ව මූල්‍ය තත්ත්වයන් වඩාත් අභියෝගාත්මක වූ අතර, එමගින් දේශීය ආර්ථිකය වෙත අහිතකර බලපෑම් සම්ප්‍රේෂණය විය. මැදපෙරදිග කලාපයේ ගැටුම් උත්සන්න වීම ඇතුළු ඉහළ ගිය භූදේශපාලනික ආතතීන්, ඉහළ ගිය ගෝලීය අවිනිශ්චිතතා, යලි මතු වූ උද්ධමන පීඩන, දැඩි වූ ගෝලීය මූල්‍ය තත්වයන්, වෙළෙඳ බණ්ඩනය වැඩිවීම, ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතාව, එල් නිනෝ (El Niño) සංසිද්ධිය වැනි දේශගුණික අවදානම් සහ මූල්‍ය වෙළෙඳපොළවල ඉහළ විචලනය යනාදිය මගින් අභියෝගාත්මක බාහිර පරිසරයක් නිර්මාණය වූ අතර, එමගින් දේශීය සාර්ව ආර්ථික සහ මූල්‍ය ස්ථායීතාව කෙරෙහි බලපෑම් ඇති විය හැකිය. බලශක්ති සහ අනෙකුත් භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, ප්‍රධාන වෙළෙඳ මාර්ග වලට බාධා එල්ල වීම සහ ඉහළ ගිය අවිනිශ්චිතතා හේතුවෙන් නැවතත් උද්ධමන පීඩන ඇති වූ අතර ගෝලීය ආර්ථික දැක්මට අහිතකර අවදානම් වැඩි විය. මෙම වර්ධනයන් හේතුවෙන් ශ්‍රී ලංකාව ඇතුළු නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්, වෙළෙඳාම, ප්‍රාග්ධන ප්‍රවාහ, මූල්‍යකරණය සහ විනිමය අනුපාත මාර්ග හරහා ඇති වන අහිතකර බලපෑම්වලට මෙන්ම දේශගුණික කම්පනවලට ද නිරාවරණය වීම ඉහළ යන ලදී.

මෙවැනි පසුබිමක් තුළ, අඛණ්ඩ ආර්ථික වර්ධනය, වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සහ හිතකර මූල්‍ය අංශ වර්ධනයන්ගේ සහාය ඇතිව දේශීය සාර්ව මූල්‍ය තත්ත්වයන්, මූල්‍ය ස්ථාවරත්වය සඳහා දායක වෙමින් සමස්තයක් ලෙස හිතකර ව පැවතුණි. කෙසේ වුව ද, වේගවත් ණය ප්‍රසාරණය සහ ගෝලීය සාර්ව මූල්‍ය තත්ත්වයන් හේතුවෙන් උද්ගත වෙමින් පවතින පීඩනයන් හේතුවෙන් මූල්‍ය පද්ධතිය කෙරෙහි සමීපව අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාව මතු විය. ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රකෘතිමත් වීම සහ සමාලෝචනයට ගැනෙන කාල පරිච්ඡේදයේ වැඩි කාලයක් පුරා සාපේක්ෂ වශයෙන් ලිහිල් මුදල් ප්‍රතිපත්ති තත්ත්වයන් පැවතීම මධ්‍යයේ පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වූ අතර, විශේෂයෙන්ම කුටුම්බ ණය, වාහන මූල්‍යකරණය සහ රන් ඇපකර ණය ආශ්‍රිතව සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ණය වර්ධනය අඛණ්ඩ ව තැන්පතු වර්ධනය අභිබවා යෑමත් සමඟ මූල්‍ය අතරමැදිකරණය තවදුරටත් ශක්තිමත් විය. තවද, පෞද්ගලික අංශයේ ණය චක්‍රය අඛණ්ඩ ව ප්‍රසාරණ අවධියක පැවතුණු අතර, පද්ධතිමය අවදානම් ක්‍රමයෙන් ගොඩනැගීමට ඇති හැකියාව පෙන්නුම් කරමින් පෞද්ගලික අංශයේ ණය පරතරය (Credit Gap) පුළුල් විය. මේ අතර, ප්‍රධාන වශයෙන් ගෝලීය බලශක්ති හා භාණ්ඩ මිල ගණන් ඉහළ යාමෙන් සහ දේශීය ඉල්ලුම ශක්තිමත් වීමෙන් යලි මතු වූ උද්ධමන පීඩන මෙන්ම පෞද්ගලික අංශයේ ණය සැලකිය යුතු අයුරින් වර්ධනය වීමත් හේතුවෙන් 2026 වසරේ මැයි මාසයේ දී දේශීය මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමට පියවර ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳපොළ පොලී අනුපාතික සහ රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික තවදුරටත් ඉහළ යෑමට මෙය දායක විය. මීට අමතරව, සැලකිය යුතු ණය වර්ධනයක් පැවති පසුබිමක, මූල්‍ය අංශය තුළ පද්ධතිමය අවදානම් ගොඩනැගීම අවම කිරීම සඳහා වාහන සහ රන් ඇපකර මත ණය සඳහා වටිනාකම මත ණය අනුපාත (Loan to Value - LTV) සීමා පැනවීම වැනි සාර්ව විචක්ෂණ පියවර හඳුන්වාදෙන ලදී.

රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය තවදුරටත් ශක්තිමත් වූ අතර, එය දේශීය මූල්‍යකරණය මත රඳා පැවතීම අවම කරමින් මූල්‍ය අංශයේ සම්පත් පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් වෙත යොමු කිරීමට සහාය විය. කෙසේ වුවද, විශේෂයෙන් භාණ්ඩ මිල ගණන් හරහා ඇති වන අහිතකර ගෝලීය වර්ධනයන්ට විදේශීය අංශය අවදානමට ලක්විය හැකි අංශයක් ලෙස පැවති අතර, වෙළෙඳාම, සංචාරක කර්මාන්තය, විදේශ ශ්‍රමික ප්‍රේෂණ සහ විනිමය අනුපාතික මාර්ග ඔස්සේ සම්ප්‍රේෂිත බලපෑම් ඇති වීමේ හැකියාව ද පැවතුණි. ඒ සමඟම, මූල්‍ය ආයතන අතර අන්තර්සම්බන්ධතාවයන් වර්ධනය වීම, ඉහළ යමින් පවතින මූල්‍ය සේවා ඩිජිටල්කරණය සහ මූල්‍ය තාක්ෂණය ආශ්‍රිත වේගවත් සංවර්ධනයන් මෙන්ම ඉහළ යන සයිබර් ආරක්ෂණ තර්ජන මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා වැදගත් වන සාධක ලෙස පැන නැඟුණි. තවද, දේශගුණික ආශ්‍රිත සිදුවීම්වල වාර ගණන සහ ඒවායේ තීව්‍රතාව ඉහළ යෑම සාර්ව මූල්‍ය අවදානම් පසුබිම තවදුරටත් පුළුල් කරමින්, එමගින් ස්ථායීතාවයට අභියෝග එල්ල කළේය.

ඉදිරි කාලය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී, විවිධ අංශ ඔස්සේ එල්ල විය හැකි අභියෝග පැවතිය ද ශ්‍රී ලංකාවේ සාර්ව මූල්‍ය ඉදිරි දැක්ම බොහෝ දුරට ස්ථායී ව පවතී. අඛණ්ඩ ආර්ථික වර්ධනය, ශක්තිමත් රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සහ වැඩිදියුණු වූ මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව උද්ගත විය හැකි කම්පනවලට එරෙහි වැදගත් ආරක්ෂක සාධක ලෙස ක්‍රියා කරනු ඇත. කෙසේ වුව ද, තීව්‍ර වූ භූදේශපාලනික ආතතීන්, නැවත ඇති වූ උද්ධමන පීඩන, දැඩි ගෝලීය මූල්‍ය තත්ත්වයන්, දේශගුණික අවදානම් සහ වේගවත් ණය ප්‍රසාරණය ඉදිරි කාලයේ දී මූල්‍ය ස්ථායීතාව කෙරෙහි අභියෝග එල්ල කළ හැකිය. ඒ අනුව, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා සාර්ව ආර්ථික ස්ථායීතාව ආරක්ෂා කිරීම, ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වා ගැනීම, අවදානම් කළමනාකරණ පිළිවෙත් ශක්තිමත් කිරීම සහ ණය ප්‍රසාරණය ආර්ථික මූලධර්මවලට අනුකූල වන බව සහතික කිරීම වැදගත් වේ. එහෙයින්, මූල්‍ය පද්ධතිය වෙත මතු වෙමින් පවතින අවදානම් සහ දුර්වලතා සමීප ව නිරීක්ෂණය කිරීමට සහ ඇගැයීමටත්, අවශ්‍ය වූ විට පූර්වෝපායික සහ කාලෝචිත සාර්ව විචක්ෂණශීලී පියවර අනුගමනය කිරීමටත් මහ බැංකුව අඛණ්ඩ ව කටයුතු කරනු ඇත.

1.1 ජාත්‍යන්තර ආර්ථික පරිසරය සහ මූල්‍ය තත්ත්වයන්


ගෝලීය සාර්ව මූල්‍ය වර්ධනයන් සහ ඉදිරි දැක්ම

තීව්‍ර වූ භූදේශපාලනික ආතතීන්, මැදපෙරදිග කලාපයේ ගැටුම්, නැවත ඇති වූ උද්ධමනකාරී පීඩන, ඉහළ යන වෙළෙඳ බණ්ඩනය, ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතා සහ මූල්‍ය වෙළෙඳපොළ විචලනය හේතුවෙන් සමාලෝචනයට ගැනෙන කාල පරිච්ඡේදයේ දී ගෝලීය සාර්ව මූල්‍ය තත්ත්වයන් වඩාත් අභියෝගාත්මක විය. 2026 වසරේ පළමු භාගයේ දී මැදපෙරදිග කලාපයේ ආතතීන් උත්සන්න වීම හේතුවෙන් ගෝලීය අවදානම් වාතාවරණය සැලකිය යුතු අයුරින් වෙනස් වූ අතර, එමගින් බලශක්ති සුරක්ෂිතතාව, ජාත්‍යන්තර වෙළෙඳ මාර්ගවලට බාධා එල්ල වීම සහ යළි මතු වූ සැපයුම් අංශයේ පීඩන පිළිබඳ අවධානය තවදුරටත් ඉහළ ගියේය. මෙම පසුබිම තුළ, ගෝලීය අවිනිශ්චිතතා දර්ශක 2025 වසරේ දී වාර්තා වූ ඉහළතම අගයන්ට සාපේක්ෂව යම් පහළ යෑමක් පෙන්නුම් කළද, ඓතිහාසික සාමාන්‍ය මට්ටම්වලට වඩා ඉහළ මට්ටමක පැවතුණි. කෙසේ වුවද, භූදේශපාලනික ආතතීන් උත්සන්න වීමෙන් අනතුරුව ගෝලීය මූල්‍ය තත්ත්වයන් දැඩි වීම, මීට පෙර වාර්තා වූ ප්‍රධාන ගෝලීය කම්පන වලදී දක්නට ලැබුණු තරම් තීව්‍ර නොවූ අතර, ජාත්‍යන්තර ණය වෙළෙඳපොළ සමස්තයක් ලෙස විධිමත්ව ක්‍රියාත්මක විය. ඒ සමඟම, දේශගුණික සිදුවීම් නිරන්තරයෙන් සිදුවීම සහ ඒවායේ තීව්‍රතාව ඉහළ යෑම හේතුවෙන් ගෝලීය සැපයුම් බාධා, භාණ්ඩ මිල ගණන් ආශ්‍රිත පීඩන සහ ආර්ථික අලාභ තවදුරටත් උත්සන්න විය හැකිය. එමගින් දැනට පවතින සාර්ව මූල්‍ය අවදානම් තවදුරටත් ඉහළ යා හැකි අතර, සම්ප්‍රේෂිත බලපෑම් හරහා දේශීය සාර්ව මූල්‍ය තත්ත්වයන්ට ද බලපෑම් ඇති කිරීමට ඉඩ ඇත. මේ අතර, භූදේශපාලනික අවදානම්, අඛණ්ඩ ව පවතින උද්ධමනකාරී පීඩන, ඉහළ ස්වෛරී ණයගැතිභාවය සහ ගෝලීය මුදල් ප්‍රතිපත්ති ඉදිරි දැක්ම පිළිබඳ අවිනිශ්චිතතාව අතර පවතින අන්තර් ක්‍රියාකාරීත්වය හේතුවෙන් එකිනෙක තවදුරටත් තීව්‍ර කරන පීඩන තත්ත්වයන් මතු විය හැකිය. දේශීය සාර්ව මූල්‍ය තත්ත්වයන්, ප්‍රධාන වශයෙන් භාණ්ඩ ආනයනය, වෙළෙඳාම, සංචාරක කර්මාන්තය, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, විනිමය අනුපාතික සහ ගෝලීය ආයෝජක ආකල්ප හරහා මෙම වර්ධනයන්ට නිරාවරණය වේ. කෙසේ වුවද, වඩාත් ශක්තිමත් රාජ්‍ය මූල්‍ය අවකාශය, විදේශ ප්‍රේෂණ අඛණ්ඩ ව ගලා ඒම සහ වැඩිදියුණු වූ විදේශ සංචිත ස්වාරක්ෂක මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා යම් ආරක්ෂාවක් සපයයි. මේ අතර, ගෝලීය තත්ත්වයන්හි දිගුකාලීන පිරිහීමක් පැවතුණහොත් දේශීය සාර්ව මූල්‍ය තත්ත්වයන් තවදුරටත් පීඩනයට ලක් වීමට ඉඩ ඇති අතර එමගින් මූල්‍ය ආයතන සහ සමස්ත මූල්‍ය ස්ථායීතාව කෙරෙහි අහිතකර බලපෑම් එල්ල වීමේ හැකියාවක් පවතී.

ගෝලීය ආර්ථික වර්ධනය සහ වෙළෙඳ භාණ්ඩ වෙළෙඳාම

පවත්නා භූදේශපාලනික සහ ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතා මධ්‍යයේ එකිනෙකට විෂම වූ ගෝලීය වර්ධනය සහ මන්දගාමී වූ ගෝලීය වෙළෙඳාම, ශ්‍රී ලංකාව වැනි කුඩා විවෘත ආර්ථිකයන් බාහිර අවදානම්වලට ලක් වීමට ඇති හැකියාව තවදුරටත් ඉහළ නැංවීය. ගෝලීය ආර්ථික වර්ධනය ධනාත්මක ව පැවතිය ද, රටවල් සහ කලාප අතර, ආර්ථික වර්ධනය අසමාන ස්වභාවයක් ගත් අතර විශේෂයෙන් මැදපෙරදිග ගැටුම් හේතුවෙන් අහිතකර ලෙස බලපෑමට ලක් වූ බලශක්ති ආනයනය කරන ආර්ථිකයන්හි මෙම තත්ත්වය කැපී පෙනුණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) 2026 වසරේ ජූලි මස ලෝක ආර්ථික ඉදිරි දැක්ම (WEO) යාවත්කාලීන වාර්තාවට අනුව ගෝලීය ආර්ථික වර්ධනය 2025 වසරේ දී පැවති 3.5% සිට 2026 වසරේ දී 3.0%ක් දක්වා මන්දගාමී වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් යම් ඔරොත්තු දීමේ


රූප සටහන 1.1 ගෝලීය අවිනිශ්චිතතාව



මූලයන්: ලෝක අවිනිශ්චිතතා දර්ශකය (WUI) දත්ත පද්ධතිය* www.matteoiacoviello.com


* WUI දත්ත සමුදාය, H.Ahir, N. Bloom සහ D. Furceri විසින් 2022 වසරේ ප්‍රකාශයට පත් කරන ලද "The World Uncertainty Index", NBER Working Paper 29763 හි භාවිත කරන ලද ක්‍රමවේදය මත පදනම්ව සකස් කර ඇත.

රූප සටහන 1.2 ගෝලීය මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය



මූලාශ්‍රය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - ලෝක ආර්ථික ඉදිරි දැක්ම

රූප සටහන 1.3 ගෝලීය නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (PMI)



මූලාශ්‍රය: එස් ඇන්ඩ් පී ග්ලෝබල්

හැකියාවක් පෙන්නුම් කළ ද, ආර්ථිකයන් අතර වර්ධන කාර්යසාධනය සැලකිය යුතු අයුරින් එකිනෙකට වෙනස් විය. කෘතිම බුද්ධිය (AI) ආශ්‍රිත තාක්ෂණික වටිනාකම් දාමයන් සමඟ වඩාත් ඒකාබද්ධ වූ රටවල ආර්ථික ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණය ආශ්‍රිත අයෝජනවල අඛණ්ඩ ශක්තිමත්භාවය සහ කෘතිම බුද්ධියේ දියුණුව සහාය විය. ඊට ප්‍රතිවිරුද්ධව, නැඟී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් (EMDEs) රැසක් දුර්වල බාහිර ඉල්ලුමකට සහ තීව්‍ර වූ අවදානම්වලට මුහුණ දුන්නේය.

ගෝලීය නිෂ්පාදන ක්‍රියාකාරකම් ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළ අතර, ගෝලීය නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (PMI) 2025 වසරේ ජූනි මාසයේ සිට ප්‍රසාරණ කලාපයෙහි පැවතුණි. නිෂ්පාදන නිමැවුම සහ නව ඇණවුම් අඛණ්ඩ ව වර්ධනය වූ අතර, එයට පෙර සිදු කළ පූර්වෝපායික තොග රැස් කිරීම් සහ ප්‍රධාන ආර්ථිකයන්වල ඔරොත්තුදීමේ හැකියාවක් සහිත ආර්ථික ක්‍රියාකාරකම් යම්තාක් දුරට සහාය විය. කෙසේ වුවද, නිෂ්පාදන නිමැවුම සහ නව ඇණවුම්වල වර්ධනය ලිහිල් වීමත් සමඟ දෙවන කාර්තුවේ දී, වාර්තා වූ ඉහළම මට්ටම්වලට සාපේක්ෂව ප්‍රසාරණයවන වේගය ක්‍රමයෙන් මන්දගාමී විය. සැපයුම් දාමයේ පීඩන සහ පිරිවැය ඉහළ යාමේ ප්‍රවණතාවයේ යම් අඩුවීමක් දක්නට ලැබුණ ද, ව්‍යාපාරික ආකල්ප තවදුරටත් දුර්වල මට්ටමක පැවතුණි. තවද, මෑත කාලීනව සිදු වූ සංකෝචනයන්ගෙන් අනතුරුව, 2026 වසරේ ජූලි මාසයේ දී නව අපනයන ඇණවුම් ස්ථාවර තත්ත්වයකට පත් වූ අතර, භූදේශපාලනික ආතතීන්, වෙළෙඳ ප්‍රතිපත්ති පිළිබඳ අවිනිශ්චිතතාව සහ බලශක්ති මිල ගණන් ආශ්‍රිත අවිනිශ්චිතතා තවදුරටත් ඉදිරි දැක්ම කෙරෙහි සෘණාත්මක බලපෑම් එල්ල කළ අතර ගෝලීය නිෂ්පාදන ක්‍රියාකාරකම් පහළ යාමේ අවදානම් මතු කළේය.

රූප සටහන 1.4 ගෝලීය වෙළෙඳ භාණ්ඩ වෙළෙඳාම ආශ්‍රිත වර්ධනය



මූලාශ්‍රය: CPB ගෝලීය වෙළෙඳාම් නිරීක්ෂණය


භූදේශපාලනික ආතතීන්, ඉහළ ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතා සහ වෙළෙඳ සීමා කිරීම් අඛණ්ඩ ව පුළුල් වීම ඔස්සේ දේශ සීමා හරහා සිදුවන වෙළෙඳ කටයුතු කෙරෙහි ඍණාත්මක බලපෑම් එල්ල වීම හේතුවෙන් සමාලෝචනයට ගැනෙන කාල පරිච්ඡේදයේ දී ගෝලීය භාණ්ඩ වෙළෙඳාම මන්දගාමී මට්ටමක පැවතුණි. එහෙයින් 2026 වසරේ මාර්තු මාසයේ දී මැදපෙරදිග ආතතීන් උත්සන්න වීමෙන් අනතුරුව, දියුණු සහ නැගී එන ආර්ථිකයන් යන දෙඅංශයේම වෙළෙඳ වර්ධනය දුර්වල වූ අතර, එම මන්දගාමීත්වය නැගී එන ආර්ථිකයන් අතර වඩාත් කැපී පෙනුණි. ගෝලීය වෙළෙඳ මාර්ගවලට එල්ල වූ මහා පරිමාණ බාධා බොහෝ දුරට වළක්වා ගැනීමට හැකි වුව ද, විශේෂයෙන් මැදපෙරදිග ප්‍රධාන සමුද්‍රීය මාර්ගවලට එල්ල වූ බාධා මධ්‍යයේ සැපයුම් දාමය ආශ්‍රිත අවදානම් ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර, ඉහළ ප්‍රවාහන සහ සැපයුම් සේවා පිරිවැය, වැඩි වූ සමුද්‍රීය රක්ෂණ වාරික සහ බෙදාහැරීමට ගතවන කාලය දීර්ඝ වීම වෙළෙඳ කටයුතු සම්බන්ධ අවිනිශ්චිතතාවන් තවදුරටත් තීව්‍ර කළේය. තවද, කාර්මික ප්‍රතිපත්ති, අපනයන පාලනයන්, වෙළෙඳ සීමා සහ ප්‍රධාන ආර්ථිකයන් අතර පවතින උපායමාර්ගික තරඟකාරීත්වය හරහා වැඩිවන වෙළඳ ඛණ්ඩනය හේතුවෙන් ගෝලීය වෙළෙඳාම සහ ආයෝජන රටා අඛණ්ඩ ව ප්‍රතිනිර්මාණය වූ අතර, එමගින් ගෝලීය ආර්ථික ඉදිරි දැක්ම පිළිබඳ අස්ථාවරත්වය තවදුරටත් ඉහළ ගියේය.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, දේශීය මූල්‍ය අංශය තවදුරටත් වත්මන් ගෝලීය වර්ධන ප්‍රවණතාවලින් එල්ල විය හැකි අහිතකර සම්ප්‍රේෂිත බලපෑම්වලට ලක්වීමේ අවදානම් තත්ත්වයක පවතින අතර, එමගින් මූල්‍ය ස්ථායීතාව කෙරෙහි බලපෑම් එල්ල කළ හැකිය. දුර්වල ගෝලීය ආර්ථික වර්ධනය සහ වෙළෙඳාම ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයීම් අවම වීමට හේතු වී ඇති අතර, ඉහළ බලශක්ති සහ භාණ්ඩ මිල ගණන් මෙන්ම ප්‍රවාහන පිරිවැය ඉහළ යෑම ද ආනයන වියදම් ඉහළ යෑමට හේතු වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශ විනිමය සංචිත රැස් කිරීමට බලපෑම් කරමින් විදේශීය ජංගම ගිණුමේ හිඟයක් ඇති විය. මෙම වර්ධන ප්‍රවණතා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ආශ්‍රිත පීඩන ඉහළ නංවන ලද අතර විනිමය අනුපාතික විචලනයට ද දායක විය. එමගින් ආනයනික උද්ධමනය, ඉහළ නිෂ්පාදන පිරිවැය, කුටුම්බ සහ සමාගම් අංශයේ ණය ආපසු ගෙවීමේ හැකියාව දුර්වල වීම සහ දේශීය මූල්‍ය තත්ත්වයන් දැඩි වීම හරහා දෙවන වටයේ බලපෑම් ඇති විය හැකිය. ඒ අනුව, ගෝලීය වෙළෙඳ කටයුතු සහ ආර්ථික වර්ධන තත්ත්වයන් තවදුරටත් පිරිහීමක් සිදු වුවහොත්, එය ශ්‍රී ලංකාවේ බාහිර ස්වාරක්ෂක දුර්වල කිරීමටත් බාහිර කම්පන දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සහ මූල්‍ය පද්ධතිය වෙත සම්ප්‍රේෂණය වීම තීව්‍ර වීමටත් හේතු විය හැකි අතර, එමගින් සාර්ව මූල්‍ය තත්ත්වයන් සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පහළ යාමේ අවදානම් මතු විය හැකිය.

ගෝලීය උද්ධමනය සහ වෙළෙඳ භාණ්ඩ මිල ගණන්

භාණ්ඩ මිල ගණන් ඉහළ සහ අස්ථාවර මට්ටම්වල පැවතීම හේතුවෙන් 2026 වසරේ දී ගෝලීය උද්ධමන පීඩන තීව්‍ර විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ, 2026 වසරේ ජූලි මස ලෝක ආර්ථික දැක්ම යාවත්කාලීන වාර්තාවට අනුව, 2025 වසරේ 4.1%ක් වූ අගයේ සිට ගෝලීය මතුපිට උද්ධමනය 2026 වසරේ දී 4.7% දක්වා ඉහළ ගොස් පසුව 2027 වසරේ දී 3.9%ක් දක්වා පහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. බලශක්ති සැපයුම්වලට සිදුවිය හැකි බාධා, ප්‍රවාහන අවහිරතා සහ මැදපෙරදිග කලාපයේ ප්‍රධාන නැව් මාර්ග වෙත එල්ල වන අවදානම් පිළිබඳ ගැටලු හේතුවෙන් බොරතෙල් මිල ගණන්වල අස්ථාවරත්වය තීව්‍ර වූ අතර බලශක්ති පිරිවැය ඉහළ යෑම හේතුවෙන් ඉන්ධන, විදුලි බල, නිෂ්පාදන, ප්‍රවාහන සහ සැපයුම් සේවා පිරිවැය ඉහළ ගොස් පුළුල් උද්ධමනීය පීඩන ඇති විය. ඉහළ බලශක්ති සහ පොහොර පිරිවැය, අහිතකර කාලගුණ තත්ත්වයන්, දේශගුණික ආශ්‍රිත කම්පන සහ කෘෂිකාර්මික සැපයුම් දාමයන්ට බාධා එල්ල වීම හමුවේ ආහාර මිල ගණන් ද අවදානමට ලක් ව පැවති අතර, එය කුටුම්බ වියදමින් සාපේක්ෂව වැඩි කොටසක් ආහාර සහ බලශක්තිය සඳහා වැය කරන නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් කෙරෙහි වඩාත් දැඩි බලපෑමක් එල්ල කළේය. ශ්‍රී ලංකාව වැනි ශුද්ධ වශයෙන් බලශක්ති ආනයනය කරන ආර්ථිකයන්ට, ගෝලීය බලශක්ති සහ ආහාර මිල ගණන් අඛණ්ඩ ඉහළ යෑම වෙළෙඳ භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑමට හේතුවන අතර, එය විදේශීය ජංගම ගිණුම සහ දේශීය උද්ධමනය මත පීඩනයක් ඇති කරයි. එමෙන්ම, එය කුටුම්බවල මිල දී ගැනීමේ හැකියාව අඩු කිරීමටත්, ව්‍යාපාරවල මෙහෙයුම් පිරිවැය වැඩි කිරීමටත් හේතු වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, ණය සේවාකරණ හැකියාව, වත්කම්වල ගුණාත්මකභාවය සහ සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය.


රූප සටහන 1.5 ගෝලීය උද්ධමනය*




* සියලු අයිතම පාරිභෝගික මිල දර්ශකය (CPI) මත පදනම් වූ මතුපිට උද්ධමනය, කාල පරිච්ඡේදයේ සාමාන්‍යය, ප්‍රතිශත වෙනස

මූලයඃ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - ලෝක ආර්ථික ඉදිරි දැක්ම

රූප සටහන 1.6 ගෝලීය වෙළෙඳ භාණ්ඩ මිල දර්ශක






මූලයන්: ලෝක බැංකුව
බ්ලූම්බර්ග් තොරතුරු සේවය

මේ අතර, ඉහළ ගිය භූදේශපාලනික අවිනිශ්චිතතා සහ ආරක්ෂිත ආයෝජනයක් (safe hevan investment) ලෙස රන් සඳහා වූ ඉල්ලුම වැඩිවීම මධ්‍යයේ 2026 වසරේ ජනවාරි මාසයේ දී ගෝලීය රන් මිල ඉතිහාසයේ වාර්තා වූ ඉහළම අගයට ළඟා වූ අතර, පසුව එම මිල ගණන් 25%කට ආසන්න ප්‍රමාණයකින් පහළ ගියේය. රන් මිලෙහි මෙම සැලකිය යුතු උච්චාවචනයන්, රන් ඇපකර මත ණය ලබා දීමට සැලකිය යුතු නිරාවරණයක් ඇති මූල්‍ය ආයතන සහිත ශ්‍රී ලංකාව වැනි රටවල් මෙම තත්ත්වය කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

ගෝලීය මූල්‍ය තත්ත්වයන්


තීව්‍ර වූ භූදේශපාලනික ආතතීන්, යළි මතු වූ උද්ධමන පීඩන සහ ගෝලීය මුදල් ප්‍රතිපත්ති ඉදිරි දැක්ම පිළිබඳ ඉහළ ගිය අවිනිශ්චිතතාව මධ්‍යයේ, 2026 වසර තුළ ගෝලීය මූල්‍ය තත්ත්වයන් දැඩි විය. මැදපෙරදිග ගැටුම් උත්සන්න වීමත් සමඟ ආයෝජකයින් උද්ධමනය, පොලී අනුපාතික සහ ආර්ථික වර්ධනය පිළිබඳ අපේක්ෂාවන් නැවත ඇගයීමකට ලක් කිරීම හේතුවෙන් ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ වල මිල ගණන් නැවත පුළුල් ඇගයීමකට ලක්විය. රාජ්‍ය බැදුම්කර ඵලදා ඉහළ ගිය අතර, කොටස් වෙළෙඳපොළ තුළ මිල ගණන් තාවකාලික පසුබෑමකට ලක් වීම සහ වෙළෙඳපොළ කිහිපයක මූල්‍යකරණ තත්ත්වයන් දැඩි විය. කෙසේ වුවද, මෙම දැඩි වීම මීට පෙර පැවති ප්‍රධාන ගෝලීය වෙළෙඳපොළ ආතති අවස්ථාවලට සාපේක්ෂව අඩු මට්ටමක පැවති අතර, ඓතිහාසික මට්ටම් සමඟ සැසඳීමේදී සමස්ත මූල්‍ය තත්ත්වයන් පුළුල් ලෙස ලිහිල් මට්ටමක පැවතුණි. ආර්ථික ක්‍රියාකාරකම් ස්ථාවරව පැවතීම, සාපේක්ෂ වශයෙන් හිතකර ද්‍රවශීලතා තත්ත්ව සහ ප්‍රධාන ආර්ථිකයන් කිහිපයක මුදල් ප්‍රතිපත්තීන් ක්‍රමයෙන් ලිහිල් වනු ඇතැයි යන අපේක්ෂාවන් හේතුවෙන්, මූල්‍ය වෙළෙඳපොළ සමස්තයක් ලෙස ක්‍රමවත් ආකාරයෙන් අබණ්ඩ ව ක්‍රියාත්මක විය. කෙසේ වෙතත්, ආර්ථිකයන් අතර මූල්‍ය සම්පාදන තත්ත්වයන් විෂම ලෙස පැවතුණි. දියුණු ආර්ථිකයන් සාමාන්‍යයෙන් ගැඹුරු සහ වඩාත් ද්‍රවශීල මූල්‍ය වෙළෙඳපොළ තුළින් අබණ්ඩ ව ප්‍රතිලාභ ලැබූ අතර, නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් කිහිපයක් ඉහළ බාහිර අවදානම්, දුර්වල රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් සහ සාපේක්ෂව ඉහළ ණය ගැනීමේ පිරිවැය හේතුවෙන් වඩාත් අභියෝගාත්මක මූල්‍ය සම්පාදන පරිසරයන්ට මුහුණ දුන්හ. තවද, වඩාත් ශක්තිමත් එක්සත් ජනපද ඩොලරය, අඩු පොලී අනුපාතයකට මුදල් ණයට ගෙන වැඩි ප්‍රතිලාභයක් ලැබෙන ස්ථානයක ආයෝජනය කිරීමෙන් ලාභ උපයාගැනීමේ අරමුණින් සිදු කරන ආයෝජන (Carry Trades) ආපසු හැරවීමට ඇති හැකියාව, සහ අවදානම් කෙරෙහි සංවේදී වන බැංකු නොවන මූල්‍ය ආයතන ආයෝජකයින්ගේ සහභාගීත්වය වැඩි වීම

රූප සටහන 1.7 මූල්‍ය තත්ත්ව දර්ශකය




මූලය: බ්ලූම්බර්ග් තොරතුරු සේවය

රූප සටහන 1.8 **ප්‍රතිපත්ති පොලී අනුපාතික පරාසය (2021 ජනවාරි සිට 2026 ජූලි දක්වා)**



මූලයන්: එංගලන්ත මහ බැංකුව, ෆෙඩරල් සංචිතය, යුරෝපීය මහ බැංකුව, ජපාන මහ බැංකුව

රූප සටහන 1.9 **දිගු කාලීන රාජ්‍ය බැඳුම්කර ඵලදා: වසර 10**



මූලයන්: ශාන්ති ලුවිස් ෆෙඩරල් සංචිත බැංකුව - ආර්ථික දත්ත

හේතුවෙන් ප්‍රාග්ධන ප්‍රවාහ පිටතට ගලා යාමේ සහ විනිමය අනුපාතිකය මත පීඩන ඇති වීමේ හැකියාව ඉහළ යා හැකිය.


මෙම වර්ධන ප්‍රවණතා හේතුවෙන් විශේෂයෙන් අවදානම් සහිත ආර්ථිකයන් සඳහා මූල්‍ය තත්ත්වයන් තවදුරටත් දැඩි වීමට හේතු විය හැකිය. මූල්‍ය තත්ත්වයන් දැඩි වීම මධ්‍යයේ ප්‍රතිමූල්‍යකරණ පිරිවැය ඉහළ යෑම, සැලකිය යුතු විදේශ විනිමය වගකීම් හෝ විශාල බාහිර මූල්‍යකරණ අවශ්‍යතා සහිත ආර්ථිකයන්ට අහිතකර ලෙස බලපෑ හැකිය. මේ අතර, දිගු කාලීන භූදේශපාලනික ගැටුමක්, බලශක්ති මිල ගණන් මත පදනම් වූ කල්පවත්නා උද්ධමනය හෝ ගෝලීය මුදල් ප්‍රතිපත්ති ඉදිරි දැක්ම පිළිබඳ හදිසි නැවත ඇගයීමට ලක් කිරීමක් සිදු වුවහොත් මූල්‍ය තත්ත්වයන් තවදුරටත් දැඩි විය හැකිය. මෙම වර්ධනයන් ශ්‍රී ලංකාවේ බාහිර මූල්‍යකරණ පිරිවැය ඉහළ නැංවීමට, ප්‍රාග්ධන ප්‍රවාහ ලැබීම් සහ විනිමය අනුපාතික හැසිරීම්වලට බලපෑම් කිරීමට මෙන්ම දේශීය ආයතනවලට ජාත්‍යන්තර මූල්‍ය පහසුකම් වෙත ප්‍රවේශය සීමා කිරීමට ද හේතු විය හැකිය. එහෙයින්, මූල්‍ය තත්ත්වයන් දැඩි වීම මගින් ප්‍රතිමූල්‍යකරණ පීඩන තීව්‍ර කළ හැකි අතර ඉහළ ණයගැතිභාවයක් සහිත ණයගැනුම්කරුවන්ගේ සහ මූල්‍ය අතරමැදිකරුවන්ගේ ශේෂ පත්‍ර දුර්වල කළ හැකිය. ඒ අනුව, ගෝලීය මූල්‍ය තත්ත්වයන්ගෙන් ඇතිවිය හැකි අහිතකර වක්‍ර බලපෑම් අවම කිරීම සඳහා සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම මෙන්ම ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය, විදේශ සහ මූල්‍ය අංශයේ ස්වාරක්ෂක පවත්වා ගැනීම වැදගත් වේ.

ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ

මැදපෙරදිග ආතතීන් උත්සන්න වීමත් සමඟ භූදේශපාලනික අවිනිශ්චිතතා ඉහළ යෑම සහ ආයෝජක විශ්වාසය දුර්වල වීම හේතුවෙන් සමාලෝචනයට ගැනෙන කාල පරිච්ඡේදයේ දී මූල්‍ය වෙළෙඳපොළ විචලනය ඉහළ ගියේය. බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳ ගැටලු, යළි මතු වූ උද්ධමන පීඩන සහ ගෝලීය වෙළෙඳාම කෙරෙහි එල්ල වූ බාධා හේතුවෙන් ආයෝජකයින් මූල්‍ය වෙළෙඳපොළ අවදානම් පිළිබඳ ව යළි ඇගැයීමක් සිදු කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කොටස්, ස්වෛරී බැඳුම්කර, විදේශ විනිමය සහ භාණ්ඩ වෙළෙඳපොළවල මිල උච්චාවචනයන් තීව්‍ර විය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින්, 2026 වසර පළමු භාගයේ දී, අනුමානිත උච්චාවචනය මැනෙන ප්‍රධාන දර්ශක කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය.[1] විවිධ වත්කම් කාණ්ඩවල අස්ථාවරත්වය එකවර ඉහළ යෑම මගින් ගෝලීය මූල්‍ය වෙළෙඳපොළවල අන්තර්සම්බන්ධිත බව සහ භූදේශපාලනික කම්පන, ආයෝජක කළඹ සහ මූල්‍ය අතරමැදියන් හරහා වේගයෙන් ව්‍යාප්ත වීමට ඇති හැකියාව පෙන්නුම් කළේය. මෙම ඉහළ ගිය අස්ථාවරත්වය අවදානම් අධිමිල (risk premia) ඉහළ යෑමට, වෙළෙඳපොළ ද්‍රවශීලතාව අවම කිරීමට සහ ආයෝජකයින් සාපේක්ෂ වශයෙන් අවදානම් සහිත වත්කම් සඳහා නිරාවරණය වීම අවම කිරීමට පෙළඹවිය හැකි අතර, එමගින් ශ්‍රී ලංකාව වැනි නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්ගෙන් ප්‍රාග්ධන ප්‍රවාහ පිටතට ගලා යෑමක් සිදුවිය හැකිය. කෙසේවෙතත්, භූදේශපාලනික ආතතීන් ලිහිල් වීමේ සලකුණු සහ ආයෝජක විශ්වාසය ඉහළ යෑමත් සමඟ මූල්‍ය වෙළෙඳපොළ අස්ථාවරත්වය යම් මට්ටමකට පහත වැටුණද, ගෝලීය වෙළෙඳපොළ තවදුරටත් නැවත ඇතිවිය හැකි පීඩනකාරී තත්ත්වයන්ට ගොදුරු වීමේ අවදානමක පැවතුණි. තවද, රාජ්‍ය ණය ඉහළ මට්ටමක පැවතීම සහ කෙටි කාලීන ණය නිකුතු මත වැඩි වශයෙන් රඳා පැවතීම හේතුවෙන් ප්‍රධාන ස්වෛරී වෙළෙඳපොළවල ණය අලුත් කිරීමේ

1 එක්සත් ජනපද S&P 500 දර්ශකයේ අපේක්ෂිත විචලනය මනිනු ලබන VIX දර්ශකය, යුරෝ කලාපයේ EURO STOXX 50 දර්ශකයේ අපේක්ෂිත විචලනය පිළිබිඹු කරන VSTOXX දර්ශකය, ජපානයේ Nikkei 225 දර්ශකයේ අපේක්ෂිත වෙනස්වීම් මනිනු ලබන NKY විචලන දර්ශකය, භූදේශපාලනික ආතතීන් උත්සන්න වූ කාල සීමාවන් තුළ දී කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය.

රූප සටහන 1.10 MSCI කොටස් මිල දර්ශක



අවදානම (rollover) සහ වෙළෙඳපොළ ද්‍රවශීලතා අවදානම් ඉහළ ගියේය. පවත්නා භූදේශපාලනික අවදානම්, අධික ලෙස ඉහළ ගිය වත්කම් වටිනාකම්, ඉහළ ගිය ස්වෛරී ණය සහ උද්ධමනය හා මුදල් ප්‍රතිපත්ති ඉදිරි දැක්ම පිළිබඳව පවතින අවිනිශ්චිතතා හේතුවෙන් අඛණ්ඩ ව ගෝලීය අවදානම් පිළිබඳ ව පවතින අදහස් ක්ෂණිකව වෙනස්වීමේ තත්ත්වයන් නිර්මාණය විය. ගෝලීය අවදානම් පිළිබඳ අදහස් දිගුකාලීනව පිරිහීමට ලක් වුවහොත් එය ස්වෛරී බැදුම්කර වෙළෙඳපොළ, ප්‍රාග්ධන ප්‍රවාහ, විනිමය අනුපාතික සහ අරමුදල් සම්පාදන තත්ත්වයන් හරහා එකිනෙක තීව්‍ර වන පීඩනයන් ඇති කළ හැකි අතර, එමගින් මූල්‍ය ආයතනවල ශේෂ පත්‍ර සහ ගෝලීය මූල්‍ය ස්ථායීතාවට අහිතකර බලපෑම් එල්ල විය හැකිය. එබැවින් එවැනි තත්ත්වයන් විනිමය අනුපාතික සහ ප්‍රාග්ධන ප්‍රවාහවල අස්ථාවරත්වය වැඩි කිරීමටත්, විදේශීය ආයෝජක සහභාගීත්වය කෙරෙහි බලපෑම් කිරීමටත්, විදේශ මූල්‍ය වෙළෙඳපොළවලින් සම්ප්‍රේෂණය වන අහිතකර බලපෑම් හරහා දේශීය මූල්‍ය තත්ත්වයන් දැඩි වීමටත් හේතු විය හැකිය.

දේශීය මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි වන බලපෑම්

ගෝලීය සාර්ව මූල්‍ය වර්ධනයන් හේතුවෙන් දේශීය මූල්‍ය අංශයට එල්ල වන බාහිර අවදානම් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් විශේෂයෙන් වෙළෙඳාම, ප්‍රාග්ධන ප්‍රවාහ, විනිමය අනුපාතිකය සහ වෙළෙඳ භාණ්ඩ මිල ගණන් ආදී සම්ප්‍රේෂණ මාර්ග හරහා ඇති වන අහිතකර බාහිර බලපෑම්වලට ලක්වීමේ අවදානම තවදුරටත් පවතී. ඉහළ බලශක්ති සහ වෙළෙඳ භාණ්ඩ මිල ගණන් මෙන්ම ගෝලීය වෙළෙඳ සහ සැපයුම් දාමයන්ට එල්ල විය හැකි බාධා හේතුවෙන් දේශීය උද්ධමන තත්ත්වයට, විදේශීය අංශයේ ශේෂයන්ට සහ ආර්ථික ක්‍රියාකාරකම්වලට ඉදිරියේ දී අහිතකර බලපෑම් ඇති කළ හැකිය. තවද, එමගින් අපනයනකරුවන්ගේ, සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපාරවල මෙන්ම ආනයනකරුවන්ගේ ලාභදායීත්වය සහ ණය සේවාකරණ හැකියාව දුර්වල කළ හැකිය. මෙම වර්ධන ප්‍රවණතා හේතුවෙන් ඉහළ ගිය ආහාර, ඉන්ධන සහ උපයෝගිතා පිරිවැය හේතුවෙන් කුටුම්බවලට වැය කළ හැකි ආදායම අඩු වුවහොත්, ඔවුන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව අඩු විය හැකිය. ඊට අමතරව, විශේෂයෙන් ගෝලීය අවිනිශ්චිතතා අඛණ්ඩ ව පැවතුණහොත් මූල්‍ය ආයතනවල අක්‍රීය ණය සහ ණය හානිපූරණ වියදම් ඉහළ යෑමට ද මෙය හේතු විය හැකිය. කෙසේ වුවද, 2026 වසරේ මැයි මාසයේ දී මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම සහ වටිනාකම් මත ණය අනුපාතයට[2] (LTV) අදාළ ක්‍රියාමාර්ග හඳුන්වා දීම, ණය ප්‍රසාරණය ක්‍රමයෙන් මන්දගාමී කිරීමට සහ මූල්‍ය අවදානම් ගොඩනැගීම සීමා කිරීමට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ සමඟම ප්‍රධාන දියුණු ආර්ථිකයන් තුළ සාපේක්ෂ වශයෙන් දැඩි මුදල් ප්‍රතිපත්ති තත්ත්වයන් අඛණ්ඩ ව පැවතීම සහ ගෝලීය ආයෝජක ආකල්ප වෙනස්වීම හේතුවෙන් අඛණ්ඩ විනිමය අනුපාතික මත පීඩන, දැඩි විදේශ මූල්‍යකරණ තත්ත්වයන් සහ ප්‍රාග්ධන ප්‍රවාහවල විචලනය ඉහළ යෑම් සිදුවිය හැකි අතර, එමගින් සාර්ව ආර්ථික සහ මූල්‍ය ස්ථායීතාව කෙරෙහි අභියෝග එල්ල විය හැකිය. එහෙයින්, අවදානම් කළමනාකරණ ක්‍රමවේද තවදුරටත් ශක්තිමත් කිරීම, ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වා ගෙන යෑම සහ මතු වෙමින් පවතින අවදානම් අඛණ්ඩ ව නිරීක්ෂණය කිරීම, දේශීය මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහ ඉදිරියේ දී ඇති විය හැකි බාහිර කම්පනවලට මුහුණ දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා වැදගත් වනු ඇත.

1.2 දේශීය සාර්ව මූල්‍ය තත්ත්වයන්

ණය ආශ්‍රිත වර්ධනයන්


සමාලෝචනයට ගැනෙන කාල පරිච්ඡේදයේ දී සමස්ත දේශීය ණය[3] සීඝ්‍ර වේගයකින් වර්ධනය වූ අතර ඒ සඳහා ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩ ප්‍රතිසාධනය සහ එම කාල සීමාවේ වැඩි කාලයක් පුරා සාපේක්ෂ වශයෙන් ලිහිල් මුදල් තත්ත්වයන් පැවතීම හේතු විය. කෙසේ වුවද, මැදපෙරදිග ගැටුම් උත්සන්න වීමත් සමඟ මෙහෙයුම් පරිසරය වඩාත් අභියෝගාත්මක වූ අතර, එය ඉහළ ගිය බලශක්ති සහ වෙළෙඳ භාණ්ඩ මිල ගණන් හරහා ගෝලීය අවිනිශ්චිතතාව ඉහළ යෑමට සහ උද්ධමන පීඩන නැවත මතුවීමට දායක විය. එහි බලපෑම් දේශීය ආර්ථිකය වෙත ද සම්ප්‍රේෂණය විය. ඉන් අනතුරුව, 2026 වසරේ මැයි මාසයේ දී දේශීය මුදල් ප්‍රතිපත්ති තත්ත්වයන් දැඩි කිරීමත්,

2 වටිනාකම් මත ණය අනුපාතය පිළිබඳ වැඩිදුර විස්තර 5 වන පරිච්ඡේදයේ ඇතුළත් වේ.

3 බැංකු සහ මුදල් සමාගම් විසින් පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයටම ලබා දුන් සමස්ත ණය මෙයට ඇතුළත් වේ.

රූප සටහන 1.11

බැංකු සහ මුදල් සමාගම්වල සමස්ත ණය වර්ධනය



මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව


වටිනාකම් මත ණය අනුපාතිකය සම්බන්ධයෙන් ගනු ලැබූ සාර්ව විචක්ෂණ ක්‍රියාමාර්ගත් හේතුවෙන් ඉදිරි කාලයේ දී ණය වර්ධනය යම්තාක් මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බැංකු සහ මූල්‍ය සමාගම්වලින් සමන්විත, නියාමනය වන තැන්පතු භාර ගන්නා මූල්‍ය ආයතන විසින් ප්‍රදානය කරන ලද ණය ශක්තිමත් වර්ධනයක් වාර්තා කළ අතර, සමස්ත ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2025 වසරේ ජූනි මාසයේ දී පැවති 14.0%ක සිට 2026 වසරේ මාර්තු මාසයේ දී 27.9%ක ඉහළම අගයක් දක්වා වේගවත් වූ අතර, දේශීය මුදල් තත්ත්වයන් ක්‍රමයෙන් දැඩි වීම පිළිබිඹු කරමින් 2026 වසරේ ජූනි මාසය වනවිට 26.4%ක් දක්වා සුළු වශයෙන් මන්දගාමී විය. තවද, මෙම ණය ප්‍රසාරණය විශේෂයෙන් රන් ඇපකර මත ණය සහ රථ වාහන මූල්‍යකරණය ආශ්‍රිත ව දක්නට ලැබුණි. ණය ලබා දීමේ විශාලතම දායකත්වය අඛණ්ඩ ව බැංකු අංශය සතු වුව ද මුදල් සමාගම් අංශය සැලකිය යුතු ඉහළ වර්ධන වේගයක් වාර්තා කරමින් සමස්ත මූල්‍ය පද්ධතියේ ණය ප්‍රසාරණය වීමට දායක විය.


වේගවත් ණය ප්‍රසාරණය, මූල්‍ය අතරමැදිකරණය සඳහා සහාය වුව ද, ණය වර්ධන වේගය අඛණ්ඩ ව ඉහළ මට්ටමක පැවතීම සහ ණය සංයුතිය සමීප ව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. ආර්ථිකයේ අඛණ්ඩ ප්‍රකෘතිමත් වීම මධ්‍යයේ ණය වර්ධනයේ ශක්තිමත් ඉහළ යෑම මූල්‍ය අතරමැදිකරණය සඳහා සහාය වුව ද, ණය ප්‍රසාරණ වේගය අඛණ්ඩ ව ඉහළ මට්ටමක පැවතීම මූල්‍ය පද්ධතිය තුළ පද්ධතිමය අවදානම් ගොඩනැගීමට ඇති හැකියාව පෙන්නුම් කරයි. විශේෂයෙන්, ණයගැනුම්කරුවන්ගේ ණයගැතිභාවය ඉහළ යෑම, සාපේක්ෂ වශයෙන් වැඩි අවදානම් සහිත අංශ වෙත ණය සංකේන්ද්‍රණය වීම, ණය අනුමත කිරීමේ දී සලකා බලනු ලබන ප්‍රමිතීන් දුර්වල වීම හෝ මූල්‍ය ආයතන විසින් වැඩි අවදානම් ගැනීම සමඟ වේගවත් ණය වර්ධනයක් දිගුකාලීනව පැවතියහොත්, එය මූල්‍ය පද්ධතිය තුළ අවදානම් සහගත තත්ත්වයන් ඇති කිරීමට හේතු විය හැකිය. ඒ සමඟම, දේශීය උද්ධමනය ඉහළ යෑම හේතුවෙන් මුදල් තත්ත්වයන් දැඩි කිරීමට සිදු වීම කුටුම්බ සහ ව්‍යාපාරවල ණය සේවාකරණ පීඩනය ඉහළ යෑමට හේතු විය හැකිය. ඉදිරි කාලයේ දී, ගෝලීය ආර්ථික ඉදිරි දැක්ම පිළිබඳ ව අවිනිශ්චිතතා අඛණ්ඩ ව පැවතීම, භූදේශපාලනික වර්ධනයන්, වෙළෙඳ භාණ්ඩ මිල ගණන් උච්චාවචනය වීම සහ ගෝලීය මූල්‍ය තත්ත්වයන්හි සිදුවන වෙනස් වීම් මෙන්ම දේශගුණික අවදානම් යථාර්ථයක් බවට පත් වුවහොත්, එය දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සහ ණයගැනුම්කරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය. දේශගුණය ආශ්‍රිත සංසිද්ධි හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම්වලට බාධා ඇතිවීම, නිෂ්පාදන වත්කම්වලට හානි සිදුවීම සහ කුටුම්බ හා සමාගම් ආදායම්වලට අහිතකර ලෙස බලපෑම් ඇති වීම හරහා ණය සේවාකරණ හැකියාව දුර්වල විය හැකි අතර, එමගින් විශේෂයෙන් දේශගුණික විපර්යාසවලට සංවේදී වන අංශවල ණය අවදානම් ඉහළ යා හැකිය. මෙම වර්ධනයන් හේතුවෙන් ණය අවදානම් තීව්‍ර වීම සහ විශේෂයෙන් වේගවත් ණය ප්‍රසාරණයක් වාර්තා කර ඇති අංශවල වත්කම්වල ගුණාත්මකභාවයට ද අහිතකර බලපෑම් එල්ල විය හැකිය. එමගින්, මූල්‍ය පද්ධතිය පුරා ණය වර්ධනයේ වේගය, සංයුතිය සහ ගුණාත්මකභාවය අඛණ්ඩ ව නිරීක්ෂණය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.

සමාලෝචනයට ගැනෙන කාල පරිච්ඡේදය තුළ මූල්‍ය ආයතනවල ණය නිරාවරණයන් තවදුරටත් පෞද්ගලික අංශය වෙත නැඹුරු වූ අතර, එමගින් පෞද්ගලික අංශයේ ශක්තිමත් ණය ඉල්ලුම සහ මූල්‍ය අතරමැදිකරණය ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීම පිළිබිඹු විය. මූල්‍ය සමීක්ෂණ (M4) දත්ත අනුව, මෙම ණය නැවත දිශානතිගත වීම

රූප සටහන 1.12

බැංකු සහ මුදල් සමාගම්වල ණය නිරාවරණය





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව, මූල්‍ය සම්ක්ෂණය (M4)


තවදුරටත් වේගවත් වූ අතර, සමස්ත මූල්‍ය අංශයේ ණය නිරාවරණය තුළ පෞද්ගලික අංශයේ ණය නිරාවරණය 2026 වසරේ ජූනි මස අවසානය වන විට 61.3%ක් දක්වා ඉහළ යමින්, රජය සහ රාජ්‍ය සංස්ථාවල ණය නිරාවරණය 38.7%ක් දක්වා පහත ගියේය. මෙම වෙනස සඳහා, විශේෂයෙන් රන් ඇපකර මත ණය ලබාදීම ඇතුළු පුද්ගලික ණය සහ අත්තිකාරම් කෙරෙහි පෞද්ගලික අංශයේ ණය නිරාවරණය සීඝ්‍ර ලෙස වර්ධනය වීම හේතු වූ අතර, සේවා අංශයට සහ තෝරාගත් කාර්මික අනු අංශවලට ලබා දුන් ණය ඉහළ යෑම ද ඊට දායක විය. ඒ සමඟ, සලකා බලනු ලබන කාල පරිච්ඡේදය තුළ රජය සහ රාජ්‍ය සංස්ථා වෙත පැවති ණය නිරාවරණය ක්‍රමයෙන් පහත වැටුණි. කෙසේ වුවද, රජයේ සුරැකුම්පත්වල ආයෝජනයන් ඇතුළු ව රජය සහ රාජ්‍ය සංස්ථාවල වෙත පවතින සමස්ත ණය නිරාවරණය තවදුරටත් සැලකිය යුතු මට්ටමක පවතින අතර, එමගින් රජය සහ මූල්‍ය අංශය අතර පවතින අඛණ්ඩ අන්තර්සම්බන්ධතාවයේ වැදගත්කම අවධාරණය කරයි. ඉදිරිය දෙස බලන විට තීව්‍ර වී ඇති භූදේශපාලනික අවිනිශ්චිතතා සහ ඒ ආශ්‍රිතව රාජ්‍ය මූල්‍ය ආදායම් සහ වියදම් මත ඇතිවන පීඩන හේතුවෙන්, රජයේ මූල්‍යකරණ අවශ්‍යතා ඉහළ යා හැකි අතර, එමගින්, රාජ්‍ය අංශය කෙරෙහි දේශීය මූල්‍ය අංශය නිරාවරණය වීම පහළ යාමේ ප්‍රවණතාව ආපසු හැරවිය හැකිය. මූල්‍ය ස්ථායීතා දැක්මකින් බැලූ කළ, අඛණ්ඩ ව පෞද්ගලික අංශය කෙරෙහි ණය ප්‍රතිතුලිත වීම, ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය විය හැකි වුව ද, පෞද්ගලික අංශයේ ණය වර්ධනයේ වේගවත් බව සමීප ව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. විශේෂයෙන්, මෙම ක්‍රියාවලිය හේතුවෙන් ණයගැනුම්කරුවන්ගේ ණයගැතිභාවය අධික ලෙස ඉහළ නොයන බව, ණය ලබාදීමේ ප්‍රමිතීන් දුර්වල නොවන බව හෝ ආංශික වශයෙන් ණය සංකේන්ද්‍රණය වීමක් සිදු නොවන බව සහතික කිරීම වැදගත් වේ.

මූල්‍ය අතරමැදිකරණය සහ ණය චක්‍රය

අඛණ්ඩ ණය ප්‍රසාරණයත් සමඟ සලකා බලනු ලබන කාල පරිච්ඡේදය තුළ දී මූල්‍ය අතරමැදිකරණය තවදුරටත් ශක්තිමත් විය. බැංකු අංශයේ ණය-තැන්පතු අනුපාතය, 2025 වසරේ පළමු භාගයේ දී ආරම්භ වූ වර්ධන ප්‍රවණතාව තවදුරටත් පවත්වාගෙන ගියේය. ඒ අනුව, 2026 වසරේ මුල් භාගය වනවිට ණය-තැන්පතු අනුපාතය වසර තුනකින් පසු පළමු වරට 70% ඉක්මවා ගිය අතර 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වනවිට එය දිගු කාලීන සාමාන්‍යය අගය ද ඉක්මවා ගියේය. විශේෂයෙන්ම, මෙම ණය-තැන්පතු අනුපාතය ඉහළ යෑම බෝහෝ දුරට ස්ථාවර දළ දේශීය නිෂ්පාදිතයෙහි (GDP) වර්ධනයත් සමඟ සිදු වූ අතර, එමගින් මූල්‍ය අතරමැදිකරණය සහ ණය ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම, සමස්ත ආර්ථික ක්‍රියාකාරකම්වල සිදු වූ වර්ධනය අභිබවා ගොස් ඇති බව පෙන්නුම් කරයි.


රූප සටහන 1.13

බැංකු අංශයේ ණය-තැන්පතු අනුපාතය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 1.14 **බැංකු අංශයේ ණය-තැන්පතු අනුපාතය සහ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩ ව යථා තත්ත්වයට පත් වීම මෙන්ම සලකා බැලෙන කාල පරිච්ඡේදයේ වැඩි කාලයක් පුරා පැවති ලිහිල් මුදල් තත්ත්වය හේතුවෙන් ණය වර්ධනය සැලකිය යුතු ලෙස වේගවත් වූ අතර, තැන්පතු වර්ධනය සාපේක්ෂ වශයෙන් මධ්‍යස්ථ මට්ටමක පැවතීම නිසා ණය සහ තැන්පතු වර්ධනය අතර පරතරය පුළුල් වීම ණය සහ තැන්පතු අනුපාතයේ ඉහළ යෑම මගින් පිළිබිඹු කරයි. කෙසේ වුවද, ණය-තැන්පතු අනුපාතය තවමත් මෑත කාලීන ආර්ථික අර්බුදයට පෙර කාලයේ දී නිරීක්ෂණය කළ මට්ටම්වලට වඩා අඩු මට්ටමක පැවැති අතර, ඒ අනුව, වර්තමාන ඉහළ යෑම, 2023 සහ 2024 වසරවල වාර්තා වූ අතිශය පහළ මට්ටම්වල සිට මූල්‍ය අතරමැදිකරණය සාමාන්‍යකරණය වීම යම්තාක් දුරට පිළිබිඹු කරයි. තව ද, ණය සැපයුම් සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව, 2026 වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව වඩා මන්දගාමී වේගයකින් වුව ද 2026 වසරේ දෙවන කාර්තුවේ දී ණය ඉල්ලුම අඛණ්ඩ ව ශක්තිමත් වූ අතර සිල්ලර, සංස්ථා, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) සහ රජය සතු ව්‍යවසායන් (SOEs) යන අංශ සියල්ලෙහිම එම වර්ධනය දක්නට ලැබුණි. ණය ඉල්ලුම් ප්‍රසාරණය වීම සඳහා ඉහළ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා, කෙටි කාලීන ණය සඳහා ඉල්ලුම සහ ආයෝජන ක්‍රියාකාරකම් යළි වර්ධනය වීම ප්‍රධාන වශයෙන් සහාය විය. කෙසේ වුව ද, 2026 වසරේ 3 වන කාර්තුවේ දී ණය ලබාදීමේ ක්‍රියාකාරකම් සහ ණය ඉල්ලුම ධනාත්මක ව පවතිනු ඇතැයි බැංකු අපේක්ෂා කළ ද, අපේක්ෂිත උද්ධමන පීඩන, ඉහළ යන මෙහෙයුම් පිරිවැය, විනිමය අනුපාතික උච්චාවචනය සහ භූදේශපාලනික අවිනිශ්චිතතා හමුවේ වඩාත් සුපරීක්ෂාකාරී දැක්මක් පිළිබිඹු කරමින් බැංකුවල ණය ලබාදීමට ඇති කැමැත්ත මන්දගාමී වේගයකින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මූල්‍ය අතරමැදිකරණය යථා තත්ත්වයට පත්වීම ආර්ථිකයේ මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීමට සහායක් වුවද, ණය වර්ධනය, අඛණ්ඩ ව තැන්පතු වර්ධනය සැලකිය යුතු ලෙස අභිබවා යෑම තුළින්, ණය සහ තැන්පතු වර්ධනය අතර පරතරය අඛණ්ඩ ව පුළුල් වීම මගින් මූල්‍යකරණ පීඩන ඉහළ යා හැකි අතර, ද්‍රවශීලතා ස්වාරක්ෂක සංචිත ක්‍රමයෙන් ක්ෂය වීමට ද දායක විය හැකිය.

පෞද්ගලික අංශයේ ණය චක්‍රය එහි ප්‍රසාරණ අවධිය තුළ තවදුරටත් ඉදිරියට ගමන් කළ අතර, ණය පරතරය පුළුල් වීම මගින් පද්ධතිමය අවදානමක් ගොඩ නැගීමට ඇති හැකියාව පෙන්නුම් කෙරිණි. ප්‍රධාන වශයෙන් වාහන මූල්‍යකරණය සහ රන් ඇප මත ලබා දුන් ණය ඇතුළු පෞද්ගලික ලැබිය යුතු ණය මුදල්වල ශක්තිමත් වර්ධනය මෙන්ම සේවා අංශය සහ තෝරාගත් කාර්මික අනු අංශ වෙත ණය ලබා දීම් ඉහළ යාමේ සහාය ඇතිව සමාලෝචන කාල සීමාව පුරා දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශයේ ණය අඛණ්ඩ ව ඉහළ ගියේය. ඒ සමඟම, ණය පරතරය අඛණ්ඩව ධනාත්මක කලාපය තුළ තවදුරටත් පුළුල් වූ අතර, එමගින් පෞද්ගලික අංශයේ ණය


රූප සටහන 1.15 **ණය සැපයුම් සමීක්ෂණ දර්ශකවල වෙනස්වීම්**



* මෙමගින් අදියර 3 යටතේ පවතින ණය පිළිබිඹු කළ හැකිය

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 1.16 **පෞද්ගලික අංශයේ ණය චක්‍රය***



* දත්ත මූල්‍ය සම්මේලනය (M4) මගින් ලබාගත් ණය සම්බන්ධ දත්තවේ.


මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

වර්ධනය අඛණ්ඩ ව එහි දිගු කාලීන ප්‍රවණතාව අභිබවා වර්ධනය වූ බව පෙන්නුම් කළේය. 2022-2024 කාලය තුළ දක්නට ලැබුණු දිගු කාලීන ණය සංකෝචනයෙන් පසුව ණය ප්‍රසාරණය යථා තත්ත්වයට පත්වීමත් සමඟ ධනාත්මක ණය පරතරයක් ඇති වීම අපේක්ෂා කල හැකි වුව ද, විශේෂයෙන් පෞද්ගලික අංශයේ වේගවත් ණය වර්ධනය සමඟ ණය පරතරය අඛණ්ඩව පුළුල් වීම, මූල්‍ය ස්ථායීතා දැක්මකින්, සමීපව නිරීක්ෂණය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි. ණයගැනුම්කරුවන්ගේ ආදායම සහ ණය ආපසු ගෙවීමේ හැකියාව ඊට අනුරූපව වර්ධනය නොවන පසුබිමක, ණය ප්‍රසාරණය එහි දිගු කාලීන ප්‍රවණතාවට වඩා සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක අඛණ්ඩව පැවතීම, ණයගැනුම්කරුවන්ගේ ණයගැතිභාවය ඉහළ යෑමට, අවදානම් භාරගැනීම් ඉහළ යෑමට සහ අංශමය ණය සංකේන්ද්‍රණය වීමට හේතු විය හැකිය. කෙසේ වුවද, 2026 වසරේ මැයි මාසයේ දී මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම සහ වටිනාකම් මත ණය සම්බන්ධ ක්‍රියාමාර්ග හඳුන්වා දීම, ණය ප්‍රසාරණය ක්‍රමයෙන් මන්දගාමී වීමට සහ තවදුරටත් ණය ආශ්‍රිත අවදානම් ගොඩනැගීම පාලනය කිරීමට දායක වනු ඇතැයි අපේක්ෂා කරයි. මෙම ක්‍රියාමාර්ගවල බලපෑම යම් කාල පමාවක් සහිත ව ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, ඒවායෙන් ණය වර්ධනයේ වේගයට සහ ණය සංයුතියට එල්ල වන බලපෑම් අඛණ්ඩ ව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, ණය චක්‍රයේ පවතින ප්‍රසාරණය මගින් මතු වෙමින් පවතින පද්ධතිමය අවදානම් තීව්‍ර කරන්නේ ද යන්න තක්සේරු කිරීම සඳහා ණය හැසිරීම් සමීප ව නිරීක්ෂණය කිරීම තවදුරටත් වැදගත් වේ.

වෙළෙඳපොළ පොලී අනුපාතික සහ ඵලදා අනුපාතික


2025 වසර තුළ නිරීක්ෂණය වූ පුළුල් පරාසයක පොලී අනුපාතික පහළ යාමෙන් අනතුරුව, 2026 වසරේ පළමු භාගයේ තුළ වෙළෙඳපොළ පොලී අනුපාතික සහ රාජ්‍ය

රූප සටහන 1.17 ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සහ තෝරාගත් වෙළෙඳපොළ පොලී අනුපාතික



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය


රූප සටහන 1.18 බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ මූර්ත බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව


සුරැකුම්පත් ඵලදා අනුපාතික ඉහළ ගියේය. භූදේශපාලනික ආතතීන් හේතුවෙන් මතුවූ අවිනිශ්චිතතා, උද්ධමනය සම්බන්ධ වෙළෙඳපොළ අපේක්ෂාවන් සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික දැඩි කිරීම මගින් ප්‍රධාන වශයෙන් බලපෑම් එල්ල වීමත් සමඟ වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ යාමේ පීඩනයකට ලක්ව පැවතුණි. මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම හේතුවෙන් කෙටි කාලීන මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ ගිය අතර, ප්‍රතිපත්ති ස්ථාවරයේ වෙනස මූල්‍ය පද්ධතිය හරහා ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීමත් සමඟ ණය පොලී අනුපාතික ද තවදුරටත් ඉහළ ගියේය. පොලී අනුපාතික මෙලෙස ඉහළ යෑම මධ්‍යයේ වුව ද, වෙළෙඳපොළ පොලී අනුපාතික, ආර්ථික අර්බුදයෙන් පසු කාල සීමාවේ දී නිරීක්ෂණය කළ ඉහළ මට්ටම්වලට වඩා බෙහෙවින් පහළ මට්ටමක පැවති අතර, සමාලෝචනයට ගැනෙන කාල පරිච්ඡේදයේ දී මූල්‍ය තත්ත්වයන් සාපේක්ෂ වශයෙන් මූල්‍ය අතරමැදිකරණයට හිතකර මට්ටමින් පැවති බව එමගින් පෙන්නුම් කරයි. මේ අතර, වෙනස්වන වෙළෙඳපොළ අපේක්ෂාවන්, ආයෝජක ආකල්ප සහ ඉහළ ගිය අවිනිශ්චිතතා මධ්‍යයේ, සියලුම කල්පිරීම් සඳහා වන රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික ඉහළ ගිය අතර, එමගින් ඵලදා වක්‍රය ඉහළට විතැන් වීමට දායක විය. මේ අතර, උද්ධමනය ක්‍රමයෙන් ඉහළ යෑමත් සමඟ අදාළ කාල සීමාවේ දී මූර්ත පොලී අනුපාතික පහළ යන ලදී. මෙම පසුබිම යටතේ, 2025 වසරේ දී සහ 2026 වසරේ පළමු භාගයේ දී කැපී පෙනෙන ලෙස ශක්තිමත් වූ පෞද්ගලික අංශයේ ණය වර්ධනය, මූල්‍යකරණ තත්ත්වයන් දැඩි වීම සහ සාර්ව මූල්‍ය පරිසරය විකාශනය වීම මධ්‍යයේ එම කාල සීමාවේ අවසාන භාගය වනවිට යම් මන්දගාමී වීමක් පෙන්නුම් කළේය. සමස්තයක් වශයෙන්, මූල්‍ය වෙළෙඳපොළ සහ මූල්‍ය ආයතන සැලකිය යුතු පීඩන ලක්ෂණ පෙන්නුම් නොකරමින්, වෙනස්වන පොලී අනුපාතික පරිසරයට අනුගත වීම විධිමත් ලෙස අඛණ්ඩ ව සිදු විය.

රූප සටහන 1.19 රජයේ සුරුකුම්පත්වල ද්විතීයික වෙළෙඳපොල ඵලදා වක්‍රය



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

රූප සටහන 1.20 කාර්තුමය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය





මූලය: ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථික වර්ධනය සහ උද්ධමනය

ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩ ප්‍රසාරණය සාර්ව ආර්ථික ස්ථායීතාවට සහාය වූ අතර කුටුම්බ සහ සමාගම් මත පැවති මූල්‍ය පීඩන ලිහිල් කිරීමට ද දායක විය. ශ්‍රී ලංකා ආර්ථිකය 2026 දෙවන කාර්තුව තුළ යථා තත්ත්වයට පත්වීමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, 2025 වසරේ දෙවන කාර්තුවේදී වාර්තා වූ 5.0%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයට සාපේක්ෂව 4.2%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. කෘෂිකාර්මික අංශයේ සංකෝචනයක් වාර්තා වුවද, කර්මාන්ත සහ සේවා අංශවල ධනාත්මක දායකත්වය මෙම ආර්ථික වර්ධනයට සහාය විය. ආර්ථිකය අඛණ්ඩ ව යථා තත්ත්වයට පත්වීම මගින් ව්‍යාපාරික විශ්වාසය සහ ආදායම් උත්පාදනය ශක්තිමත් වීමට සහාය වී ඇති අතර එමගින් කුටුම්බ සහ සමාගම් අංශයේ ශේෂ පත්‍ර ක්‍රමානුකූලව ශක්තිමත් වීමට දායක විය. එමගින්, මූල්‍ය ආයතන මුහුණ දෙන ණය පැහැර හැරීමේ අවදානම ලිහිල් කිරීමට ද සහාය විය. කෙසේ වුවද, විශේෂයෙන් මැදපෙරදිග කලාපයේ උත්සන්න වන භූදේශපාලනික ආතතීන් හේතුවෙන් වර්ධන ඉදිරි දැක්ම තවදුරටත් පහළ යාමේ අවදානමක පවතින අතර, එය ඉහළ තෙල් මිල හා නැව් ගාස්තු, දුර්වල විදේශ ඉල්ලුම සහ ඉහළ ගිය අවිනිශ්චිතතා හරහා ආර්ථික කටයුතුවලට අහිතකර ලෙස බලපෑම් කළ හැකිය. 2026 වසරේ මුල් කාලයේ දී අත්විඳින ලද දැඩි උෂ්ණත්වය සහ එල් නිනෝ (El Niño) තත්ත්වයන් ඇතුළු අහිතකර කාලගුණ තත්ත්වයන් ඇති වීමේ හැකියාව කෘෂිකාර්මික නිෂ්පාදන, බලශක්ති සැපයුම් සහ සමස්ත ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළ හැකිය. කෙසේ වුවද, පෞද්ගලික අංශයේ ණය අඛණ්ඩ ව ප්‍රසාරණය වීම සහ දේශීය ඉල්ලුමේ ඔරොත්තු දීමේ ස්වභාවය ඉදිරි කාලයේ දී ආර්ථික වර්ධනයට සහාය වනු ඇතැයි අපේක්ෂා කරයි.

රූප සටහන 1.21 මතුපිට උද්ධමනය සහ දේශීය තෙල් මිල ගණන්






මූලයන්: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

මෑත කාලීන ව උද්ධමන පීඩනයන් තීව්‍ර වීම මගින් කුටුම්බ සහ සමාගම් මත වන මූල්‍ය පීඩන ඉහළ යා හැකි අතර, එමගින් මූල්‍ය අංශය කෙරෙහි සෘණාත්මක බලපෑම් ඇති විය හැකිය. අබණ්ඩ මාස එකොළහක් පුරා පැවති අවධමන කාල පරිච්ඡේදයකින් පසු ව, 2025 වසරේ අගෝස්තු මාසයේ දී උද්ධමනය යළි ධන අගයකට පත් වූ අතර, එතැන් පටන් තවදුරටත් වේගවත් වී 2026 වසරේ අප්‍රේල් මාසයේ සිට මහ බැංකුවේ ඉලක්කගත 5% මට්ටම අභිබවා ගියේය. මැදපෙරදිග ගැටුම් මධ්‍යයේ ඉහළ ගිය දේශීය බලශක්ති සහ ඉන්ධන මිල ගණන් මෙන්ම අනෙකුත් මිල ගැලපීම්වල ප්‍රතිඵලයක් ලෙස, 2025 වසර අවසානයේ 2.1%ක් ව පැවති මතුපිට උද්ධමනය 2026 වසරේ ජූලි වනවිට 7.3% දක්වා ඉහළ ගොස් ඉලක්ක පරාසයේ ඉහළ සීමාව ද ඉක්මවා ගියේය. ආර්ථික ක්‍රියාකාරකම් අබණ්ඩ ව යථා තත්ත්වයට පත්වීම ආදායම් උත්පාදනයට සහ ණය ආපසු ගෙවීමේ හැකියාව ශක්තිමත් වීමට සහාය වී ඇතත්, මිල මට්ටම් ඉහළ යෑම හේතුවෙන් මූර්ත ආදායම් ක්ෂය වීමටත්, විශේෂයෙන් වේගවත් ණය වර්ධනයක් පවතින සන්දර්භයක් තුළ කුටුම්බ සහ සමාගම් අංශයේ ශේෂ පත්‍ර මත පීඩනයක් ඇති වීමටත් ඉඩ ඇත. 2025 වසරේ මැද භාගයේ සිට මූර්ත වැටුප් දර්ශක ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වුව ද, 2026 වසරේ දෙවන කාර්තුවේ දී නිරීක්ෂණය වූ සුළු පහත වැටීම මගින් යළි ඇති වූ උද්ධමන පීඩන මධ්‍යයේ, කුටුම්බවල මිල දී ගැනීමේ හැකියාව මත පීඩන මතුවෙමින් පවතින බව පෙන්නුම් කරයි. තවද, උද්ධමනය නුදුරු කාලීනව ඉලක්කගත මට්ටමට වඩා ඉහළින් පවතිනු ඇතැයි පුරෝකථනය කරන අතර, මැදි කාලීනව 5%ක ඉලක්කගත මට්ටම වටා ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම, භූදේශපාලනික අවිනිශ්චිතතා, ඉහළ බලශක්ති සහ නැව් ගාස්තු, ශක්තිමත් දේශීය ඉල්ලුම, විනිමය අනුපාතික පීඩන සහ විශේෂයෙන් එල් නිනෝ (El Niño) තත්ත්වයන්ගේ බලපෑමෙන් ඇතිවන අහිතකර කාලගුණ තත්ත්වයන් හේතුවෙන් උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම තවදුරටත් අවිනිශ්චිත ව පවතී. එහෙයින්, දිගු කාලයක් පුරා උද්ධමනය ඉහළ මට්ටමක පැවතීම කුටුම්බ සහ සමාගම් යන දෙඅංශයේම ණය සේවාකරණ හැකියාව තවදුරටත් දුර්වල කළ හැකි අතර, එමගින් මූල්‍ය අංශය තුළ වත්කම්වල ගුණාත්මකභාවයට අභියෝග මතු කළ හැකිය.

දේපළ වෙළෙඳාම් අංශය


දේපළ වෙළෙඳාම් මිලෙහි අබණ්ඩ ඉහළ යාමේ ප්‍රවණතාව සමඟ දේපළ වෙළෙඳාම් ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා බැංකු අංශය නිරාවරණය වීම ඉහළ යෑම, අබණ්ඩව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම්, නිවාස සහ සහාධිපත්‍ය නිවාස සඳහා වන ඉල්ලුම් මිල දර්ශක එම කාලය තුළ අබණ්ඩ ව ඉහළ ගිය අතර, දර්ශක තුනම 2019 වසරෙන් පසු වාර්තා වූ ඒවායේ ඉහළම මට්ටම් කරා ළඟා විය. මිල ගණන්වල මෙම ඉහළ යෑම, මඟින් දියුණු වන ආර්ථික ක්‍රියාකාරකම්, ඉහළ ගිය ඉදිකිරීම් පිරිවැය සහ සාපේක්ෂව ලිහිල් මුදල් ප්‍රතිපත්ති තත්ත්වයන් යටතේ පහත වැටුණු ණය ගැනීමේ පිරිවැය හේතුවෙන් දේපළ වෙළඳාම් සඳහා පවතින අබණ්ඩ ඉල්ලුම පෙන්නුම් කෙරෙයි. කෙසේ වෙතත්, දේපළ තක්සේරු අගයන් අබණ්ඩ ව ඉහළ යෑම මගින්, ඇති විය හැකි වෙළෙඳපොළ අසමතුලිතතා අවදානම හේතුවෙන් මෙම වර්ධනයන් කෙරෙහි අබණ්ඩ ව අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි. මේ අතර, 2026 වසරේ ජූනි මාසය අවසන් වන විට, එම අංශයට ලබා දී ඇති ණය, මුළු ණය සහ අත්තිකාරම්වලින් 13.7%ක් ලෙස සටහන් වීමත් සමඟ, බැංකු අංශය දේපළ වෙළෙඳාම් සම්බන්ධ කටයුතු සඳහා නිරාවරණය වීම ඉහළ මට්ටමක පැවතුණි. දේපළ වෙළඳාම් අංශයේ ණය ප්‍රසාරණය සඳහා මූලික වශයෙන්ම නේවාසික දේපළ වෙළෙඳාම් ක්‍රියාකාරකම් මගින් මෙහෙයවනු ලැබූ අතර, නේවාසික නොවන දේපළ වෙළෙඳාම් ආශ්‍රිත ක්‍රියාකාරකම්

රූප සටහන 1.22 විරැකියා අනුපාතය සහ වැටුප් අනුපාත දර්ශක




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රූප සටහන 1.23 මූර්ත දේපළ වෙළෙඳාම් මිල ගණන් සහ ණය අනුපාතික



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 1.24 **දේපළ වෙළෙඳාම් අංශය කෙරෙහි බැංකු අංශයේ නිරාවරණය***



* ඉඩම් මිලදී ගැනීම, සියලු වර්ගවල නේවාසික ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධනය කිරීම, හෝ පවතින නේවාසික ව්‍යුහ ප්‍රතිසංස්කරණය හා නවීකරණය කිරීම සඳහා ලබා දෙන ණය; සියලු වර්ගවල නේවාසික නොවන ගොඩනැගිලි ඉදිකිරීම, සංවර්ධනය කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම, හෝ එවැනි ව්‍යුහ නවීකරණය කිරීම සඳහා ලබා දෙන ණය, තමන්ට අයත් හෝ බදු පදනම මත ලබාගත් දේපළ මත සහාධිපත්‍ය ව්‍යාපෘති සංවර්ධනය ඇතුළුව දේපළ වෙළෙඳාම් කටයුතු, සහ අනෙකුත් ඉදිකිරීම් ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 1.25 **රන් මිලෙහි වෙනස්වීම්***



* රන් පවුම් මිල ගණනය කර ඇත්තේ බ්ලූම්බර්ග්හි රන් මිල (එ. ඡ. ඩොලර්./ට්‍රෝයි අවුන්සය) මත පදනම්ව වන අතර, එය ග්‍රෑම්වලට පරිවර්තනය කර රන් පවුමක සම්මත බර වන ග්‍රෑම් 8 සඳහා ගැළපෙන පරිදි සකස් කර ඇත.

මූලය: බ්ලූම්බර්ග් තොරතුරු සේවය

සඳහා ලබා දුන් ණයවල සංකෝචනයක් වාර්තා විය. කෙසේ වෙතත්, ණය ප්‍රසාරණය මධ්‍යයේ වත්කම්වල ගුණාත්මකභාවය වැඩි දියුණු වී ඇති බව පෙන්නුම් කරමින් මෙම අංශයේ අදියර 3 යටතේ පවතින ණය අනුපාතිකය පෙර වසරේ පැවති 14.0% සිට 2026 වසරේ ජූනි මස අවසානය වන විට 10.4% දක්වා පහත වැටුණි. දේපළ වෙළෙඳාම් කටයුතු සහ බැංකු අංශය අතර පවතින සමීප සම්බන්ධතාව සැලකිල්ලට ගත් විට, දේපළ මිල ගණන්වල හදිසි පහත වැටීමක් සිදු වුවහොත් එමගින් ඇපකර වටිනාකම්වලට සහ ණයගැනුම්කරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව කෙරෙහි අහිතකර ලෙස බලපෑම් කළ හැකි අතර, එමගින් මූල්‍ය ස්ථායීතාවය සඳහා අහිතකර සම්ප්‍රේෂිත බලපෑම් එල්ල විය හැකිය.

ඇපකර වත්කම්වල මිල ගණන්

භූදේශපාලනික ආතතීන් සමඟ රන් වෙළෙඳපොළෙහි ඇති වූ විචලනය මූල්‍ය ස්ථායීතාව සඳහා අඛණ්ඩ ව අභියෝග මතු කළේ ය. ඉහළ ගිය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් මධ්‍යයේ 2025 වසරේ දෙවන භාගයේ දී සහ 2026 මුල් කාලයේදී රන් මිල[4] ක්‍රමිකව ඉහළ ගිය අතර, 2026 වසරේ ජනවාරි මාසය අවසන් වන විට රන් පවුමක මිල ආසන්න වශයෙන් එක්සත් ජනපද ඩොලර් 1,393ක උපරිම අගයක් කරා ළඟා විය. පසුව, සැලකිය යුතු උච්චාවචනයන්ගෙන් අනතුරුව, රන් මිල පහළ ගොස් විචලනය වෙමින් පැවතුණු අතර, 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට පවුමක මිල ආසන්න වශයෙන් එක්සත් ජනපද ඩොලර් 1,141 දක්වා පහත වැටුණි. මෙම තත්ත්වය මඟින්, රන් ඇපකර මත ණය සඳහා සැලකිය යුතු නිරාවරණයක් සහිත ආයතනවලට තවදුරටත් සිදුවිය හැකි මිල වෙනස්වීම් හේතුවෙන් මුහුණ දීමට සිදු විය හැකි අවදානම් මනාව පෙන්නුම් කෙරිණි. විශේෂයෙන් රන් ඇපකර මත ලබා දුන් ණයවල ශක්තිමත් වර්ධනය සැලකිල්ලට ගැනීමේදී, රන් මිල ගණන් තවදුරටත් පහළට ගැළපීම ඇපකරවල වටිනාකම් දුර්වල කිරීමට සහ වත්කම්වල ගුණාත්මකභාවය ආශ්‍රිත අවදානම් ඉහළ නැංවීමට හේතු විය හැකිය. මෙයට අමතරව, පවත්නා භූදේශපාලනික ආතතීන් හේතුවෙන් ඉහළ බලශක්ති මිල සහ සැපයුම් දාමවල බාධා ඇති විය හැකි අතර, එමගින් කුටුම්බ සහ ව්‍යාපාරවල ආදායම් මත පීඩන ඇති වී ඔවුන්ගේ ණය සේවාකරණ හැකියාව කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැකිය. මෙම අවදානම් හඳුනා ගනිමින් මහ බැංකුව විසින්, මූල්‍ය ආයතන අධික ලෙස අවදානම් දැරීම පාලනය කිරීම හා වත්කම් මිල අස්ථාවරත්වය හේතුවෙන් ඇතිවන අවදානම් අවම කිරීම ඉලක්ක කර ගනිමින්, රන් ඇපකර ණය සඳහා වන වටිනාකම් මත ණය සීමා පැනවීම ඇතුළු, ඉලක්කගත සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිමය පියවර ක්‍රියාත්මක කර ඇත.


විදේශීය අංශය

ශ්‍රී ලංකාවේ විදේශීය අංශය අහිතකර ගෝලීය තත්ත්වයන් හමුවේ තවදුරටත් අවදානමට ලක්ව පැවති අතර, එමගින් මූල්‍ය අංශයට ද සම්ප්‍රේෂිත බලපෑම් ඇති විය. ශුද්ධ බලශක්ති ආනයන ආර්ථිකයක් වන ශ්‍රී ලංකාව, ගෝලීය තෙල් සහ අනෙකුත් වෙළෙඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යාමේ බලපෑම්වලට විශේෂයෙන් නිරාවරණය වී පැවතුණ අතර, වාහන ආනයන ඉහළ යෑම සමඟ ආනයන වියදම වැඩි වීම හේතුවෙන් වෙළෙඳ භාණ්ඩ වෙළෙඳ හිඟය පුළුල් වීමට ද මෙම තත්ත්වය දායක විය. එසේ වුවද, වාහන ආශ්‍රිත ණය සඳහා හඳුන්වා දී ඇති වටිනාකම් මත ණය සීමා මගින් වාහන ආනයන සඳහා වන ණය ඉල්ලුම මන්දගාමී වී, ඒ ආශ්‍රිත ආනයන වියදම් සහ විදේශ විනිමය ඉල්ලුම මත ඇති වන පීඩන පාලනය වනු ඇතයි අපේක්ෂා

4 රන් පවුමක මිල, බ්ලූම්බර්ග් තොරතුරු සේවයෙහි ප්‍රකාශයට පත් කරන රන් මිල (එ. ඡ. ඩොලර්/ට්‍රෝයි අවුන්සය) ග්‍රෑම්වලට පරිවර්තනය කර, පවුමක සම්මත බර වන ග්‍රෑම් 8 සඳහා ගැලපීම මගින් ගනණය කර ඇත.

රූප සටහන 1.26

විදේශීය ගිණුම් ශේෂයන්



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව


කරන අතර, එය විදේශීය අංශයේ අවදානම් අවම කර ගැනීමට යම් සහායක් ලබා දෙනු ඇත. එමෙන්ම, දුර්වල ගෝලීය ආර්ථික වර්ධනය සහ වෙළෙඳ බණ්ඩනය හේතුවෙන් වෙළෙඳ භාණ්ඩ අපනයන ආදායම් සහ අනෙකුත් විදේශ විනිමය ගලා ඒම් සීමා වූ අතර, ඉහළ ගිය භූදේශපාලනික අවිනිශ්චිතතාව සංචාරක ඉපැයීම් සහ ආයෝජක ලැබීම් වෙත ද බලපෑම් ඇති කළේය. එසේ වුවද, සංචාරක ක්ෂේත්‍රයෙන් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් අඛණ්ඩ ව ලැබුණු විදේශ විනිමය ගලා ඒම්, විදේශීය පීඩනවලට එරෙහිව වැදගත් ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කළ අතර ම, විදේශ විනිමය ද්‍රවශීලතාව පවත්වා ගැනීමට ද උපකාරී විය. මේ අනුව, විදේශීය ජංගම ගිණුමේ තත්ත්වය පිරිහීමත් සමඟ, විදේශ සංචිත ගොඩනැගීමේ වේගය මන්දගාමී වීමක් දක්නට ලැබුණු අතර, දළ නිල සංචිත 2026 ජූලි අවසානය වන විට එක්සත් ජනපද ඩොලර් බිලියන 6.6ක් පමණ මට්ටමේ ස්ථාවර විය. එමෙන්ම, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමෙන් පෙන්නුම් කෙරෙන පරිදි දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ පීඩනයන් ඉහළ ගියේය. ඒ අනුව, ආනයන පිරිවැය ඉහළ යෑම සහ දේශීය මුදල් ඒකකයේ අවප්‍රමාණය වීම මගින් ආනයනික උද්ධමනය සහ විදේශ මුදල් මූල්‍යකරණ පිරිවැය ඉහළ ගිය අතර, එය විදේශ විනිමය අවදානම ආවරණය කර නොගත් විදේශ මුදල් ණයගැනුම්කරුවන්ගේ ණය සේවාකරණ පීඩනය වැඩිවීමට ද හේතු විය.

රාජ්‍ය මූල්‍ය අංශය

රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයේ අඛණ්ඩ වර්ධනය පුළුල් ආර්ථික හා මූල්‍ය ස්ථායීතාවට සහාය විය. මූලිකවම එකතු කළ අගය මත බද්ද (VAT), නිෂ්පාදන/සුරා බදු, ආනයන ආශ්‍රිත බදු සහ ආදායම් බදු මගින් ලද බදු ආදායම් හේතුවෙන් 2026 වසරේ පළමු භාගය තුළ රජයේ ආදායම ශක්තිමත් ව පැවතුණි. මෙම ඉහළ යෑම මගින් බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම්, බදු පරිපාලනයේ වැඩිදියුණුව, ආර්ථික කටයුතු ශක්තිමත් වීම සහ වාහන ආනයනයේ ශක්තිමත් වර්ධනය පිළිබිඹු කළේය. මේ අතර, සහනාධාර, පැවරුම්, වැටුප් සහ වේතන මෙන්ම ප්‍රාග්ධන වියදම් ඉහළ ගියද, රජයේ වියදම්වල වර්ධනය සාපේක්ෂව මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම කාල සීමාව තුළ සැලකිය යුතු ප්‍රාථමික සහ ජංගම ගිණුමේ අතිරික්තයන් වාර්තා කරමින් ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් තවදුරටත් වර්ධනය විය. රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය අඛණ්ඩ ව ශක්තිමත් වීම හේතුවෙන් රජය, දේශීය මූල්‍යකරණය මත යැපීම අඩුවී ඇති අතර, දේශීය මූල්‍ය අංශය මත ඇති විය හැකි පීඩනයන් ද ලිහිල් විය. ඒ අනුව, 2026 වසරේ ජූනි මාසයෙන් අවසන් වූ මාස හයක කාලය තුළ රජය දේශීය මූල්‍යකරණයේ ශුද්ධ ණය ආපසු ගෙවීමක් වාර්තා කළ අතර, එමගින් දේශීය ණය ගැනීමේ අවශ්‍යතාව

රූප සටහන 1.27

රාජ්‍ය මූල්‍යකරණය



මූලයන්: මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

විශේෂ සටහන 1

ඉහළ යන දේශගුණික අවදානම්: මූල්‍ය පද්ධති ස්ථායීතාවය කෙරෙහි වන වර්ධනීය බලපෑම

හැඳින්වීම

වර්තමානයේ දී දිවයිනට බලපා ඇති දේශගුණික සිදුවීම් හමුවේ, අනාගතයේ දී එවැනි සිදුවීම් නැවත නැවත ඇති වීමෙන් විය හැකි ආර්ථික බලපෑම් පිළිබඳ ව මේ වනවිට අවධානය යොමු වී තිබේ. ඕනෑම දේශගුණික ව්‍යසනයක් හේතුවෙන් නිෂ්පාදන කටයුතු අඩාල වී පොදු මිල මට්ටම කෙරෙහි බලපෑම් ඇති වීම මගින් මිල ස්ථායීතාව පිළිබඳ ගැටලු මතුවිය හැකි අතර, එමගින් සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව කෙරෙහි ද බලපෑම් එල්ල විය හැකිය. මෙවැනි සිදුවීම් මගින් ඇතිවිය හැකි කම්පනවල තීව්‍රතාව පිළිබඳව වඩාත් පැහැදිලි නිදර්ශනයක් ශ්‍රී ලංකාවේ මෑතකාලීන අත්දැකීම් මගින් සපයනු ලබයි. ලෝක බැංකුවේ ආපදාවකින් පසු සිදු වූ හානිය පිළිබඳ ගෝලීය කඩිනම් ඇස්තමේන්තුගත (GRADE) තක්සේරුවට[1] අනුව 2025 වසරේ නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවට බලපෑ "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන්, ඇස්තමේන්තුගත භෞතික හානිය එ.ජ. ඩොලර් බිලියන 4.1ක් වූ අතර, ආසන්න වශයෙන් එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 4% ක් පමණ විය. මෙම සංඛ්‍යාලේඛන මගින් නිරූපණය වන්නේ සෘජු භෞතික හානි පමණක් වන අතර, පුළුල් ආදායම්, නිෂ්පාදන සහ ප්‍රතිසාධන වියදම් මෙයට ඇතුළත් නොවේ.

වර්තමාන පසුබිම තුළ, 2026 වසරේ සැප්තැම්බර්-නොවැම්බර් කාලයේ සිට 2026 වසරේ නොවැම්බර්-2027 වසරේ ජනවාරි දක්වා කාලසීමාව[2] තුළ ඉතා ප්‍රබල එල් නිනෝ තත්ත්වයක් හට ගැනීමේ සම්භාවිතාව 90%ක් බවට ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිල පුරෝකථනයක් නිකුත් කර ඇත. සමස්තයක් ලෙස මෙය 2015-16 හෝ 2023-24 කාලසීමාවන් තුළ අත්විඳින ලද එල් නිනෝ තත්ත්වයන්ට වඩා දරුණු ප්‍රතිඵල ඇති කළ හැකි අතර, විශේෂයෙන් වී වගාවට සහ අනෙකුත් කෘෂිකාර්මික සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශවල නිෂ්පාදනයට බලපෑම් එල්ල කරනු ඇත.

මෙවැනි දේශගුණික සිදුවීම් තුළින් විශේෂයෙන්ම, භෞතික අවදානම් සහ ඒ හා සමඟ ඇති විය හැකි පරිවර්තනීය අවදානම් හරහා මූල්‍ය ස්ථායීතාව කෙරෙහි එල්ල කරන අවදානම් වර්ධනය කරනු ලබයි. දේශගුණික විපර්යාස ආශ්‍රිත සිදුවීම් හා ඒ ආශ්‍රිත දිගුකාලීන වෙනස්වීම් හේතුවෙන් ගංවතුර, සුළි කුණාටු, නියඟ, අධික උෂ්ණත්වය සහ සාගර ජල මට්ටම ඉහළ යෑම වැනි භෞතික අවදානම් පැන නගින අතර, දේශගුණික විපර්යාස හමුවේ අඩු කාබන් විමෝචනයක් සහිත ආර්ථිකයක් කරා ගමන් කිරීමේ දී සිදුවන දේශගුණික ප්‍රතිපත්ති, තාක්ෂණය, වෙළෙඳපොළ සහ පාරිභෝගික රුචිකත්වය ආශ්‍රිත වෙනස්කම් හේතුවෙන් පරිවර්තනීය අවදානම් හටගනී. මෙම අවදානම් දෙවර්ගයම ආර්ථික ක්‍රියාකාරකම්, මූල්‍ය ආයතන සහ මූල්‍ය වෙළෙඳපොළ කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය.


එබැවින්, ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම් මෙන්ම රක්ෂණ සහ ස්වෛරී අවදානම් ඇතුළු සාම්ප්‍රදායික මූල්‍ය අවදානම් රැසකට එකවර බලපාන මූලාශ්‍රයක් ලෙස දේශගුණික අවදානම් සැලකිය යුතුය. බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුව (Basel Committee on Banking Supervision – BCBS) ද දේශගුණික අවදානම් සාධක මගින් එක් එක් බැංකුවල සුරක්ෂිතභාවයට සහ සාධනීයත්වයට බලපෑම් කළ හැකි බවත්, මූල්‍ය ස්ථායීතාව කෙරෙහි පුළුල් වශයෙන් බලපෑම් කළ හැකි බවත් හඳුනාගෙන ඇත.[3]

දේශගුණික සිදුවීමක බලපෑම මූල්‍ය ස්ථායීතාවට බලපෑ හැකි ආකාරය

ආර්ථිකයක විවිධ අංශ ආවරණය වන පරිදි එකිනෙකට සම්බන්ධ වූ මාර්ග කිහිපයක් හරහා දේශගුණය ආශ්‍රිත අවදානම් මූල්‍ය පද්ධතියට සම්ප්‍රේෂණය විය හැකිය.

ශ්‍රී ලංකාවේ පසුබිම තුළ, විශේෂයෙන් කෘෂිකාර්මික කුටුම්බ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ ආපදා අවදානම් සහිත ප්‍රදේශවල පිහිටි ව්‍යාපාර ඇතුළු දේශගුණික විපර්යාසවලින් බලපෑමට ලක්වන ණයගැනුම්කරුවන්ගේ ආදායම හා ණය ආපසු ගෙවීමේ හැකියාව, දේශගුණික කම්පන හේතුවෙන් අඩු විය හැකිය. මූල්‍ය ස්වාරක්ෂක සීමිත වීම හේතුවෙන් හිඟ ණය වාරික ඉහළ යෑම, ණය ප්‍රතිව්‍යුහගත කිරීම් සහ ණය පැහැර හැරීම් සිදු විය හැකි අතර, ඇපයට තබා ඇති වත්කම්වලට හානි සිදුවීම මගින් ඇති විය හැකි ණය අලාභ තවදුරටත්

රූප සටහන 1 දේශගුණික අවදානම් මූල්‍ය ස්ථායීතාව වෙත සම්ප්‍රේෂණය වන මාර්ග



මූලයඃ මූල්‍ය පද්ධතිය හරිකරණය සඳහා වූ ජාලය (NGFS)

තීව්‍ර විය හැකිය. නිදසුන් ලෙස, නැවත නැවත ඇතිවන ගංවතුර සහ වෙරළබඩ ආපදා හේතුවෙන් එවැනි ප්‍රදේශවල පිහිටි දේපළවල වෙළෙඳපොළ වටිනාකම සහ එම දේපළ විකිණීමට ඇති හැකියාව අඩු විය හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස, ණයගැනුම්කරුවෙකු ආරම්භයේ දී ණය වාරික නිසි පරිදි ගෙවනු ලැබුව ද, ඇප වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම හේතුවෙන් ණය පැහැර හැරීමක් සිදුවන අවස්ථාවක දී බැංකුවලට සිදුවිය හැකි පාඩුව තවදුරටත් ඉහළ යා හැකිය.

එසේම, ස්වභාවික ව්‍යසන සිදුවන වාර ගණන සහ ඒවායේ තීව්‍රතාව ඉහළ යෑම හේතුවෙන් රක්ෂණ හිමිකම් ඉල්ලීම් ඉහළ යෑම, රක්ෂණ වාරික වැඩි වීම සහ රක්ෂණ ආවරණය සීමා වීම ද සිදු විය හැකිය. මේ හේතුවෙන් රක්ෂණ ආරක්ෂණ පරතරය පුළුල් වන අතර, අවසානයේ දී කුටුම්බ, ආයතන, රජය සහ මූල්‍ය ආයතන විසින් දරනු ලබන අලාභයන් ද ඉහළ යා හැකිය. නැගී එන ආර්ථිකයන්හි දේශගුණික ව්‍යසන ආශ්‍රිත අලාභයන්ගෙන් සාමාන්‍යයෙන් 80%-90% ත් අතර ප්‍රමාණයක් රක්ෂණයක් මගින් ආවරණය කර නොමැති බව ස්විස් රී (Swiss Re) ආයතනය ඇස්තමේන්තු කරන අතර එමඟින්, සාපේක්ෂව අඩු රක්ෂණ ව්‍යාප්තියක් සහිත රටවල් සඳහා, දේශගුණය ආශ්‍රිත අලාභ රක්ෂණයෙහි වැදගත්කම අවධාරණය කරයි.[4]

දේශගුණික කම්පන හේතුවෙන් ආපදා ආශ්‍රිත වියදම් ඉහළ යෑම, රජයේ ආදායම් දුර්වල වීම සහ ස්වභාවික ව්‍යසනයකින් පසුව යථා තත්ත්වයට පත් වීමේ ක්‍රියාවලියේ දී ආනයන ඉහළ යෑම හරහා රාජ්‍ය මූල්‍ය සහ විදේශීය අංශයේ පීඩන ඉහළ යා හැකිය. එමෙන්ම, කෘෂිකර්මාන්තය, බලශක්තිය, ප්‍රවාහනය සහ ආහාර සැපයුම වෙත බාධා එල්ල කිරීම හරහා උද්ධමනකාරී පීඩන ඇති කළ හැකි අතර, එමගින් කුටුම්බවල මිලදී ගැනීමේ ශක්තිය අඩු වීම මෙන්ම සමාගම් ලාභදායීත්වය සීමා වීම සහ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සංකීර්ණ වීම තුළින් ණය ගැනීමේ පිරිවැය ද ඉහළ යා හැකිය.

මූල්‍ය ස්ථායීතාව කෙරෙහි ඇති විය හැකි බලපෑම් කල්තියා හඳුනාගැනීම

දේශගුණික කම්පනවල බලපෑම පළමු ව නිරීක්ෂණය විය හැකි වන්නේ බැංකු සහ මුදල් සමාගම්වල හිඟ වාරික අදියර 1 සිට අදියර 2 යටතේ පවතින නිරාවරණ වෙත සංක්‍රමණය වීම හරහායි. ණයගැනුම්කරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව පිරිහීම හේතුවෙන් අපේක්ෂිත ණය අලාභ සඳහා අදාළ ප්‍රතිපාදන ඉහළ යා හැකිය. මෙම තත්ත්වය අබණ්ඩව පැවතුණහොත්, එම ණය නිරාවරණයන්ගෙන් කොටසක් අදියර 3 යටතේ පවතින නිරාවරණ බවට පත්විය හැකිය. කෘෂිකර්මාන්තය, ග්‍රාමීය ණය ලබාදීම්, කල්බදු සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ තුළ කේන්ද්‍ර ගත වී ඇති මූල්‍ය ආයතනවලට මෙහිදී වැඩි බලපෑමකට මුහුණ දීමට සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බැංකු අංශයේ සමස්ත ණය කළඹෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ණය ප්‍රතිශතය 11%ක් පමණ වේ. එබැවින්, එක් එක් ආයතන ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළ ද, දේශගුණික කම්පන හේතුවෙන් සමස්ත මූල්‍ය පද්ධතියටම බලපෑම් ඇති විය හැකිය.

2026 වසරේ පළමු භාගය අවසන් වනවිට, බැංකු අංශය විසින් කෘෂිකාර්මික අංශය වෙත ලබා දී ඇති ණය ප්‍රමාණය සමස්ත ණය කළඹෙන් 8.7%ක් වූ අතර, එහි දළ අදියර 3 යටතේ පවතින ණය අනුපාතය 9.2%ක් විය. ඒ හා සමානව, බැංකු අංශයේ සමස්ත ණය ලබාදීම්වලින් පරිභෝජන ණය 19.5%ක් වූ අතර, එහි අදියර 3 යටතේ පවතින ණය අනුපාතය 3.3%ක් විය. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පුරෝකථනය කර ඇති පරිදි, එල් නිනෝ සංසිද්ධියක් ඇති වීමේ සම්භාවිතාව 90%ක් පමණ වන අතර, එවැනි අවස්ථාවක ඉහත සඳහන් කළ සම්ප්‍රේෂණ මාර්ග හරහා විවිධ අංශ අතර, කෘෂිකාර්මික හා පාරිභෝජන අංශ වෙත එහි බලපෑම වැඩි වශයෙන් එල්ල විය හැකිය.

එබැවින්, දේශගුණය ආශ්‍රිත අවදානම්වල බලපෑම ඉහළ යෑම සහ ආර්ථිකයට බලපාන අයුරු සැලකිල්ලට ගනිමින්, සාර්ව විචක්ෂණ අධීක්ෂණ රාමුව තුළ දේශගුණික අවදානම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් පහත සඳහන් පියවර අනුගමනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කළ හැකිය.

- **දේශගුණික අවදානම් අධීක්ෂණය ශක්තිමත් කිරීම තුළින්** දේශගුණික අවදානම්වලට සංවේදී ආපදා සම්බන්ධයෙන් ආංශික සහ භූගෝලීය වශයෙන් පවතින නිරාවරණයන් අධීක්ෂණය කිරීම සහ අවදානමට ලක්විය හැකි අංශ සහ ප්‍රදේශවල නිරාවරණයන් කේන්ද්‍රගත වී ඇති අයුරු හඳුනාගැනීම.

- **දේශගුණික අවදානම් දත්ත නිර්මිතයක් ගොඩනැගීම** - ජාත්‍යන්තර වශයෙන් පවතින ප්‍රධාන බාධාවක් වන්නේ ප්‍රමාණවත් තරම් සවිස්තරාත්මක, පුරෝකථන සහිත දත්ත ලබා ගත නොහැකි වීමයි. දේශගුණික අවදානම් මැනීම සඳහා සවිස්තරාත්මක දත්ත සහ පුරෝකථන සහිත ක්‍රමවේදයන් අවශ්‍ය බව බාසල් කමිටුව (BCBS) පෙන්වා දෙන අතර, ඉන්දියානු මහ බැංකුව (Reserve Bank of India – RBI) ද ණයගැනුම්කරුවන් සහ ඇපකර පිළිබඳ භූගෝලීය වශයෙන් තොරතුරු ලබා ගැනීම ප්‍රධාන අභියෝගයක් ලෙස හඳුනාගෙන ඇත.[5]

- මෙහිදී පළමු ව ශ්‍රී ලංකාවේ ප්‍රධාන භෞතික ආපදා කෙරෙහි අවධානය යොමු කර පසුව පරිවර්තනීය අවදානම් ද සලකා බැලිය හැකි වන පරිදි දැනට පවතින මූල්‍ය ස්ථායීතා රාමුව තුළ **දේශගුණික තත්ත්ව විශ්ලේෂණය කිරීම සහ ආතති පරීක්ෂණ සංවර්ධනය කිරීම.**

- **ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට දේශගුණික අවදානම් ඒකාබද්ධ කිරීම තුළින්** විශේෂයෙන් දේශගුණික විපර්යාසවලට සංවේදී වන අංශ සහ ආපදා අවදානම් සහිත ප්‍රදේශ සඳහා වන ණයගැනුම්කරු ඇගයීම්, ඇපකර තක්සේරුව, ණය කළඹ අධීක්ෂණය සහ ප්‍රතිපාදන වෙන් කිරීම ආදිය ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට ඒකාබද්ධ කල හැකිය.

- **ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා සැලසුම්කරණයට දේශගුණික කරුණු ඒකාබද්ධ කිරීම** - දේශගුණික අවදානම් තක්සේරු කිරීම වර්ධනය වීමත් සමඟ, සැලකිය යුතු දේශගුණික අවදානම් සහ බලපෑම් බැංකුවල අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලීන් (Internal Capital Adequacy Assessment Processes – ICAAPs),

ප්‍රතිස්ථාපන සැලසුම්කරණය සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ සඳහා වැඩි වශයෙන් සැලකිල්ලට ගත යුතුය. ජාත්‍යන්තර අත්දැකීම් මගින් සාම්ප්‍රදායික ආතති පරීක්ෂණ හරහා හඳුනාගත නොහැකි අවදානම් දේශගුණික ආතති පරීක්ෂණ මගින් හඳුනාගත හැකි බව පෙන්වා දෙනු ලබයි.[6]

- **ජාත්‍යන්තර සහයෝගීතාව සහ තාක්ෂණික ධාරිතාව ශක්තිමත් කිරීම** - ජාත්‍යන්තර මුලපිරීම් සමඟ අඛණ්ඩ ව සම්බන්ධවීමෙන් සහ ජාත්‍යන්තර ව පිළිගත් දේශගුණික තත්ත්වයන් සහ ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ ලබාගත හැකි නමුත් ඒවා මෙරටට ආවේණික භෞතික ආපදා, ආර්ථික ව්‍යුහය සහ මූල්‍ය අංශයේ නිරාවරණයන්ට අනුකූල වන පරිදි සකස් කර ගත යුතුය.

ඉදිරි ගමන්මග

මූල්‍ය පද්ධතියේ පාර්ශ්වකරුවන් විසින් තනි තනිව මෙන්ම සාමූහිකවද වැඩිදියුණු කළ අවදානම් අධීක්ෂණ, දේශගුණික සංසිද්ධි විශ්ලේෂණ, ආතති පරීක්ෂණ, සවිස්තරාත්මක දත්ත, රක්ෂණ සහ අවදානම් හුවමාරු යාන්ත්‍රණයන් හරහා දේශගුණික අවදානම් දැනට පවතින අවදානම් කළමනාකරණ රාමුව ඒකාබද්ධ කිරීමටත් වඩාත් තිරසර මූල්‍ය පහසුකම් සැලසීමටත් උත්සාහ කළ යුතුය. දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන යටිතල පහසුකම්, දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වූ කෘෂිකර්මාන්තය, පුනර්ජනනීය බලශක්ති සහ අනෙකුත් තිරසර ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම මගින් දිගුකාලීන ආර්ථික සංවර්ධනයට සහාය විය හැකි අතර ම මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ද ශක්තිමත් කළ හැකිය.

1 ලෝක බැංකු සමූහය - මාධ්‍ය නිවේදනය - https://www.worldbank.org/en/news/press-release/2025/12/22/damage-from-cyclone-ditwah-in-sri-lanka-estimated-at-4-1-billion
2 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව 2026 වසරේ සැප්තැම්බර් සිට නොවැම්බර් කාලසීමාව සඳහා ENSO සහ IOD හි වත්මන් තත්ත්වය සහ පුරෝකථන
3 BCBS – කාලගුණය ආශ්‍රිත මූල්‍ය අවදානම්
4 Swiss Re ආයතනය - https://www.swissre.com/press-release/Wildfires-storms-floods-contribute-to-record-92-of-global-insured-losses-in-2025-says-Swiss-Re-Institute/7b39b1a5-b878-4a55-a5ff-bf5aa561a675
https://www.swissre.com/institute/research/sigma-research/sigma-2026-01-natcat-2025-wildfire-storm-risk/global-natcat-losses-2025.html
5 දේශගුණය ආශ්‍රිත මූල්‍ය අවදානම් - මිතුම් ක්‍රමවේද - https://www.bis.org/bcbs/publ/d518.htm
6 දේශගුණික සහ ස්වභාවික අවදානම් කළමනාකරණය කිරීමේ දී බැංකු සාර්ථක ප්‍රගතියක් ලබා ඇති අතර එය අඛණ්ඩ ව පවත්වාගෙන යා යුතුය. https://www.ecb.europa.eu/press/blog/date/2025/html/ecb.blog20250711~f5c6a0259f.en.html

පහළ ගොස් ඇති බව පෙන්නුම් කෙරිණි. මෙම තත්ත්වය පෞද්ගලික අංශයේ ණය සඳහා මූල්‍ය සම්පත් ලබා ගැනීමට පහසුකම් සලසා ඇති අතර, එමගින් පෞද්ගලික අංශය තුළ මූල්‍ය අතරමැදිකරණය වැඩිදියුණු වීමට සහාය විය. එසේ වුවද, වෙනස් වෙමින් පවතින විදේශීය අවිනිශ්චිතතා සහ අහිතකර කාලගුණික තත්ත්ව මෙන්ම භූදේශපාලනික වර්ධනයන් හේතුවෙන් ඇතිවිය හැකි වියදම් පීඩන මධ්‍යයේ වුවද, රාජ්‍ය මූල්‍ය විනය අඛණ්ඩ ව පවත්වා ගැනීම තවදුරටත් වැදගත් වේ.

මූල්‍ය ස්ථායීතාවට බලපාන දේශගුණික විපර්යාස අවදානම්


දේශගුණික විපර්යාස ආශ්‍රිත සිදුවීම් නිරන්තරයෙන් ඇති වීම සහ ඒවායේ තීව්‍රතාව ඉහළ යෑම හේතුවෙන් වත්කම්වල වටිනාකම්, ණයගැනුම්කරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව, ණයවල ගුණාත්මකභාවය, රක්ෂණ අලාභ සහ පුළුල් සාර්ව ආර්ථික තත්ත්වයන් කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම් හරහා මූල්‍ය ස්ථායීතාවය වෙත අවදානම් ඇති කළ හැකිය. දිස්ත්‍රික්ක 25ට ම බලපෑ 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් භෞතික යටිතල පහසුකම්වලට සැලකිය යුතු හානියක් සිදු වූ අතර, එය වත්කම්වල වටිනාකම් පහළ යෑමට හේතු වෙමින් මූල්‍ය ආයතනවල ඇපකර කෙරෙහි ද බලපෑම් ඇති කළේය. මේ අතර, ආර්ථික ක්‍රියාකාරකම්වලට ඇති වූ බාධා හේතුවෙන් ණයගැනුම්කරුවන්ගේ ණය ගෙවීමේ හැකියාව අඩාල වූ අතර, එමගින් බලපෑමට ලක් වූ ණයගැනුම්කරුවන් සඳහා ණය වාරික ගෙවීම් තාවකාලිකව අත්හිටුවීමට සහ සහනදායී ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට සිදු විය. එය අක්‍රීය ණය හරහා මූල්‍ය අංශයට ඇති වන බලපෑම යටපත් කිරීමට සහාය වනු ඇත. තවද, වත්මන් එල් නිනෝ (El Niño) ආශ්‍රිත කාලගුණික තත්ත්වයන් හේතුවෙන්, දේශගුණයට සංවේදී වන අංශවල ක්‍රියාත්මක වන, බලපෑමට ලක් වූ, කුටුම්බ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ ව්‍යාපාරවල ණය ගෙවීමේ හැකියාව අඩාල වීම නිසා, 2 සහ 3 වන අදියර යටතේ පවතින ණය ප්‍රමාණය වැඩි වීමේ හැකියාවක් පවතින අතර, එමගින් ණය ගුණාත්මකභාවය පිරිහීම හරහා එය මූල්‍ය ආයතන වෙත පීඩනයක් එල්ල කරනු ඇත. නිරන්තරයෙන් සිදුවන දේශගුණය ආශ්‍රිත සිදුවීම්වල වාර ගණන හෝ ඒවායෙහි තීව්‍රතාව ඉහළ යෑම හේතුවෙන් රක්ෂණ අංශයට ද ඉහළ හිමිකම් ඉල්ලීම්වලට සහ රක්ෂණාවරණ අලාභ සඳහා මුහුණ දීමට සිදු විය හැකිය. මේ අතර, කෘෂිකාර්මික නිෂ්පාදනයට සිදුවන හානි සහ ප්‍රවාහන, යටිතල පහසුකම් සහ සැපයුම් දාමයන් සඳහා ඇති වන බාධා හේතුවෙන් දේශීය නිෂ්පාදන සහ අපනයන සීමාවීම, ආහාර සහ අනෙකුත් භාණ්ඩවල මිල ඉහළ යෑම, සහන ක්‍රියාමාර්ග සඳහා රාජ්‍ය අංශයේ වියදම් වැඩි වීම සිදු විය හැකි අතර, එමගින් සමස්ත සාර්ව ආර්ථික තත්ත්වයන් කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැකිය. මීට අමතරව, රජයේ ප්‍රතිපත්තිවල සිදුවන වෙනස්වීම්, තාක්ෂණික දියුණුව සහ ආයෝජකයන්ගේ හා වෙළෙඳපොළ අපේක්ෂාවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය අංශයට මෙන්ම දේශගුණික විපර්යාසවලට අනුගතවීම සඳහා ප්‍රමාණවත් සූදානමක් නොමැති ණයගැනුම්කරුවන්ට අහිතකර බලපෑම් ඇති විය හැකිය. මේ අනුව, අඛණ්ඩ ව සිදුවන දේශගුණික සිදුවීම් හමුවේ, ඉදිරියේදී මූල්‍ය ආයතනවල ලාභදායීත්වය, ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධන ස්වාරක්ෂක මත අමතර පීඩනයක් ඇති වීමට මෙම තත්ත්වයන් හේතු විය හැකිය. මේ අතර, තිරසර ණයදීම සාපේක්ෂව සීමිත මට්ටමක පවතින අතර, එය බැංකු අංශයේ ණය කළඹෙන් 2%ක් පමණ ද, මුදල් සමාගම් අංශයේ සමස්ත ණය කළඹෙන් 1%ක් පමණ ද නියෝජනය කරයි. එමගින් දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහ ඉහළ නංවන

සහ අනුගත වීමේ ක්‍රියාවලිය සඳහා සහය දක්වන ක්‍රියාකාරකම් වෙනුවෙන් තවදුරටත් මූල්‍යකරණයේ පුළුල් කිරීමට අවකාශ පවතින බව පෙන්නුම් කරයි.

සමස්තයක් ලෙස, මතුවෙමින් පවතින අවදානම් සහ බාහිර අවිනිශ්චිතතා මධ්‍යයේ වුවද, දේශීය සාර්ව මූල්‍ය තත්ත්වයන්, මූල්‍ය අංශයේ ස්ථායීතාවයට වඩාත් පුළුල් වශයෙන් සහාය වෙමින් පැවතුණි. අබණ්ඩ ආර්ථික වර්ධනය, වැඩිදියුණු වන මූල්‍ය අතරමැදිකරණය, ශක්තිමත් රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සහ ණය ගුණාත්මක දර්ශකවල ඔරොත්තු දීමේ ස්වභාවය මෙම හිතකර පසුබිමට පදනම විය. ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සහ ලිහිල් මූල්‍ය තත්ත්වයන්, පෞද්ගලික අංශයේ ණය ශක්තිමත් ලෙස වර්ධනය වීමට සහාය වූ අතර, වැඩිදියුණු වූ ආදායම් උත්පාදනය සහ ලිහිල් වන මූල්‍ය පීඩනය, කුටුම්බ සහ සමාගම් අංශවල ශේෂ පත්‍ර ශක්තිමත් කළේය. අබණ්ඩ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග හේතුවෙන් රාජ්‍ය අංශයේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් වූ අතර, දේශීය මූල්‍යකරණය මත යැපීම අඩු වීම හේතුවෙන් මූල්‍ය සම්පත් ඵලදායී පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් වෙත යොමු කිරීමට පහසුකම් සැලසිණි. කෙසේ වෙතත්, ණය වර්ධනය කැපී පෙනෙන ලෙස වේගවත් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් අංශවල ණය ප්‍රසාරණය සහ ඒ ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් අතර පරතරය පුළුල් වීම සිදු විය. ඒ සමඟම, උද්ධමන පීඩන යළි මතු වූ අතර වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ ගියේය. වත්කම් ගුණාත්මකභාවය පිළිබඳ දර්ශක තවදුරටත් දියුණු වුවද, ගෝලීය ණය වර්ධනයේ සීඝ්‍ර වේගය, ඉහළ යන පෞද්ගලික අංශයේ ණය බර, ඉහළ ගිය දේපළ වටිනාකම් තක්සේරු කිරීම් සහ ඉහළ ගිය ගෝලීය ආර්ථික හා මූල්‍ය දැක්ම පිළිබඳ අවිනිශ්චිතතාව, මෙන්ම දේශගුණික අවදානම්වලට නිරාවරණය වීම ඉහළ යෑම, දේශීය මූල්‍ය පද්ධතියට එල්ල විය හැකි අවදානම් තත්ත්ව ලෙස තවදුරටත් පවතී. ඒ අතරම, බැංකු සහ මුදල් සමාගම් අතර වර්ධනය වන අන්තර්සම්බන්ධතාවය, මූල්‍ය සේවා ඩිජිටල්කරණය ඉහළ යෑම, ඉහළ යන සයිබර් ආරක්ෂණ තර්ජන, වැඩිදියුණු වන ගෙවීම් තාක්ෂණයන්, කෘත්‍රිම බුද්ධිය මත පදනම් වූ මූල්‍ය සේවාවල වර්ධනයන් සහ ඩිජිටල් මුදල් ඒකක බිහිවීම ආදිය මූල්‍ය අංශයේ ඔරොත්තුදීමේ හැකියාව සඳහා වන වැදගත් කරුණු බවට පත්වී ඇත. ඉදිරි කාලයේ දී සාර්ව මූල්‍ය ස්ථායීතාව ආරක්ෂා කර ගැනීමට සහ මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා විචක්ෂණශීලී ණය ප්‍රමිතීන් අබණ්ඩ ව පවත්වා ගැනීම, ප්‍රමාණවත් ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන ස්වාරක්ෂක පවත්වා ගැනීම සහ ණය වර්ධනය ඵලදායී ආර්ථික ක්‍රියාකාරකම් හා සමගාමීව පවතින බව සහතික කිරීම ඉතා වැදගත් වනු ඇත. ණය ප්‍රසාරණය වේගවත්වීම හේතුවෙන් ඇතිවිය හැකි අවදානම් ඉහළ යෑම මෙන්ම විදේශීය, උද්ධමනකාරී සහ දේශගුණික අවදානම් හමුවේ අබණ්ඩ ව සුපරීක්ෂාකාරී වීම අවශ්‍ය වේ. ඒ අනුව, මතුවන අවදානම් සමීපව නිරීක්ෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී කාලෝචිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ආරක්ෂා කර ගැනීම සඳහා වැදගත් වනු ඇත.

2 පරිච්ඡේදය

මූල්‍ය වෙළෙඳපොළ සහ ගෙවීම් පද්ධති යටිතල පහසුකම්



මූල්‍ය ආතති දර්ශකය (Financial Stress Index)[1], මගින් මනිනු ලබන දේශීය මූල්‍ය වෙළෙඳපොළවල ආතති තත්ත්වය, භූදේශපාලනික අවිනිශ්චිතතා හමුවේ 2026 වසරේ මාර්තු මාසයේ දී තාවකාලික වශයෙන් ඉහළ ගිය ද, 2026 වසරේ මුල් මාස අට තුළ සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවතුණි. රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ සහ මුදල් වෙළෙඳපොළ තත්ත්වයන් සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවතීම හේතුවෙන්, කොටස් වෙළෙඳපොළ සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ආතතීන්හි වරින් වර ඇති වූ ඉහළ යාම්වල බලපෑම සමනය වූ අතර, සමස්ත මූල්‍ය ආතති දර්ශකය පහළ අගයක පැවතුණි.

තීව්‍ර වූ භූදේශපාලනික ආතතීන්, ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ අවිනිශ්චිතතා, ඉහළ ගිය බලශක්ති මිල ගණන්, දේශීය උද්ධමන ඉදිරි දැක්ම සහ දැඩි මුදල් ප්‍රතිපත්ති තත්ත්වයන් මධ්‍යයේ 2026 වසරේ පළමු මාස අට තුළ කොටස් වෙළෙඳපොළ කාර්යසාධනය සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි. කොටස් මිල දර්ශක අවම මට්ටමක පැවතුණු අතර වෙළෙඳපොළ ද්‍රවශීලතාව මන්දගාමී වීම සහ දර්ශක විචලනය ඉහළ යාම ද නිරීක්ෂණය විය. වෙළෙඳපොළ අගය තක්සේරු කිරීමේ දර්ශක සුළු වශයෙන් ඉහළ ගිය ද ඒවා බොහෝ දුරට එම දර්ශකවල දිගු කාලීන සාමාන්‍යය අගයන්ට අනුකූලව පැවති අතර, කලාපයේ අනෙකුත් සමාන වෙළෙඳපොළ අගයන්ට වඩා පහළ මට්ටමක පැවතුණි. ශුද්ධ විදේශ ආයෝජන අඛණ්ඩව පිටතට ගලායාම මගින් අවධාරණය කරනු ලබන්නේ කොටස් වෙළෙඳපොළ ද්‍රවශීලතාව සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ස්ථාවර, දිගුකාලීන ප්‍රාග්ධන ලැබීම් ආකර්ෂණය කර ගැනීමේ වැදගත්කමයි.

සියලුම කල්පිරීම් කාලසීමාවන්හි ඵලදා අනුපාතික ඉහළ යාමත් සමඟ රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ තත්ත්වයන් දැඩි විය. වෙනස් වෙමින් පවතින වෙළෙඳපොළ අපේක්ෂාවන්, භූදේශපාලනික අවිනිශ්චිතතාව සහ දැඩි මුදල් ප්‍රතිපත්තිමය තත්ත්වයන් ඵලදා අනුපාතිකවල ඉහළ යාම තුළින් පිළිබිඹු විය. ශක්තිමත් රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයක් සහ රජයේ සුරැකුම්පත් සඳහා ඉහළ ඉල්ලුමක් පැවතිය ද, ද්විතීයික වෙළෙඳපොළ ද්‍රවශීලතාව සීමාසහිත මට්ටමක පැවති අතර, එම ගනුදෙනු සීමිත කල්පිරීම් පරාසයක් තුළ සංකේන්ද්‍රණය වී පැවතුණි. සමස්ත විදේශීය සහභාගීත්වය අඩු මට්ටමක පැවතිය ද, ඵලදා අනුපාතික ඉහළට ගැළපීම සහ පසු කාලීනව විනිමය අනුපාතිකය වැඩිදියුණු වීම හේතුවෙන් සමාලෝචිත කාල පරිච්ඡේදයේ අවසාන භාගය වනවිට විදේශීය ආයෝජන මධ්‍යස්ථ වශයෙන් යථා තත්ත්වයට පත්විය.

දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ යම් පීඩනයකට ලක් වූ අතර, සමාලෝචිත කාල සීමාවේ අවසාන භාගයේ දී එම තත්ත්වය තරමක් යහපත් විය. තීව්‍ර වූ භූදේශපාලනික ආතතීන්, ඉහළ යන බලශක්ති මිල ගණන්, ඉහළ ගිය ආනයන ඉල්ලුම සහ වෙනස්වන ආයෝජක අපේක්ෂා හේතු කරගෙන එක්සත් ජනපද ඩොලරයට සහ අනෙකුත් ප්‍රධාන විදේශ මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය. කෙසේ වුවද, පසුව එම තත්ත්වය, ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, විදෙස්ගත ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණ ලැබීම්, සංචාරක ඉපැයීම් සහ අපනයන ආදායම් හරහා අඛණ්ඩව විදේශ විනිමය ගලාඒම්වල සහාය ඇතිව වැඩිදියුණු වූ අතර, විනිමය අනුපාතිකයේ උච්චාවචනය වීම් පහළ ගොස් අන්තර් බැංකු ගනුදෙනු පරිමාවන් ද ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළේය.

ප්‍රතිමිලදී ගැනුම් සහ ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ ගනුදෙනු ඉහළ යාමත් සමඟ දේශීය මුදල් වෙළෙඳපොළ ආශ්‍රිත ක්‍රියාකාරකම් තවදුරටත් ශක්තිමත් විය. රජයේ බැංකු, ප්‍රධාන ශුද්ධ ණය සපයන්නන් ලෙසත් දේශීය පෞද්ගලික බැංකු ශුද්ධ ණයගැනුම්කරුවන් ලෙසත් අඛණ්ඩ ව කටයුතු කළ අතර, ද්‍රවශීලතාවේ අසමමිතික බෙදී යාම එමගින් පිළිබිඹු කෙරිණි. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය වරින් වර ඉහළ යාමේ පීඩනයක් පෙන්නුම් කළ ද, පසුව බොහෝ දුරට එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට අනුකූල මට්ටමකට නැවත පැමිණි අතර සමස්ත මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව අතිරික්තයක් වාර්තා කළේය.


සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී ගෙවීම් සහ පියවීම් යටිතල පහසුකම් මෙහෙයුම්මය වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කළ අතර, ඩිජිටල් ගෙවීම්වල අඛණ්ඩ වර්ධනය, පියවීම් අවදානම් කළමනාකරණය, අන්තර් ක්‍රියාකාරීත්වය සහ ගෙවීම් පහසුකම් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ගනු ලැබූ පියවර තුළින් ගෙවීම් පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් වර්ධනය විය. කෙසේ වුවද, ඩිජිටල් මාධ්‍යයන් මත වැඩිවන රඳා පැවැත්ම හේතුවෙන් සයිබර්, මෙහෙයුම් සහ තෙවන පාර්ශ්වීය අවදානම් සමීප ව නිරීක්ෂණ කිරීමේ අවශ්‍යතාව අඛණ්ඩව පැන නැඟුණි.

සමස්තයක් ලෙස, තීව්‍ර වූ ගෝලීය අවිනිශ්චිතතා, දැඩි දේශීය මුදල් ප්‍රතිපත්තිමය තත්ත්වයන් සහ විදේශ විනිමය වෙළෙඳපොළ සහ කොටස් වෙළෙඳපොළ මත පැවති මධ්‍යස්ථ පීඩන හමුවේ වුව ද, සමාලෝචිත කාල සීමාව තුළ දී දේශීය මූල්‍ය වෙළෙඳපොළ සහ පියවීම් යටිතල පහසුකම් ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කරන ලදී. තවදුරටත්, සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීම, ආයෝජක විශ්වාසය ශක්තිමත් කිරීම, විදේශ ආයෝජන පදනම පුළුල් කිරීම සහ දේශීය මූල්‍ය වෙළෙඳපොළ සහ ගෙවීම් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් දේශීය මූල්‍ය වෙළෙඳපොළට විදේශීය සහ දේශීය කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවා ගත හැකි වනු ඇත.

---

1 මෙම දර්ශකය මගින් කොටස් වෙළෙඳපොළ, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ සහ දේශීය මුදල් වෙළෙඳපොළ තුළින් හටගන්නා ඒකාබද්ධ ආතති මට්ටම ගණනය කරනු ලැබේ.

රූප සටහන 2.1 මූල්‍ය ආතති දර්ශකය



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
බිලූම්බර්ග් තොරතුරු සේවය

2.1 කොටස් වෙළෙඳපොළ


2025 වසරේ වාර්තා වූ කොටස් වෙළෙඳපොළ ශක්තිමත් කාර්යසාධනයෙන් අනතුරුව, සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී බාහිර අවිනිශ්චිතතාව තීව්‍ර වීම හේතුවෙන් එහි මන්දගාමී කාර්යසාධනයක් පැවතුණි. මැදපෙරදිග කලාපයේ ආතතීන් ඉහළ යාමත් සමඟ 2026 වසරේ මාර්තු මාසයේ දී කොටස් වෙළෙඳපොළ මිල දර්ශක පහත වැටීමක් පෙන්නුම් කළ අතර, 2026 වසරේ අගෝස්තු මස අවසානය දක්වා සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවතුණි. එම දර්ශක 2026 අගෝස්තු අවසානය වන විට, සියලු කොටස් මිල දර්ශකය (ASPI) සහ S&P SL20 දර්ශකය පිළිවෙළින් 5.7%කින් සහ 2.4%කින් පහළ ගිය අතර, 2025 අවසානය වන විට එම දර්ශක පිළිවෙළින් 41.9%ක සහ 26.6%ක සැලකිය යුතු වාර්ෂික වර්ධනයක් වාර්තා කර තිබුණි. මැදපෙරදිග කලාපයේ තීව්‍ර වූ භූදේශපාලනික ආතතීන් සහ ගෝලීය මූල්‍ය වෙළෙඳපොළවල අවිනිශ්චිතතා ඉහළ යාම කොටස් වෙළෙඳපොළෙහි මන්දගාමී කාර්යසාධනය මගින් නිරූපණය වූ අතර, එය ආයෝජක විශ්වාසය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරන ලදී. ඒ සමඟම ගෝලීය බලශක්ති මිල ගණන් ඉහළ යාම ද දේශීය උද්ධමන ඉදිරි දැක්ම පිළිබඳ සැලකිලිමත්භාවය වැඩි කරමින් වෙළෙඳපොළ අවිනිශ්චිතතාව තවදුරටත් ඉහළ නැංවීය. අනතුරුව දේශීය මුදල් ප්‍රතිපත්තිමය තත්ත්වයන් දැඩි වීම සමඟ වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ යාම හේතුවෙන් ස්ථාවර ආයෝජනවල ආකර්ෂණීය බව ඉහළ යාම සහ ආයතනික ඉපැයීම් සඳහා අදාළ වන මූල්‍ය පිරිවැය සහ වට්ටම් අනුපාතික ඉහළ යාම මගින් කොටස් වෙළෙඳපොළ පිළිබඳ ව පවතින සාපේක්ෂ ආකර්ෂණය කෙරෙහි බලපෑම් ඇති කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2025 වසර අවසානයට සාපේක්ෂව 4.2%කින් පහළ ගොස්, 2026 අගෝස්තු අවසානය වනවිට රුපියල් බිලියන 7,730.8ක් දක්වා පහත වැටුණි. මෙතෙක් දක්නට ලැබුණු මෙම ක්‍රමවත් ගැලපුම් ස්වභාවය මගින් මූල්‍ය පද්ධතියට එල්ල විය හැකි ක්ෂණික බලපෑම් සීමිත බව පෙන්නුම් කළ ද, ආයෝජකයින්ගේ ණයගැතිභාවය, විදේශීය ආයෝජන ප්‍රවාහ සහ වෙළෙඳපොළ ද්‍රවශීලතාව ආශ්‍රිත වෙනස්වීම් අඛණ්ඩව අධීක්ෂණය කළ යුතු වේ.

උද්ධමනයට අනුව ගැලපූ සියලු කොටස්වල සමස්ත ප්‍රතිලාභ දර්ශකය (ASTRI) මගින් මනිනු ලබන කොටස් වෙළෙඳපොළේ මූර්ත ප්‍රතිලාභය[2], සලකා බලන කාල සීමාවේ දී අඛණ්ඩව පහළ ගියේය. 2025 වසරේ අගෝස්තු මාසයේ දී උපරිම අගයක් වාර්තා කිරීමෙන් පසුව, නාමික කොටස් වෙළෙඳපොළ කාර්යසාධනය මන්දගාමීව වීම ඉහළ යන දේශීය උද්ධමනය සමඟ සමපාත

2 සියලු කොටස් මිල දර්ශකය සඳහා මූර්ත ප්‍රතිලාභය ගණනය කිරීම:


$$\text{මූර්ත ප්‍රතිලාභය} = \frac{(1+\text{මාසික සියලු කොටස්වල සමස්ත ප්‍රතිලාභ දර්ශකය})}{(1+\text{මාසික කොපාමිදප්‍රනම් කරගත් උද්ධමන අනුපාතය})} - 1$$

රූප සටහන 2.2 කොටස් මිල දර්ශක




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව

රූප සටහන 2.3 මාසික කොටස් වෙළඳපොළ පිරිවැටුම සහ මූර්ත ප්‍රතිලාභ



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රූප සටහන 2.4 **අනුමානිත කොටස් අවදානම් අතිරික්තය සහ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ණය නිරාවරණය**



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසන් සභාව

වීම හේතුවෙන් කොටස් වෙළෙඳපොළ මූර්ත ප්‍රතිලාභ පහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආයෝජකයින්ට හිමිවන මූර්ත ප්‍රතිලාභ ද පහළ යන ලදී. 2025 වසර තුළ දී වාර්තා වූ රුපියල් මිලියන 5,179.2ට සාපේක්ෂව 2026 වසරේ පළමු මාස 8 තුළ දී සාමාන්‍ය දෛනික පිරිවැටුම රුපියල් මිලියන 4,000.3ක් දක්වා පහළ යාමත් සමඟ සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී වෙළෙඳපොළ ද්‍රවශීලතාව ද දුර්වල විය. අනුමානිත කොටස් අවදානම් අතිරික්තය (ERP)[3] අඛණ්ඩව පහත වැටීමේ ප්‍රවණතාවයක් පැවතුණු අතර 2026 වසරේ මැයි මාසයේ සිට එය සෘණ අගයක් ගන්නා ලදී. සෘණ අගයක් ගත් අනුමානිත කොටස් අවදානම් අතිරික්තය මගින්, කොටස් වෙළෙඳපොළෙහි සමස්ත ඉපැයීම් ඵලදා අනුපාතිකය දින 364 භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතිකයට වඩා පහළ මට්ටමකට පත්ව ඇති බව පෙන්නුම් කරන ලදී. මෙම තත්ත්වය නිසා කොටස් හිමිකාරිත්වය සඳහා ලැබෙන සාපේක්ෂ ප්‍රතිලාභ පහළ ගිය අතර, එය අවදානම් රහිත රජයේ සුරැකුම්පත්වලට සාපේක්ෂව කොටස්වල ආකර්ෂණීය බව අඩු වීමට හේතු විය හැකිය. තවද, කොටස් වෙළෙඳපොළ සඳහා වූ සමස්ත ණය නිරාවරණය[4] 2026 වසරේ මුල් භාගය තුළ ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, අනතුරුව තරමක් පහළ ගියේය. වෙළෙඳපොළ ඉපැයීම් මන්දගාමී වීම සමීපව අනුගමනය කළ කාල පමාවක් සහිත ව ප්‍රතිචාර දක්වන ආකාරය එමගින් පිළිබිඹු විය. 2026 වසරේ අගෝස්තු මස අවසානය වනවිට, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සමස්ත ණය තත්ත්වය රුපියල් බිලියන 99.0ක් වූ අතර එය 2025 වසර අවසානයේ පැවති අගයට සාපේක්ෂව 12.0%ක සහ 2024 වසර අවසානයේ පැවති අගයට සාපේක්ෂව 91.0%ක ඉහළ යාමකි. කෙසේ වුවද, එය වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයේ හා බැංකු සහ මුදල් සමාගම් අංශවල සමස්ත ණය කළඹේ ප්‍රතිශතයක් ලෙස සැලකූ විට පහළ මට්ටමක පැවතුණි. ඒ අතරම, පසුව ණය නිරාවරණයේ දක්නට ලැබුණු මන්දගාමී වීම මගින් තෝලනය (leverage) හේතුවෙන් කොටස් වෙළෙඳපොළෙහි ගැළපීම් තීව්‍ර වීමේ හැකියාව අඩු කළද, විශේෂයෙන් වෙළෙඳපොළ උච්චාවචනය ඉහළ මට්ටමක පවතින කාලපරිච්ඡේදවල දී ආන්තික ණය සහ අනෙකුත් ණය නිරාවරණයන්හි වර්ධනයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීම අවශ්‍ය විය. කෙසේ වුවද, වෙළෙඳපොළ මිල ගණන්වල සිදු වූ ක්‍රමවත් ගැලපීම සහ පසුව ණය නිරාවරණය මන්දගාමී වීම මගින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සඳහා වන සෘජු බලපෑම් සීමිත මට්ටමක පවතින බව පෙන්නුම් කළ ද, වෙළෙඳපොළ දර්ශක විචලනය, ආයෝජක ණයගැති භාවය සහ ද්‍රවශීලතා තත්ත්වයන් අඛණ්ඩ ව අධීක්ෂණය කළ යුතු වනු ඇත.

තීව්‍ර වූ භූදේශපාලනික අවිනිශ්චිතතාව සහ වෙනස්වන ආයෝජක ආකල්ප මධ්‍යයේ, 2026 වසරේ පළමු මාස අට තුළ කොටස් වෙළෙඳපොළ දර්ශක විචලනය[5] සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. දින 20 චලිත සම්මත අපගමනය මගින් මනිනු ලබන සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) සහ S&P SL20 යන දර්ශක ද්විත්වයෙහිම

3 අනුමානිත කොටස් අවදානම් අතිරික්තය (ERP) යනු සමස්ත වෙළෙඳපොළ ඵලදා අනුපාතිකය, එනම් වෙළෙඳපොළ මිල ඉපැයීම් අනුපාතිකයේ (PER) ප්‍රතිලෝම අගය සහ අවදානම් රහිත අනුපාතය පිළිබිඹු කරන දින 364ක භාණ්ඩාගාර බිල්පත්වල ද්විතියික වෙළෙඳපොළ ඵලදා අනුපාතිකය අතර ඇති පරතරය ලෙස වේ.


$$\text{Implied ERP}_t = \left(\frac{1}{\text{PER}_t} \times 100\right) - Y_{t,Rf}$$

PER_t යනු වෙළෙඳපොළ ඉපැයීම් මත මිල අනුපාතය සහ $Y_{t,Rf}$ යනු දින 364ක භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතිකයයි.

4 කොටස් වෙළෙඳපොළ සමස්ත ණය නිරාවරණයට කොළඹ කොටස් වෙළෙඳපොළ මත සුරැකුම්පත් ගනුදෙනු කිරීම සඳහා බලපත්‍රලාභී ආන්තික සැපයුම්කරුවන් ලබා දී ඇති මුළු ආන්තික ණය සහ බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන් විසින් ආයෝජකයින් වෙත ලබා දී ඇති ණය ඇතුළත් වේ.

5 කොළඹ කොටස් වෙළෙඳපොළේ ක්‍රියාත්මක වූ පෙර සක්‍රීය ගනුදෙනු දින 20 සඳහා සියලු කොටස් මිල දර්ශකය (ASPI) සහ S&P SL 20 දර්ශකවල සම්මත අපගමනය මගින් කොටස් වෙළෙඳපොළ දර්ශක විචලනයන් ගණනය කර ඇත.

රූප සටහන 2.5 **කොටස් මිල දර්ශකවල උච්චාවචන**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව

විචලනයන් 2024 සහ 2025 වසරවල වාර්තා වූ සාමාන්‍ය මට්ටම් ඉක්මවා ගිය අතර, විශේෂයෙන් මැදපෙරදිග කලාපයේ භූදේශපාලනික ආතතීන් උත්සන්න වීම මධ්‍යයේ ඉහළ ගිය වෙළෙඳපොළ අවිනිශ්චිතතාව සහ ආයෝජක ආකල්පවල වෙනස්වීම් පිළිබිඹු කරමින්, 2026 මාර්තු මාසයේ දී තියුණු ලෙස ඉහළ යමින් 2021 වසරේ ජනවාරි මාසයෙන් පසු වාර්තා වූ ඉහළම මට්ටමට ළඟා විය. අනතුරුව 2026 වසරේ මාර්තු මාසයේ දී උපරිමයකට ළඟා වූ කොටස් වෙළෙඳපොළ විචලනය පසුව මන්දගාමී වුව ද සමාලෝචිත කාලපරිච්ඡේදයේ ඇතැම් අවස්ථාවල දී සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතුණි. අඛණ්ඩ ව පවතින හෝ නැවත ඇතිවන ඉහළ උච්චාවචනයන් මගින් ආයෝජක විශ්වාසය දුර්වල වීමටත්, වෙළෙඳපොළ ද්‍රවශීලතාව අඩු වීමටත් තක්සේරුකරණ අලාභ ඉහළ යාමටත් බලපෑ හැකි අතර විශේෂයෙන් ආයෝජකයින් ණය තෝලනය තත්ත්වයන් හරහා නිරාවරණය වී ඇති අවස්ථාවල දී මෙම බලපෑම් වඩාත් තීව්‍ර විය හැකිය. කෙසේ වුවද, පුළුල් මූල්‍ය පද්ධතිය සහ කොටස් වෙළෙඳපොළ අතර පවතින සාපේක්ෂ වශයෙන් සීමිත අන්තර් සම්බන්ධතාව හේතුවෙන් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සඳහා වන සෘජු බලපෑම් සීමිත මට්ටමක පැවතුණ ද වෙළෙඳපොළ ද්‍රවශීලතාව, ආයෝජක ණය තෝලනය සහ මූල්‍ය ආයතනවල කොටස් ආශ්‍රිත නිරාවරණයන් වර්ධනය වීම අඛණ්ඩව අධීක්ෂණය කළ යුතු විය.

කොටස් වෙළෙඳපොළෙහි මිල පොත් අගය (PBV) අනුපාතය සහ මිල ඉපැයීම් අනුපාතය (PER) ඒවායේ දිගුකාලීන සාමාන්‍යය අගයන්ට ආසන්න මට්ටමක පැවතුණි. 2026 අගෝස්තු මස අවසානය වන විට මිල පොත් අගය 1.30ක් වූ අතර, එය 2025 අවසානයේ වාර්තා වූ මට්ටමෙන් නොවෙනස්ව පැවතුණි. තව ද, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ මිල ඉපැයීම් අනුපාතය 2025 වසර අවසානයේ දී පැවති 10.70ක අගයට සාපේක්ෂව 2026 වසරේ අගෝස්තු මස අවසානය වනවිට 11.20ක් දක්වා ඉහළ ගිය ද, 2000 වසරේ සිට පැවති එහි දිගුකාලීන සාමාන්‍යය වන 12.00ට වඩා තරමක් පහළ අගයක පැවතුණි. මෙම ඉහළ යාම් සඳහා, කොටස් වෙළෙඳපොළ මිල ගණන්වල මන්දගාමී වීමේ බලපෑම ඉක්මවා යමින් සමාගම් ඉපැයීම් පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. භූදේශපාලනික අවිනිශ්චිතතා ඇතුළු සාධක වෙළෙඳපොළ වර්ධනය යම් දුරටකට සීමා කර ඇති බව මිල පොත් අගය අනුපාතය පහළ වැටීම සහ කෙටි කාලීන උච්චාවචනයන් මගින් පෙන්නුම් කරයි. කෙසේ වුවද, කලාපයේ අනෙකුත් කොටස් වෙළෙඳපොළ බොහොමයකට සාපේක්ෂව කොළඹ කොටස් වෙළෙඳපොළෙහි මිල පොත් අගය අනුපාතය සහ මිල ඉපැයීම් අනුපාතය පහළ මට්ටමක පැවතුණි.


සලකා බලන කාල සීමාව තුළ ප්‍රධාන අංශවල කොටස් වෙළෙඳපොළ කාර්යසාධනය ඒකාකාරී නොවීය. 2020 වසර පදනම් කර ගනිමින් සකස් කරන ලද ආංශික සම්මත මිල දර්ශකවලට අනුව, 2026 වසරේ අගෝස්තු මස අවසානය වනවිට වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයෙන් ආසන්න වශයෙන් 74%ක් පමණ නියෝජනය කළ ප්‍රධාන අංශ පහ සමාලෝචිත කාල පරිච්ඡේදයේ දී මිශ්‍ර කාර්යසාධනයක් වාර්තා කරන ලදී. 2026 වසරේ මාර්තු මාසයේ දී සියලුම අංශ පහත වැටීමේ පීඩනයකට ලක් වූ අතර, ඉන් අනතුරුව යථා තත්ත්වයට පත්වීම අංශ අතර අසමාන විය. විදුලි සංදේශ සේවා අංශය ශක්තිමත් ප්‍රකෘතිමත් වීමක් වාර්තා කරමින් අනෙකුත් ප්‍රධාන අංශ අභිබවා ගිය අතර, 2026 අගෝස්තු අවසානය වන විට එහි දර්ශකය ජනවාරි මස මුල පැවති මට්ටමට වඩා 48.3%කින් පමණ ඉහළ මට්ටමක පැවතුණි. ඊට සාපේක්ෂව, විවිධාංගී මූල්‍ය සේවා, ප්‍රාග්ධන භාණ්ඩ, බැංකු සහ ආහාරපාන හා දුම්කොළ යන අංශ වසර ආරම්භයේ

රූප සටහන 2.6 වෙළෙඳපොළ තක්සේරුකරණ දර්ශක



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව

රූප සටහන 2.7 කොටස් වෙළෙඳපොළෙහි ආංශික දර්ශක වෙනස්වීම්*




* මෙම ප්‍රස්ථාරය මගින් දර්ශකගත කළ අංශවල මිල වෙනස්වීම් ඉදිරිපත් කරන අතර, සෑම අංශයකටම දර්ශකය 2020 වසරේ ජනවාරි 02 දිනට 100 ලෙස පාදක කර ඇත. (2020 ජනවාරි 02=100).

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව

රූප සටහන 2.8

අංශ අනුව ස්ථානගතවීම් (2020 ජනවාරි සිට 2026 අගෝස්තු)*




*සටහන්:
අදාළ කාලපරිච්ඡේද අවසානය වනවිට අදාළ අංශයේ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය වෘත්තයේ ප්‍රමාණයෙන් දැක්වේ.
රූප සටහනේ තොරතුරුවල පැහැදිළි බව පවත්වාගැනීම සඳහා, ප්‍රවාහන අංශය (2020 දී මිල පොත් අගය සහ 2026 දී ලාභාංශ ඵලදාව සඳහා අන්ත අගයන් පැවති) සහ මෘදුකාංග හා සේවා අංශය (2026 දී ලාභාංශ ඵලදාව සඳහා අන්ත අගයක් පැවති) ප්‍රස්ථාරයෙන් ඉවත් කර ඇත.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව

පැවති මට්ටම්වලට වඩා පහළ මට්ටමක පැවතුණි. මෙම විෂමතාව මගින් ආංශික කාර්යසාධනය පුළුල් පදනමක් මත සිදු නොවූ බව පෙන්නුම් කරන අතර, සමස්ත වෙළෙඳපොළ කාර්යසාධනයට ප්‍රධාන වශයෙන් විදුලි සංදේශ සහ සේවා අංශය සහාය වූ අතර, අනෙකුත් ප්‍රධාන අංශ 2026 මාර්තු මාසයේ සිදු වූ වෙළෙඳපොළ නිවැරදි වීමෙන් අනතුරුව තවදුරටත් මන්දගාමී කාර්යසාධනයක් පෙන්නුම් කළේය. මෙමගින්, කොටස් වෙළෙඳපොළෙහි ඉන් අනතුරුව සිදු වූ ප්‍රකෘතිමත් වීම ලැයිස්තුගත සමාගම් අතර පුළුල් පදනමක් මත සිදු වූ වර්ධනයක් මගින් සහාය වීම වෙනුවට, තෝරාගත් අංශ කිහිපයක සංකේන්ද්‍රණය වී පැවති බව පෙන්නුම් කරයි. මෙවැනි කේන්ද්‍රගත වීම් හේතුවෙන් සාපේක්ෂ වශයෙන් කුඩා අංශ සහ සමාගම් කෙරෙහි බලපාන වෙනස්වීම් කෙරෙහි සමස්ත වෙළෙඳපොළ කාර්යසාධනය සංවේදී වීමේ හැකියාව ඉහළ යා හැකිය. කෙසේ වුවද, අංශ අතර කාර්යසාධනය මෙලෙස වෙනස් වීම මගින් එක් එක් අංශයට ආවේණික වූ ඉපැයීම් අපේක්ෂා, ශේෂ පත්‍ර තත්ත්වයන් මෙන්ම දේශීය සහ විදේශීය අංශයේ සාර්වමූල්‍ය තත්ත්වයන්හි සිදුවන වෙනස්කම් කෙරෙහි දක්වන සංවේදීතාව පිළිබිඹු කරයි.

රූප සටහන 2.9

ද්විතියික කොටස් වෙළඳපොළ තුළ විදේශීය සහභාගිත්වය



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව

ආංශික තක්සේරු දර්ශකවල සැලකිය යුතු විෂමතා පැවති අතර, වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය අඛණ්ඩව ප්‍රධාන අංශ පහක් තුළ කේන්ද්‍රගත ව පැවතිණි. ඇතැම් අංශවල මිල පොත් අගය අනුපාතිකය කැපී පෙනෙන ලෙස ඉහළ යාමක් පෙන්නුම් කළ ද අංශ කිහිපයක මිල පොත් අගය අනුපාතික පළමු පදනම් මට්ටම දෙසට සමීප වූ බව 2020 වසරේ ජනවාරි සිට 2026 වසරේ අගෝස්තු දක්වා වන ද්විතීයික වෙළෙඳපොළ දත්ත මගින් පිළිබිඹු කරයි. සමාලෝචිත කාල පරිච්ඡේදයේ දී මෘදුකාංග සහ සේවා අංශය මිල පොත් අගය අනුපාතිකයේ විශාලතම ඉහළ යාම වාර්තා කළ අතර එය 2025 වසරේ පැවති 5.0ක අගයේ සිට 2026 වසරේ අගෝස්තු මස අවසානය වනවිට 6.9ක් දක්වා ඉහළ යන ලදී. වාණිජ සහ වෘත්තීමය සේවා අංශය සහ විදුලි සංදේශන සේවා අංශය ද එහි වැඩිවීම් වාර්තා කළේය. ඊට සාපේක්ෂව පාරිභෝගික සේවා අංශය මිල පොත් අගය අනුපාතිකයේ විශාලතම පහළ යෑම වාර්තා කළ අතර, එය 2025 වසරේ පැවති 1.3ක අගයේ සිට 2026 වසරේ අගෝස්තු මස අවසානය වනවිට 0.9ක් දක්වා පහළ යන ලදී. එමෙන්ම ආහාර සහ ප්‍රධාන භාණ්ඩ සිල්ලර වෙළෙඳාම සහ විවිධාංගීකරණය වූ මූල්‍ය සේවා සහ සිල්ලර වෙළෙඳාම් අංශ ද පිළිවෙළින් මිල පොත් අගය අනුපාතිකයේ පහළ යාම් වාර්තා කරන ලදී. දිගු කාලීන ලාභාංශ ඵලදා සහ මිල පොත් අගය අනුපාතිකයන් අනුව මෝටර් රථ සහ කොටස්, දේපල වෙළෙඳාම් කළමනාකරණය සහ සංවර්ධනය, බැංකු සහ රක්ෂණ යන අංශවල මිල පොත් අගය අනුපාතය බොහෝ දුරට මධ්‍යස්ථ මට්ටමක පැවති අතර සාපේක්ෂ වශයෙන් ඉහළ ලාභාංශ ඵලදාවන්ගෙන් සමන්විත විය.


2026 වසරේ පළමු මාස අට තුළ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ශුද්ධ විදේශීය ආයෝජන පිටතට ගලායෑම් වාර්තා විය. 2024 වසරේ දී එක්සත් ජනපද

ඩොලර් මිලියන 32.6ක සහ 2025 වසරේ දී එක්සත් ජනපද ඩොලර් මිලියන 127.7ක ශුද්ධ විදේශීය ආයෝජන පිටතට ගලා යාම්වලින් අනතුරුව, 2026 වසරේ අගෝස්තු මස අවසානය වනවිට එක්සත් ජනපද ඩොලර් මිලියන 171.8 ක සමුච්චිත ශුද්ධ විදේශීය ආයෝජන පිටතට ගලායාමක් වාර්තා විය. ප්‍රාථමික වෙළෙඳපොළ තුළ විදේශීය සහභාගීත්වය ද අඩු මට්ටමක පැවති අතර 2024 වසරේ එක්සත් ජනපද ඩොලර් මිලියන 65.5ක අගයට සහ 2025 වසරේ එක්සත් ජනපද ඩොලර් මිලියන 5.4ක අගයට සාපේක්ෂව සමාලෝචිත කාල පරිච්ඡේදයේ දී විදේශීය ප්‍රාග්ධන ලැබීම් එක්සත් ජනපද ඩොලර් මිලියන 2.9 කට සීමා විය. කොළඹ කොටස් වෙළෙඳපොළෙහි විදේශ ආයෝජකයින් සතු කොටස්වල මුළු වටිනාකම 2023 වසර අවසානයේ පැවති 24.9%ට, 2024 වසර අවසානයේ පැවති 17.6%ට සහ 2025 වසර අවසානයේ පැවති 17.8%ට සාපේක්ෂව 2026 වසරේ ජූලි මස අවසානය වනවිට 19.0%ක් ලෙස පැවතුණි. දිගු කාලීන ආයෝජන ප්‍රවාහ ආකර්ෂණය කර ගැනීම කොටස් වෙළෙඳපොළ තුළ තිරසර වර්ධනයක් ළඟාකර ගැනීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පවතී. ස්ථාවර සහ දිගුකාලීන විදේශීය ආයෝජකයින්ගේ සහභාගීත්වය වැඩි වීම මගින් වෙළෙඳපොළ ගැඹුර, මනා ද්‍රවශීලතාවක් සහිත සහ විවිධාංගීකරණ වූ ආයෝජක පදනමක් සහිත වෙළෙඳපොළක් ගොඩනැගීම සඳහා සහාය වන අතර, එමගින් දේශීය කොටස් වෙළෙඳපොළෙහි ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් වීම සහ වෙළෙඳපොළ සංවර්ධනයට සහාය වනු ඇත.

2.2 රජයේ සුරුකුම්පත් වෙළෙඳපොළ

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී රජයේ සුරුකුම්පත් මත ඵලදා අනුපාතික ඉහළ ගිය අතර, ඒ සඳහා වෙනස්වන වෙළෙඳපොළ ආකල්ප සහ දැඩි මුදල් ප්‍රතිපත්ති තත්ත්වයන්


රූප සටහන 2.11 ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ කොපාමිද පදනම් කරගත් උද්ධමනය



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය


හේතු විය. දිට්වා සුළි කුණාටුව හේතුවෙන් රජයේ සුරුකුම්පත් ඵලදා අනුපාතික මත එල්ල වූ බලපෑම සීමිත වුව ද රාජ්‍ය මූල්‍ය පීඩනයන් පිළිබඳ අපේක්ෂාවන් සහ රාජ්‍ය මූල්‍ය ස්ථාවරක්ෂක අරමුදල් භාවිතය හේතුවෙන් 2025 වසරේ අවසානය වනවිට ඵලදා අනුපාතිකයන්ගේ යම් ඉහළ යාමක් දක්නට ලැබුණි. පසුව, මැදපෙරදිග කලාපයේ භූදේශපාලනික ආතතීන් උත්සන්න වීම දේශීය උද්ධමන ඉදිරිදැක්ම වෙනස් කළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2026 වසරේ මාර්තු මාසයේ දී ඵලදා අනුපාතික ක්‍රමයෙන් ඉහළ ගියේය. තවද, 2026 වසරේ මැයි මාසයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 100කින් ඉහළ නැංවීමත් සමඟ ඵලදා අනුපාතික කැපී පෙනෙන ලෙස ඉහළ යන ලදී. 2023 වසරේ ජූනි මාසයෙන් පසු ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ඉහළ නැංවූ පළමු අවස්ථාව මෙය විය. ශක්තිමත් රාජ්‍ය මූල්‍ය සහ ස්ථාවරක්ෂක අරමුදල්

රූප සටහන 2.10 රජයේ සුරුකුම්පත්වල ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

රූප සටහන 2.12 රජයේ සුරුකුම්පත් සඳහා ප්‍රාථමික වෙළඳපොළ ඉල්ලුම



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය


රූප සටහන 2.13 **භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල ගතිකත්වය**



සටහන: මෙරුන් (Maroon) පැහැති තීන් මඟින් මාසය අවසානයේ වෙන්දේසි ඵලදායීතා අනුපාත ඉහළ ගිය, වෙන්දේසි ප්‍රතිපාදන ඉදිරිපත් කළ ප්‍රමාණයෙන් 100% ට අඩු වූ, හෝ වෙන්දේසි දායකත්වය ඉදිරිපත් කළ ප්‍රමාණයෙන් සියයට 100ට අඩු වූ කාලපරිච්ඡේද පෙන්නුම් කරයි. කොළ පැහැය මඟින් ඊට ප්‍රතිවිරුද්ධ තත්ත්වයන් පෙන්නුම් කරයි.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

රූප සටහන 2.15 **රජයේ සුරුකුම්පත් ද්විතියික වෙළඳපොළ ගනුදෙනු - ඵලදා අනුපාතික සහ කල් පිරීමේ කාල සීමාව**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පවත්වාගෙන යාම මධ්‍යයේ වුව ද ආයෝජකයින් ඉහළ ගිය උද්ධමන පීඩන අඛණ්ඩව මිලකරණයට ඇතුළත් කිරීම හේතුවෙන්, 2026 වසරේ අගෝස්තු මස අවසානය දක්වා සියලු කල්පිරීම් කාලසීමාවල ඵලදා අනුපාතිකය මත පීඩනය ඉහළ මට්ටමක පැවතුණි.


පෞද්ගලික අංශයේ ණය වර්ධනය ශක්තිමත් වීම සහ ප්‍රාථමික වෙන්දේසිවල දී ඉහළ වටිනාකම් ප්‍රමාණයන් ඉදිරිපත් කර තිබියදී ද සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී ප්‍රාථමික වෙළෙඳපොළ තුළ රජයේ සුරුකුම්පත් සඳහා ඉල්ලුම ශක්තිමත් ව පැවතුණි. 2025 වසරේ දී වාර්තා කළ ශක්තිමත් වර්ධනයෙන් පසුව, 2026 වසරේ දී පෞද්ගලික අංශයේ ණය සාපේක්ෂ වශයෙන් වැඩි වේගයකින් අඛණ්ඩ ව ප්‍රසාරණය වුව ද භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ ආයෝජක ඉල්ලුම ශක්තිමත් ව පැවතුණි. කෙසේ වෙතත්, වෙනස් වූ ගෝලීය තත්ත්වයන් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් 2026 වසරේ මාර්තු මාසයේ සිට දේශීය වෙළෙඳපොළ පිළිබඳ ව පවතින අපේක්ෂා වෙනස්වීම හේතුවෙන්, ප්‍රාථමික වෙළෙඳපොළ වෙන්දේසිවලදී ආයෝජකයින් ඉහළ ඵලදා අනුපාතික ඉල්ලුම් කළහ. එසේ වුවද, 2026 වසරේ පළමු මාස අට තුළ දී භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ලංසු පිරිනැමුම් අනුපාතයේ (bid-to-offer ratio) සාමාන්‍යය 221%ක් ලෙස වාර්තා වූ අතර, එමගින් රජයේ සුරුකුම්පත් සඳහා ආයෝජකයින් තුළ පවතින අඛණ්ඩ කැමැත්ත පිළිබිඹු කරයි. කෙසේ වුවද, ඵලදා අනුපාතික මත ඉහළ යාමේ පීඩනයක් ඇතිවීමත් සමඟ, විශේෂයෙන් දින 182 සහ දින 364 භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ඇතැම් වෙන්දේසිවල දී ඉදිරිපත් කර තිබූ ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් පිළිගන්නා ලදී. මේ අතර, 2025 වසරේ දෙවන භාගයේ දී පහළ මට්ටමක

රූප සටහන 2.14 **රජයේ සුරුකුම්පත් ද්විතියික වෙළඳපොළ ගනුදෙනු**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

රූප සටහන 2.16 **රජයේ සුරුකුම්පත් සඳහා ද්විතියික වෙළඳපොළ ඵලදා වක්‍රය**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

රූප සටහන 2.17 **ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතිකවල විචලනය**



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

රූප සටහන 2.18 **රජයේ සුරැකුම්පත් වෙළඳපොළ තුළ විදේශීය ආයෝජන ප්‍රවාහ**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පැවතුණු වෙන්දේසි සඳහා ඉදිරිපත් කළ ප්‍රමාණයන්, 2026 වසරේ පළමු මාස අට තුළ දී ඉහළ යන ලදී. රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම් ඉහළ මට්ටමක පැවතිය ද අඛණ්ඩ ව පැවති ඉහළ ලංසු ලැබීම් මගින් රජයේ සුරැකුම්පත් සඳහා වෙළෙඳපොළ තුළ පවතින ශක්තිමත් ඉල්ලුම නිරූපණය විය.

මෑතකාලීනව වෙළෙඳපොළ ගනුදෙනු යථා තත්ත්වයට පත් වුව ද, ද්‍රවශීලතා තත්ත්වයන් සීමා සහිත වීම හේතුවෙන් රජයේ සුරැකුම්පත්වල ද්විතීයික වෙළෙඳපොළ ක්‍රියාකාරකම් සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි. 2025 වසරේ සැප්තැම්බර් මාසයෙන් පසුව, තවදුරටත් පහත වැටුණු පිරිවැටුම් අනුපාතිකය (turnover ratio) 2025 වසරේ නොවැම්බර් මාසය වනවිට 16.4%ක් දක්වා පහළ ගියේය. ඉන් අනතුරුව, විශේෂයෙන්ම භාණ්ඩාගාර බැඳුම්කරවල වෙළෙඳ ගනුදෙනු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වූ අතර, එය පිරිවැටුම් අනුපාතිකයේ ඉහළ යාම සඳහා දායක විය. කෙසේ වුවද, 2023 වසරේ සිට පිරිවැටුම් අනුපාතිකයේ දක්නට ලැබුණු විචලනයන් මගින් ද්‍රවශීලතා තත්ත්වයන්ගේ තිරසර දියුණුවකට වඩා ද්විතීයික වෙළෙඳපොළ ක්‍රියාකාරකම්හි අඛණ්ඩ නොවන ස්වභාවයක් පෙන්නුම් කෙරිණි. මෑත කාලීන වසර කිහිපය පුරා වෙළෙඳ ගනුදෙනු කෙටි කාලීන සුරැකුම්පත් මත කේන්ද්‍රගතව පැවතුණි. 2026 වසරේ දී භාණ්ඩාගාර බැඳුම්කරවල දක්නට ලැබුණු සාපේක්ෂ වශයෙන් ඉහළ පිරිවැටුම මගින් දිගුකාලීන සුරැකුම්පත්වල යම් ඉහළ ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළ නමුත් සමස්ත වෙළෙඳපොළ ද්‍රවශීලතාව සීමිත විය. 2023 සහ 2024 වසරවල දී ඵලදා අනුපාතික පහළ යාම සහ පසුකාලීනව 2026 වසරේ දී නැවත ඵලදා අනුපාතික ඉහළ යාම ඇතුළු ව ඵලදා චක්‍රයේ සිදු වූ වෙනස්කම් මගින් වෙළෙඳ කටයුතු සම්බන්ධයෙන් වන ආයෝජක ආකල්ප හෝ සමස්ත වෙළෙඳපොළ ද්‍රවශීලතාව ප්‍රමාණාත්මකව වෙනස් වී නොමැති බව මෙමගින් පෙන්නුම් කරයි. සක්‍රීය ලෙස ගනුදෙනු වූ කල්පිරීම් පරාසය සීමා වීම නිසා ද්‍රවශීලතාව අඛණ්ඩව සීමිත මට්ටමක පැවති අතර එය පූර්ණ ඵලදා චක්‍රයක් නිර්මාණය වීමට සහ මිල නිර්ණය වීමේ ක්‍රියාවලිය ට සීමා ඇති කරන ලදී. තවද, සක්‍රීය ලෙස ගනුදෙනු නොවන කල්පිරීම් සඳහා වන ප්‍රකාශිත මිල ගණන් මත රඳා පැවතීම හේතුවෙන් වෙළෙඳපොළ විචලනයන් අඩුවෙන් තක්සේරු වීම සිදු විය හැකිය. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර යන ද්විත්වයේම සමස්ත පිරිවැටුම් අනුපාතිකය 2026 වසරේ ජූලි මාසයේ දී 45.6%ක් දක්වා ඉහළ ගොස් නැවත අගෝස්තු මාසයේ දී 37.3% දක්වා මන්දගාමී වුවද, ගනුදෙනු ක්‍රියාකාරකම්වල අඛණ්ඩ විචලනය සහ එය සීමිත කල්පිරීමේ පරාසයක් තුළ සංකේන්ද්‍රණය වී පැවතීම, පිරිවැටුමෙහි මෑතකාලීන ඉහළ යාම මගින් ද්විතීයික වෙළෙඳපොළෙහි තිරසර දියුණුවක් තවමත් ඇති වී නොමැති බව පෙන්නුම් කරයි.

සලකා බලනු ලබන කාල පරිච්ඡේදය තුළ සියලුම කල් පිරීමේ කාලසීමාවල රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික ඉහළ ගිය අතර, ඒ සමඟ ඵලදා අනුපාතික ආශ්‍රිත විචලනය ද ඉහළ ගියේය. ඵලදා අනුපාතික 2025 වසර පුරා බොහෝ දුරට ස්ථායී ලෙස පැවතීමෙන් පසුව 2026 වසරේ දී ක්‍රමයෙන් ඉහළ යාමේ පිඩනයක් පෙන්නුම් කරන ලදී. 2026 වසරේ මාර්තු මාසයේ දී මූලික ගැලපීම් සිදුවූ අතර, රජයේ සුරැකුම්පත් ඵලදා චක්‍රයේ ඵලදා පරතරය පහළ යාමේ ස්වභාවයක් (bearish flattening) පෙන්නුම් කරමින් කෙටි කාලීන ඵලදා අනුපාතික සාපේක්ෂව වැඩියෙන් ඉහළ යාමක් පෙන්නුම් කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කල්පිරීම් පරතරය තාවකාලිකව සංකෝචනය විය. ඉන් අනතුරුව, වෙළෙඳපොළෙහි ස්වභාවයෙන්ම පවතින අඩු ද්‍රවශීලතාව සහ වෙනස්වන වෙළෙඳපොළ අපේක්ෂා හේතුවෙන්, ඵලදා චක්‍රයේ දිගු කාලීන අන්තයට ඉහළ යාමේ පිඩනයක් ඇති වූ අතර, මුදල් ප්‍රතිපත්ති අනුපාතික ගැලපීමෙන් පසුව එම පිඩනය තවදුරටත් දැකගත හැකි විය. මෙම වෙනස්වීම්වලට අනුකූලව, 2025 වසරේ දෙවන

රූප සටහන 2.19 **මාසික විදේශීය ආයෝජන ප්‍රවාහ, විනිමය අනුපාතිකය සහ මාසික ඵලදා අනුපාතික**



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය


භාගයේ දී දක්නට ලැබුණු අඩු මට්ටම්වලට සාපේක්ෂව 2026 වසර තුළ කෙටි කාලීන සහ දිගු කාලීන සුරැකුම්පත් ද්විත්වයේම ඵලදා අනුපාතිකවල විචලනය ඉහළ යන ලදී. ඵලදා අනුපාතිකවල විචලනය ඉහළ යාම හේතුවෙන්, ස්ථාවර ආදායම් සුරැකුම්පත් තක්සේරු කිරීමේ අවිනිශ්චිතතා ඇති වීමට සහ ද්විතියික වෙළෙඳපොළ සහභාගීත්වය අධෛර්යමත් කිරීමට හේතු විය හැකි අතර එමගින් පවතින ද්‍රවශීලතා සීමා තවදුරටත් තීව්‍ර විය හැකිය. ඵලදා චක්‍රය පුළුල් පදනමක් සහිත ව ඉහළ යාම හේතුවෙන් රජයේ සුරැකුම්පත් විශාල ප්‍රමාණයක් සතු මූල්‍ය ආයතනවල පොලී අනුපාතික අවදානම ඉහළ ගිය අතර විශේෂයෙන් සාධාරණ වටිනාකම (fair value) මගින් මනිනු ලබන සුරැකුම්පත්වල වටිනාකම් තක්සේරු කිරීමේ දී සිදුවන අලාභ හේතුවෙන් එය තවදුරටත් තීව්‍ර විය.

රජයේ සුරැකුම්පත් සඳහා වන ඵලදා අනුපාතික ඉහළ යාම පිළිබිඹු කරමින් සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර සඳහා වන විදේශීය ආයෝජන කළඹ යම් වශයෙන් යථා තත්ත්වයට පත් වීමේ ස්වරූපයක් වාර්තා කළ ද විදේශීය සහභාගීත්වය අඩු මට්ටමක පැවති අතර වරින් වර ආයෝජන පිටතට ගලායාම් සිදුවිය. 2025 වසරේ දී නිරීක්ෂණය වූ ශුද්ධ ගලාඒම්වලින් පසුව, 2026 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දී රජයේ සුරැකුම්පත් සඳහා වූ විදේශීය ආයෝජනවල තවදුරටත් ශුද්ධ ගලාඒම් වාර්තා විය. කෙසේ වුවද, තීව්‍ර වූ භූදේශපාලනික අවිනිශ්චිතතාව සහ නැගී එන වෙළෙඳපොළ වත්කම් (emerging market assets) සම්බන්ධයෙන් වන ආයෝජක මත දුර්වල වීම හේතුවෙන් 2026 වසරේ මාර්තු සිට මැයි දක්වා කාලයේ දී කැපී පෙනෙන ලෙස ආයෝජන පිටතට ගලායාම් දක්නට ලැබුණි. ශ්‍රී ලංකා රුපියල මත ඇති වූ පීඩනය සහ බලශක්ති මිල ඉහළ යාම හේතුවෙන් ඉහළ ගිය ආනයන වියදම් සමඟ මෙම ප්‍රාග්ධන පිටතට ගලායාම් සමපාත විය. පසුව රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික ඉහළ යාම සහ විදේශ විනිමය වෙළෙඳපොළ තත්ත්වයන් ස්ථායී වීම හේතුවෙන් විදේශීය ආයෝජක විශ්වාසය වැඩිදියුණු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2026 වසරේ ජුනි, ජූලි සහ අගෝස්තු මාසවල දී නැවතත් ශුද්ධ ලැබීම් වාර්තා විය. ඒ අනුව, 2025 වසරේ අගෝස්තු මාසයේ පැවති 0.6%ට සාපේක්ෂ ව 2026 වසරේ අගෝස්තු මස අවසානය වනවිට විදේශීය ආයෝජකයින් සතු රජයේ සුරැකුම්පත් වල වටිනාකම පියවිය යුතු මුළු සුරැකුම්පත් වලින් 1.1%ක් දක්වා ඉහළ යන ලදී. 2026 වසරේ මාර්තු සිට මැයි දක්වා කාලයේ දී දක්නට ලැබුණු ආයෝජන පිටතට ගලායාම් සහ 2026 වසරේ ජුනි සිට අගෝස්තු දක්වා කාලයේ දී ආයෝජන ගලාඒම් ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර මත සංකේන්ද්‍රණය වී තිබූ අතර, එමගින් විදේශීය ආයෝජන සඳහා ප්‍රධාන වශයෙන් වෙනස්වන ඵලදා අනුපාතික අපේක්ෂාවන් සහ පුළුල් වෙළෙඳපොළ තත්ත්වයන් බලපා ඇති බව පෙන්නුම් කෙරේ. කෙසේ වුවද, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ විදේශීය ආයෝජක සහභාගීත්වය සහ ඔවුන් සතු රජයේ සුරැකුම්පත්වල ප්‍රමාණය අඩු මට්ටමක පවතින අතර, එමගින් විදේශීය කළඹ ආයෝජක ප්‍රවාහ ඉවත් කර ගැනීමෙන් රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළට එල්ල විය හැකි විචලනය සීමා සහිත වනු ඇත.

2.3 දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ

එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 2023 සහ 2024 වසර දෙක තුළ අබාණ්ඩව අතිප්‍රමාණය වීමෙන් පසුව, 2025 වසරේ දී වාර්තා වූ අවප්‍රමාණය වීම තවදුරටත් තීව්‍ර කරමින් 2026 වසරේ පළමු මාස අට තුළ දී 5.5%කින් අවප්‍රමාණය විය. 2026 වසරේ පළමු මාස දෙක තුළ සුළු වශයෙන් අතිප්‍රමාණය වීමෙන් පසුව, මැදපෙරදිග කලාපයේ උත්සන්න වන භූදේශපාලනික ආතතීන් මධ්‍යයේ ගෝලීය බලශක්ති මිල ගණන් තියුණු ලෙස ඉහළ යාම සහ ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ

රූප සටහන 2.20 **එ. ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

තුළ අවිනිශ්චිතතා වැඩි වීම, පෙබරවාරි මස අග භාගයේ සිට රුපියල නැවතත් පීඩනයට ලක් වීමට හේතු විය. මෙම වර්ධනයන්ට අමතරව, විශේෂයෙන් ඉන්ධන සඳහා වූ ආනයන ආශ්‍රිත විදේශ විනිමය ඉල්ලුම ඉහළ යාම, අනෙකුත් සමපේක්ෂණාත්මක වෙළෙඳපොළ ක්‍රියාකාරකම්, කොටස් වෙළෙඳපොළෙන් විදේශ ආයෝජන පිටතට ගලා යාම, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙන් වරින් වර විදේශ ආයෝජන පිටතට ගලා යාම සහ මාස කිහිපයකදී අපනයන ආදායම් විදේශ විනිමයට පරිවර්තනය කිරීම මන්දගාමී වීම යන කරුණු එක්ව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ කෙරෙහි පීඩනයක් එල්ල විය. ඉහළ ගිය බලශක්ති ආනයන පිරිවැය, ආර්ථික ක්‍රියාකාරකම් සහ ආනයන වර්ධනය වීමත් සමඟ විදේශ විනිමය සඳහා වන ඉල්ලුම ඉහළ යාම සහ අහිතකර වෙළෙඳපොළ ආකල්ප වෙනස් වීම් විනිමය අනුපාතිකය කෙරෙහි බලපෑම් කිරීම හේතුවෙන් 2026 වසරේ දෙවන කාර්තුවේ දී රුපියල අවප්‍රමාණය වීම සහ විචලනය වීම තීව්‍ර විය. කෙසේ වුවද, විදේශ විනිමය වෙළෙඳපොළ පීඩන සමනය කිරීමට සහ ඉහළ විචලනයන් පාලනය කිරීම සඳහා මහ බැංකුව අනුගමනය කළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ මැදිහත්වීම්වලින් පසුව 2026 වසරේ මැයි මස අග භාගයේ දී වෙළෙඳපොළ තත්ත්වයන් යහපත් වීම ආරම්භ වූ අතර, 2026 වසරේ අගෝස්තු මාසයේ දී 2.4%ක අතිප්‍රමාණය වීමක් වාර්තා විය. මේ අතර, රජය විසින් මෝටර් රථ ආනයනය මත පනවන ලද අධිභාරය සහ මහ බැංකුව විසින් මෝටර් රථ ආශ්‍රිත ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් හඳුන්වාදුන් වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතික[6] (Loan to Value-LTV) සීමා හේතුවෙන් වාහන ආනයනය සඳහා පවතින ඉල්ලුම පාලනය කර, එමගින් විදේශ විනිමය ඉල්ලුම සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ මත ඇතිවන පීඩනය සීමා කිරීමට සහාය වනු ඇත. විදේශ විනිමය වෙළෙඳපොළ වෙත අබණ්ඩව සහාය ලැබුණු විදෙස්ගත ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණ, අපනයන ආදායම් සහ සංචාරක ඉපැයීම් මගින් විදේශ විනිමය ඉල්ලුම ඉහළ යාමේ බලපෑම යම් මට්ටමකට සීමා කිරීමට සහාය විය. තවද, දෙවන කාර්තුව ආරම්භයේ දී වෙළෙඳපොළ පීඩන උපරිම මට්ටමට ළඟා වූ අවස්ථාවේ දී දක්නට ලැබුණු තියුණු උච්චාවචනවලට සාපේක්ෂව 2026 වසරේ අගෝස්තු වනවිට විනිමය අනුපාතික විචලනය[7] ලිහිල් වූ අතර, එමගින් වෙළෙඳපොළ තත්ත්වයන් ක්‍රමයෙන් වැඩිදියුණු වන බව පෙන්නුම් කරයි. 2026 වසරේ පළමු මාස අට තුළ, මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට කාලෝචිතව මැදිහත් වූ අතර, එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමට අනුරූපව දළ නිල සංචිත ගොඩනැගීමට දායක වීමට, බාහිර ආරක්ෂිත සංචිත (external buffers) ශක්තිමත් කිරීමට, විනිමය අනුපාතිකයේ ඉහළ අස්ථාවරත්වය අවම කිරීමට, අත්‍යවශ්‍ය බලශක්ති ආශ්‍රිත ආනයන සඳහා මූල්‍යකරණය පහසුකම් සැලසීම සඳහා සහාය විය. කෙසේ වුවද, විනිමය අනුපාතිකය බාහිර බලපෑම්වලට, විශේෂයෙන් භූදේශපාලනික අවිනිශ්චිතතාවලට, ගෝලීය බලශක්ති මිල ගණන් උච්චාවචනය වීමට, සමුද්‍රීය ප්‍රවාහනයට එල්ල වන බාධාවලට, ආයෝජක විශ්වාසය සහ ප්‍රාග්ධන ප්‍රවාහ වෙනස්වීමට නිරාවරණය වී පැවතුණි. විදේශ විනිමය සඳහා ඇති ඉල්ලුම තවදුරටත් ඉහළ යාම විශේෂයෙන් ඉන්ධන ආනයනය සඳහා වන විදේශ විනිමය අවශ්‍යතාව සහ අහිතකර ගෝලීය වෙනස්වීම් මධ්‍යයේ පවතින විදේශීය ණය සේවාකරණ බැඳීම් රුපියල මත තවදුරටත් පීඩනයක් එල්ල කළ හැකිය. අධික විනිමය අනුපාතික විචලනය සීමා කිරීම සඳහා, ණය නිර්මාණය නොකරන විදේශ විනිමය ගලා ඒම් ශක්තිමත් මට්ටමක පවත්වා ගැනීම, ආයෝජක විශ්වාසය වැඩිදියුණු කිරීම සහ ප්‍රමාණවත් විදේශ සංචිත සමුච්චය කිරීම සහතික කිරීම වැදගත් වේ.

ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන වෙළෙඳ හවුල්කාර මුදල් ඒකකවලට සාපේක්ෂව ද අවප්‍රමාණය විය. 2026 වසරේ අගෝස්තු මස අවසානය වනවිට, ශ්‍රී ලංකා රුපියල යුරෝ මුදල් ඒකකයට සාපේක්ෂව 4.3%කින්, ස්ටර්ලින් පවුමට සාපේක්ෂව 6.1%කින්, ජපාන යෙන් මුදල් ඒකකයට සාපේක්ෂව 3.5%කින් අවප්‍රමාණය වූ අතර ඉන්දියානු රුපියලට සාපේක්ෂව 0.4%කින් අතිප්‍රමාණය විය. පදනම් මුදල් ඒකකයේ අතිප්‍රමාණය මෙන්ම රුපියල වෙනස්වීම කෙරෙහි අනෙකුත් ප්‍රධාන සාධකවල ද සැලකිය යුතු බලපෑමක් පවතින බව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම මගින් පෙන්නුම් කරයි. ප්‍රධාන වෙළෙඳ මුදල් ඒකකවලට සාපේක්ෂව විනිමය අනුපාතිකය වෙනස්වීම සඳහා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ ද්විපාර්ශ්වික විනිමය අනුපාතවල වෙනස්වීම් පමණක් නොව ගෝලීය විනිමය වෙළෙඳපොළේ අනෙකුත් මුදල් ඒකක අතර විනිමය අනුපාතිකවල සිදුවන වෙනස්කම්, භූදේශපාලනික

රූප සටහන 2.21 **ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ප්‍රධාන විනිමය අනුපාතික**



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

6 වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතික අවශ්‍යතා පිළිබඳ වැඩිදුර විස්තර සඳහා 05 වන පරිච්ඡේදය බලන්න.

7 විනිමය අනුපාතික විචලනය මනිනු ලබන්නේ එක්සත් ජනපද ඩොලරයට/ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතික දෛනික දර්ශකයේ දින 20ක චලිත සම්මත අපගමනය භාවිත කරමිනි.


අවදානම්, ප්‍රධාන මහ බැංකුවල මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ජාත්‍යන්තර ආයෝජක විශ්වාසය වෙනස්වීම ද අඛණ්ඩව හේතුවනු ඇත.

2026 මැයි සිට ජූලි දක්වා කාලය තුළ එක්සත් ජනපද ඩොලරයට/ශ්‍රී ලංකා රුපියලෙහි මිලදී ගැනීමේ හා විකිණීමේ විනිමය අනුපාතික අතර පරතරය (bid-asked spread) **සැලකිය යුතු ලෙස ඉහළ ගිය අවස්ථා වාර්තා වූ අතර, එය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ පැවති පීඩන තත්ත්වයන් පිළිබිඹු කළේය.** ඉන් අනතුරුව, සමාලෝචිත කාලපරිච්ඡේදයේ අවසාන භාගය වනවිට එම පරතරය සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි. මිලදී ගැනීමේ හා විකිණීමේ මිල ගණන් අතර පරතරයේ වරින් වර නිරීක්ෂණය වූ ඉහළ යාම් ප්‍රධාන වශයෙන් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඉල්ලුම හා සැපයුම අතර ඇති වූ නොගැළපීම් පිළිබිඹු කළ අතර, භූදේශපාලනික ආතතීන්, ඒවායේ බලපෑමෙන් බලශක්ති මිල ගණන්වල ඇති වූ වෙනස්කම් සහ ඒ ආශ්‍රිතව දේශීය වෙළෙඳපොළ තත්ත්වයන්ට ඇති වූ බලපෑම් ඇතුළු ගෝලීය වර්ධනයන් සම්බන්ධයෙන් පැවති ඉහළ අවිනිශ්චිතතාවය ඒ සඳහා හේතු විය. දිගුකාලීනව පහළ හා ස්ථාවර මිලදී ගැනීමේ හා විකිණීමේ මිල ගණන් අතර පරතරයක් පවත්වා ගැනීම සඳහා, අපනයන ආදායම්, සංචාරක ඉපැයීම්, විදේශ රැකියා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා ලැබෙන ප්‍රාග්ධන ගලාඒම් ඇතුළුව විදේශ විනිමය ලැබීම් ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය වේ. එමගින් ගනුදෙනු පිරිවැය අවම මට්ටමක පවත්වා ගැනීම තුළින් වෙළෙඳපොළ සහභාගිවන්නන්ගේ විශ්වාසයද තවදුරටත් ශක්තිමත් කිරීමට ද හැකි වනු ඇත. තවද, එවැනි තත්ත්වයක් විදේශ විනිමය වෙළෙඳපොළේ කටයුතු සුමටව සිදු කිරීමට සහ විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට පහසුකම් සැලසීම සඳහා වැදගත් වන අතර, අවසානයේ එය සමස්ත මූල්‍ය පද්ධති ස්ථායීතාවට ද දායක වේ.

2026 වසරේ පළමු මාස අට තුළ දී සමස්ත අන්තර්බැංකු විදේශ විනිමය ගනුදෙනු පරිමාව පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සුළු වශයෙන් පහත වැටුණි. පවතින අවිනිශ්චිතතා මධ්‍යයේ වෙළෙඳපොළ ක්‍රියාකාරකම් මන්දගාමී වීම පිළිබිඹු කරමින් 2026 වසරේ මාර්තු සහ මැයි අතර කාලය තුළ සමස්ත අන්තර්බැංකු විදේශ විනිමය වෙළෙඳපොළ ගනුදෙනු පරිමාව පහළ යන ලදී. කෙසේ වුවද, ඉන් අනතුරුව ගනුදෙනු පරිමාවන් යථා තත්ත්වයට පත් වූ අතර එය 2026 වසරේ ජූලි මාසයේ දී එක්සත් ජනපද ඩොලර් මිලියන 1,594.5ක් දක්වා ඉහළ ගොස්, 2026 වසරේ මෙතෙක් වාර්තා වූ ඉහළම මාසික විදේශ විනිමය ගනුදෙනු පරිමාව වාර්තා කළේය. ඉන් අනතුරුව, 2026 අගෝස්තු මාසයේදී එය එක්සත් ජනපද ඩොලර් මිලියන 1,563.4ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය. 2025 වසරේ දී වාර්තා වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 1,465.0 ක මාසික සාමාන්‍යයට සාපේක්ෂව 2026 වසරේ පළමු මාස අට තුළ දී අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළෙහි මාසික සාමාන්‍යය ගනුදෙනු පරිමාව එක්සත් ජනපද ඩොලර් මිලියන 1,355.9ක් විය. සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී ඉදිරි පදනම මත (forward) වෙළෙඳපොළ ගනුදෙනු සමස්ත ගනුදෙනු පරිමාවෙන් විශාලතම කොටස නියෝජනය කළ අතර, එය සමස්ත ගනුදෙනු සඳහා 38%ක දායකත්වයක් ලබා දුන්නේය. මුදල් පදනම මත ගනුදෙනු (cash) සහ එතැන් පදනම මත ගනුදෙනු (spot) පිළිවෙළින් 30%ක් සහ 21%ක් විය. ඉදිරි පදනම මත ගනුදෙනු වෙළෙඳපොළ තුළ, සිදු කරන ලද ගනුදෙනු අතරින් බහුතරයක් සතියට වඩා වැඩි සහ මාසයට වඩා අඩු කාලසීමාවන් සඳහා වූ අතර, එමගින් කෙටි කාලීන අවදානම් ආවරණය (hedging) සඳහා වූ වෙළෙඳපොළ කැමැත්ත පෙන්නුම් කරයි. ඉදිරි ගිවිසුම් ක්‍රියාකාරකම් මගින් ව්‍යාපාර සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ අවදානම් කළමනාකරණය කර ගැනීම සඳහා

රූප සටහන 2.22


ගැනුම්-විකුණුම් අනුපාත අතර පරතරය (ඒ. ජ. ඩොලරය/ ශ්‍රී ලංකා රුපියල්)



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව


රූප සටහන 2.23

අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 2.24 **එක් මාසයක් සඳහා ඉදිරි විනිමය අධිමිල**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

සහාය වුව ද, වෙළෙඳපොළ තත්ත්වයන් තවදුරටත් දැඩි වුවහොත් ඉදිරි ගිවිසුම් කෙටි කාලීන කල්පිරීම් මත සංකේන්ද්‍රණය වී පැවතීම ද්‍රවශීලතා පීඩනයක් ඇති කළ හැකිය.

ගෝලීය ආතතීන් සහ දේශීය වෙළෙඳපොළ තත්ත්වයන්ට අදාළ අවිනිශ්චිතතා ඉහළ යාම මධ්‍යයේ සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී එක් මාසයක් සඳහා ඉදිරි විනිමය අධිමිල (one-month forward premium) තාවකාලිකව තියුණු ලෙස ඉහළ යාමක් පෙන්නුම් කළේය. ඉදිරි විනිමය අධිමිල සීඝ්‍ර ලෙස ඉහළ යාම මගින් රුපියල කෙටි කාලීනව අවප්‍රමාණය වීමේ පීඩනයන් පිළිබඳ වෙළෙඳපොළ අපේක්ෂාවන් සහ විනිමය අනුපාතික අවදානමෙන් ආරක්ෂා වීමට වෙළෙඳපොළ සහභාගිවන්නන් අතර ඇති ඉහළ පෙළඹීම පෙන්නුම් විය. මෙම ප්‍රවණතා කෙරෙහි තීව්‍ර වූ භූදේශපාලනික ආතතීන්, ගෝලීය බලශක්ති

රූප සටහන 2.25 **දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම් සහ දළ නිල විදේශ විනිමය සංචිත**



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව


මිලෙහි අස්ථාවරත්වය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ අවිනිශ්චිතතා බලපාන ලදී. කෙසේ වුවද, එක් මාසයක් සඳහා ඉදිරි විනිමය අධිමිල පසුව මධ්‍යස්ථ වීම මගින්, අවිනිශ්චිතතා ලිහිල් වීම සහ මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් වෙළෙඳපොළ විශ්වාසය සහ විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වයන්ගේ වැඩිදියුණු වීම පෙන්නුම් කරයි.

සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ මහ බැංකුව ශුද්ධ ගැනුම්කරුවකු ලෙස කටයුතු කළේය. කෙසේ වුවද, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ පීඩනයන් ඉහළ යාම මධ්‍යයේ, විනිමය අනුපාතිකයේ ඉහළ විචලනයන් පාලනය කිරීමට සහ අත්‍යවශ්‍ය බලශක්ති ආශ්‍රිත ආනයන සඳහා පහසුකම් සැලසීමට මහ බැංකුව 2026 වසරේ මාර්තු මාසයේ සිට වෙළෙඳපොළට විදේශ විනිමය සැපයූ අතර, එමගින් මහ බැංකුව ගනුදෙනු දින පදනම මත 2026 වසරේ අප්‍රේල් සහ මැයි මාසවල දී ශුද්ධ විකුණුම්කරුවෙකු බවට පත්විය. 2026 වසරේ මැයි මස අග භාගයේ සිට වෙළෙඳපොළ තත්ත්වයන් වැඩිදියුණු වීමත් සමඟ මහ බැංකුව විදේශ විනිමය ශුද්ධ පදනමින් මිල දී ගැනීම් වාර්තා කළේය. 2026 වසරේ පළමු මාස අට තුළ, මහ බැංකුව ගනුදෙනු දින පදනම මත එක්සත් ජනපද ඩොලර් මිලියන 1,517.4 ක ශුද්ධ මිල දී ගැනීම් වාර්තා කළේය.

2.4 දේශීය මුදල් වෙළෙඳපොළ

2026 වසරේ පළමු මාස අට තුළ දී දේශීය මුදල් වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ඉහළ මට්ටමක පැවතුණි. ප්‍රතිමිලදී ගැනුම් (repo) සහ ඒක්ෂණ මුදල් (call money) යන වෙළෙඳපොළ ද්විත්වයේම ක්‍රියාකාරකම් ඉහළ යාම හේතුවෙන් සමස්ත ගනුදෙනු පරිමාව 2026 වසරේ මැයි මාසයේ දී සමස්ත මාසික ගනුදෙනු පරිමාව මෙතෙක් වාර්තා වූ ඉහළම මට්ටමකට ළඟා විය. මුදල් වෙළෙඳපොළ ක්‍රියාකාරකම්වල වැඩි කොටසක් අඛණ්ඩව ප්‍රතිමිලදී ගැනුම් වෙළෙඳපොළ තුළ සිදු වූ අතර, 2025 වසරේ පැවති මාසික සාමාන්‍ය රුපියල් බිලියන 923.4 සිට 2026 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලයේ දී මාසික ගනුදෙනු පරිමාවන්ගේ සාමාන්‍යය රුපියල් බිලියන 1,468.5ක් දක්වා ඉහළ ගියේය. ඊට සමානව, මාසික ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ පිරිවැටුම 2025 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 480.2ක මාසික සාමාන්‍යය සිට 2026 වසරේ පළමු මාස අට තුළ දී මාසික සාමාන්‍යය රුපියල් බිලියන 805.2ක් දක්වා කැපී පෙනෙන අයුරින් ඉහළ ගියේය. ඇපකර රහිත ණයවලට (clean lending) සාපේක්ෂව ඇපකර සහිත ණයදීම් (securitised lending) සඳහා වෙළෙඳපොළ සහභාගීවන්නන්ගේ සක්‍රීය දායකත්වය පිළිබිඹු කරමින් මාසික ප්‍රතිමිලදී ගැනුම් වෙළෙඳපොළ පරිමාවන් මාසික ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ පරිමාවන්ට වඩා අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතුණි. සහභාගිවන්නන්ගේ ක්‍රියාකාරකම් වල ස්වරූපය මූල්‍ය ආයතන අතර ද්‍රවශීලතා මට්ටම්වල වෙනස්කම් පවතින බව පෙන්නුම් කරයි. ශුද්ධ පදනම මත, 2026 වසරේ පළමු


රූප සටහන 2.26 **දේශීය මුදල් වෙළඳපොළ ගනුදෙනු පරිමාව**



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

මාස අට තුළ දේශීය පෞද්ගලික බැංකු සහ ස්වාධීන ප්‍රාථමික අලෙවිකරුවන් ප්‍රතිමිලදී ගැනුම් වෙළෙඳපොළෙහි ශුද්ධ ණය ගැනුම්කරුවන් ලෙස කටයුතු කළ අතර, රාජ්‍ය බැංකු අඛණ්ඩව ණය ලබාදෙන්නන් ලෙස කටයුතු කළහ. එම කාල සීමාවේ දී ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ තුළ, රාජ්‍ය බැංකු සහ විදේශීය බැංකු අඛණ්ඩව ශුද්ධ ණය ලබාදෙන්නන් ලෙස කටයුතු කළ අතර, පෞද්ගලික බැංකු ශුද්ධ ණයගැනුම්කරුවන් ලෙස කටයුතු කළේය. සමාලෝචනයට ගැනෙන කාල පරිච්ඡේදයේ දී ද්‍රවශීලතා සපයන්නන් ලෙස රාජ්‍ය බැංකුවල භූමිකාව, මුදල් වෙළෙඳපොළ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා උපකාරී විය. කෙසේ වුවද, රාජ්‍ය බැංකු අතර ද්‍රවශීලතා තත්ත්ව සහ රජයේ මූල්‍යකරණ මෙහෙයුම් අතර පවතින සම්බන්ධතාව සැලකිල්ලට ගත් විට, පද්ධතිමය ද්‍රවශීලතා අතරමැදිකරණය රාජ්‍ය බැංකුවලට සංකේන්ද්‍රණය වී පැවතීම අවදානම් සහගත තත්ත්වයන් ඇති කළ හැකිය.

රූප සටහන 2.28 **ප්‍රතිමිලදී ගැනුම් වෙළඳපොළ සහභාගීවන්නන්**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

ඒ අනුව, රජයේ මූල්‍යකරණ අවශ්‍යතාවල අනපේක්ෂිත වැඩිවීම් රාජ්‍ය බැංකුවල ද්‍රවශීලතා මට්ටම් කෙරෙහි බලපෑ හැකි අතර, එය සමස්ත මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතා තත්ත්වයන් කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය.


වෙනස්වන ද්‍රවශීලතා තත්ත්වයන් මධ්‍යයේ, ඇතැම් තාවකාලික අපගමනයන් පැවතිය ද එක්දින මුදල් වෙළෙඳපොළ අනුපාතිකයන් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට (OPR) අනුකූල ව පැවතුණි. 2026 වසරේ පළමු මාස අට තුළ දී බරිත සාමාන්‍ය එක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) සහ බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය (AWRR) බොහෝ දුරට එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට අනුකූල විය. කෙසේ වෙතත්, 2026 මැයි මස අවසානයේ සිදු කළ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීමෙන් අනතුරුව, විශේෂයෙන් 2026 ජූනි සිට අගෝස්තු දක්වා කාලය තුළ, පොලී අනුපාතික දෙකම ඉහළ යාමේ පීඩනයකට ලක් විය.

රූප සටහන 2.27 **ඒක්ෂණ මුදල් වෙළඳපොළ සහභාගීවන්නන්**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 2.29 **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)**



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව


රූප සටහන 2.30 **බරිත සාමාන්‍ය ප්‍රති මිල දී ගැනුම් අනුපාතිකය (AWRR)**



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

වසරේ මුල් භාගයේ දී, දේශීය මුදල් වෙළෙඳපොළ තුළ පැවති සැලකිය යුතු අතිරික්ත ද්‍රවශීලතාව හේතුවෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට වඩා පහළ අගයකට පත්විය. මෙම සන්දර්භය තුළ, අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමට සහ කෙටි කාලීන වෙළෙඳපොළ අනුපාතික, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ අනුකූල වීමට පහසුකම් සැලසීම සඳහා 2026 වසරේ පෙබරවාරි මස මැද සිට මහ බැංකුව විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් (OMO) නැවතත් ආරම්භ කළේය. අතිරික්ත ද්‍රවශීලතාව අඩු වීමත් සමඟ 2026 වසරේ අප්‍රේල් මාසයේ දී විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් තවකාලිකව අත්හිටුවන ලදී. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, විදේශ ණය ආපසු ගෙවීම සහ උත්සව සමයේ දී මුදල් ආපසු ලබාගැනීම් ඉහළ යාම වන අතර, ඉන් අනතුරුව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ක්‍රමයෙන් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය දෙසට විතැන් විය. කෙසේ වුවද, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ පීඩනයන් නැවත ඇතිවීම සැලකිල්ලට ගෙන, 2026 වසරේ අප්‍රේල් මස අග භාගයේ සිට විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් යළි ආරම්භ කරන ලදී. පසුව දේශීය මුදල් වෙළෙඳපොළේ ද්‍රවශීලතාව මධ්‍යස්ථ වීම සහ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීම හේතුවෙන් කෙටි කාලීන වෙළෙඳපොළ පොලී අනුපාතික මත ඉහළ යාමේ පිඩනයක් ඇති විය. ද්‍රවශීලතා තත්ත්වයන් මධ්‍යස්ථ වීම 2026 වසරේ දෙවන කාර්තුව තුළ ද අඛණ්ඩව පැවති අතර, එය කෙටි කාලීන පොලී අනුපාතික මත ඉහළ පිඩනයක් ඇති කළේය. ඒ හේතුවෙන් 2026 වසරේ මැයි මස මැද සිට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට වඩා ඉහළ යාමට හේතු විය. 2026 වසරේ මැයි මාසයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 100කින් ඉහළ දැමීමෙන් පසුව 2026 වසරේ අගෝස්තු මස අවසානය වනවිට, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය පිළිවෙළින් 8.85%ක් සහ 8.91%ක් ලෙස පැවති අතර එම අනුපාත දෙකම 8.75%ක් ලෙස පවතින එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට වඩා තරමක් ඉහළ මට්ටමක පැවතුණි. ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ඉහළ නැංවීමෙන් අනතුරුව මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළට ගැළපීම මගින් මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය ඵලදායී ලෙස සිදු වූ බව පෙන්නුම් කළ අතර, එම අනුපාතික එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ සමීපව අනුකූලව පැවතුණි. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ, ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි සහ ප්‍රතිමිලදී ගැනුම් වෙළෙඳපොළෙහි දෛනික අවම සහ උපරිම අනුපාතික අතර පරතරය පටු මට්ටමක පැවති අතර, එමගින් වෙළෙඳපොළේ කාර්යක්ෂම වෙළෙඳ කටයුතු පිළිබිඹු විය. මෙම වර්ධනයන් හේතුවෙන්, 2026 වසරේ පළමු මාස අට තුළ දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය අඛණ්ඩව අඩු විචලනයන් පෙන්නුම් කරන ලදී.

රූප සටහන 2.31 **මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතා ව්‍යාප්තිය**



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

2026 වසරේ පළමු මාස අට පුරා දේශීය මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව අතිරික්ත මට්ටමක පැවති අතර, එම කාලසීමාව තුළ අතිරික්තයේ ප්‍රමාණය සැලකිය යුතු ලෙස විචලනය විය. ප්‍රධාන වශයෙන් මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම, විදේශ විනිමය හුවමාරු ගනුදෙනු (foreign exchange swaps) සහ මහ බැංකු ලාභ රජය වෙත පැවරීම හේතු කරගෙන 2026 වසරේ මාර්තු මස මුල දී ද්‍රවශීලතා අතිරික්තය රුපියල් බිලියන 403.8ක් දක්වා මෑතකාලීන ව වාර්තා වූ ඉහළම මට්ටම වෙත ළඟා විය. ඉන් අනතුරුව, 2026 වසරේ අප්‍රේල් සිට ජූනි දක්වා කාලයේ දී ද්‍රවශීලතා අතිරික්තයේ කැපී පෙනෙන පහත වැටීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා මූලික වශයෙන් සංචිත භාවිත කරමින් රජය විසින් ශුද්ධ විදේශ ණය ආපසු ගෙවීම, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි විදේශ විනිමය විකිණීම සහ මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා කූපන් ගෙවීම (coupon payment) හේතු විය. අතිරික්ත ද්‍රවශීලතාව 2025 වසර

අවසානයේ පැවති රුපියල් බිලියන 175.2ට සාපේක්ෂව 2026 වසරේ අගෝස්තු මස අවසානය වනවිට රුපියල් බිලියන 132.3ක් විය. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවයේ දක්නට ලැබුණු මෙම සැලකිය යුතු උච්චාවචනයන් මගින් ප්‍රධාන වශයෙන් දේශීය මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතා තත්ත්වයන් කෙරෙහි මහ බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් සහ රජය ආශ්‍රිත මුදල් ප්‍රවාහයන්ගේ වැදගත්කම පෙන්නුම් කරයි.

යම් වැඩිදියුණුවක් පැවතිය ද, දේශීය මුදල් වෙළෙඳපොළෙහි සහභාගීත්ව ආයතන අතර ද්‍රවශීලතාව බෙදී යාම අසමාන වීම 2026 වසරේ දී ද අඛණ්ඩව පැවතුණි. විදේශීය බැංකු අඛණ්ඩව අතිරික්ත ද්‍රවශීලතාවක් පවත්වාගෙන ගිය අතර, රජයට අදාළ ගනුදෙනු හේතුවෙන් රාජ්‍ය බැංකුවල අතිරික්ත ද්‍රවශීලතා මට්ටම තරමක් පහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයේ ණය ප්‍රසාරණය හේතුවෙන් දේශීය පෞද්ගලික බැංකු සාපේක්ෂව වැඩි වශයෙන් ද්‍රවශීලතා තත්ත්වයන්ට මුහුණ දෙන ලදී. සහභාගීත්ව ආයතන අතර ද්‍රවශීලතාව වෙනස් ලෙස ව්‍යාප්ත වීම අඛණ්ඩව පැවතීම හේතුවෙන් වෙළෙඳපොළ අසමානතා ඉහළ යා හැකි අතර, අන්තර් බැංකු වෙළෙඳපොළ තුළ ද්‍රවශීලතාව කාර්යක්ෂම ලෙස නැවත බෙදී යාම සීමා විය හැකිය. මෙමගින් කෙටි කාලීන වෙළෙඳපොළ පොලී අනුපාතික, ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ අනුකූල ව පැවතීමට බලපෑම් ඇතිවිය හැකි අතර, ඒ හේතුවෙන් මුදල් ප්‍රතිපත්තියේ ඵලදායී සම්ප්‍රේෂණය කෙරෙහි බලපෑම් කළ හැකිය.


2.5 ගෙවීම් සහ පියවීම් යටිතල පහසුකම්

2026 වසරේ පළමු භාගය තුළ ගෙවීම් සහ පියවීම් පද්ධති මෙහෙයුම්මය වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. සහභාගීත්ව ආයතන අතර ඉහළ වටිනාකමකින් යුත් සහ කාල සංවේදී ගනුදෙනු සුමට ව, ආරක්ෂිත ව සහ කාලෝචිතව පියවීම සඳහා පහසුකම් සලසන තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS) හරහා රුපියල් ට්‍රිලියන 263ක වටිනාකමකින් යුත් ගනුදෙනු 318,231ක් පියවා ඇත. එය 2025 වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී ගනුදෙනු පරිමාව සහ වටිනාකම අනුව පිළිවෙළින් 10.4%ක සහ 31.5%ක ඉහළ යාමකි. සුළු පරිමාණ ගෙවීම් පද්ධති ද 2026 වසරේ පළමු භාගය පුරා අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරන ලදී. විශේෂයෙන්, රටේ වේගවත් ගෙවීම් පද්ධතිය වන විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) මගින්, අන්තර්බැංකු අරමුදල් ක්ෂණික පැවරීම් සඳහා අඛණ්ඩව පහසුකම් සැලසූ අතර ප්‍රධාන ඩිජිටල් ගෙවීම් මාධ්‍යයක් ලෙස පැවතුණි. විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා සිදු කරන ලද ගනුදෙනුවල වටිනාකම 2025 වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී 31.9%කින් ඉහළ ගිය අතර, ගිණුම් අතර ක්ෂණික ව මුදල් හුවමාරු කිරීම සඳහා වන ඉහළ කැමැත්ත එමගින් පිළිබිඹු කරයි. මූල්‍ය පද්ධති ස්ථායීතා දෘෂ්ටි කෝණයකින් බැලූ කළ, ඩිජිටල් ගෙවීම් මාධ්‍ය මත රඳා පැවතීම ඉහළ යාම සහ පද්ධතිමය වශයෙන් වැදගත් වන ගෙවීම් යටිතල පහසුකම් හරහා සිදු කළ ගනුදෙනුවල පරිමාව සහ වටිනාකම ඉහළ යාම තුළ මෙහෙයුම් බාධා, සයිබර් අවදානම් සහ තාක්ෂණික බිඳ වැටීම්වලින් බලපෑම් එල්ල විය හැකි අතර, මෙමගින් ශක්තිමත් මෙහෙයුම්මය ඔරොත්තු දීමේ හැකියාව, සයිබර් ආරක්ෂණ ක්‍රියාමාර්ග, හදිසි අවස්ථා සඳහා වන විකල්ප ක්‍රියාමාර්ග ශක්තිමත් ව පවත්වාගෙන යාමේ වැදගත්කම අවධාරණය කෙරේ.

සලකා බලනු ලබන කාල සීමාව තුළ, විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) සහ ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS) සම්බන්ධ ණය අවදානම සාර්ථක ව කළමනාකරණ සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීමත් සමඟ සුළු පරිමාණ ගෙවීම් යටිතල පහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් විය. ඒ අනුව, 2026 වසරේ ජූනි 01 වනදා සිට ක්‍රියාත්මක වන පරිදි, විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සහ ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සහභාගිවන්නන්[8] එම යාන්ත්‍රණ ද්විත්වයටම අදාළ වන ශුද්ධ හර සීමාවට (NDC) මෙන්ම තත්කාලීන දළ පියවීම් පද්ධතියට අදාළ පියවීම් ඇපකර මුදලට (SGA) අනුකූල විය යුතුය. තත්කාලීන දළ පියවීම් පද්ධතියේ (RTGS) සහභාගිවන්නකු විසින් එම පියවීම් පද්ධතියේ පියවීම් ඇපකර අරමුදල් ගිණුමේ (SGFA) පවත්වාගෙන යන පියවීම් ඇපකර මුදල මගින් ඔවුන්ගේ ශුද්ධ හර සීමාව තීරණය කරන අතර, ශුද්ධ හර සීමාව මගින් තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගිවන්නකුට පියවීම් චක්‍ර දෙකක් අතර කාලයේ දී මුහුණ දීමට සිදුවිය හැකි උපරිම ණය නිරාවරණය ශුද්ධ හර සීමාවේ වටිනාකමට සීමා කරයි. මෙම යාන්ත්‍රණය මගින් පියවීම් ආශ්‍රිත ණය

8 CEFTS සහ CAS සහභාගිවන්නන් තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගිවන්නන් වේ.

රූප සටහන 2.32 ඉහළ වටිනාකම් සහිත ගෙවීම් පද්ධතිය - තත්කාලීන දළ පියවුම් පද්ධතියේ ගනුදෙනුවල පරිමාව



මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

විශේෂ සටහන 2

පද්ධතිමය අවදානම් පිළිබඳ සමීක්ෂණය (SRS)

මූල්‍ය ආයතනවල අවදානම් කළමනාකරණ කටයුතුවල නියැලී සිටින විධායක නිලධාරීන්ගේ අදහස් මත පදනම් ව, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියට ඇති අවදානම් තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2017 වසරේ සිට අර්ධ වාර්ෂික ව පද්ධතිමය අවදානම් පිළිබඳ සමීක්ෂණය පවත්වනු ලබයි.[1] පද්ධතිමය අවදානම් සමීක්ෂණය යනු ඉදිරි දැක්මක් සහිත සමීක්ෂණයක් වන අතර, මෙම විශේෂ සටහන මගින් 2026 වසරට අදාළ මූලික සොයාගැනීම්[2] සාරාංශගත කරයි. එහි දී මෙම වසරේ දෙවන භාගය වෙනුවෙන් පවත්වන ලද අවසන් සමීක්ෂණයේ[3] ප්‍රතිඵල වෙත විශේෂ අවධානය යොමු කර ඇත.

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව කෙරෙහි පවතින විශ්වාසය

සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් තුළ මූල්‍ය පද්ධතිය කෙරෙහි පවතින විශ්වාසය ශුද්ධ ප්‍රතිශතක ශේෂය[4] මගින් මනිනු ලබන අතර, සමස්තයක් ලෙස එය 2026 වසරේ පළමු භාගයේ දී පහළ ගොස් තිබුණ ද, 2026 වසරේ දෙවන භාගයේ දී සුළු වශයෙන් වැඩිදියුණු විය. සමස්තයක් ලෙස, කෙටි කාලීන විශ්වාසය 2025 වසරට සාපේක්ෂ ව 2026 වසරේ දී පහළ මට්ටමක පැවතිය ද, එය තවදුරටත් ධනාත්මක මට්ටමක පැවතුණි. මැදි කාලීන විශ්වාසය ද සමීක්ෂණ වට දෙකෙහි දී ම බොහෝ දුරට සමාන රටාවක් පෙන්නුම් කරන ලදී. සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් "මධ්‍යස්ථ ලෙස විශ්වසනීය" ප්‍රතිචාරය ලබා දී තිබුණු අතර, එමගින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පිළිබඳ ව ඔවුන් තුළ පවතින විශ්වාසය මධ්‍යස්ථ මට්ටමක පවතින බව පෙන්නුම් විය.

මූල්‍ය පද්ධතිය කෙරෙහි ඉහළ බලපෑමක් ඇති කළ හැකි ඍණාත්මක සිදුවීමක් හට ගැනීම පිළිබඳ අපේක්ෂාව

කෙටි කාලීන සහ මැදි කාලීන කාල පරාසයන් තුළ මූල්‍ය පද්ධතිය කෙරෙහි ඉහළ බලපෑමක් ඇති කළ හැකි ඍණාත්මක සිදුවීමක් හට ගැනීමේ සම්භාවිතාව තක්සේරු කිරීමට මෙම සමීක්ෂණය මගින් ඊට සහභාගී වූවන්ගෙන් ප්‍රතිචාර රැස් කරන ලදී. ශුද්ධ ප්‍රතිශතක ශේෂය[5] මගින් පිළිබිඹු වන පරිදි, කෙටි කාලීනව එවැනි සිදුවීමක් හට ගැනීමේ සම්භාවිතය ඉහළ ගොස් ඇති අතර, එමගින් පෙර වසරවල නිරීක්ෂණය වූ පහළ යාමේ ප්‍රවණතාව වෙනස් වී ඇත. ඊට සාපේක්ෂව, මූල්‍ය පද්ධතිය කෙරෙහි මධ්‍ය කාලයේ දී ඉහළ බලපෑමක් ඇති කළ හැකි ඍණාත්මක සිදුවීමක් හට ගැනීමේ සම්භාවිතාව 2026 වසරේ පළමු භාගයේ දී සුළු වශයෙන් ඉහළ ගොස් 2026 වසරේ දෙවන භාගයේ දී නැවත සුළු වශයෙන් පහළ ගොස් ඇත. එමගින් මැදි කාලීන අවදානම් පිළිබඳ ව ප්‍රතිචාරකයන් තුළ වඩාත් හිතකර තක්සේරුවක් පවතින බව පෙන්නුම් කරයි.

මූල්‍ය පද්ධතියට ඇති අවදානම්වල මූලාශ්‍ර

සමීක්ෂණයට ලද ප්‍රතිචාර අනුව, 2026 වසරේ දෙවන භාගයේ දී මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව කෙරෙහි ඇති විය හැකි අවදානම් සැලකිල්ලට ගත් විට, ගෝලීය සාර්ව ආර්ථික අවදානම් වඩාත් තීරණාත්මක අවදානම් කාණ්ඩය ලෙස හඳුනාගෙන ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් භූ දේශපාලනික ආතතීන් හා ඒ ආශ්‍රිත වක්‍ර බලපෑම් පිළිබඳ ව පවතින අවිනිශ්චිතතා හේතු වී ඇත. ඊට අමතරව 'පොදු දේශීය සාර්ව ආර්ථික අවදානම්' ද තරමක් ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර, මූල්‍ය යටිතල පහසුකම් හා සම්බන්ධ අවදානම් මූල්‍ය පද්ධතිය කෙරෙහි ඇති කළ හැකි බලපෑම් පිළිබඳ ව, ප්‍රතිචාර දැක්වූවන්ගේ අවධානය 2026 වසරේ පළමු භාගයට සාපේක්ෂ ව 2026 වසරේ දෙවන භාගයේ දී සුළු වශයෙන් ඉහළ ගොස් තිබුණි. එමගින් මෑත කාලීන සමීක්ෂණවල දී එම අවදානම ඉහළ යන ප්‍රවණතාවක්

1 මෙම සමීක්ෂණයට සහභාගී වූවන්ගේ නියැළුම් රාමුව බලපතලාභී බැංකු, මුදල් සමාගම්, ප්‍රාථමික වෙළෙඳුන්, රක්ෂණ සමාගම්, ඒකක භාර කළමනාකරණ සමාගම්, කොටස් නැරඹිකාර සමාගම්, බලපතලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්, ශ්‍රේණිගත කිරීමේ ආයතන, මූල්‍ය යටිතල පහසුකම් සපයන්නන් සහ ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා සපයන්නන් ඇතුළු විවිධ ආයතන නියෝජනය කරයි.

2 මෙම සටහනේ සාකච්ඡා කර ඇති සොයාගැනීම් සමීක්ෂණ ප්‍රතිචාර මත පදනම් වන අතර, එමගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මතය ප්‍රකාශ නොවේ.


3 2026 වසරේ දෙවන භාගයේ සිට, සමීක්ෂණය සම්පූර්ණයෙන්ම මාර්ගගත සමීක්ෂණයක් බවට පත් වූ අතර, එමගින් සමීක්ෂණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත් ප්‍රතිචාරවල විශ්වසනීයත්වය සහ අඛණ්ඩතාවය තහවුරු කිරීමටත් සහාය වී ඇත.

4 සමස්ත විශ්වාසයේ මට්ටම ශුද්ධ ප්‍රතිශතක ශේෂය මගින් මනිනු ලැබේ. 'පූර්ණ ලෙස විශ්වාසය සඳහා 1, ඉතා විශ්වාසය සඳහා 0.5, මධ්‍යස්ථ ලෙස විශ්වාසය සඳහා 0, අඩු විශ්වාසය සඳහා -0.5 සහ විශ්වාසය නොමැති සඳහා -1 ලෙස බර තැබීම මගින් ශුද්ධ ප්‍රතිශතක ශේෂය ගණනය කරනු ලැබේ.

5 මෙම සන්දර්භය තුළ, 'ඉතා ඉහළ' සඳහා 1, 'ඉහළ' සඳහා 0.5, 'මධ්‍යස්ථ' සඳහා 0, 'පහළ' සඳහා -0.5 සහ 'ඉතා පහළ' සඳහා -1 ලෙස බර තැබීම මගින් ශුද්ධ ප්‍රතිශතක ශේෂය ගණනය කරනු ලැබේ.

රූප සටහන 1


මූල්‍ය පද්ධතිය කෙරෙහි පවතින සමස්ත විශ්වාසය පිළිබඳ ආකල්ප



H1 : වසරේ පළමු භාගය H2 : වසරේ දෙවන භාගය


මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 2 මූල්‍ය පද්ධතිය කෙරෙහි ඉහළ බලපෑමක් ඇති කළ හැකි සෘණාත්මක සිදුවීමක් හට ගැනීම පිළිබඳ අපේක්ෂාව




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3 ප්‍රධාන අවදානම් කාණ්ඩවල ගතිකත්වය



සටහන: සමීක්ෂණයට ප්‍රතිචාර දැක් වූ ප්‍රතිචාරකයන් විසින් හඳුනාගනු ලැබූ උප අවදානම් පහම එක් එක් ප්‍රධාන අවදානම් කාණ්ඩය සඳහා වූ සමස්ත අගය ගණනය කිරීමේ දී සලකා බලන ලදී. මීට පෙර පැවති සමීක්ෂණවල 'දේශීය සාර්ව ආර්ථික අවදානම්' යන අවදානම් කාණ්ඩය, 2025 වසරේ දෙවන භාගයේ පවත්වන ලද සමීක්ෂණයේ සිට රාජ්‍ය මූල්‍ය හා ස්වෛරීත්ව අවදානම් සහ පොදු දේශීය සාර්ව ආර්ථික අවදානම් ලෙස කාණ්ඩ දෙකකට වෙන් කරන ලදී.




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පෙන්නුම් කරන ලදී. මේ අතර, අනෙකුත් අවදානම් කාණ්ඩ මූල්‍ය පද්ධතිය කෙරෙහි ඇති කළ හැකි බලපෑම පිළිබඳ තක්සේරුව පහළ ගොස් ඇත.

සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් විසින් 2026 වසරේ දෙවන භාගයේ දී මූල්‍ය පද්ධතියට විශාලතම බලපෑමක් එල්ල කළ හැකි වඩාත්ම තීරණාත්මක උප අවදානම ලෙස භූදේශපාලනික ආතතීන් සහ අනෙකුත් රටවලින් ඇති වන වක්‍ර අවදානම් හඳුනාගෙන ඇත. ඊට අමතරව සයිබර් ප්‍රහාර සහ වංචනික ලෙස පෞද්ගලික තොරතුරු සොරා ගැනීම් සහ උද්ධමනය යන අවදානම් සඳහා ප්‍රතිචාර ද ඉහළ මට්ටමක පැවතුණි. භූදේශපාලනික සහ උද්ධමනයට අදාළ අවදානම්වල ප්‍රබල බව ඉහළ යාම මගින්, විශේෂයෙන් මැදපෙරදිග කලාපයේ තීව්‍ර වූ භූදේශපාලනික ආතතීන් සහ ඉන් දේශීය ආර්ථිකය වෙත එල්ල විය හැකි බලපෑම් පිළිබඳ ව සමීක්ෂණ කාල සීමාවේ දී පැවති අවධානය පිළිබිඹු කරන බවට සැලකිය හැකිය. සයිබර් ප්‍රහාර සහ වංචනික ලෙස පෞද්ගලික තොරතුරු සොරා ගැනීම් සම්බන්ධ අවදානම් 2025 වසරේ සිට පවත්වන ලද සියලුම සමීක්ෂණවල දී වැඩි වශයෙන් සඳහන් කෙරුණු උප අවදානම් කාණ්ඩ අතර අඛණ්ඩව පැවතුණි. තවද, බැංකු, මුදල් සමාගම් සහ රක්ෂණ සමාගම් ඇතුළු මූල්‍ය පද්ධතියේ

රූප සටහන 4 ප්‍රතිචාරකරයන් විසින් වැඩිම වශයෙන් සඳහන් කළ උප අවදානම්



සටහන: එක් එක් උප අංශය සඳහා අදාළ ප්‍රධාන අවදානම් කාණ්ඩය වාත්තයේ වර්ණය මගින් පෙන්නුම් කරයි

ගෝලීය සාර්ව ආර්ථික අවදානම්
රාජ්‍ය මූල්‍ය සහ ස්වෛරීත්ව අවදානම්
පොදු දේශීය සාර්ව ආර්ථික අවදානම්
මූල්‍ය යටිතල පහසුකම්වලට අදාළ අවදානම්
මූල්‍ය වෙළඳ පොළ අවදානම්
මූල්‍ය ආයතන වලට අදාළ අවදානම්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


සියලුම අංශවල ප්‍රතිචාර දක්වන්නන්, ආයතනික මට්ටමින් කළමනාකරණය කිරීමේ දී වඩාත් අභියෝගාත්මක උප අවදානම ලෙසද භූදේශපාලනික ආතතීන් සහ අනෙකුත් රටවලින් ඇති වන අවදානම් අඛණ්ඩව හඳුනාගෙන ඇත.

නිගමනය

මෑතක දී පවත්වන ලද පද්ධතිමය අවදානම් සමීක්ෂණයේ සොයාගැනීම්වලට අනුව, 2026 වසරේ දී සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් තුළ මූල්‍ය පද්ධතිය කෙරෙහි වූ සමස්ත විශ්වාසයෙහි උච්චාවචනයන් දක්නට ලැබුණු අතර, ප්‍රධාන වශයෙන් ගෝලීය අවදානම් ඒ සඳහා හේතු වී ඇත. 2026 වසරේ පළමු භාගයට සාපේක්ෂව, 2026 වසරේ දෙවන භාගයේ දී සමස්ත විශ්වාසය සුළු වැඩිදියුණු වීමක් වාර්තා කළ අතර, එමගින් මූල්‍ය පද්ධතිය සම්බන්ධයෙන් ප්‍රතිචාරකයන්ගේ මධ්‍යස්ථ වශයෙන් ස්ථාවර ඉදිරි දැක්මක් පවතින බව පෙන්නුම් කරයි. කෙටි කාලීනව මූල්‍ය පද්ධතිය කෙරෙහි ඉහළ බලපෑමක් සිදුකළ හැකි අහිතකර සිදුවීම් හට ගැනීමේ සම්භාවිතාව පිළිබඳ අවධානය ඉහළ ගොස් ඇති අතර, ඒ අනුව මෑත කාලීන ව දක්නට ලැබුණු පහළ යාමේ ප්‍රවණතාව වෙනස් විය. ඊට ප්‍රතිවිරුද්ධව, 2026 වසරේ දෙවන භාගයේ දී මැදි කාලීන අවදානම් පිළිබඳ අපේක්ෂාවන් තරමක් ලිහිල් වූ අතර, එමගින් මැදි කාලීන අවදානම් පිළිබඳ වඩාත් හිතකර තක්සේරුවක් පෙන්නුම් කරයි. සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දැක්වූවන් විසින් මූල්‍ය පද්ධතිය කෙරෙහි බලපෑම් කළ හැකි වඩාත් සැලකිය යුතු අවදානම් මූලාශ්‍රය ලෙස ගෝලීය සාර්ව ආර්ථික අවදානම් හඳුනාගෙන ඇති අතර, භූදේශපාලනික ආතතීන් සහ අනෙකුත් රටවලින් ඇති වන වක්‍ර අවදානම් වඩාත් තීරණාත්මක උප අවදානම් කාණ්ඩය ලෙස හඳුනාගෙන ඇත. මූල්‍ය යටිතල පහසුකම් ආශ්‍රිත අවදානම්, විශේෂයෙන් සයිබර් ප්‍රහාර සහ වංචනික ලෙස පෞද්ගලික තොරතුරු සොරා ගැනීම සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන්ගේ අවධානයට ලක් වූ ප්‍රමුඛ අවදානම් අතර පැවතුණි. තවද, මූල්‍ය අංශයේ විවිධ ආයතන විසින් භූදේශපාලනික ආතතීන් සහ බාහිර අවදානම්වලින් ඇති වන වක්‍ර අවදානම් ආයතනික මට්ටමෙන් කළමනාකරණ කිරීමේ දී වඩාත් අභියෝගාත්මක අවදානම ලෙස ද හඳුනාගෙන ඇත. මෙම සොයාගැනීම් මගින්, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා අඛණ්ඩ අවධානයෙන් පසුවීම, අවදානම් කළමනාකරණ රාමු තවදුරටත් ශක්තිමත් කිරීම, සයිබර් තර්ජනවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ ගෝලීය තත්ත්වයන් වඩාත් සමීප ව නිරීක්ෂණය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.

2026 වසරේ පද්ධතිමය අවදානම් සමීක්ෂණයේ ප්‍රධාන සොයාගැනීම් ඉදිරිපත් කරන අර්ධ වාර්ෂික ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර, https://www.cbsl.gov.lk/en/publications/other-publications/systemic-risk-survey/ සබැඳිය හරහා එම ප්‍රකාශන වෙත පිවිසිය හැකිය.

රූප සටහන 2.33 **2026 වසරේ පළමු භාගය සඳහා සුළු පරිමාණ ගෙවීම් පද්ධති/උපකරණ**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

නිරාවරණයන් කළමනාකරණය කිරීම ශක්තිමත් කරන අතර, සහභාගිවන්නෙකුට තම පියවීම් වගකීම් ඉටු කිරීමට නොහැකි වීමෙන් ඇති විය හැකි අලාභයන් සම්ප්‍රේෂණය වීම පාලනය කිරීමට උපකාරී වේ. එමගින් ගෙවීම් පද්ධතිය සහ පුළුල් මූල්‍ය පද්ධතිය පුරා බාධා පැතිරීමේ අවදානම අඩු කරයි.

2026 වසරේ පළමු භාගයේ දී ඩිජිටල් ගෙවීම් සඳහා ප්‍රවේශ වීමට ඇති හැකියාව සහ ඩිජිටල් ගෙවීම් භාවිතය පුළුල් කිරීම සඳහා මහ බැංකුව විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. JustPay හරහා සිදු කළ හැකි ගනුදෙනු සඳහා වූ උපරිම සීමාව 2026 වසරේ පෙබරවාරි සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 150,000ක් දක්වා වැඩි කරන ලදී. එමෙන්ම LANKAQR හරහා පුද්ගලයාගෙන් පුද්ගලයාට ඍජුව මුදල් හුවමාරු කිරීම් (peer-to-peer - P2P) 2026 වසරේ අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි සක්‍රීය කරන ලද අතර, රුපියල් 5,000ක් හෝ ඊට අඩු LANKAQR ගනුදෙනු සඳහා වෙළෙඳුන්ගෙන් අය කරන වෙළෙඳ වට්ටම් අනුපාතය 2026 වසරේ අප්‍රේල් සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරන ලදී. තවත් ජාත්‍යන්තර ගෙවීම් ජාල ද්විත්වයක් වන WeChat Pay සහ නේපාලයේ Connect IPS, LankaPay පුද්ගලික සමාගමත් සමඟ ඒකාබද්ධ වීමත් සමඟ ශ්‍රී ලංකාවේ QR ගෙවීම් යටිතල පහසුකම්වල අන්තර් ක්‍රියාකාරීත්වය සහ ජාත්‍යන්තර ප්‍රවේශය තවදුරටත් ප්‍රසාරණය විය. ඩිජිටල් ගෙවීම් ක්‍රම බහුලව භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා සහ ඩිජිටල් ගෙවීම් නිෂ්පාදනවල ප්‍රතිලාභ සහ ආරක්ෂිත භාවිතය පිළිබඳ ව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රවර්ධනය සහ මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම ක්‍රියාමාර්ග මගින් කාර්යක්ෂමතාව, ගෙවීම් ක්‍රම සඳහා ප්‍රවේශ විමේ හැකියාව සහ මූල්‍ය අන්තර්ගතභාවය කෙරෙහි සහාය වන අතර, ආර්ථික ක්‍රියාකාරකම්වල දී අන්තර් ක්‍රියාකාරී ඩිජිටල් මාධ්‍යවල භූමිකාව පුළුල් කරයි. කෙසේ වුවද, ඩිජිටල් ගෙවීම් මාධ්‍ය මත රඳා පැවතීම ඉහළ යාම හේතුවෙන් මූල්‍ය පද්ධතිය සයිබර් තර්ජන කෙරෙහි නිරාවරණය වීම, මෙහෙයුම් බාධා, වංචා සහ තෙවන පාර්ශ්වීය යැපීම් තීව්‍ර විය හැකි අතර, එහෙයින් සයිබර් ආරක්ෂාව, මෙහෙයුම්වල ශක්තිමත් භාවය සහ හදිසි අවස්ථාවල දී භාවිත කළ හැකි විකල්ප ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

3 පරිච්ඡේදය
මූල්‍ය ආයතන



ස්වභාවික ආපදා සහ තීව්‍ර වූ භූදේශපාලනික අවිනිශ්චිතතා හේතුවෙන් ඇති වූ අහිතකර බලපෑම් මධ්‍යයේ වුව ද, ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව යථා තත්ත්වයට පත්වීම, වැඩි වූ ඉපැයීම් සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන ස්වාරක්ෂක මගින් සහාය ලැබීම හේතුවෙන් 2026 වසරේ ජූනි මාසයෙන් අවසන් වූ මාස 12ක කාලය තුළ මූල්‍ය ආයතන ශක්තිමත් ව පැවතුණි. මෙම කාල සීමාව තුළ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ සමස්ත ක්‍රියාවලියට සහාය වෙමින් බැංකු සහ මුදල් සමාගම් අංශවල මූල්‍ය අතරමැදිකරණය වැඩිදියුණු විය. වාහන සහ රන් ඇපකර ණය පහසුකම් ඇතුළු ඇතැම් අංශ සඳහා වන ණය ඉල්ලුම ඉහළ මට්ටමක පැවතුණි. කෙසේ වෙතත්, ප්‍රමාණවත් ස්වාරක්ෂක අදාළ අවම නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළින් පවත්වා ගැනීමට බැංකු සහ මුදල් සමාගම් අංශ සමත් වුව ද, ණය ප්‍රසාරණය වේගවත් වීම හේතුවෙන් ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන තත්ත්වයන් මන්දගාමී විය. කෙසේ වුවද, වේගවත් සහ කේන්ද්‍රගත වූ ණය වර්ධනය, අදියර 2 යටතේ පවතින ණය ඉහළ යෑම, විදේශයන් වෙත ණය ලබා දීම සහ මුදල් සමාගම් වෙත අධික ලෙස ණය ලබා දීම හේතුවෙන් බැංකු සහ මුදල් සමාගම් අතර පවතින අන්තර්සම්බන්ධතාව සමීපව අධීක්ෂණය කළ යුතු වේ. අධික ණය වර්ධනය හේතුවෙන් පද්ධතිමය අවදානම් ඇති වීමේ හැකියාව සැලකිල්ලට ගනිමින් මහ බැංකුව විසින් වාහන සඳහා වන වටිනාකම මත උපරිම ණය සීමා දැඩි කිරීම සහ රන් ඇපකර ණය පහසුකම් සඳහා වටිනාකම මත උපරිම ණය සීමා හා ඉහළ අවදානම් මත බර තැබීම් නියම කිරීම ඇතුළු සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී.[1] මෙම ක්‍රියාමාර්ග මෙන්ම 2026 වසරේ මැයි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික සංශෝධනය සහ මෝටර් වාහන ආනයනය මත පැනවූ තාවකාලික අධිභාරය දීර්ඝ කිරීම හේතුවෙන් ඉදිරි කාර්තුවල දී ණය වර්ධනය මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

බැංකු අංශයේ සමස්ත කාර්ය සාධනය පිළිබඳ දර්ශකයක් වන බැංකු පද්ධතියේ සාධනීයත්ව දර්ශකය, 2026 වසරේ පළමු භාගය තුළ සුළු වශයෙන් පහත වැටුණි. පරිභෝජනය, වෙළෙඳ කටයුතු, මූල්‍ය සේවා සහ විදේශීය ණය ලබාදීම්වල කැපී පෙනෙන වර්ධනයක් සමඟින් පෞද්ගලික අංශයේ ශක්තිමත් ණය ඉල්ලුම මධ්‍යයේ බැංකු අංශයේ ණය සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය. ණය පදනම ප්‍රසාරණය වීම සහ අදියර 3 යටතේ පවතින නොපියවූ ණය අඩු වීම හේතුවෙන් වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ දර්ශක අඛණ්ඩව වැඩිදියුණු වූ අතර, අදියර 3 යටතේ පවතින ණය හානිකරණ ආවරණ අනුපාතය වැඩිදියුණු වීම, අනපේක්ෂිත ණය අලාභයන්ට මුහුණ දීම සඳහා අමතර ආවරණයක් සැපයීය. කෙසේ වුවද, 2026 වසරේ දෙවන කාර්තුව තුළ අදියර 2 යටතේ පවතින ණය ඉහළ යෑම, අනාගතයේ දී අක්‍රීය ණය කරා ගමන් කිරීමේ අවදානම ඉස්මතු කරයි. මෙම කාල සීමාවේ දී පෞද්ගලික අංශයේ ශක්තිමත් ණය ඉල්ලුම මධ්‍යයේ, රජය සහ රාජ්‍ය සතු ව්‍යවසායන් වෙත වන බැංකු අංශයේ නිරාවරණ පහත වැටුණ ද එය තවදුරටත් සැලකිය යුතු මට්ටමක පැවතුණි. බැංකු විසින් ණය ලබා දීම සඳහා ද්‍රවශීල වත්කම් යොදා ගැනීම හේතුවෙන්, ද්‍රවශීලතා ආවරණ අනුපාත සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය සුළු වශයෙන් මන්දගාමී වුව ද අවම නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉහළ අගයක පැවතුණි. ශක්තිමත් ණය ප්‍රසාරණය මධ්‍යයේ ප්‍රාග්ධනයට වඩා වේගයෙන් අවදානම් බරිත වත්කම් ප්‍රසාරණය වීම හේතුවෙන් ප්‍රාග්ධන අනුපාතය ද පහත වැටුණු අතර, එමගින් අනපේක්ෂිත අලාභයන් දරා ගැනීමට බැංකු අංශයට ඇති හැකියාව පහළ ගියේය.

වාහන ආනයන සීමා ලිහිල් කිරීමෙන් පසු මෝටර් රථ මූල්‍යකරණය සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම සහ රන් මිල ඉහළ යෑම මධ්‍යයේ රන් ඇපකර මත ණය ලබා දීම අඛණ්ඩව ප්‍රසාරණය වීම හේතුවෙන් මෙම කාල සීමාවේ දී මුදල් සමාගම් අංශය ද ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කළේය. වාහන සහ රන් ඇපකර මත ණය සංකේන්ද්‍රණය වී පැවතීම හේතුවෙන්, අදාළ ඇපකරයන්හි වටිනාකම් අහිතකර ලෙස වෙනස්වීම හමුවේ මුදල් සමාගම් අංශය අවදානමට ලක්වීමට ඇති හැකියාව ඉහළ ගියේය. මෙම අවදානම් පාලනය කිරීම සඳහා, මහ බැංකුව විසින් පූර්වගාමී ලෙස සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිමය පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදී. ණය කළඹ සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීම සහ අදියර 3 යටතේ පවතින නොපියවූ ණය අඩු වීම හේතුවෙන් වත්කම් ගුණාත්මකභාවය පිළිබඳ දර්ශක වැඩිදියුණු විය. කෙසේ වුවද, අදියර 2 යටතේ පවතින නිරාවරණයන් ඉහළ යෑම සහ හානිකරණ ආවරණය මන්දගාමී වීම හේතුවෙන් වත්කම් ගුණාත්මකභාවය පිළිබඳව අඛණ්ඩව අවධානය යොමු කළ යුතු වේ. ශේෂ පත්‍ර වේගයෙන් ප්‍රසාරණය වීම මධ්‍යයේ මුදල් සමාගම් අංශයේ ද්‍රවශීලතා ස්වාරක්ෂක පහත වැටුණි. මේ අතර, මුදල් සමාගම් අංශය බැංකු වෙතින් ලබාගන්නා අරමුදල් මත රඳා පැවතීම ඉහළ යෑම හේතුවෙන් 2026 වසරේ ජූනි මස අවසානයේ දී ණයගැනීම් ඉහළ මට්ටමක පැවතුණි. ණය ලබාදීමේ වර්ධනය හේතුවෙන් ප්‍රාග්ධන ස්වාරක්ෂක පහත වැටුණ ද, මුදල් සමාගම් අංශයේ සමස්ත ප්‍රාග්ධන අනුපාතය නියාමන අවශ්‍යතා මට්ටමට වඩා ඉහළ මට්ටමක පැවතුණි.

දළ ලියාහළ වාරිකවල සහ වත්කම්වල ශක්තිමත් වර්ධනය හේතුවෙන් මෙම කාල සීමාව තුළ රක්ෂණ අංශය අඛණ්ඩව ප්‍රසාරණය වූ අතර, රක්ෂණ ක්ෂේත්‍රයේ ව්‍යාප්තිය (insurance penetration) ද වැඩිදියුණු විය. දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ යන අංශ ද්විත්වයේම ලාභදායීත්වය මන්දගාමී වුවද, එම අංශවල ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය අදාළ අවම නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළ මට්ටමක පැවතුණි. දිට්වා සුළි කුණාටුව සැලකිය යුතු රක්ෂණ හිමිකම් ජනනය කළ අතර, මෙම හිමිකම් පියවීමට යාමේ දී සාමාන්‍ය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂණ කාර්ය සාධනය, ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධන තත්ත්වයන් මත යම් පීඩනයක් ඇති කළ හැකිය.

---

1 වටිනාකම මත උපරිම ණය අනුපාත සහ අවදානම් මත බර තැබීම් පිළිබඳ වැඩිදුර විස්තර පස්වන පරිච්ඡේදයේ දැක්වේ.


3.1. බැංකු අංශය

බැංකු පද්ධතියේ සාධනීයත්ව දර්ශකය[2]

බැංකු පද්ධතියේ සාධනීයත්ව දර්ශකය මගින් මනිනු ලබන බැංකු අංශයේ සමස්ත සාධනීයත්වය, 2025 වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී සුළු වශයෙන් පහළ ගිය අතර, මේ සඳහා මූලික වශයෙන් ශක්තිමත් ණය වර්ධනයෙන්, ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව කෙරෙහි එල්ල වූ බලපෑම් හේතු විය. ඒ අනුව, වේගවත් ණය ප්‍රසාරණය අරමුදල් වර්ධනය අභිබවා යාම සහ රජයේ සුරැකුම්පත්වල පැවති අරමුදල් ණය ලබාදීමේ ක්‍රියාකාරකම් සඳහා නැවත වෙන් කිරීම හේතුවෙන් ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම් පහළ යෑමත් සමඟ ද්‍රවශීලතා උප-දර්ශකය දුර්වල විය. ණය ප්‍රසාරණය හා සම්බන්ධ අවදානම් බරිත වත්කම් ඉහළ යෑම මධ්‍යයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත පහත වැටීම පිළිබිඹු කරමින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා උප-දර්ශකය ද පිරිහීමකට ලක් විය. මේ අතර, කොටස් මත ප්‍රතිලාභ, වත්කම් මත ප්‍රතිලාභ සහ ශුද්ධ පොලී ආන්තික පහත වැටීම හේතුවෙන් ලාභදායීත්ව උප-දර්ශකය මන්දගාමී විය. කෙසේ වුවද, අදියර 3 යටතේ පවතින ණය අනුපාතය පහත වැටීම සහාය කොට ගෙන වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ උප-දර්ශකය කැපී පෙනෙන වැඩිදියුණු වීමක් වාර්තා කළ අතර, කාර්යක්ෂමතාව සහ වෙළෙඳපොළ අවදානම්වලට ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ උප-දර්ශක ද මෙම කාලසීමාව තුළ වැඩිදියුණු විය.

2 බැංකු පද්ධතියේ සාධනීයත්ව දර්ශකය යනු, වත්කම් ගුණාත්මකභාවය, ද්‍රවශීලතාව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව, වෙළෙඳපොළ අවදානම්වලට ඔරොත්තු දීමේ හැකියාව, ලාභදායීත්වය සහ කාර්යක්ෂමතාව යන අංශවල වර්ධනයන් මත පදනම්ව බැංකු අංශයේ සමස්ත ස්ථායීතාව පෙන්නුම් කරන සංයුක්ත දර්ශකයකි. මෙම දර්ශකය එක් එක් බැංකුවේ වෙළෙඳපොළ කොටස මත පදනම්ව බර තබා සකස් කර ඇත. 2021 වසරේ පළමු කාර්තුවේ සිට SLFRS 9 මත පදනම් වූ දත්ත භාවිත කරමින් බැංකු පද්ධතියේ සාධනීයත්ව දර්ශකය සම්පාදනය කර ඇත.


රූප සටහන 3.1 බැංකු පද්ධතියේ සාධනීයත්ව දර්ශකය*



* මධ්‍යන්‍යයට ඉහළින් ඇති සම්මත අපගමන දෙකක සීමාව (Upper 2Sigma) මගින් 2007 වසරේ සිට සාමාන්‍ය දර්ශක අගයට සම්මත අපගමන දෙකකට ඉහළින් ඇති අගය නියෝජනය කරන අතර, මධ්‍යන්‍යයේ සිට පිළිගත හැකි ඉහළම අපගමන මට්ටම නිරූපණය කරයි. ඒ හා සමානව, මධ්‍යන්‍යයට පහළින් ඇති සම්මත අපගමන දෙකක සීමාව (Lower 2Sigma) මගින් 2007 වසරේ සිට සාමාන්‍ය දර්ශක අගයට සම්මත අපගමන දෙකකට පහළින් ඇති අගය දක්වන අතර, සාමාන්‍යයේ සිට පිළිගත හැකි අවම අපගමන මට්ටම නිරූපණය කරයි. මෙම සීමා දෙක අතර පිහිටන දර්ශක අගයන් පිළිගත හැකි පරාසක් තුළ පවතියි යැයි සලකනු ලැබේ.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.2 බැංකු අංශයේ සාධනීයත්ව සිතියම*




* මධ්‍ය ලක්ෂයේ සිට අපගමනය වීම මගින් ධනාත්මක බලපෑමක් පෙන්නුම් කරයි.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

ණය අවදානම

මැතකාලීනව අහිතකර ගෝලීය අවිනිශ්චිතතා පැවතිය ද, හිතකර සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ සහාය ඇතිව, සලකා බලන කාලපරිච්ඡේදයේ දී බැංකු අංශයේ ණය සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2023 වසරේ දෙවන භාගයේ සිට දක්නට ලැබුණු ණය වර්ධන ප්‍රවණතාව 2026 වසරේ පළමු භාගය තුළ ද අඛණ්ඩව පැවති අතර, 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ වාර්තා වූ 11.4%ක ණය වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී 23.6%ක වාර්ෂික ලක්ෂ්‍යමය ණය වර්ධනයක් වාර්තා විය. ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සහ සලකා බලන කාලසීමාවේ වැඩි කාලයක් පුරා සාපේක්ෂ වශයෙන් ලිහිල් මුදල් ප්‍රතිපත්තිමය තත්ත්වයන් පැවතීම මධ්‍යයේ බැංකු අංශයේ ණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, විශේෂයෙන් වාහන සහ රන් ඇපකර මත පදනම් වූ කුටුම්බ

රූප සටහන 3.3 ණය සහ ලැබිය යුතු දෑ




මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

ණය ලබා දීම්වල කැපී පෙනෙන ප්‍රසාරණයක් දැකගත හැකි විය. ණය ලබා දීමේ මෙම අබණ්ඩ ඉහළ යෑම මගින්, ණය ඉල්ලුම කැපී පෙනෙන ලෙස ඉහළ යෑම සහ බැංකු අංශය ණය ලබා දීම සඳහා දක්වන කැමැත්ත වැඩිදියුණු වීම පෙන්නුම් කරයි. කෙසේ වුවද, යළි ඇති වූ උද්ධමන පීඩන, වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ යෑම, සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග දැඩි වීම, ඉහළ බලශක්ති පිරිවැය සහ භූදේශපාලනික අවිනිශ්චිතතා හේතුවෙන් ණය ප්‍රසාරණයේ මන්දගාමී වීමක් සිදු විය හැකිය. එනමුත්, සීඝ්‍ර ණය ප්‍රසාරණය මගින් ණය ලබා දීමේ වේගය, සංයුතිය සහ ගුණාත්මකභාවය අබණ්ඩව නිරීක්ෂණය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.


සලකා බලන කාලයේ දී ණය ප්‍රසාරණය සඳහා ප්‍රධාන වශයෙන් රුපියල් මගින් ලබාදෙන ණය ඉහළ යෑම හේතු විය. බැංකු අංශයේ රුපියල්වලින් නිකුත් කරන ලද ණය 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 25.4%කින් ඉහළ ගිය අතර, එය සලකා බලන කාලපරිච්ඡේදය තුළ සිදු වූ ණය ප්‍රසාරණයෙන් 84.3%ක් විය. මේ අතර, රුපියල්වලින් නම් කරන ලද විදේශ මුදල් ණය ද සලකා බලන කාලපරිච්ඡේදය අවසානයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 17.2%ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර, එය බැංකු අංශයේ ණය ප්‍රසාරණයෙන් 15.7%ක් විය. එක්සත් ජනපද ඩොලර් අගයෙන් ගත් කළ, 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ විදේශ මුදල් ණයවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 4.4%ක් පමණක් වූ අතර, සමස්ත විදේශ මුදල් ණයවලින් 37.1%ක් විදේශීය ආයතන වෙත ලබා දී තිබුණි. තවද, ණය ප්‍රසාරණය සඳහා මුළුමනින්ම පාහේ දේශීය බැංකු මගින් ලබාදුන් ණය හේතු වූ අතර, ඉන් දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකු (Domestic Systemically Important Banks - D-SIBs) 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී බැංකු අංශයේ ණය ප්‍රසාරණයෙන් 73.8%ක් සඳහා දායක විය. අනෙකුත් දේශීය බැංකු ඉතිරි 26.2%ක ණය ලබාදීම් සඳහා දායක විය. කෙසේ වුවද, විදේශීය බැංකු වාර්තා කළ වාර්ෂික ලක්ෂ්‍යමය ණය වර්ධනය ඉතා සුළු අගයක් ගත් අතර, පසුගිය වසරේ ඇතැම් කාලවල දී ණය ලබා දීම කාර්තුමය සංකෝචනයක් වාර්තා කළේය. මීට එක් විදේශීය බැංකුවක සිට තවත් දේශීය බැංකුවක් වෙත පෞද්ගලික (retail) බැංකු මෙහෙයුම් මාරු කිරීමේ ක්‍රියාවලිය යම්තාක් දුරකට හේතු වූ අතර, එමගින් අදාළ ණය කළඹ බැංකු කාණ්ඩ දෙක අතර හුවමාරු විය. 2026 වසරේ ජූලි මාසයේ දී තවත් විදේශීය බැංකුවක සිට දේශීය බැංකුවක් වෙත පෞද්ගලික බැංකු මෙහෙයුම් මාරු කිරීමක් සිදු වූ අතර, ඒ හේතුවෙන් 2026 වසරේ තෙවන කාර්තුවේ දී විදේශීය බැංකුවල වාර්තාගත ණය තත්ත්වය මන්දගාමී වනු ඇතැයි ද, ඊට සමගාමීව දේශීය බැංකුවල ණය තත්ත්වය ඉහළ යනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

රූප සටහන 3.4
මුදල් වර්ගය මත පදනම් වූ ණය ප්‍රමාණයේ කාර්තුමය වෙනස් වීම



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


රූප සටහන 3.5
බැංකු කාණ්ඩය මත පදනම් වූ ණය ප්‍රමාණයේ කාර්තුමය වෙනස්වීම



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

මෙම කාලපරිච්ඡේදය තුළ ණය ප්‍රසාරණය ප්‍රධාන වශයෙන් පරිභෝජනය, වෙළෙඳාම, විදේශීය ආයතන වෙත ණය ලබා දීම, මූල්‍ය සේවා සහ ඉදිකිරීම් අංශ මත සංකේන්ද්‍රණය වී පැවතුණි. ඒ අනුව, ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමත් සමඟ ණය ලබාදීම් අබණ්ඩව ප්‍රසාරණය වීම පෙන්නුම් කරමින්, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ බැංකු අංශයේ ණය ප්‍රසාරණයෙන් 10%කට වඩා වැඩි ප්‍රමාණයකට මෙම එක් එක් අංශ දායක විය. තවද, 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ පැවති 71.1%ට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව වන විට බැංකු අංශයේ සමස්ත ණය ප්‍රමාණයෙන් 72.9%ක් පරිභෝජන, ඉදිකිරීම්, වෙළෙඳ, නිෂ්පාදන, කෘෂිකර්මය සහ විදේශීය ආයතන යන අංශ හය තුළ සංකේන්ද්‍රණය වී පැවති අතර, එමගින් මෙම කාල පරිච්ඡේදය තුළ ණය සංකේන්ද්‍රණය වීමේ සුළු ඉහළ යාමක් පෙන්නුම් කරයි.


රූප සටහන 3.6 **2026 වසරේ දෙවන කාර්තුවෙන් අවසන් වන වසර තුළ ණය වෙනස්වීම් සඳහා ආංශික දායකත්වය**



* මුදල් අමාත්‍යාංශය වෙත ලබා දුන් ණය ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.8 **පරිභෝජනය සඳහා වන ණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

විශාලතම ණය කාණ්ඩය ලෙස පැවති පාරිභෝජන ණය, මූලික වශයෙන් උකස් ණය සහ වාහන මිලදී ගැනීම් සඳහා ලබා දුන් ණය ඇතුළු පුද්ගලික ණය හේතුවෙන් වේගයෙන් ප්‍රසාරණය විය. 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ වාර්තා වූ 11.0%ක වර්ධනයට සාපේක්ෂව පාරිභෝජන ණය 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී 29.1%ක සැලකිය යුතු වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. උකස් ණය පහසුකම් සහ පෞද්ගලික ණය පිළිවෙළින් 49.2%කින් සහ 21.3%කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. උකස් ණය පහසුකම් මෙලෙස කැපී පෙනෙන අයුරින් වැඩි වීම සඳහා රන් මිල ගණන් ඉහළ යෑම හේතු වූ අතර, ගෝලීය රන් මිල ගණන්වල සැලකිය යුතු පහත වැටීමක් සිදුවුවහොත් වෙළෙඳපොළ අවදානමට නිරාවරණය වීම සහ ණය ආපසු නොගෙවීම් හේතුවෙන් ඇපකර අවදානම් ඇතිවීම් ඉහළ යා හැකිය. කෙසේ වුවද, ඉහත සඳහන් කළ අවදානම් අවම කිරීම් සඳහා මහ බැංකුව විසින්, 2026 වසරේ මැයි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි රන් ඇපකර මත ලබාදෙන ණය පහසුකම් සඳහා 70%ක වටිනාකම් මත උපරිම ණය අනුපාතයක් හඳුන්වා දෙන ලදී. මෙමගින් රන් මිලෙහි උච්චාවචනයන්ට මුහුණ දීම් සඳහා ඇපකර ස්වාරක්ෂකයක් සපයන අතර විචක්ෂණශීලී ණය ලබාදීමේ භාවිතයන් ශක්තිමත් කරයි.


විදේශීය ආයතන වෙත සහ මූල්‍ය සේවා අංශය වෙත ලබාදුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම මගින් විදේශ මුදල් ද්‍රවශීලතාව සම්බන්ධයෙන් ඇතිවිය හැකි අවදානම, බාහිර කම්පනවලට ගොදුරු වීමට ඇති හැකියාව මෙන්ම මුදල් සමාගම් අංශය සමඟ පවතින අන්තර්සම්බන්ධතාව ඉහළ යෑම පෙන්නුම් කළේය. විදේශීය ශාඛා මෙන්ම දේශීය බැංකු ශාඛා හරහා විදේශීය ආයතන වෙත ණය ලබා දීම, පෙර වසරේ පැවති 32.3%ක අගයේ සිට, 2026

රූප සටහන 3.7 **ප්‍රධාන ආර්ථික අංශවල ණය සංයුතිය**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.9 **පරිභෝජන ණයවල සංකේන්ද්‍රණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.10 **විදේශීය ආයතන වෙත ලබාදුන් ණය**



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.12 **අදියර 3 සහ අදියර 2 යටතේ පවතින ණය අනුපාත**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 51.9%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයකින් ඉහළ ගියේය. එමගින් බැංකු අදාළ විදේශයන්ට ආවේණික වූ අවදානම්, විදේශ විනිමය සහ දේශසීමා අතර ගනුදෙනු අවදානම්වලට නිරාවරණය විය හැකිය. මූල්‍ය සේවා අංශය වෙත ලබා දී ඇති ණය ද 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 52.9%කින් තීව්‍ර ලෙස ඉහළ ගිය අතර, එය ප්‍රධාන වශයෙන් මුදල් සමාගම් වෙත සැලකිය යුතු ලෙස ණය ලබා දීම පිළිබිඹු කරයි. එමගින් බැංකු අංශය සහ මුදල් සමාගම් අංශය අතර අන්තර්සම්බන්ධතාව ඉහළ ගියේය. කෙසේ වුවද, වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 2026 වසරේ පළමු කාර්තුව අවසානයේ වාර්තා වූ වේගවත් වර්ධනය හා සැසඳීමේ දී විදේශීය ආයතන සහ මූල්‍ය සේවා අංශය වෙත ලබාදුන් ණය වර්ධනය 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී තරමක් මන්දගාමී විය.


සැලකිය යුතු ණය ප්‍රසාරණය මධ්‍යයේ බැංකු අංශයේ අදියර 3 යටතේ පවතින ණය අනුපාතය (භාවිතා නොකළ ණය සීමා ඇතුළුව) 2025 වසරේ අග භාගයේ සිට තනි ඉලක්කම් මට්ටමක් දක්වා පහත වැටුණි. 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ පැවති 11.9%ට සාපේක්ෂව බැංකු අංශයේ අදියර 3 යටතේ පවතින ණය අනුපාතය 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී 9.1%ක් දක්වා පහත වැටුණි. මෙම කාලපරිච්ඡේදය තුළ අදියර 3 යටතේ පවතින ණය අනුපාතය පහත වැටීම සඳහා මූලික වශයෙන් සැලකිය යුතු ණය ප්‍රසාරණය සහ බැංකු අංශයේ අදියර 3 යටතේ පවතින ණය ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 5.8%කින් පහත වැටීම හේතු විය. කෙසේ වුවද, දිට්වා සුළි කුණාටුවේ බලපෑම මෙන්ම මැදපෙරදිග යුද්ධයෙන් පැන නගින භූදේශපාලනික අවිනිශ්චිතතාවන් සහ ඉහළ ගිය ඉන්ධන මිල හේතුවෙන්, බැංකු අංශයේ

රූප සටහන 3.11 **මූල්‍ය සේවා අංශය වෙත ලබාදුන් ණය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.13 **අදියර අනුව ණය සංයුතිය**



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


රූප සටහන 3.14 **බැංකු අනුව අදියර 3 යටතේ පවතින ණය අනුපාතය***



* වඩාත් පැහැදිලි නිරූපණයක් උදෙසා ඉහළ අදියර 3 යටතේ පවතින ණය අනුපාත සහිත කුඩා බලපත්‍රලාභී විශේෂිත බැංකු 3ක් රූප සටහනෙන් ඉවත් කර ඇත.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.15 **ණය හානිකරණ ආවරණ අනුපාත**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

අදියර 3 යටතේ පවතින ණය 2026 වසරේ පළමු සහ දෙවන කාර්තු අවසානයේ දී සුළු වශයෙන් ඉහළ ගියේය. තවද, බැංකු අංශයේ අදියර 2 යටතේ පවතින ණය, 2026 වසරේ පළමු කාර්තුවේ අවසානයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී 10.4%කින් ඉහළ ගියේය. අදියර 2 යටතේ පවතින ණය මෙලෙස ඉහළ යෑම, විදේශීය ආයතන වෙත ණය ලබාදීම්, වෙළෙඳ සහ සංචාරක යන අංශ තුළ සංකේන්ද්‍රණය වී පැවති අතර, එය මැදපෙරදිග අර්බුදයෙන් පැන නැගුණු අහිතකර ආර්ථික අතුරු බලපෑම් සහ විදේශීය ගනුදෙනු අවදානම් ඉහළ යෑම පිළිබිඹු කරයි. තවද, සැලකිය යුතු ණය ප්‍රමාණයක ණය අවදානම එම කාර්තුව තුළ කැපී පෙනෙන අයුරින් ඉහළ ගොස් ඇති බව මෙමගින් පෙන්නුම් කෙරෙන අතර, ණයගැනුම්කරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව දුර්වල වුවහොත් අනාගතයේ මෙම අදියර 2 යටතේ පවතින ණය අදියර 3 වෙත සංක්‍රමණය වීමේ හැකියාවක් ඇති බව ඉස්මතු කරයි.

ණය හානිකරණවල වර්ධනය සහ අදියර 3 යටතේ පවතින ණය පහත වැටීම හේතුවෙන්, අදියර 3 යටතේ පවතින ණය සඳහා වන ණය හානිකරණ ආවරණ අනුපාතය 2025 වසරේ දෙවන කාර්තුවේ අවසානයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී වැඩිදියුණු වීමක් වාර්තා කළේය. බැංකු අංශයේ අදියර 3 යටතේ පවතින ණය සඳහා වන ණය හානිකරණ ආවරණ අනුපාතය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය අවසානයේ වාර්තා වූ 54.8%ට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී 61.3%ක් දක්වා කැපී පෙනෙන ලෙස වැඩිදියුණු විය. ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී අදියර 3 යටතේ වන ණය හානිකරණය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 5.2%කින් වර්ධනය වීම සහ අදියර 3 යටතේ පවතින ණය 5.8%කින් සංකෝචනය වීමයි. ණය හානිකරණය ඉහළ යෑම මගින් අනාගතයේ දී ඇතිවිය හැකි ණය අලාභයන් දරා ගැනීම සඳහා බැංකුවලට අමතර ස්වාරක්ෂකයක් සපයන අතර, එමගින් වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම හමුවේ බැංකුවල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් වේ. තවද, ඉහළ ණය හානිකරණ ආවරණ අනුපාතයක් මගින් බැංකු විසින් විචක්ෂණශීලී සහ ක්‍රියාශීලී අවදානම් කළමනාකරණ ප්‍රවේශයක් අනුගමනය කරන බව පිළිබිඹු කරයි.


පළමු ස්ථර පොදු හිමිකම් ප්‍රාග්ධනය (Common Equity Tier 1 Capital) වර්ධනය වීම සහ ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන්, පෙර වසරට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය, පළමු ස්ථර පොදු හිමිකම් ප්‍රාග්ධනයට දක්වන අනුපාතය කැපී පෙනෙන ලෙස පහළ ගියේය. ප්‍රතිපාදන මගින් ආවරණය කර

රූප සටහන 3.16 **අදියර 3 යටතේ පවතින ණය සහ අදියර 3 යටතේ පවතින ණය හානිකරණය**



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.17 **බැංකු අනුව අදියර 3 යටතේ පවතින ණය සහ අදියර 3 යටතේ පවතින ණය සඳහා වන ණය හානිකරණ ආවරණ**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

නොමැති ණය පැහැර හැරීම්වලින් සිදුවිය හැකි අලාභ අවශෝෂණය කර ගැනීමට ගුණාත්මක ප්‍රාග්ධනයට ඇති හැකියාව මනිනු ලබන ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය, පළමු ස්ථර පොදු හිමිකම් ප්‍රාග්ධනයට දක්වන අනුපාතය 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ වාර්තා වූ 40.2%ට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී 28.3%ක් දක්වා කැපී පෙනෙන අයුරින් පහළ ගියේය. කාලපරිච්ඡේදය අවසානයේ දී ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය 19.3%කින් සංකෝචනය වීම මධ්‍යයේ පළමු ස්ථර පොදු හිමිකම් ප්‍රාග්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 14.5%කින් වර්ධනය වීම මෙම අනුපාතය පහත වැටීමට දායක වූ අතර, එමගින් ප්‍රතිපාදන මගින් ආවරණ නොවන, සිදුවිය හැකි ණය අලාභයන් හමුවේ බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් වීම පෙන්නුම් කරයි.

සමස්තයක් වශයෙන් බැංකු අංශයේ අදියර 3 යටතේ පවතින ණය අනුපාතය පහත වැටුණ ද, 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට ඇතැම් ආර්ථික අංශවල වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ අවදානම් තවදුරටත් පැවතුණි. තනි තනිව ගත් කල බැංකු අංශයේ සමස්ත ණය ප්‍රමාණයෙන් 10%කට වඩා වැඩි ප්‍රමාණයකට දායක වූ නිෂ්පාදන, වෙළෙඳ සහ ඉදිකිරීම් යන අංශ, සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක අදියර 3 යටතේ පවතින ණය අනුපාත වාර්තා කරන ලද අතර, එමගින් සමස්ත ආර්ථිකයට වැදගත් වන අංශ කිහිපයක ණය අවදානම ඉහළ මට්ටමක පවතින බව පෙන්නුම් කළේය. කෙසේ වුවද, 2025 වසරේ දෙවන කාර්තුව අවසානයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී මෙම අංශවල, අදියර 3 යටතේ පවතින ණය අනුපාත පහළ යාමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි. ප්‍රවාහන අංශයේ අදියර 3 යටතේ පවතින ණය අනුපාතය ද පහළ ගිය ද, එය 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී 45.2%ක සැලකිය යුතු ඉහළ මට්ටමක පැවති අතර, ඒ සඳහා විශේෂයෙන් එක් ප්‍රධාන රජය සතු ව්‍යවසායක් විසින් ලබාගෙන ඇති ණය පහසුකම්වල කල් ඉකුත් වූ ගෙවීම් හේතු විය. තවද, සංචාරක අංශයට ලබා දී ඇති ණය සම්බන්ධයෙන් ණය පැහැර හැරීමේ අවදානම 2022 වසරේ පසු භාගයේ සිට අඛණ්ඩව ඉහළ මට්ටමක පැවති නමුත්, සංචාරක ක්ෂේත්‍රයට අදාළ ණයවල අදියර 3 යටතේ පවතින ණය අනුපාතය 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ පැවති 38.3%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 28.4%ක් දක්වා පහත වැටුණි. කෙසේ වුවද, ප්‍රවාහන සහ සංචාරක අංශ, බැංකු අංශයේ සමස්ත ණය කළඹෙන් පිළිවෙළින් 2.2%ක් සහ 3.1%ක් පමණක් නියෝජනය කළ අතර, එම අංශවලින් බැංකු පද්ධතියට එල්ල වී ඇත්තේ සාපේක්ෂ වශයෙන් අඩු බලපෑමක් බව එමගින් පෙන්නුම් කරයි.

රූප සටහන 3.18 **පළමු ස්ථර පොදු හිමිකම් ප්‍රාග්ධනයට සාපේක්ෂව ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය**



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.19 **ඉහළ අදියර 3 යටතේ පවතින ණය අනුපාත සහිත ආර්ථික අංශ**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට, රජය සහ රාජ්‍ය සතු ව්‍යවසායන්[3] වෙත බැංකු අංශය සතුව පැවති ණය නිරාවරණය (credit exposure) තනි ඉලක්කමේ මට්ටමකට පහත වැටුණු අතර, ඒ හා සම්බන්ධ ණය පැහැර හැරීමේ අවදානම ද අඩු විය. ප්‍රධාන වශයෙන් මූල්‍ය නොවන සමාගම් වෙත ලබාදෙන ලද ණය ඉහළ යෑම හේතුවෙන්, බැංකු අංශයේ සමස්ත ණය ප්‍රමාණයෙන්, සියලුම පෞද්ගලික අංශයේ ආයතන වෙත ලබාදුන් ණය 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ පැවති 51.2%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 52.1%ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. ඊට ප්‍රතිවිරුද්ධව, 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ පැවති 12.2%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 9.6%ක් දක්වා බැංකු අංශයේ සමස්ත ණය ප්‍රමාණයෙන් රජය සහ රාජ්‍ය සතු ව්‍යවසායන් වෙත ලබාදුන් ණය ප්‍රමාණය පහත වැටුණි. මේ අතර, පෞද්ගලික අංශයේ ආයතනවල අදියර 3 යටතේ පවතින ණය අනුපාතය සමස්ත බැංකු අංශයේ අනුපාතයට වඩා ඉහළ අගයක පැවති අතර, 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී එය 11.2%ක් විය. එමගින් ණය පැහැර හැරීමේ අවදානම සාපේක්ෂ වශයෙන් මෙම ආයතන තුළ සංකේන්ද්‍රණය වී ඇති බව පෙන්නුම් කළේය. කෙසේ වුවද, මෙය වසරකට පෙර 15.2%ක් ලෙස පැවති අදියර 3 යටතේ පවතින ණය අනුපාතයට සාපේක්ෂව පහත වැටීමකි. තවද, රජය සහ රාජ්‍ය සතු ව්‍යවසායන්ගේ ණය පැහැර හැරීමේ අවදානම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය අවසානයේ පැවති 11.1%ට සාපේක්ෂව සලකා බලන කාලපරිච්ඡේදය අවසානයේ දී 10.2%ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණ ද, එය තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණි.

3 රජය සහ රාජ්‍ය සතු ව්‍යවසායන් වෙත ලබා දුන් ණය යනුවෙන් අදහස් කරනුයේ බැංකු අංශය මගින් මධ්‍යම රජය, රාජ්‍ය සතු ව්‍යවසායන් සහ රජයට සම්බන්ධ වෙනත් ඕනෑම ආයතනයක් වෙත ලබා දී ඇති ණය ප්‍රමාණයයි.

රූප සටහන 3.21 **2026 වසරේ දෙවන කාර්තුව අවසන් වනවිට ණයගැනුම්කරුවන්ගේ කාණ්ඩය අනුව ණය පැහැර හැරීමේ අවදානම***




* වෘත්තයේ ප්‍රමාණය මගින් අදියර 3 යටතේ පවතින ණයවල ප්‍රමාණය නිරූපණය කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බැංකු අංශය විසින් සලකා බලන කාලපරිච්ඡේදය තුළ කෘෂිකර්මාන්තය සහ වෙළෙඳාම ආශ්‍රිත ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්[4] (micro, small, and medium enterprises - MSMEs) සඳහා ලබාදුන් ණය, මෙම ක්ෂේත්‍රයේ ණය ප්‍රසාරණය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. ඒ අනුව, අදාළ කාලපරිච්ඡේදයේ දී බැංකු අංශය විසින් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ලබාදුන් ණය ප්‍රමාණයේ සමස්ත ඉහළ යාමෙන් 60.8%ක් පමණ මෙම අංශ දෙක මගින් නියෝජනය කරන ලදී. තවද, 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ලබාදුන් ණය ප්‍රමාණයෙන් 72.8%ක් වෙළෙඳ, කෘෂිකර්ම, නිෂ්පාදන සහ ඉදිකිරීම් හා


4 ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වර්ගීකරණය: ක්ෂුද්‍ර-වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 15ට අඩු හෝ සමාන; කුඩා-වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 15ට වැඩි හෝ රුපියල් මිලියන 250ට අඩු හෝ සමාන; සහ මධ්‍ය-වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 250ට වැඩි හෝ රුපියල් බිලියන 1ට අඩු හෝ සමාන.

රූප සටහන 3.20 **ණයගැනුම්කරුවන්ගේ කාණ්ඩය අනුව ණය සංයුතිය**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.22 **ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ලබාදුන් ණය අංශ අනුව සංකේන්ද්‍රණය සහ ණය පැහැර හැරීමේ අවදානම**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යටිතල පහසුකම් යන අංශ හතර තුළ සංකේන්ද්‍රණය වී තිබූ අතර, එමගින් ඉහළ මට්ටමේ ආංශීය සංකේන්ද්‍රණ අවදානමක් පෙන්නුම් කරයි. ඊට අමතරව, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ බහුතරයක අදියර 3 යටතේ පවතින ණය අනුපාතය තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණු නමුත්, පෙර වසරේ අනුරූප කාල සීමාවට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී කැපී පෙනෙන පහළ යාමක් වාර්තා කළේය. කෙසේ වුවද, 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී සංචාරක සහ ඉදිකිරීම් ආශ්‍රිත ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි අදියර 3 යටතේ පවතින ණය අනුපාතය අඛණ්ඩව 20.0%ට වඩා ඉහළ මට්ටමක පැවති අතර, එමගින් ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් එම අංශවල පවතින අභියෝග පෙන්නුම් කරයි.


2026 වසරේ දෙවන කාර්තුවෙන් අවසන් වූ වසර තුළ බැංකු අංශයේ ස්වෛරීත්ව නිරාවරණය[5] (sovereign exposure) පහත වැටුණු නමුත්, එය තවදුරටත් බැංකු අංශයේ වත්කම්වලින් සැලකිය යුතු කොටසක් නියෝජනය කරන ලදී. වසරකට පෙර වාර්තා වූ 13.2%ක වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට බැංකු අංශයේ ස්වෛරීත්ව නිරාවරණය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 8.1%කින් පහත වැටුණි. ඒ අනුව, බැංකු අංශයේ සමස්ත වත්කම්වලින් ප්‍රතිශතයක් ලෙස ස්වෛරීත්ව නිරාවරණය වසරකට පෙර පැවති 45.0%ක අගයේ සිට 37.9% දක්වා පහත වැටුණු අතර, එමගින් රාජ්‍ය අංශය වෙත අරමුදල් සංකේන්ද්‍රණය වීමේ අවදානම යම් ප්‍රමාණයක ලිහිල් වීමක් පෙන්නුම් කළ ද, එම නිරාවරණය තවදුරටත් සැලකිය යුතු මට්ටමක පැවතුණි. මෙම සංකෝචනය සඳහා ප්‍රධාන වශයෙන් බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 38.7%කින් පහත වැටීම හේතු විය. සාපේක්ෂ වශයෙන් අඩු ඵලදා අනුපාතික සහිත කෙටි කාලීන රජයේ සුරැකුම්පත්වලින් අරමුදල් ඉවත් කර පෞද්ගලික අංශයට ණය වශයෙන් ලබා දීම සඳහා නැවත වෙන් කිරීම මෙන්ම, රජය සතුව ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක පැවතීම මධ්‍යයේ සමස්ත භාණ්ඩාගාර බිල්පත් තොගය අඩු වීම මෙයින් ගම්‍ය වේ. රජය සහ රාජ්‍ය සතු ව්‍යවසායන් වෙත ලබාදුන් රුපියල්වලින් නම් කරන ලද ණය පහසුකම් ද මෙම කාල සීමාවේ දී කැපී පෙනෙන අයුරින් සංකෝචනය විය. ඊට ප්‍රතිවිරුද්ධව, බැංකු කෙටි කාලීන මූල්‍ය මෙවලම්වලට වඩා ඉහළ ඵලදා අනුපාතිකයක් සහිත දිගු කාලීන රජයේ සුරැකුම්පත් වෙත යොමු වීම ඉහළ යෑම හේතුවෙන් රජයේ බැඳුම්කරවල ආයෝජනය ඉහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන් එම කාලපරිච්ඡේදය තුළ විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ බලපෑම පිළිබිඹු කරමින්, රජය වෙත ලබාදුන් විදේශ මුදලින් නම් කරන ලද ණය පහසුකම්වල රුපියල් වටිනාකම ඉහළ ගියේය.

5 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී, බලපතලාභී බැංකු විසින් විදේශ මුදලින් ප්‍රතිව්‍යුහගත කළ බැඳුම්කරවල (මීට පෙර ස්වෛරීත්ව බැඳුම්කර ලෙස හැඳින් වූ) සිදු කරන ලද ආයෝජන, භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත්, දේශීය ඩොලර් බැඳුම්කර සහ බලපතලාභී බැංකු විසින් රජයට සහ රජය සතු ව්‍යවසායන්ට රුපියල් සහ විදේශ මුදල් යන ද්විත්වයෙන්ම ලබා දී ඇති ණය සහ අත්තිකාරම්වලින් බැංකු අංශයේ ස්වෛරීත්ව නිරාවරණ සමන්විත වේ.

ද්‍රවශීලතා අවදානම


වේගවත් ණය ප්‍රසාරණය පිළිබිඹු කරමින්, 2025 වසර ආරම්භයේ සිට බැංකු අංශයේ ද්‍රවශීලතා අනුපාත අඛණ්ඩව පහළ ගිය නමුත් අවම නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළ මට්ටමක පැවතුණි. රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ පැවති 328.5%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 272.5%ක් දක්වා පහළ ගියේය. සියලු මුදල් ඒකක සඳහා වන ද්‍රවශීලතා ආවරණ

රූප සටහන 3.23 රජය සහ රාජ්‍ය සතු ව්‍යවසායන් වෙත පවතින නිරාවරණය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.24 රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.25 **සියලු මුදල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනුපාතය ද මෙවැනි ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, එය 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ පැවති 283.7%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 229.7%ක් දක්වා පහත වැටුණි. කෙසේ වුවද, කෙටි කාලීන ද්‍රවශීලතා පීඩන තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් වන ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වා ගැනීමට බැංකු අංශය සමත් වූ බව පෙන්නුම් කරමින් අනුපාත ද්විත්වයම 100%ක් වන අවම නියාමන අවශ්‍යතාවට වඩා ඉහළ මට්ටමක පැවතුණි. තවද, පවතින ද්‍රවශීලතා ස්වාරක්ෂක මගින් බැංකුවලට තම ශේෂ පත්‍ර ප්‍රසාරණය කර ගැනීමට සහ මූල්‍ය අතරමැදිකරණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට සහායක් ලබා දෙයි. එමෙන්ම, ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය ද වසරකට පෙර පැවති 162.7%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 148.1%ක් දක්වා පහත වැටුණ ද, එය 100%ක අවම නියාමන අවශ්‍යතාවට වඩා ඉහළ මට්ටමක පැවතුණි. මේ මගින් බැංකු විසින් තම වත්කම් ව්‍යුහයට සාපේක්ෂව ප්‍රමාණවත් ස්ථාවර අරමුදල් පවත්වාගෙන ගිය බවත්, දිගු කාලීන අරමුදල් පීඩනයන්ට මුහුණ දීම සඳහා සූදානමින් පසු වූ බවත් පිළිබිඹු වේ.

බැංකු විසින් ණය ප්‍රසාරණය සඳහා අරමුදල් වැඩි වශයෙන් වෙන් කිරීමත් සමඟ ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම් (High Quality Liquid Assets-HQLA) සංකෝචනය වීම හේතුවෙන් ද්‍රවශීලතා ආවරණ අනුපාත පහළ ගියේය. 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ වාර්තා වූ 27.0%ක වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම් වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 15.1%කින් සංකෝචනය විය. බැංකු විසින් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ අරමුදල් ණය ලබා දීම සඳහා යොමු කිරීම මෙම සංකෝචනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, 2023 වසරේ මැද භාගයේ සිට ක්‍රියාත්මක වූ ලිහිල් මුදල් ප්‍රතිපත්තිය, 2025 වසර ආරම්භයේ සිට මෝටර් වාහන ආනයනය මත පනවා තිබූ ආනයන සීමා ඉවත් කිරීම සහ 2025 වසරේ දෙවන භාගයේ සිට රන් මිල ගණන් වේගයෙන් ඉහළ යෑම හේතුවෙන් ණය වර්ධනය සැලකිය යුතු ලෙස වේගවත් විය. මීට අමතරව, රජය ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක පවත්වාගෙන යාම හේතුවෙන් වසර තුළ, පවතින භාණ්ඩාගාර බිල්පත් ශේෂය පහත වැටුණු අතර එමගින් ආයෝජන සඳහා පවතින භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය අඩු විය.


ඉහළ ගිය ආනයන සඳහා අවශ්‍ය විදේශ විනිමය අලෙවි කිරීම් මෙන්ම මහ බැංකුව විසින් විදේශ විනිමය මිල දී ගැනීම් සිදු වූ පසුබිමක, විදේශ මුදල් අයෝජන සංකෝචනය වීම හේතුවෙන් 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී බැංකු අංශයේ විදේශ මුදල් වත්කම්වල වර්ධනය සැලකිය

රූප සටහන 3.26 **ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


රූප සටහන 3.27 **ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම් සංයුතිය***



* රුපියල් සහ විදේශ මුදල් යන ද්විත්වයෙන්ම නම් කර ඇති ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම්.


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.28 **විදේශ මුදල් වත්කම්වල සංයුතිය**



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.30 **විදේශ මුදල් වගකීම්වල සංයුතිය**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

යුතු ලෙස මන්දගාමී විය. බැංකු අංශයේ විදේශ මුදල් වත්කම් වර්ධනය 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී පැවති 10.5%ට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 1.3%ක් දක්වා සැලකිය යුතු ලෙස මන්දගාමී විය. ප්‍රධාන වශයෙන් 4.4%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ විදේශ මුදල් ණය හේතුවෙන් විදේශ මුදල් වත්කම්වල මෙම වර්ධනය සිදු වූ අතර, විදේශීය මූල්‍ය ආයතනවල පවතින ශේෂයන් ද 13.2%කින් ප්‍රසාරණය විය. කෙසේ වුවද, බැංකු කිහිපයක් විසින් විදේශ ස්වෛරීත්ව සුරැකුම්පත්වල තමන් සතු ආයෝජන ප්‍රමාණය අඩු කිරීම හේතුවෙන් 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී බැංකු අංශය සතු විදේශ මුදල් ආයෝජන වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 20.7%කින් කැපී පෙනෙන අයුරින් පහළ ගියේය. සැලකිය යුතු ප්‍රමාණයක විදේශීය ණය ලබා දීම් ද ඇතුළුව විදේශ මුදල් ඒකකවලින් පවතින අරමුදල්, ණය ලබා දීම සඳහා යෙදවීම විදේශ මුදල් ආයෝජනවල මෙම අඩු වීමට යම්තාක් දුරකට හේතු විය. කෙසේ වුවද, බැංකු අංශයේ විදේශ ණය ලබා දීම මෙලෙස දැඩි ලෙස ප්‍රසාරණය වීම මගින් එම අංශය විදේශීය ණය අවදානමට සහ විදේශ මුදල් ද්‍රවශීලතා අවදානමට නිරාවරණය විය හැකිය.

විදේශ මුදල් වත්කම්වලට වඩා වේගයෙන් විදේශ මුදල් වගකීම් වර්ධනය වීම හේතුවෙන් ශුද්ධ විදේශ මුදල් වත්කම් සංකෝචනය වූ අතර, එමගින් විදේශ මුදලින් පවතින අරමුදල් සපයා ගැනීමේ දී විදේශ මුදල් තැන්පතු මත බැංකු අංශයේ අධික ලෙස රඳා පැවතීම පිළිබිඹු කෙරිණි. විදේශ මුදල් වගකීම් 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී 4.0%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, එය 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ වාර්තා වූ 7.6%ක වර්ධනයට සාපේක්ෂව මන්දගාමී විය. මෙම


රූප සටහන 3.29 **විදේශ මුදල් ආයෝජනවල සංයුතිය**



* 2023 වසරේ දෙවන කාර්තුව දක්වා වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ 2025 වසරේ සිව්වන කාර්තුවේ සිට වූ දේශීය ඩොලර් බැඳුම්කර මෙයට ඇතුළත් වේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.31 **ශුද්ධ විදේශ මුදල් වත්කම්**



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව


වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් විදේශ මුදල් තැන්පතු 5.1%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කිරීම හේතු වූ අතර, අදාළ කාලපරිච්ඡේදයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් ඉහළ යෑම විදේශ මුදල් තැන්පතුවල මෙම වැඩි වීමට යම්තාක් දුරකට බලපෑවේ ය. මේ අතර, විදේශ මුදල් ණයගැනීම් පෙර වසරවල දී සැලකිය යුතු සංකෝචනයක් වාර්තා කිරීමෙන් පසුව 2025 වසර අවසානයේ සිට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ප්‍රසාරණය වීම ආරම්භ විය. ඒ අනුව, එය 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී 2.2%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. තවද, සමස්ත විදේශ මුදල් වත්කම්වල වර්ධනය සැලකිය යුතු අයුරින් මන්දගාමී වීමත් සමඟ, බැංකු අංශයේ ශුද්ධ විදේශ මුදල් වත්කම් වසරකට පෙර වාර්තා කළ 43.3%ක වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 22.6%කින් සැලකිය යුතු ලෙස සංකෝචනය විය.

බැංකු අංශය තවදුරටත් ප්‍රධාන වශයෙන් පෞද්ගලික අරමුදල්[6] (retail funding) මත රඳා පැවතුණ ද ඇප රහිත ආයතනික අරමුදල්[7] (unsecured wholesale funding) වඩා වේගයෙන් වර්ධනය වූ අතර, විශේෂයෙන් විදේශීය බැංකු අතර එම අරමුදල් ඉහළ මට්ටමක පැවතුණි. 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට පෞද්ගලික අරමුදල් 6.7%ක වාර්ෂික ලක්ෂ්‍යමය ඉහළ යාමක් වාර්තා කළ අතර, ඇප රහිත ආයතනික අරමුදල් 11.4%කින් වර්ධනය විය.

6 ඉල්ලුම්, ඉතුරුම් සහ කාලීන තැන්පතු (කල්පිරීම් කාලය දින 30ට අඩු) මෙන්ම ඉතිරි කල්පිරීම දින 30 ඉක්මවන කාලීන තැන්පතු ඇතුළත් වේ.


7 නිෂ්කාශන, භාරකාර සහ මුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් මගින් ජනනය කරන ලද මෙහෙයුම් තැන්පතු, ආයතනික ජාලයක් තුළ පවතින සමූපාකාර බැංකු (මධ්‍යගත ආයතනය සමඟ සුදුසුකම් ලබන තැන්පතු), මූල්‍ය නොවන සංස්ථා, ස්වෛරී රාජ්‍ය, මහ බැංකු, බහුපාර්ශ්වික සංවර්ධන බැංකු සහ රාජ්‍ය අංශයේ ව්‍යවසායන් මෙන්ම අනෙකුත් නෛතික ආයතන ගනුදෙනුකරුවන් ඇතුළත් වේ.

රූප සටහන 3.32 පෞද්ගලික සහ ආයතනික අරමුදල්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.33 බැංකු කාණ්ඩය අනුව පෞද්ගලික සහ ආයතනික අරමුදල්




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකු සහ අනෙකුත් දේශීය බැංකු සතුව ඇති පෞද්ගලික අරමුදල්, මුළු අරමුදල් ප්‍රමාණයෙන්[8] 66.9%ක් හා 73.2%ක් විය. විදේශීය බැංකු ප්‍රධාන වශයෙන් ඇප රහිත ආයතනික අරමුදල් මත රඳා පැවති අතර, එය වසරකට පෙර පැවති 74.8%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 91.6%ක් දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. මෙය අදාළ කාලසීමාවේ දී විදේශීය බැංකුවක සිට දේශීය බැංකුවක් වෙත පෞද්ගලික (retail) බැංකු මෙහෙයුම් මාරු වීම සුවිශේෂී ලෙස පිළිබිඹු කළේය. පෞද්ගලික තැන්පතු වැඩි වශයෙන් පැවතීම අරමුදල් ස්ථායීතාව සඳහා සහාය වන නමුත්, විදේශීය බැංකු අඛණ්ඩව ආයතනික අරමුදල් මත රඳා පැවතීම දේශීය පෞද්ගලික තැන්පතු සීමිත ලෙස රැස් කිරීමේ ඔවුන්ගේ ව්‍යාපාර ආකෘතිය සමඟ අනුකූල වේ. කෙසේ වෙතත්, විශේෂයෙන් වෙළෙඳපොළ ආතතීන් පවතින කාලවල දී අරමුදල් සකේන්ද්‍රණය වීමේ සහ අරමුදල් කල්පිරීමේ දී නැවත සපයා ගැනීමේ අවදානම්වලට මෙම බැංකු නිරාවරණය විය හැකි බැවින් එවැනි අරමුදල් මූලාශ්‍ර සමීපව නිරීක්ෂණය කළ යුතු වේ. කෙසේ වෙතත්, 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී බැංකු අංශයේ ආයතනික අරමුදල්වල සැලකිය යුතු මන්දගාමී වීමක් දක්නට ලැබුණි.

2026 වසරේ දී කෙටි කාලීන කල්පිරීම් අසමතුලිත වීම පුළුල් වූ අතර, ඒ හේතුවෙන් අනපේක්ෂිත ආතති තත්ත්වයන් මධ්‍යයේ ප්‍රතිමූල්‍යකරණ සහ ද්‍රවශීලතා පීඩන වැඩි වීමට ඉඩ ඇත. බැංකු අංශයේ දින 7, දින 28, මාස 3, මාස 6 සහ මාස 12 ඇතුළු කෙටි කාලීන කල් පිරීම් කාණ්ඩවල ඍණ සමුච්චිත කල් පිරීමේ පරතරයන් නිරපේක්ෂ අගයෙන් මෙන්ම සමස්ත වත්කම්වලට සාපේක්ෂව ද සාමාන්‍යයෙන් පුළුල් වී ඇති අතර, එමගින් වසරක කාල

8 පෞද්ගලික අරමුදල් සහ ඇප රහිත ආයතනික අරමුදල්වල එකතුව.

රූප සටහන 3.34
කල්පිරීම් පරතරය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

පරාසයක් තුළ අපේක්ෂිත මුදල් ලැබීම් සහ ගෙවීම් අතර වර්ධනය වන අසමතුලිතතාව පිළිබිඹු කරයි. දිගු කාලීන කාණ්ඩවල සමුච්චිත පරතරයන් පුළුල් වීම මගින් වත්කම් සහ වගකීම්වල කල්පිරීම් අතර කල් පවතින ව්‍යුහාත්මක අසමතුලිතතාවක් ද පෙන්නුම් කරන අතර, එය කාලයත් සමඟ අඛණ්ඩව පැවතුණහොත් ප්‍රතිමූල්‍යකරණ සහ අරමුදල් සපයා ගැනීමේ පිරිවැය ඉහළ යා හැකිය. මීට අමතරව, වසරක් දක්වා වූ සමුච්චිත ඍණ පරතරය ඉක්මවා ගිය ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම් 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ පැවති රුපියල් ට්‍රිලියන 5.0ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී රුපියල් ට්‍රිලියන 2.6ක් දක්වා පහළ ගිය අතර, එමගින් පවතින ද්‍රවශීල වත්කම් ස්වාරක්ෂකවල පහළ යාම මධ්‍යයේ කෙටි කාලීන අසමතුලිතතාවන් ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කරයි. මෙම හැසිරීම තවදුරටත් පවත්වාගැනීම මගින් විශේෂයෙන්, ආතති සහගත ද්‍රවශීල තත්ත්වයන් තුළ බැංකු තැන්පතු ආපසු ගැනීම්, වෙළෙඳපොළ ප්‍රවේශය සීමා වීම හෝ ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම් මුදල් බවට පත් කිරීමේ දී පීඩනයන්ට ලක් වීම යනාදියට බැංකුවලට මුහුණ දීමට සිදුවුවහොත්, අරමුදල් කල්පිරීමේ දී නැවත සපයා ගැනීමේ අවදානම සහ කෙටි කාලීන ප්‍රතිමූල්‍යකරණ අවදානම් තීව්‍ර විය හැකිය.


ආතතිමය තත්ත්වයන් යටතේ ඇතිවිය හැකි අවිනිශ්චිත ද්‍රවශීලතා සහ ණය අවදානම් ඉස්මතු කරමින් 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට ශේෂ පත්‍රයෙන් පරිබාහිර නිරාවරණ සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය. 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ ශේෂ පත්‍රයෙන් පරිබාහිර මුළු නිරාවරණයන් 19.3%ක වාර්ෂික ලක්ෂ්‍යමය ඉහළ යාමක් වාර්තා කළ අතර, එම නිරාවරණයන් ශේෂ පත්‍රගත වගකීම්වල කොටසක් ලෙස වසරකට පෙර පැවති 30.5%ක අගයේ සිට 33.5%ක් දක්වා ඉහළ ගියේය. භාවිතා නොකළ ණය සීමා සමස්ත ශේෂ පත්‍රයෙන් පරිබාහිර නිරාවරණයන්ගෙන් 35.4%ක් නිරූපණය කරමින් විශාලතම සංරචකය ලෙස පැවති අතර, එය ණය ප්‍රසාරණයට අනුකූලව වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 10.1%කින් ඉහළ යන ලදී. විදේශ විනිමය ගිවිසුම් ද වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 15.7%කින් ඉහළ යමින් සැලකිය යුතු මට්ටමක පැවතුණි. ලේඛන ණය සහ ඇපකර/බැඳුම්කර හේතුවෙන් බැංකුවලට අනාගතයේ දී ඇතිවිය හැකි අවිනිශ්චිත බැඳීම් වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 25.3%කින් ඉහළ ගිය අතර, එමගින් වෙළෙඳ කටයුතුවලට අදාළ සහ ඇපකර සම්බන්ධ නිරාවරණයන් ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කරයි. භාවිතා නොකළ ණය සීමා ප්‍රසාරණය වීම හේතුවෙන් ආතතිමය කාලවල දී ගනුදෙනුකරුවන් එම වෙන්කරන ලද පහසුකම් ලබාගන්නේ නම් බැංකු ඉහළ ද්‍රවශීලතා ඉල්ලුමකට නිරාවරණය විය හැකි අතර,

රූප සටහන 3.35
කෙටිකාලීන කල්පිරීම් පරතරය සහ ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම්



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.36
ශේෂ පත්‍රයෙන් පරිබාහිර මෙහෙයුම්



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


විදේශ විනිමය ගිවිසුම් ඉහළ යෑම මගින්, විශේෂයෙන් අස්ථාවර වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ, ප්‍රතිපාර්ශ්වීය, පියවීම් සහ විනිමය අනුපාතික ආශ්‍රිත අවදානම් තීව්‍ර කළ හැකිය. තවද, ඇපකර හෝ ලේඛන ණය ඉල්ලා සිටියහොත් බැංකුවලට අනාගතයේ දී ඇතිවිය හැකි අවිනිශ්චිත බැඳීම් ඉහළ යෑම මගින් ඒවා ශේෂ පත්‍රගත නිරාවරණයන් බවට පත්වීමේ හැකියාවක් ඇත. එබැවින්, ශේෂ පත්‍රයෙන් පරිබාහිර නිරාවරණ ක්‍රියාකාරකම් අබණ්ඩව ප්‍රසාරණය වීම, විශේෂයෙන් බැංකුවල ද්‍රවශීලතා ස්වාරක්ෂක, ප්‍රතිපාර්ශ්වීය අවදානම් කළමනාකරණය සහ ණය නිරාවරණ බවට පරිවර්තනය වීමේ අවදානම් සඳහා වන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා සම්බන්ධයෙන්, සමීපව අධීක්ෂණය කළ යුතු වේ.

ලාභදායීත්වය

2025 වසරේ අනුරූප කාල සීමාවට සාපේක්ෂව වර්ධන වේගය මන්දගාමී වුවද, 2026 වසරේ පළමු භාගයේ බැංකු අංශයේ ලාභදායීත්වය වර්ධනය විය. 12.9%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් බැංකු අංශය 2026 වසරේ පළමු භාගයේ දී රුපියල් බිලියන 208.7ක බදු පසු ලාභයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, මෙය, 2025 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ 67.2%ක වර්ධනයට වඩා සැලකිය යුතු අඩු වීමක් විය. ලිහිල් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක අවධියක් මධ්‍යයේ පොලී වියදම් වේගයෙන් අඩු වීම හේතුවෙන් සිදු වූ ශුද්ධ පොලී ආදායමේ තියුණු වැඩි වීම 2025 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ ඉහළ ලාභ වර්ධනයට ප්‍රධාන වශයෙන්ම හේතු විය. 2026 වසරේ පළමු භාගයේ දී, ශුද්ධ පොලී ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 11.3%කින් වර්ධනය වූ අතර, බැංකු අංශයේ ලාභදායීත්වය වර්ධනයට ප්‍රධාන සාධකය ලෙස තවදුරටත් පැවතුණි. වෙළෙඳාමෙන් ලැබුණු ශුද්ධ ලාභ සහ ශුද්ධ ගාස්තු මත පදනම් වූ ආදායම ද පිළිවෙළින් 105.7%ක සහ 19.2%ක කැපී පෙනෙන වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයන් වාර්තා කළේය. කෙසේ වෙතත්, මෙහෙයුම් වියදම් සහ හානිකරණ ගාස්තු සැලකිය යුතු ලෙස ඉහළ යෑම නිසා මෙම ආදායම් ලැබීම් කොටසක් පියවී ගියේය.

2026 වසරේ පළමු භාගයේ දී බැංකු අංශයේ ලාභදායීත්වය වැඩිදියුණු වීම සඳහා දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකුවල ඉහළ ලාභ ලැබීම මූලික වශයෙන් දායක විය. ශුද්ධ පොලී ආදායමේ සැලකිය යුතු වර්ධනය මගින් මෙහෙය වූ දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකුවල බදු පසු ලාභය 2026 වසරේ පළමු භාගයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 11.7%කින් ඉහළ ගිය අතර, එය බැංකු අංශයේ සමස්ත ලාභ වර්ධනයෙන් 58.6%ක ප්‍රතිශතයක් නියෝජනය


රූප සටහන 3.38 බදු පසු ලාභයේ සංරචක



* වෙනත් ආදායම්/වියදම් සඳහා, ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමින් මනිනු ලබන මූල්‍ය උපකරණවලින් ලැබෙන ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභ, මූල්‍ය වත්කම් බැහැර කිරීමෙන් ලැබෙන ශුද්ධ ලාභ සහ ආශ්‍රිත සමාගම් හා ඒකාබද්ධ ව්‍යාපාරවලින් ලැබෙන ලාභ කොටස ඇතුළත් වේ.


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.37 බදු පසු ලාභය (අර්ධ වාර්ෂික)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.39 බැංකු කාණ්ඩය අනුව බදු පසු ලාභය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කළේය. මේ අතර, විදේශීය බැංකුවල බදු පසු ලාභය ද 43.4%ක සැලකිය යුතු වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, අදාළ කාල සීමා තුළ සිය පෞද්ගලික (retail) බැංකු ව්‍යාපාරය දේශීය බැංකුවකට විකිණීමෙන් විදේශීය බැංකුවක අනෙකුත් මෙහෙයුම් ආදායම ඉහළ යෑම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, ශුද්ධ පොළී ආදායම ඉහළ යෑම, වෙළෙඳාමෙන් ලද ශුද්ධ ලාභ, ශුද්ධ ගාස්තු පදනම් ආදායම, සහ ඉහත සඳහන් විදේශීය බැංකුවේ පෞද්ගලික බැංකු ව්‍යාපාරය අත්පත් කරගත් බැංකුවේ ආයතනික ආදායම් බදු අඩු කිරීම හේතුවෙන්, අනෙකුත් දේශීය බැංකු කාණ්ඩය 6.2%ක වාර්ෂික බදු පසු ලාභ වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, මෙහෙයුම් වියදම්වල කැපී පෙනෙන ඉහළ යාමක් සහ අනෙකුත් මෙහෙයුම් ආදායමේ පහළ යාමක් සමඟ ඉහළ ගිය හානිකරණ ගාස්තු හේතුවෙන් අනෙකුත් දේශීය බැංකු කාණ්ඩයේ ලාභ වර්ධනය මන්දගාමී විය.

ශුද්ධ පොළී ආදායමේ වර්ධනය මූලික වශයෙන්ම දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකු මගින් සිදු වූ අතර, විදේශීය බැංකු ණය ලබාදීමේ ක්‍රියාකාරකම්වලින් අඛණ්ඩව පහළ ඉපැයීම් වාර්තා කළේය. 2026 වසරේ පළමු භාගයේ දී දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකුවල ශුද්ධ පොළී ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 13.4%කින් වර්ධනය වූ අතර, එය බැංකු අංශයේ ශුද්ධ පොළී ආදායමෙන් 66.0%ක් නියෝජනය කළේය. අනෙකුත් දේශීය බැංකු ද 9.2%ක වාර්ෂික ලක්ෂ්‍යමය ශුද්ධ පොළී ආදායම් වර්ධනයක් වාර්තා කළ අතර, විදේශීය බැංකුවල ශුද්ධ පොළී ආදායම මෑත වසරවල දී දක්නට ලැබුණු පහළ යෑමේ ප්‍රවණතාව තවදුරටත් පවත්වා ගනිමින් 1.3%කින් පහත වැටුණි. බැංකු කාණ්ඩවල පවතින ශුද්ධ පොළී ආදායම් ව්‍යාප්තිය මගින් දේශීය බැංකු තුළ පොළී ආදායම් උත්පාදනය කේන්ද්‍රගත වී ඇති බව ඉස්මතු කරයි.

රූප සටහන 3.41 **පොළී නොවන ආදායම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළෙඳ ක්‍රියාකාරකම්වලින් ලද ඉහළ ශුද්ධ ලාභය, ගාස්තු මත පදනම් වූ ආදායම සහ අනෙකුත් මෙහෙයුම් ආදායම්වල වර්ධනය හේතුවෙන්, 2025 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස පොළී නොවන ආදායම වැඩි විය. ඒ අනුව, පෙර වසරේ අනුරූප කාල සීමාවේ පැවති 21.3%ක අගයට සාපේක්ෂව, 2026 වසරේ පළමු භාගයේ දී දළ ආදායමට සාපේක්ෂව පොළී නොවන ආදායමේ ඇති අනුපාතය 24.3% දක්වා වැඩි විය. වෙළෙඳාමෙන් ලද ශුද්ධ ලාභය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 105.7%ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ අතර, ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම සහ අනෙකුත් ශුද්ධ මෙහෙයුම් ආදායම පිළිවෙළින් 19.2%කින් සහ 56.9%කින් ඉහළ ගියේය.


2026 වසරේ පළමු භාගයේ දී නව හානිකරණ ගාස්තු බැංකු අංශයේ ලාභදායීත්වයට සෘණාත්මක ලෙස බලපෑවේ ය. ණය සහ ලැබිය යුතු දෑ, ආයෝජන සහ ශේෂ පත්‍රයෙන්

රූප සටහන 3.40 **බැංකු කාණ්ඩය අනුව ශුද්ධ පොළී ආදායම**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.42 **වත්කම් මත නව ණය හානිකරණ ගාස්තු**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බැහැර නිරාවරණ සම්බන්ධ නව හානිකරණ ප්‍රතිපාදන ඇතුළුව සමස්ත නව හානිකරණ ගාස්තු, 2025 වසරේ පළමු භාගයේ පැවති 29.5%ක සංකෝචනයට සාපේක්ෂව, 2026 වසරේ පළමු භාගයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 104.7%කින් වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන්ම බැංකු අංශයේ සිදු වූ ණය ප්‍රසාරණය වේගවත්වීම මධ්‍යයේ, ණය සහ ලැබිය යුතු දෑ මත පැන වූ හානිකරණ ගාස්තු හේතු විය.

පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී ප්‍රධාන ලාභදායීත්ව අනුපාතික සුළු වශයෙන් පහත වැටුණි. 2025 වසරේ පළමු භාගයේ දී පිළිවෙළින් 18.2%, 2.6% සහ 4.5% ලෙස වාර්තා වූ අගය සමඟ සැසඳීමේදී, බැංකු අංශයේ හිමිකම් මත ප්‍රතිලාභය, වත්කම් මත ප්‍රතිලාභය සහ ශුද්ධ පොලී ආන්තිකය 2026 වසරේ පළමු භාගයේ දී පිළිවෙළින් 17.5%, 2.5% සහ 4.4% දක්වා පහත වැටුණි.

ණය මගින් ලැබුණු පොලී ආදායම ඉහළ යාමත් සමඟ බැංකු අංශයේ ශුද්ධ පොලී ආන්තිකය ඉහළ මට්ටමක පැවතුණ ද, අනෙකුත් මූල්‍ය වත්කම්වලින් ලැබුණු අඩු පොලී ආදායම එම අනුපාතයට සෘණාත්මක බලපෑමක් ඇති කළේය. බැංකු අංශයේ ශුද්ධ පොලී ආන්තිකය 2025 වසරේ පළමු භාගයේ පැවති 4.5% සිට 2026 වසරේ පළමු භාගයේ දී 4.4% දක්වා සුළු වශයෙන් පහත වැටුණ ද, එය එහි වසර 10ක සාමාන්‍යය වන 3.8%ට වඩා ඉහළ මට්ටමක පැවතුණි. ආර්ථික අර්බුදය සමයේ ඉහළ ඵලදා අනුපාතික පැවතීම හේතුවෙන් බැංකු විසින් රජයේ සුරැකුම්පත්වල සැලකිය යුතු ලෙස සිදු කරන ලද ආයෝජනවලින් යම් සහායක් ලබමින්, බැංකු අංශයේ ශුද්ධ පොලී ආන්තිකය 2022 වසරේ දී කැපී පෙනෙන ඉහළ යාමක් වාර්තා කළේය. තවද, 2023 වසරේ මැද භාගයේ ආරම්භ වූ ලිහිල් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වූ අවධිය තුළ, ණය පොලී

රූප සටහන 3.44 **බැංකු අනුව ශුද්ධ පොලී ආන්තිකයේ සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතයෙහි ව්‍යාප්තිය***




* එක් එක් බැංකුවේ වෙළෙඳපොළ කොටස ව්‍යාප්තියේ ප්‍රමාණය මගින් නිරූපණය කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


අනුපාතිකවලට සාපේක්ෂව තැන්පතු පොලී අනුපාතික වේගවත් හා අසමමිතික ලෙස ගැලපීම මගින් බැංකු අංශය විසින් ශුද්ධ පොලී ආන්තිකය ඉහළ මට්ටමක පවත්වා ගෙන යන ලදී. අනතුරුව සිදුවූ ණය කළඹේ ප්‍රසාරණය ද ණය ලබා දීම මගින් ලැබෙන පොලී ආදායම තවදුරටත් ශක්තිමත් කළේය. කෙසේ වෙතත්, 2025 වසරේ දෙවන භාගයේ සිට අනෙකුත් මූල්‍ය වත්කම්වලින්, විශේෂයෙන්ම, රජයේ සුරැකුම්පත්වලින් ලැබෙන ආදායමෙහි අඩු වීමක් දක්නට ලැබුණි. රජයේ සුරැකුම්වල ඵලදා අනුපාතික පහළ යාම මෙන්ම වේගවත් වූ ණය ඉල්ලුමට සහාය දීම සඳහා රජයේ සුරැකුම්පත්වලින් ණය ලබා දීම වෙත අරමුදල් යොමු කිරීමත්, මෙයට හේතු වන්නට ඇත. අනෙකුත් මූල්‍ය වත්කම්වලින් ලැබෙන පොලී ආදායමේ මෙම පහත වැටීම 2026 වසරේ පළමු භාගයේ දී ශුද්ධ පොලී ආන්තිකය කෙරෙහි යම් පීඩනයක් ඇති කළ ද, පෙර වාර්තා වූ

රූප සටහන 3.43 **ලාභදායීත්ව දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.45 **ශුද්ධ පොලී ආන්තිකයේ විශ්ලේෂණය**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.46 **පොළී ආදායමේ සංයුතිය**



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව


සාමාන්‍යය සමඟ සසඳන විට ශුද්ධ පොළී ආන්තිකය සාපේක්ෂව ඉහළ මට්ටමක පවත්වා ගැනීමට ණය කළඹේ ප්‍රසාරණය සහාය විය.

වෙළෙඳපොළ අවදානම

වෙළෙඳපොළ පොළී අනුපාතික ඉහළ යමින් පවතින තත්ත්වයන් මධ්‍යයේ, මසක කාල සීමාවක් දක්වා පොළිය උපයන වත්කම් කාණ්ඩය, පොළිය ගෙවිය යුතු වගකීම්වලට වඩා වැඩි වීම හේතුවෙන්, 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට බැංකු අංශයේ ආසන්න-කාලීන ප්‍රතිමිලකරණ කළඹ වැඩිදියුණු විය. කෙසේ වෙතත්, මාසයක කාල සීමාවෙන් ඔබ්බට සැලකිය යුතු ඍණාත්මක පරතරයන් අඛණ්ඩව පැවතුණි. 2025 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට මාසයක කාල සීමාවක් තුළ රුපියල් බිලියන 111.2ක ඍණ අගයක් ලෙස පැවති සමුච්චිත තත්ත්වය 2026 දෙවන කාර්තුව අවසානය වන විට රුපියල් බිලියන 457.3ක ධන අගයක් දක්වා වැඩි වූ අතර, මාස 3 සහ 6ක කාල සීමාවන් තුළ පැවති ඍණාත්මක තත්ත්වයන් පිළිවෙළින් රුපියල් බිලියන 277.7ක් සහ රුපියල් බිලියන 709.0ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. මාස 12ක කාල සීමාවක් තුළ සමුච්චිත ඍණ අගය ද රුපියල් ට්‍රිලියන 2.7ක සිට රුපියල් ට්‍රිලියන 2.5ක් දක්වා අඩු විය. මාසයක කාල සීමාවක් ඉක්මවා ගිය පසු, වත්කම්වලට සාපේක්ෂව පොළී සංවේදී වගකීම් වැඩි ප්‍රමාණයක්, ප්‍රතිමිලකරණයට යටත්ව පැවති බව මෙමගින් පෙන්නුම් කරයි. 2026 වසරේ මැයි මාසයේ දී එක්දින ප්‍රතිපත්ති පොළී අනුපාතිකය පදනම් ලකුණු 100කින් ඉහළ දැමීමෙන් අනතුරුව, පවතින ඍණ ප්‍රතිමිලකරණ පරතර හේතුවෙන් වත්කම්වලට වඩා වේගයෙන් වගකීම් ප්‍රතිමිලකරණය වීමට ඉඩ ඇති අතර, එය ශුද්ධ පොළී ආන්තිකය යම් තරමකට පහළ යාමට හේතු විය හැකි ය. කෙසේ වෙතත්, ශුද්ධ පොළී ආන්තිකය තවදුරටත් ඉහළ මට්ටමක පවතින බැවින්, එවැනි පහළ යාමක් බැංකු අංශයේ ලාභදායීත්වය සම්බන්ධව ක්ෂණිකව අවධානයට ලක් විය යුතු කරුණක් නොවනු ඇත.


විනිමය අනුපාතික වෙනස්වීම කෙරෙහි සංවේදීතාව ඉහළ යෑම පිළිබිඹු කරමින්, බැංකු අංශයේ ශුද්ධ විදේශ මුදල් නිරාවරණය 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට ඉහළ ගියේය. ශේෂ පත්‍රය තුළ සහ ශේෂ පත්‍රයෙන් පරිබාහිර තත්ත්වයන් දෙකම ඇතුළත් වන ශුද්ධ විදේශ මුදල් නිරාවරණය, 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 31.0%කින් ඉහළ ගොස්, රුපියල් බිලියන 504.3ක (එක්සත් ජනපද ඩොලර් මිලියන 1,499.9ක) අතිරික්ත තත්ත්වයක් දක්වා වර්ධනය විය. ඒ අනුව, නියාමන ප්‍රාග්ධනය සඳහා ශුද්ධ විදේශ

රූප සටහන 3.47 **සමුච්චිත පොළී ගෙවිය යුතු වත්කම් සහ වගකීම්**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.48 **නියාමන ප්‍රාග්ධනයට සාපේක්ෂව ශුද්ධ විදේශ මුදල් නිරාවරණය**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.49 මුදල් ඒකක වශයෙන් ශුද්ධ විදේශ මුදල් නිරාවරණය



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.50 හිමිකම් ආශ්‍රිත ආයෝජන



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


මුදල් නිරාවරණ අනුපාතිකය 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ පැවති 18.9% සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 21.3% දක්වා ඉහළ ගියේය. ශේෂ පත්‍රයේ දැක්වෙන තත්ත්වය, 2025 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට පැවති රුපියල් බිලියන 51.5ක ශුද්ධ වත්කම් තත්ත්වයක සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට රුපියල් බිලියන 106.8ක ශුද්ධ වගකීම් තත්ත්වයක් දක්වා වෙනස් වුව ද, මෙය ශේෂ පත්‍රයෙන් පරිබාහිර ශුද්ධ අතිරික්ත තත්ත්වයේ සැලකිය යුතු වැඩි වීමක් මගින් හිලව් විය. මුදල් වර්ගය සම්බන්ධයෙන් ගත් කළ, එක්සත් ජනපද ඩොලර් නිරාවරණය ප්‍රමුඛව පැවතිය ද, අනෙකුත් මුදල් ඒකක වෙත ඇති නිරාවරණයන්හි කැපී පෙනෙන වැඩි වීමක් වාර්තා විය. සමස්ත විදේශ විනිමය නිරාවරණයෙහි අතිරික්ත තත්ත්වයක් පැවතීම තුළින් රුපියල තවදුරටත් අවප්‍රමාණය වීමක දී ලැබෙන ඉපයීම් වැඩි වීමට ඉඩ ඇති නමුත්, රුපියලේ අගය අතිප්‍රමාණය වීමක දී බැංකු අංශය පාඩු ලැබීම්වලට නිරාවරණය වනු ඇත.

2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට හිමිකම් ආශ්‍රිත අවදානම් (equity risk) සඳහා බැංකු අංශයේ නිරාවරණය සුළු වශයෙන් ඉහළ ගිය ද, හිමිකම් ආශ්‍රිත ආයෝජන සාපේක්ෂව අඩු අගයක පැවතිණි. 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට ලැයිස්තුගත හිමිකම් ආශ්‍රිත ආයෝජන වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 16.3%කින් රුපියල් බිලියන 80.4ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට බැංකු අංශයේ සමස්ත ආයෝජන වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 9.8%කින් අඩු වී රුපියල් බිලියන 8,955.0ක් බවට පත් වූ අතර, එය 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ 0.7%ක්ව පැවති සමස්ත ආයෝජනවලින් හිමිකම් ආශ්‍රිත ආයෝජන ප්‍රමාණය, 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 0.9%ක් දක්වා ඉහළ දැමීමට හේතු විය. එසේ වුව ද, සමස්ත ආයෝජන කළඹ තුළ හිමිකම් ආශ්‍රිත ආයෝජනවල කොටස සීමිත මට්ටමක පැවතීම හේතුවෙන් කොටස් වෙළෙඳපොළේ මිල උච්චාවචනයන් සඳහා බැංකු අංශය සෘජුව නිරාවරණය වීම සීමා විය.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව

ඉහළ ගිය ණය ප්‍රසාරණය හේතුවෙන් මෙම කාලසීමාව තුළ දී බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත පහත වැටුණ ද, එම අනුපාත නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළ මට්ටමක පවත්වාගෙන යන ලදී. බැංකු අංශයේ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 2025 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට පැවති 19.4%ට සාපේක්ෂව, 2026 වසරේ දෙවන කාර්තුව

රූප සටහන 3.51 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

අවසානය වන විට 18.2% දක්වා පහළ ගියේය. 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට, නියාමන ප්‍රාග්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 15.9%ක සාපේක්ෂව අඩු වර්ධනයක් පෙන්නුම් කළ පසුබිමක, මෙම කාල සීමාව තුළ සිදු වූ සුවිශේෂී ණය ප්‍රසාරණය මැනවින් පිළිබිඹු කරමින් අවදානම් මත බර තැබූ වත්කම් වාර්ෂිකව 23.8%කින් ඉහළ යෑම මෙයට ප්‍රධාන හේතුව විය. තවද, බැංකු අංශයේ පළමු ස්ථර පොදු හිමිකම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය ද වසරකට පෙර පැවති 15.7%ට සාපේක්ෂව, 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට 14.6%ක් දක්වා පහත වැටුණි. එය අවදානම් මත බර තැබූ වත්කම්වලට සාපේක්ෂව, බැංකු අංශයේ ගුණාත්මක ප්‍රාග්ධන ස්වාරක්ෂක පහත වැටී ඇති බව පෙන්නුම් කරමින් අනපේක්ෂිත අලාභයන් හමුවේ බැංකු අංශයේ අවදානම් සහගත බව තවදුරටත් ඉහළ නංවයි.


ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයෙහි පහත වැටීම සියලුම බැංකු කාණ්ඩයන් පුරා පුළුල්ව දක්නට ලැබුණු අතර, එය නියාමන ප්‍රාග්ධනයට සාපේක්ෂව අවදානම් මත බර තැබූ වත්කම්වල සමස්ත බැංකු අංශය පුරා ඉහළ යාමක් පිළිබිඹු කරයි. 2025 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට පිළිවෙළින් 18.3%ක් සහ 17.4%ක් ලෙස වාර්තා වූ දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකු සහ අනෙකුත් දේශීය බැංකුවල සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය, 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට පිළිවෙළින් 17.2%ක් සහ 16.4%ක් දක්වා පහත වැටුණි. දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකුවල සමස්ත නියාමන ප්‍රාග්ධනය 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 19.6%කින් වර්ධනය වූ අතර, එහි අවදානම් මත බර තැබූ වත්කම් 27.4%කින් සැලකිය යුතු ලෙස සාපේක්ෂව වඩාත් වේගයෙන් ප්‍රසාරණය විය. එසේම

රූප සටහන 3.52
බැංකු කාණ්ඩය අනුව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.53
බැංකු කාණ්ඩය අනුව සමස්ත ප්‍රාග්ධනය සහ අවදානම් මත බර තැබූ වත්කම්




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

අවදානම් මත බර තැබූ වත්කම්වල 21.3%ක වර්ධනයට සාපේක්ෂව, 2026 වසරේ දෙවන කාර්තුවේ අවසානය වන විට අනෙකුත් දේශීය බැංකුවල සමස්ත නියාමන ප්‍රාග්ධනය, වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 14.2%කින් වර්ධනය විය. විදේශීය බැංකු සම්බන්ධයෙන් ගත් කළ, සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය වසරකට පෙර පැවති 35.0% සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 34.8%ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණු අතර, සමස්ත නියාමන ප්‍රාග්ධනය සහ අවදානම් මත බර තැබූ වත්කම් පිළිවෙළින් 4.3%ක සහ 4.8%ක සාපේක්ෂව මධ්‍යස්ථ වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කළේය. විදේශීය බැංකුවකින් දේශීය බැංකුවක් වෙත පෞද්ගලික (retail) බැංකු මෙහෙයුම් පැවරීම, අනෙකුත් දේශීය බැංකු කාණ්ඩයේ අවදානම් මත බර තැබූ වත්කම්වල වඩාත් වේගවත් ඉහළ යාමට යම්තාක් දුරකට බලපෑ අතර, පවරන බැංකුවේ අවදානම් මත බර තැබූ වත්කම්වල සිදු වූ අනුරූපී අඩු වීම විදේශීය බැංකු අතර අවදානම් මත බර තැබූ වත්කම්වල වර්ධනය මන්දගාමී කිරීමට හේතු විය. කෙසේ වෙතත්, දේශීය බැංකුවල නියාමන ප්‍රාග්ධන වර්ධනය සහ අවදානම් මත බර තැබූ වත්කම් වර්ධනය අතර පවතින සැලකිය යුතු පරතරය මගින්, අවදානම් මත බර තැබූ නිරාවරණයන්හි ඉහළ යෑම සමඟ ප්‍රාග්ධන ඒකරාශීකරණය ප්‍රමාණවත් පරිදි සිදු වී නොමැති බව පෙන්නුම් කරයි.


සමස්ත නියාමන ප්‍රාග්ධනයේ වර්ධනයට මූලික වශයෙන්ම රඳවාගත් ඉපැයීම් සහාය වූ අතර, එමගින් ප්‍රාග්ධනය වර්ධනය සඳහා අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනය මත වැඩි වශයෙන් රඳා පවතින බව පෙන්නුම් කරයි. 2025 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට වාර්තා වූ 21.6%ක වැඩි වීමට සාපේක්ෂව, 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට සමස්ත ප්‍රාග්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 15.9%කින් ඉහළ ගියේය. ප්‍රකාශිත

රූප සටහන 3.54 **නියාමන ප්‍රාග්ධනයේ වෙනස්වීමට බලපෑ සාධක**



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.55 **ණය අවදානම් සඳහා වන අවදානම් මත බර තැබූ වත්කම් සංයුතිය**



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව


රඳවාගත් ඉපැයීම් 28.2%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට නියාමන ප්‍රාග්ධනයේ වර්ධනයෙන් 69.6%කට දායක විය. තවද, පිළිවෙළින් 30.5%කින් සහ 14.5%කින් වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් වර්ධනය වූ දෙවන ස්ථර ප්‍රාග්ධන උපකරණ සහ පොදු හා අනෙකුත් සංචිත ද එම කාලය තුළ නියාමන ප්‍රාග්ධනයේ වර්ධනයට සැලකිය යුතු ලෙස දායක විය. විශේෂයෙන්ම බැංකු විසින් උපකාරක ණයකර (subordinated debentures) නිකුත් කිරීම හේතුවෙන් දෙවන ස්ථර ප්‍රාග්ධනය අඛණ්ඩව ඉහළ ගියේය.

ආයතනික හිමිකම්[9] (corporate claims) සහ පෞද්ගලික හිමිකම්වල[10] (retail claims) සැලකිය යුතු වර්ධනය හේතුවෙන් ණය අවදානම් නිරාවරණ සඳහා වන අවදානම් මත බර තැබූ වත්කම් ප්‍රසාරණය විය. සමස්ත අවදානම් මත බර තැබූ වත්කම්වලින් 88.1%ක් නියෝජනය කරන ණය අවදානම් නිරාවරණයන්ට අදාළ අවදානම් මත බර තැබූ වත්කම්, ආයතනික හිමිකම් සහ පෞද්ගලික හිමිකම්වල සැලකිය යුතු වර්ධනය හේතුවෙන් 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 25.6%කින් වර්ධනය විය. ණය අවදානම සඳහා වන සමස්ත අවදානම් මත බර තැබූ වත්කම්වලින් 40.5%ක ප්‍රතිශතයක් ආයතනික හිමිකම් මගින් නියෝජනය කළ අතර, එය 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 29.7%කින් ඉහළ ගියේය.

ණය අවදානම සඳහා වන සමස්ත අවදානම් මත බර තැබූ වත්කම්වලින් 29.5%ක් නියෝජනය කරන සහ වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 33.6%කින් වර්ධනය වූ පෞද්ගලික හිමිකම් හේතුවෙන් ද, අවදානම් මත බර තැබූ වත්කම් තවදුරටත් ඉහළ ගියේය. කෙසේ වෙතත්, අක්‍රීය වත්කම් සඳහා වන අවදානම් මත බර තැබූ වත්කම් අදාළ කාලය තුළ පහත වැටුණු අතර, එමගින් මෙම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවයේ වැඩිදියුණු වීමක් පිළිබිඹු කෙරිණි.

ව්‍යාපාරික ආකෘතිවල පවතින වෙනස්කම් පිළිබිඹු කරමින්, 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට දේශීය බැංකුවලට සාපේක්ෂව විදේශීය බැංකුවල අවදානම් මත බර තැබූ වත්කම් ඝනත්වය[11] ඉහළ මට්ටමක පැවතුණි. 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට විදේශීය බැංකුවල

රූප සටහන 3.56 **බැංකු කාණ්ඩය අනුව අවදානම් මත බර තැබූ වත්කම් ඝනත්වය**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

9 ආයතනික හිමිකම් සඳහා ආයතන වෙත පවතින නිරාවරණයන් ඇතුළත් වන අතර, සංස්ථාපිත ආයතන, සංගම්, හවුල් ව්‍යාපාර, තනි පුද්ගල ව්‍යාපාර, භාර, අරමුදල් සහ සමාන ලක්ෂණ සහිත වෙනත් ආයතන වෙත පවතින නිරාවරණයන් (ණය, බැඳුම්කර, ලැබිය යුතු මුදල් ආදී වශයෙන්) මීට ඇතුළත් වේ (බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුවේ ණය අවදානම සඳහා අවදානම් මත බර තැබූ වත්කම් ගණනය කිරීම - CRE20.41).

10 පෞද්ගලික හිමිකම්වලට තනි පුද්ගලයෙකුට හෝ පුද්ගලයන්ට පවතින නිරාවරණයන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායන්ට පවතින නිරාවරණයන් ඇතුළත් වේ (බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුවේ ණය අවදානම සඳහා අවදානම් මත බර තැබූ වත්කම් ගණනය කිරීම - CRE20.63).

11 සමස්ත වත්කම් සඳහා අවදානම් මත බර තැබූ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස අවදානම් බර තැබූ වත්කම්වල ඝනත්වය ගණනය කරනු ලැබේ.

රූප සටහන 3.57 **සමස්ත අවදානම් මත බර තැබූ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ණය අවදානම සඳහා වන අවදානම් මත බර තැබූ වත්කම්**



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව


අවදානම් මත බර තැබූ වත්කම් ඝනත්වය 64.9%ක් ලෙස දේශීය බැංකුවලට වඩා සැලකිය යුතු ලෙස ඉහළ අගයක සටහන් විය. දේශීය බැංකුවලට සාපේක්ෂව විදේශීය බැංකු විසින් 0% අවදානමක් සහිත රජයේ සුරැකුම්පත්වල සිදු කරන ලද ආයෝජන ප්‍රමාණය අඩු වීම එයට හේතු විය. කෙසේ වෙතත්, මෙම ඉහළ අවදානම් මත බර තැබූ වත්කම් ඝනත්වය, විදේශීය බැංකුවල ණය වර්ධනය අවම වීම හේතුවෙන් වඩාත් ශක්තිමත් ආදායම් උත්පාදනයක් කරා පරිවර්තනය නොවුණු අතර, එය සලකා බලන කාලය තුළ ඔවුන්ගේ දුර්වල ශුද්ධ පොලී ආදායම මගින් ද පිළිබිඹු කෙරිණි.

අවම නියාමන අවශ්‍යතා මත පදනම්ව ගණනය කරන ලද බැංකු අංශයේ අතිරික්ත ප්‍රාග්ධනය, 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට සුළු පහළ යෑමක් වාර්තා කළේය. බැංකු අංශයේ අතිරික්ත ප්‍රාග්ධනය 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 4.9%කින් පහළ ගියේය. විශේෂයෙන්ම, සලකා බලන කාලය තුළ සිදු වූ ණය ප්‍රසාරණය පිළිබිඹු කරමින්, දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකු සහ අනෙකුත් දේශීය බැංකුවල අතිරික්ත ප්‍රාග්ධනය පිළිවෙළින් 11.1%ක් හා 4.2%ක් ලෙස සුළු වශයෙන් පහළ ගියේය.

2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට බැංකු අංශය ඉහළ තෝලන අනුපාතයක්[12] අඛණ්ඩව වාර්තා කළේය. 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට බැංකු අංශයේ තෝලන අනුපාතය 7.2%ක් ලෙස පැවති අතර, එය 3%ක් වන අවම නියාමන අවශ්‍යතාවයට වඩා බෙහෙවින් ඉහළ අගයක පැවතුණි. 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට, දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකු 6.0%ක අවම තෝලන අනුපාතයක් වාර්තා කළ අතර, එය 2025 වසරේ දෙවන කාර්තුව සමඟ සසඳන විට සුළු වැඩි වීමකි. මූලික වශයෙන්ම, වර්ධනයක් වාර්තා නොකළ පළමු ස්ථර ප්‍රාග්ධනයට සාපේක්ෂව නිරාවරණ මිනුමෙහි සැලකිය යුතු වර්ධනය හේතුවෙන්, 2025 දෙවන කාර්තුව අවසානයේ වාර්තා වූ 7.5%ක අගයට සාපේක්ෂව, 2026 දෙවන කාර්තුව අවසානය වන විට අනෙකුත් දේශීය බැංකුවල තෝලන අනුපාතය 7.2%ක් දක්වා පහත වැටිණි. අඩු ණය වර්ධනයක් හේතුවෙන් සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවති නිරාවරණ මිනුමෙහි වර්ධනයට සාපේක්ෂව පළමු ස්ථර ප්‍රාග්ධනයේ වඩාත් ඉහළ වර්ධනයක් මගින් මෙහෙයවනු ලැබූ විදේශීය බැංකු, 2026 වසරේ දෙවන


12 පළමු ස්ථර ප්‍රාග්ධනය සහ සමස්ත නිරාවරණ අතර අනුපාතය ලෙස ගණනය කරනු ලබන තෝලන අනුපාතය මගින් සිය අරමුදල් හැර වෙනත් අරමුදල් මගින් වත්කම් මූල්‍යනය කරනු ලබන ප්‍රමාණය පෙන්නුම් කරයි. බාසල් III යටතේ නිර්වචනය කර ඇති පරිදි පළමු ස්ථර ප්‍රාග්ධනය ලවය වන අතර, හරය සඳහා සියලුම ශේෂ පත්‍ර වත්කම්, ව්‍යුත්පන්න නිරාවරණ, සුරැකුම්පත් මූල්‍යකරණ ගනුදෙනු නිරාවරණ සහ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතම ඇතුළත් වේ (මූල්‍ය සාධනීය දර්ශක සම්පාදන මාර්ගෝපදේශය, 2019).

රූප සටහන 3.58 **පළමු ස්ථිමනය යටතේ අවම නියාමන අවශ්‍යතාවය ඉක්ම වූ ප්‍රාග්ධනය**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.59 **තෝලන අනුපාතය**



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.60 බැංකු කාණ්ඩය අනුව තෝලන අනුපාතය



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

කාර්තුව අවසානය වන විට 19.9%ක සාපේක්ෂ වශයෙන් ශක්තිමත් තෝලන අනුපාතයක් පවත්වා ගෙන ගියේය. ඉහළ තෝලන අනුපාතයක් මගින් ශේෂ පත්‍රය තුළ සහ ශේෂ පත්‍රයෙන් පරිබාහිර නිරාවරණවලට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින ගුණාත්මක ප්‍රාග්ධන ස්වාරක්ෂක ඇති බව පෙන්නුම් කරන අතර, එය මූල්‍ය කම්පනවලට එරෙහිව බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කරයි.


3.2 මුදල් සමාගම් අංශය

2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී මුදල් සමාගම් අංශයේ සමස්ත සාධනීයත්ව දර්ශකය සුළු වශයෙන් පහත වැටුණ ද, ශේෂ පත්‍රයේ වේගවත් ප්‍රසාරණය මධ්‍යයේ එම අංශය ශක්තිමත් ව පැවතුණි. සමස්ත සාධනීයත්ව දර්ශකයේ මෙම පහළ යාම ප්‍රධාන වශයෙන් ද්‍රවශීලතාව, ලාභදායීත්වය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව සහ වෙළෙඳපොළ අවදානම් හරහා පිළිබිඹු විය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව මුදල් සමාගම් අංශයේ ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව සුළු වශයෙන් පහළ ගිය ද, 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී එම දර්ශක අවම නියාමන අවශ්‍යතාවලට වඩා බෙහෙවින් ඉහළ මට්ටමක පැවතුණි. කෙසේ වුවද, සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී, මෙම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය කැපී පෙනෙන අයුරින් වැඩිදියුණු වූ අතර, කාර්යක්ෂමතාවයෙහි ද සුළු වර්ධනයක් වාර්තා විය.

ණය අවදානම

2026 වසරේ මැද භාගය වන විට මුදල් සමාගම් අංශයේ ණය ලබාදීමේ ක්‍රියාකාරකම් සැලකිය යුතු අයුරින් අඛණ්ඩව ප්‍රසාරණය විය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ 35.1%ක වර්ධනයට සාපේක්ෂව, 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී මුදල් සමාගම් අංශයේ දළ ණය සහ අත්තිකාරම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 45.0%කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වුවද, 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ වාර්තා වූ ණය වර්ධනය පෙර කාර්තුවේ පැවති 52.4%ක වර්ධනයට සාපේක්ෂව මන්දගාමී විය. මේ සඳහා 2026 වසරේ මැයි මාසයේ දී මහ බැංකුව විසින් මෝටර් රථ මූල්‍යකරණය සඳහා වන වටිනාකම මත උපරිම ණය අනුපාතය දැඩි කිරීම, මෝටර් රථ ආනයනය සඳහා පැවැති අධික ඉල්ලුම ලිහිල් වීම මෙන්ම සමාජ ආරක්ෂණ දායකත්ව බදු අයකරන අවස්ථාව වෙනස් වීම, 2026 වසරේ පළමු භාගයේ දී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම හා මෝටර් රථ ආනයනය සඳහා තාවකාලික රේගු ආනයන බදු අධිභාරයක් පැනවීම හේතුවෙන් වාහන මිල ඉහළ යෑම යනාදී කරුණු මූලික කරගෙන වාහන ඇපකර ණය ප්‍රසාරණය මන්දගාමී වීම හේතු විය. 2026 වසරේ මැයි මාසයේ දී රන් ඇපකර ණය පහසුකම් සඳහා වටිනාකම


රූප සටහන 3.61 මුදල් සමාගම් අංශයේ සාධනීයත්වය පිළිබඳ සිතියම*



* මධ්‍ය ලක්ෂයේ සිට සිදුවන අපගමනය ධනාත්මක බලපෑමක් පෙන්නුම් කරයි.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.62 දළ ණය සහ අත්තිකාරම්



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

මත උපරිම ණය අනුපාත සීමා හඳුන්වාදීමෙන් පසුව රන් ඇපකර ණය ප්‍රසාරණය ද මන්දගාමී විය. තවද, 2026 වසරේ මැයි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස් කිරීමෙන් පසුව ණය පොලී අනුපාතික ඉහළ යෑම සහ මෝටර් රථ ආනයනය සඳහා වන තාවකාලික අධිභාරය 2026 වසරේ අවසානය දක්වා දීර්ඝ කිරීම හේතුවෙන් වාහන සඳහා ලබාදෙන ණය පහසුකම්වල වර්ධනය ඉදිරි කාර්තුවල දී තවදුරටත් මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම, රන් ඇපකර ණය සඳහා වටිනාකම මත උපරිම ණය අනුපාතයක් හඳුන්වා දීමට අමතරව, 2026 වසරේ සැප්තැම්බර් සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකුව විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතා තීරණය කිරීම සඳහා වන රන් ඇපකර ණය පහසුකම් මත අවධානම් බර තැබීම් ඉහළ නංවන ලද අතර, එමගින් රන් ඇපකර ණය වර්ධනය ඉදිරි කාර්තුවල දී තවදුරටත් මන්දගාමී වී එහි ප්‍රතිඵලයක් ලෙස මුදල් සමාගම් අංශයේ සමස්ත ණය වර්ධනය ද මන්දගාමී වනු ඇත.


2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට මුදල් සමාගම් අංශයේ ණය වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් වාහන සහ රන් ඇපකර ණය ප්‍රසාරණය හේතු විය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ 33.4%ක වර්ධනයට සාපේක්ෂව මුදල් සමාගම් අංශයේ වාහන ඇපකර ණය 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 46.3%කින් වර්ධනය විය. ඒ අනුව, 2026 වසරේ දෙවන කාර්තුවෙන් අවසන් වූ වසරක කාලය තුළ මුදල් සමාගම් අංශයේ සමස්ත ණය වර්ධනයෙන් 65.0%ක් සඳහා වාහන ඇපකර මත ණය දායක විය. තවද, රන් ඇපකර ණය, පෙර වසරේ 43.8%ක වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී 59.8%ක සැලකිය යුතු වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, එය සලකා බලන ලද කාලපරිච්ඡේදයේ දී මුදල් සමාගම් අංශයේ ණය ඉහළ යාමෙන් 25.8%ක් නියෝජනය කළේය. රන් ඇපකර ණය මෙලෙස සැලකිය යුතු අයුරින් ඉහළ යෑම සඳහා ගෝලීය වෙළෙඳපොළේ රන් මිල ඉහළ මට්ටමක පැවතීම හේතු විය.

සලකා බලන ලද කාලපරිච්ඡේදයේ දී වාහන සහ රන් ඇපකර ණය සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීමත් සමඟ ඇපකර මත ලබා දුන් ණය සඳහා මුදල් සමාගම් අංශයේ ණය සංකේන්ද්‍රණය වී පැවතීම තවදුරටත් ඉහළ ගිය අතර, එමගින් ඇපවල වටිනාකම අහිතකර ලෙස වෙනස් වීම හේතුවෙන් එම අංශයට ඇති විය හැකි අවදානම ඉහළ ගියේය. වාහන සහ රන් ඇපකර ණය එක්ව ගත් කල, එය 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට මුදල් සමාගම් අංශයේ සමස්ත ණය ප්‍රමාණයෙන් 85.2%ක් නියෝජනය කළ අතර, එය පෙර වසරේ වාර්තා වූ 82.6%ට සාපේක්ෂව තවදුරටත් ඉහළ යාමකි. මේ අතර, රන් ඇපකර ණය, සමස්ත ණය ප්‍රමාණයෙන් 21.4%ක් වූ අතර, එය පෙර වසරේ පැවති 19.4%ට වඩා ඉහළ යාමකි. විශේෂයෙන් පවතින භූදේශපාලනික අවිනිශ්චිතතා මධ්‍යයේ ඇප වටිනාකම පහළ යන අවස්ථාවක දී මෙලෙස සීමිත ඇප වර්ග කිහිපයක් මත දැඩි ලෙස රඳා පැවතීම, සැලකිය යුතු ණය සංකේන්ද්‍රණ අවදානමක් ඇති කරයි. කෙසේ වුවද, වාහන ඇපකර ණය සඳහා වටිනාකම මත උපරිම අනුපාතික දැඩි කිරීම සහ රන් ඇපකර ණය සඳහා වටිනාකම මත උපරිම ණය අනුපාතයක් හඳුන්වා දීමත් සමඟ ඇප වටිනාකම් අහිතකර ලෙස වෙනස්වීමෙන් මතු විය හැකි අවදානම් අවම මට්ටමක පැවතුණි.

සලකා බැලෙන කාලපරිච්ඡේදයේ දී මුදල් සමාගම් අංශයේ අදියර 3 යටතේ පවතින ණය අනුපාතය[13] සමස්තයක් ලෙස පහත වැටුණු අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් සැලකිය යුතු ලෙස ණය ප්‍රසාරණය වීම සහ අදියර 3 යටතේ පවතින ණයවල ප්‍රමාණය අඩු වීම හේතු වී ඇත. මුදල්


13 අදියර 3 යටතේ පවතින ණය අනුපාතය යනු දළ අදියර 3 යටතේ පවතින ණය අනුපාතයයි.

රූප සටහන 3.63 **2026 වසරේ දෙවන කාර්තුවෙන් අවසන් වූ වසර තුළ ණය ප්‍රසාරණය සඳහා ණය කාණ්ඩය අනුව දායකත්වය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.64 **දළ ණය සහ අත්තිකාරම්වල සංයුතිය**



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.65 **අදියර 3 යටතේ පවතින ණය අනුපාත**




මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

සමාගම් අංශයේ අදියර 3 යටතේ පවතින ණය අනුපාතය, පෙර වසරේ වාර්තා වූ 8.3%ක අගයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 5.1%ක් දක්වා අඩු වූ අතර, ඒ සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 45.0%ක් ලෙස වාර්තා වූ ඉහළ ණය වර්ධනය සහ අදියර 3 යටතේ පවතින සමස්ත ණය 10.5%කින් සංකෝචනය වීම හේතු විය. සලකා බැලෙන කාලපරිච්ඡේදය තුළ දී අදියර 3 යටතේ පවතින ණය සමස්තයක් වශයෙන් පහළ යාමක් වාර්තා කළ ද, 2026 වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව දෙවන කාර්තුව අවසානයේ දී රුපියල් බිලියන 23.6ක අදියර 3 යටතේ පවතින ණය වැඩි වීමක් දක්නට ලැබුණි. මෙම වැඩි වීම සඳහා වාහන සහ රන් ඇපකර මත අදියර 3 යටතේ පවතින ණය හේතු වූ අතර, එමගින් භූදේශපාලනික අවිනිශ්චිතතා මගින් මුදල් සමාගම් අංශයට එල්ල කරන පුළුල් බලපෑම් පිළිබිඹු කරයි.

සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී වත්කම්වල ගුණාත්මකභාවයේ වැඩිදියුණු වීමක් පෙන්නුම් කරමින් මුදල් සමාගම් අංශයේ අදියර 3 යටතේ පවතින සමස්ත ණය පහත වැටී තිබුණ ද, ණය අවදානම් ඉහළ යාමට හැකියාවක් ඇති බව සංඥා කරමින් අදියර 2 යටතේ පවතින ණය ඉහළ යෑම, වත්කම්වල ගුණාත්මකභාවය සමීපව නිරීක්ෂණය කිරීමේ අවශ්‍යතාව පෙන්නුම් කරයි. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ 0.9%ක සංකෝචනයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී මුදල් සමාගම් අංශයේ අදියර 2 යටතේ පවතින ණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 92.1%කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. ඒ අනුව, මෙම අංශයේ අදියර 2 යටතේ පවතින ණය අනුපාතය ද පෙර වසරේ වාර්තා වූ 11.6%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 15.4%ක් දක්වා ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා දිට්වා සුළි කුණාටුව හා මැදපෙරදිග ගැටුම්වලින් පසුව ආදායම් උත්පාදනයට බාධා එල්ල වීම සහ පිරිවැය පීඩන ඉහළ යෑම හේතුවෙන් ඇතැම් ණයගැනුම්කරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව දුර්වල වීම යම් ප්‍රමාණයකට හේතු වන්නට ඇත. තවද, 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට, වාහන ඇප මත ලබා දුන් අදියර 2 යටතේ පවතින ණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 75.5%කින් ඉහළ ගිය අතර, එය මුදල් සමාගම් අංශයේ අදියර 2 යටතේ පවතින සමස්ත ණය ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත. එමෙන්ම රන් ඇප මත ලබාදුන් අදියර 2 යටතේ පවතින ණය 279.2%ක සැලකිය යුතු වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරන ලදී. ඒ අනුව, අදියර 2 යටතේ පවතින ණයවල දැනට දක්නට ලැබෙන ඉහළ යෑම මගින්, මුදල් සමාගම් අංශය තුළ ණය අවදානම් ගොඩනැගීමට හැකියාවක් පවතින බව පෙන්නුම් කරන අතර, එබැවින් මුදල් සමාගම් විසින් අඛණ්ඩව අදියර 2 යටතේ පවතින ණය අධීක්ෂණය සහ අවදානම් අවම


රූප සටහන 3.66 **ණය කාණ්ඩය අනුව ණය වර්ධනය සහ අදියර 3 යටතේ පවතින ණය අනුපාතය***



* එක් එක් වෘත්තයෙහි ප්‍රමාණයෙන් 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී අදාළ ණය කාණ්ඩය සතුව පැවති වෙළෙඳපොළ කොටස නිරූපණය වේ.


මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.67 **අදියර අනුව ණය සංයුතිය**




මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.68 ණය හානිකරණ ආවරණ අනුපාත



මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.69 බාහිර අරමුදල් සහ සමස්ත වත්කම්වලට සාපේක්ෂව නියාමන ද්‍රවශීල වත්කම්



මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

කිරීම සඳහා පූර්වාරක්ෂිත ක්‍රියාමාර්ග ගත යුතුය. මන්ද ණයගැනුම්කරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව තවදුරටත් පිරිහීමක් සිදු වුවහොත් ඉදිරි කාලයේ දී මෙම ණය නිරාවණයන් අදියර 3 යටතේ පවතින ණය වෙත මාරුවිය හැකි බැවිනි.


අදියර 3 යටතේ පවතින ණය සඳහා වන ණය හානිකරණ අඩු වීම හේතුවෙන්, මුදල් සමාගම් අංශයේ අදියර 3 යටතේ පවතින ණය සඳහා වන ණය හානිකරණ ආවරණ අනුපාතය පෙර වසරට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී පහත වැටුණි. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය අවසානයේ වාර්තා වූ 46.1%ට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී අදියර 3 යටතේ පවතින ණය සඳහා වන ණය හානිකරණ ආවරණ අනුපාතය 41.0%ක් දක්වා අඩු විය. තවද, අදාළ කාල සීමාව තුළ දී ප්‍රධාන වශයෙන් අදියර 2 යටතේ පවතින ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් මුදල් සමාගම් අංශයේ අදියර 2 යටතේ පවතින ණය සඳහා වන ණය හානිකරණ අනුපාතය ද පෙර වසරේ වාර්තා වූ 3.9% සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 2.9%ක් දක්වා පහත වැටුණි. අදියර 2 යටතේ පවතින ණය සම්බන්ධ අවදානම සාපේක්ෂ වශයෙන් ඉහළ බැවින්, ණය ගුණාත්මකභාවය තවදුරටත් පිරිහීමක දී සිදුවිය හැකි අලාභයන් අවශෝෂණය කර ගැනීම සඳහා අදියර 2 යටතේ පවතින ණය සඳහා ප්‍රමාණවත් ණය හානිකරණ ආවරණයක් පවත්වා ගනිමින් මුදල් සමාගම් අවධානයෙන් පසුවිය යුතු අතර, ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලිය ද ශක්තිමත් කළ යුතුය.

ද්‍රවශීලතා අවදානම

ශේෂ පත්‍රය ප්‍රසාරණය වීම හේතුවෙන් ද්‍රවශීලතා අනුපාතික සහ අතිරික්ත ද්‍රවශීල වත්කම් පහත වැටුණ ද, මුදල් සමාගම් අංශයේ ද්‍රවශීලතා තත්ත්වය අවම නියාමන අවශ්‍යතාවලට වඩා බෙහෙවින් ඉහළ මට්ටමක පැවතුණි. මුදල් සමාගම් අංශයේ, සමස්ත වත්කම්වලට ද්‍රවශීලතා වත්කම් අනුපාතිකය සහ බාහිර අරමුදල්වලට[14] ද්‍රවශීලතා වත්කම් අනුපාතිකය යන ද්විත්වයම 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී පිළිවෙළින් 10.8%ක් සහ 15.0%ක් ලෙස වාර්තා වීමට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී පිළිවෙළින් 8.5%ක් සහ 10.9%ක් දක්වා පහත වැටුණි. ඒ සඳහා ද්‍රවශීල වත්කම්වලට වඩා සමස්ත වත්කම් සහ බාහිර අරමුදල් වේගයෙන් ප්‍රසාරණය වීමෙන් ඇති වූ හර බලපෑම් (denominator effect) ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට මුදල් සමාගම් අංශය රුපියල් බිලියන 100.5ක අතිරික්ත ද්‍රවශීලතාවක් වාර්තා කළ ද, එය 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 12.3%ක අඩු වීමකි. කෙසේ වුවද, එම අංශයේ සමස්ත ද්‍රවශීල වත්කම්


14 මුදල් සමාගම් අංශයේ බාහිර අරමුදල්, තැන්පතු සහ ණය ගැනීම්වලින් සමන්විත වේ.

රූප සටහන 3.70 ද්‍රවශීල වත්කම්වල සංයුතිය




මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.71 **තැන්පතු සහ ණය ගැනීම්**



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.73 **ණය ගැනීම්වල සංයුතිය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 10.4%කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා ප්‍රතිමිලදී ගැනුම් ආයෝජන, තැන්පතු සහ බැංකුවල පවත්වාගෙන යන ජංගම ගිණුම් ශේෂයන්හි සිදුවූ වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය.

ණය ප්‍රසාරණයට සහාය වීම සඳහා විකල්ප අරමුදල් මූලාශ්‍රයක් ලෙස බැංකු අංශයෙන් ලබාගන්නා ණය මත මුදල් සමාගම් අංශය වැඩි වශයෙන් රඳා පැවතීම හේතුවෙන් එම අංශයෙන් ණය ගැනීම් ඉහළ මට්ටමක පැවතුණි. මුදල් සමාගම් අංශයේ ණය ගැනීම්, 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ වාර්තා කළ 75.9%ක වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී 124.0%ක සැලකිය යුතු වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ ද, මෑත කාර්තුවල දී එම වර්ධන වේගය ක්‍රමයෙන් මන්දගාමී වී ඇත. තවද, සාපේක්ෂ වශයෙන් ස්ථායී අරමුදල් මූලාශ්‍රයක් වන තැන්පතු, වසරකට පෙර වාර්තා වූ 16.3%ක වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 22.9%කින් ඉහළ ගියේය. මෙම වර්ධනයන් සමඟ, සමස්ත අරමුදල් සැපයුමෙන් ප්‍රතිශතයක් ලෙස ණය ගැනීම්, වසරකට පෙර වාර්තා වූ 20.7%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 32.9%ක් දක්වා ඉහළ ගිය අතර, සමස්ත අරමුදල් සැපයීම්වල ප්‍රතිශතයක් ලෙස තැන්පතු එම කාල සීමාවේ දී 51.1%ක අගයේ සිට 44.6%ක් දක්වා පහළ ගියේය. තැන්පතුවලට සාපේක්ෂව ණය ගැනීම් මත වැඩි වශයෙන් රඳා පැවතීම ඉහළ යෑම මගින්, විශේෂයෙන් සීමිත වෙළෙඳපොළ ද්‍රවශීලතාවක් පවතින හෝ අරමුදල් පිරිවැය ඉහළ ගිය කාල සීමාවක දී අරමුදල් අවශ්‍යතාව ඉහළ ගියහොත් මුදල් සමාගම් අංශය ප්‍රතිමූල්‍යකරණ අවදානමට නිරාවරණ වීම ඉහළ යා හැකිය. තවද, බැංකු අරමුදල් මත රඳා පැවතීම මගින් මුදල් සමාගම් අංශය සහ බැංකු අංශය අතර අන්තර්සම්බන්ධතාව ඉහළ මට්ටමක පවතින බව පෙන්නුම් කරයි. මේ අතර, මුදල් සමාගම් අංශයේ ණය ගැනීම් මූලික වශයෙන් කාලීන ණය පහසුකම් හරහා සපයාගෙන තිබූ අතර එය 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ මුළු ණය ගැනීම්වලින් 66.9%ක් විය. කෙසේ වුවද, ණය ප්‍රසාරණයේ අපේක්ෂිත මන්දගාමී වීමට අනුකූලව ඉදිරි කාර්තුවල දී මුදල් සමාගම් අංශයේ ණය ගැනීම්වල වර්ධනය තවදුරටත් පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රූප සටහන 3.72 **අරමුදල් ව්‍යුහය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ලාභදායීත්වය

2026/27[15] මූල්‍ය වර්ෂයේ පළමු මාස තුන තුළ (එනම් 2026 වසරේ දෙවන කාර්තුව), මුදල් සමාගම් අංශයේ බදු පසු ලාභය අඛණ්ඩව වැඩිදියුණු වූ අතර, ලාභය වර්ධනය


15 මුදල් සමාගම් බහුතරයක මූල්‍ය වර්ෂය සඳහා යම් වර්ෂයක අප්‍රේල් 01 සිට එළඹෙන වසරේ මාර්තු 31 දක්වා කාලය අදාළ වේ.

රූප සටහන 3.74 බදු පසු ලාභය (කාර්තුමය)



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.76 ශුද්ධ පොලී ආදායමේ සංයුතිය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

වීමේ කැපී පෙනෙන මන්දගාමී වීමක් දක්නට ලැබුණි. මුදල් සමාගම් අංශය 2026 වසරේ දෙවන කාර්තුවේ දී 16.4%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් සමඟ රුපියල් බිලියන 21.0ක බදු පසු ලාභයක් වාර්තා කළේය. එය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ 59.3%ක සැලකිය යුතු වර්ධනයට වඩා පහළ යාමකි. 2026 වසරේ දෙවන කාර්තුව තුළ මුදල් සමාගම් අංශයේ ශුද්ධ පොලී ආදායම 27.6%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, එය ප්‍රධාන වශයෙන් එම අංශයේ ලාභදායීත්වය වැඩිදියුණු වීමට දායක විය. මේ අතර, ණය හානිකරණ ගාස්තු ඉහළ යෑම සහ මූලික වශයෙන් සේවක වැටුප් හේතුවෙන් ඉහළ ගිය මෙහෙයුම් වියදම්, සලකා බලනු ලබන කාල සීමාව තුළ දී බදු පසු ලාභය වෙත යම් පීඩනයක් එල්ල කළේය. ඒ අනුව, 2026 වසරේ දෙවන කාර්තුව තුළ දී මෙහෙයුම් වියදම් 22.7%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, ණය හානිකරණ ගාස්තු වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 282.3%කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.


2026 වසරේ දෙවන කාර්තුව තුළ දී මුදල් සමාගම් අංශයේ පොලී වියදම, පොලී ආදායමට සාපේක්ෂව සැලකිය යුතු ඉහළ යාමක් වාර්තා කළේය. ණය කළඹ ප්‍රසාරණය වීමත් සමඟ, ණය සහ අත්තිකාරම් මගින් ඉහළ පොලී ආදායමක් ලැබීම හේතුවෙන්, 2025 වසරේ දෙවන කාර්තුවේ දී 14.2%ක් වූ මුදල් සමාගම් අංශයේ පොලී ආදායමේ වර්ධනය 2026 වසරේ දෙවන කාර්තුව තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 41.5%ක් දක්වා සැලකිය යුතු ලෙස වේගවත් විය. කෙසේ වුවද, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ 2.0%ක සංකෝචනයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව තුළ දී පොලී වියදම් 62.3%ක කැපී පෙනෙන වාර්ෂික ලක්ෂ්‍යමය ඉහළ යාමක් වාර්තා කිරීම හේතුවෙන්

රූප සටහන 3.75 බදු පසු ලාභයේ සංරචක




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.77 පොලී වියදම්වල සංයුතිය



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.78 **ලාභදායීත්ව දර්ශක**



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


පොලී ආදායමේ ඉහළ යාමේ බලපෑම අඩාල විය. මෙම අංශයේ පොලී වියදම් ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන්, 181.7%ක වාර්ෂික ලක්ෂ්‍යමය ඉහළ යාමක් වාර්තා කළ ණය ගැනීමේ පිරිවැය ඉහළ යෑම හේතු වූ අතර, සලකා බලනු ලබන කාල සීමාව තුළ තැන්පතු සඳහා වූ පොලී වියදම් ද 26.2%කින් ඉහළ ගියේය.

පෙර වසරට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව තුළ දී මුදල් සමාගම් අංශයේ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය සුළු වශයෙන් වැඩිදියුණු වුව ද, ලාභ වර්ධනය අභිබවා ගිය වත්කම් පදනමේ වේගවත් ප්‍රසාරණය හේතුවෙන් ශුද්ධ පොලී ආන්තිකය සහ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය පහළ ගියේය. මුදල් සමාගම් අංශයේ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 2025 වසරේ දෙවන කාර්තුවේ දී වාර්තා කළ 15.2%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුවේ දී 15.6%ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

කෙසේ වුවද, මුදල් සමාගම් අංශයේ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ 6.9%ක අගයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුවේ දී 5.7%ක් දක්වා අඩු විය. ඒ හා සමාන ප්‍රවණතාවක් පවත්වා ගනිමින්, එම කාල සීමාව තුළ දී මුදල් සමාගම් අංශයේ ශුද්ධ පොලී ආන්තිකය ද 11.5%ක අගයේ සිට 10.4%ක් දක්වා පහළ ගියේය. ඒ අනුව, ණය ගැනීම් මගින් අරමුදල් සපයාගත් වත්කම්වල සීඝ්‍ර ව්‍යාප්තිය, පොලී ආන්තිකය මත පීඩනයක් ඇති කිරීම හේතුවෙන් 2026 වසරේ දෙවන කාර්තුවේ දී මුදල් සමාගම් අංශයේ ලාභදායීත්ව දර්ශක මිශ්‍ර කාර්ය සාධනයක් පෙන්නුම් කළේය.

පොලී අනුපාත සංවේදීතා පැතිකඩ (interest rate sensitivity profile) මත පදනම්ව, 2026 වසරේ දෙවන කාර්තුවේ දී මුදල් සමාගම් අංශය කෙටි කාලීන ලාභදායීත්වය පවත්වා ගෙන යාමට වඩා සුදුසු මට්ටමක පවතින බව පෙන්නුම් කරයි. වසරක් දක්වා වූ සියලුම ප්‍රතිමිලකරණ කාණ්ඩ පුරා පොලී අනුපාත-සංවේදී වත්කම්, පොලී අනුපාත-සංවේදී වගකීම් ඉක්මවා ගිය අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් මාස හයක් ඇතුළත රුපියල් බිලියන 298.7ක උපරිම ධන සමුච්චිත ශුද්ධ පොලී අනුපාත-සංවේදී වත්කම් තත්ත්වයක් වාර්තා වී පසුව වසරක් ඇතුළත රුපියල් බිලියන 128.7ක් දක්වා මන්දගාමී විය. ඉදිරි මාසවල දී පොලී ගෙවිය යුතු වගකීම්වලට වඩා පොලී ආදායම් ලබන වත්කම් වැඩි ප්‍රමාණයක් ප්‍රතිමිලකරණය කිරීමට නියමිත බව ධනාත්මක ප්‍රතිමිලකරණ පරතරය මගින් පෙන්නුම් කරයි. ඒ අනුව, වගකීම්වලට වඩා වත්කම් ඉක්මනින් ප්‍රතිමිලකරණය වන බැවින් වෙළෙඳපොළ පොලී අනුපාත ඉහළ යෑම ශුද්ධ පොලී අදායම ඉහළ යෑම සඳහා සහායක් විය හැකිය. එමෙන්ම පොලී අනුපාත පහළ යාමත් ඒ අයුරින්ම ශුද්ධ පොලී ආදායම මත පීඩනයක් එල්ල කළ හැකිය. සැලකිය යුතු ධනාත්මක පරතරය සහ වාහන සහ රන් ඇපකර ණය වැනි මුදල් සමාගම් අංශයේ පොලී අනුපාත-සංවේදී


රූප සටහන 3.79 **ශුද්ධ පොලී ආන්තිකය සහ වත්කම් පදනම***



* එක් එක් වෘත්තයෙහි ප්‍රමාණයෙන් අදාළ මුදල් සමාගම විසින් 2026 වසරේ දෙවන කාර්තුවෙහි වාර්තා කළ බදු පසු ලාභය නිරූපණය කරයි. මෙම කාලසීමාව තුළ අලාභ වාර්තා කළ මුදල් සමාගම් තුනක් මෙම රූප සටහන සඳහා සලකා බලා නොමැත.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.80 **පොලී අනුපාත සංවේදී වත්කම් සහ වගකීම්**



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉපැයීම් වත්කම්වල ශක්තිමත් සංකේන්ද්‍රණය සැලකිල්ලට ගෙන, ආන්තික වෙනස්වීම් තවදුරටත් පොලී අනුපාතිකවල ඉදිරි ගමන්මඟ සහ තරගකාරී අරමුදල් තත්ත්වයන් මත රඳා පැවතුණ ද, කෙටි කාලීනව ලාභදායීත්වය ශක්තිමත්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව


2026 වසරේ දෙවන කාර්තුවේ අවසානය වන විට, අවම නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාව සහ අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාව යන දෙකම සැලකිල්ලට ගත් විට, මුදල් සමාගම් අංශයේ ප්‍රාග්ධන තත්ත්වය ශක්තිමත් මට්ටමක පැවතුණි. 3.0%ක වෙළෙඳපොළ කොටසක් නියෝජනය කළ සමාගම් තුනක් හැරුණු විට, අනෙකුත් සියලුම මුදල් සමාගම් 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට අවම නියාමන මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාව සපුරා පැවතිණි. තවද, එම කාල පරාසය තුළම එක් මුදල් සමාගමක් හැරුණු විට, අනෙකුත් සියලුම මුදල් සමාගම් රුපියල් බිලියන 2.5ක අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාව සපුරාලන ලදී.

ප්‍රධාන වශයෙන් සැලකිය යුතු මට්ටමේ ණය ප්‍රසාරණයක් මගින් මෙහෙයවූ අවදානම් මත බර තැබූ වත්කම්වල ඉහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාර්තුවට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී මුදල් සමාගම් අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත පහත වැටුණි. ඒ අනුව, 2025 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට පිළිවෙළින් 22.0% සහ 20.8% ලෙස වාර්තා වූ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ පළමු ස්ථර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය, 2026 වසරේ දෙවන කාර්තුවේ අවසානය වන විට පිළිවෙළින් 19.3% සහ 17.3% දක්වා පහත වැටුණි. කෙසේ වෙතත්, සලකා බලන කාල සීමාව තුළ දී සමස්ථ මුදල් සමාගම් අංශයේ මෙම අනුපාත අවම නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළින් පැවතුණි. 2026 දෙවන කාර්තුව අවසානය වන විට, ප්‍රාග්ධන වර්ධන වේගය 20.8%ක් වැනි මට්ටමක පැවතිය ද, අවදානම් මත බර තැබූ වත්කම් වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 37.6%කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එමගින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත වෙත පීඩනයක් ඇති විය.

රඳවාගත් ඉපැයුම් සහ දෙවන ස්ථර ප්‍රාග්ධනය හේතුවෙන් සලකා බලන කාල සීමාව තුළ දී මුදල් සමාගම් අංශයේ සමස්ත ප්‍රාග්ධනය තවදුරටත් ශක්තිමත් විය. වසරකට පෙර වාර්තා වූ 18.0%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී සමස්ත ප්‍රාග්ධනය 20.8%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. මෙම අංශයේ සමස්ත ප්‍රාග්ධනය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 2025/26 මූල්‍ය වර්ෂය සඳහා වන විගණනය කරන ලද ලාභය ඇතුළත් කිරීමත් සමඟ රඳවාගත් ඉපැයීම් ඉහළ යෑම සහ අනුමත, ඇපකර රහිත, උපකාරක ණය උපකරණ (unsecured subordinate debt instruments) හරහා දෙවන ස්ථර ප්‍රාග්ධනය එක් කිරීමත් ය.


ණය කළඹෙහි වේගවත් ප්‍රසාරණය පිළිබිඹු කරමින්, මුදල් සමාගම් අංශයේ ණය අවදානම් කාණ්ඩය යටතේ වන අවදානම් මත බර තැබූ වත්කම් 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, මුදල් සමාගම් අංශයේ සමස්ත අවදානම් මත බර තැබූ වත්කම්වලින් 89.5%ක් නියෝජනය කළ ණය අවදානම සඳහා වන අවදානම් මත බර තැබූ වත්කම්, 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී වාර්තා වූ 30.2%ක වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 39.7%කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑමට විශේෂයෙන්ම වාහන

රූප සටහන 3.81 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.82 සමස්ත නියාමන ප්‍රාග්ධනයේ වෙනස්වීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.83 **ණය අවදානම සඳහා අවදානම් මත බර තැබූ වත්කම්**



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

සහ රන් ඇපකර මත පදනම් වූ ක්‍රියාකාරී පෞද්ගලික හිමිකම්වල (retail claims) වර්ධනය මූලිකවම හේතු වූ අතර, එය වසරකට පෙර පැවති 47.5%ක අගයක සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 49.3%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් දක්වා වේගවත් විය. ඒ අනුව, පෞද්ගලික හිමිකම් තුළ අවදානම් මත බර තැබූ වත්කම් සංකේන්ද්‍රණය වීම ඉහළ යෑම එම අංශයේ ණය ක්‍රියාකාරකම් සමඟ ඉහළ යන ප්‍රාග්ධන අවශ්‍යතා නිරූපණය කරයි.

නියාමන ප්‍රාග්ධනයේ ඉහළ යෑම මධ්‍යයේ වුව ද, ප්‍රාග්ධන ස්වාරක්ෂක සීමා වීමක් පිළිබිඹු කරමින් 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී මුදල් සමාගම් අංශයේ සමස්ත අතිරික්ත ප්‍රාග්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් සංකෝචනය වීමක් වාර්තා කළේය. ඒ අනුව, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය අවසානයේ දී වාර්තා කළ 5.9%ක ප්‍රසාරණයට සාපේක්ෂව, මුදල් සමාගම් අංශයේ අතිරික්ත ප්‍රාග්ධනය 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 8.0%කින් පහළ ගියේය. තවද, ප්‍රාග්ධන ස්වාරක්ෂක සීමාවීම, අඛණ්ඩ ණය වර්ධනය මධ්‍යයේ එම අංශයේ ප්‍රාග්ධන තත්ත්වය සමීපව නිරීක්ෂණය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි. එසේ වුවද, 2026 දෙවන කාර්තුවේ අවසානය වන විට මුදල් සමාගම් අංශය සතුව රුපියල් බිලියන 156.8ක අතිරික්ත ප්‍රාග්ධනයක් පැවති අතර, ඉහළ ගිය ණය ඉල්ලුමට සහාය දැක්වීමට මුදල් සමාගම් අංශයට තවදුරටත් හැකියාවක් ඇති බව එමගින් පෙන්නුම් කෙරෙයි.

3.3 රක්ෂණ අංශය


ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව යථා තත්ත්වයට පත්වීම මධ්‍යයේ, 2025 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී රට තුළ රක්ෂණ ව්‍යාප්තිය වැඩිදියුණු විය. දළ දේශීය නිෂ්පාදිතයේ[16] ප්‍රතිශතයක් ලෙස වාර්ෂික දළ ලියාහළ වාරිකය[17] (Gross Written Premium - GWP) මගින් මනිනු ලබන රක්ෂණ ව්‍යාප්තිය, 2025 වසරේ පළමු භාගය අවසානයේ පැවති 1.3%ක අගයට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගය අවසානයේ දී 1.5%ක් දක්වා වර්ධනය විය.

2025 වසරේ අනුරූප කාල සීමාවට සාපේක්ෂව, 2026 වසරේ පළමු භාගය තුළ දී රක්ෂණ අංශය විසින් දළ ලියාහළ වාරිකයේ කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇත. 2026 වසරේ පළමු භාගය තුළ දී රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරිකය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන්

16 2025 වසර සඳහා වන දළ දේශීය නිෂ්පාදිතය මෙම ගණනය කිරීම් සඳහා යොදා ගන්නා ලදී.

17 දළ ලියාහළ වාරිකය යනු ප්‍රතිරක්ෂණ හෝ අවදානම් ඇත්හැරීමේ කොමිස් මුදල් සඳහා වන අඩු කිරීම්වලට පෙර, රක්ෂණකරුවෙකු විසින් ගිවිසුමකින් අපේක්ෂා කරන මුළු ආදායම වේ.


රූප සටහන 3.84 **අතිරික්ත ප්‍රාග්ධනය***



* මෙම විශ්ලේෂණය මගින් 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට ක්‍රියාත්මකව පැවති මුදල් සමාගම් 31ක් (Nation Lanka Finance PLC හැර) ආවරණය කෙරේ. තවද, එක් එක් කාර්තුව සඳහා, අදාළ කාර්තුව වන විට පවතින නවතම විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව රුපියල් බිලියන 100 ඉක්මවන මුළු වත්කම් ප්‍රමාණයක් සහිත මුදල් සමාගම් 'විශාල මුදල් සමාගම්' ලෙසත්, ඉතිරි මුදල් සමාගම් 'අනෙකුත් මුදල් සමාගම්' ලෙසත් වර්ගීකරණය කරනු ලැබේ. ඒ අනුව, 2026 දෙවන කාර්තුව අවසානය වන විට මුදල් සමාගම් 08ක් 'විශාල මුදල් සමාගම්' ලෙස වර්ගීකරණය කර තිබුණි.


මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.85 **දළ ලියාහළ වාරිකයේ වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)**



මූලාශ්‍රය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව


රූප සටහන 3.86 **උප අංශ අනුව දළ ලියාහළ වාරිකය***



* 2024 වසරේ දෙවන කාර්තුවේ සිට, සාමාන්‍ය රක්ෂණ උප අංශය යටතේ වන වැඩවර්ජන, අරගල සහ සිවිල් කෝලාහල කාණ්ඩය, අමාත්‍ය මණ්ඩල සන්දේශ අංක MF/PE/007/CM/2024/098ට අනුව වෙනම ඉදිරිපත් කර ඇත.

මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

රූප සටහන 3.87 **වත්කම්වල වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)**




මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

20.3%කින් වර්ධනය විය. දිගුකාලීන රක්ෂණ උප අංශයේ දළ ලියාහළ වාරිකය 2026 වසරේ පළමු භාගය තුළ දී 19.3%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ ද, එම වර්ධන වේගය 2025 වසරේ අනුරූප කාල සීමාව තුළ වාර්තා වූ 25%ක වර්ධන වේගයට සාපේක්ෂව මන්දගාමී වීමකි. සාමාන්‍ය රක්ෂණ උප අංශයේ දළ ලියාහළ වාරිකය ද 2025 වසරේ පළමු භාගයේ වාර්තා වූ 11.2%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයට සාපේක්ෂව, 2026 වසරේ පළමු භාගයේ දී 21.8%ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව යථා තත්ත්වයට පත්වීමත් සමඟ, සාමාන්‍ය රක්ෂණ උප අංශයේ සියලුම කාණ්ඩ යටතේ දළ ලියාහළ වාරිකය ප්‍රසාරණය වූ අතර, ඒ සඳහා විශේෂයෙන්ම මෝටර් රථවාහන රක්ෂණ මෙන්ම වැඩවර්ජන, අරගල හා සිවිල් කෝලාහල රක්ෂණ හරහා වර්ධනය වූ දළ ලියාහළ වාරිකය හේතු විය. 2025 වසරේ මුල් භාගයේ දී වාහන ආනයන සීමා ලිහිල් කිරීම ද සාමාන්‍ය රක්ෂණ උප අංශයේ දළ ලියාහළ වාරිකය පුළුල් වීමට දායක විය.


ව්‍යාපාර කටයුතුවල ඇති වූ සැලකිය යුතු ප්‍රසාරණය වීමේ සහාය ඇතිව සලකා බලන කාල සීමාව තුළ දී රක්ෂණ අංශය සිය වත්කම්වල ශක්තිමත් වර්ධනයක් වාර්තා කළේය. 2026 වසරේ පළමු භාගය අවසන් වන විට, රක්ෂණ අංශයේ මුළු වත්කම්වලින් 74.2%ක් දිගුකාලීන රක්ෂණ අංශය විසින් ද, 25.1%ක් සහ 0.7%ක් පිළිවෙළින් සාමාන්‍ය රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ උප අංශ මගින් ද නියෝජනය කරන ලදී. පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයේ වාර්තා වූ 15.7%ට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගය අවසානය වන විට රක්ෂණ අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය 15.4%ක් ලෙස වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් වර්ධනය විය. දිගුකාලීන රක්ෂණ සඳහා වන 13.1%ක වර්ධනයට සාපේක්ෂව, සාමාන්‍ය රක්ෂණ වත්කම් 24.1%ක ඉහළ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධන වේගයක් වාර්තා කළ ද, රක්ෂණ අංශයේ සමස්ත වත්කම් පදනමේ වර්ධනයට දිගුකාලීන රක්ෂණ අංශයෙන් 64.3%ක දායකත්වයක් ලබාදෙන ලදී. මේ අතර, 2026 වසරේ පළමු භාගය අවසන් වන විට, රක්ෂණ අංශයේ වත්කම්, ණය සුරැකුම්පත් වෙත සංකේන්ද්‍රණය වී තිබූ අතර, එම මුළු වත්කම්වලින් 47.0%ක් රජයේ සුරැකුම්පත් මගින් නියෝජනය කෙරිණි. තවද, රක්ෂණ අංශයේ වත්කම්, ස්ථාවර ආදායම් සුරැකුම්පත් වෙත දැඩි ලෙස සංකේන්ද්‍රණය වී තිබීම යම් ප්‍රමාණයකින් අඩු වී ඇති බව පෙන්නුම් කරමින්, මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස රජයේ සහ ආයතනික ණය සුරැකුම්පත්වල ඒකාබද්ධ කොටස 2025 වසරේ පළමු භාගය අවසානයේ පැවති 63.6%හි සිට 2026 වසරේ පළමු භාගය වන විට 60.9%ක් දක්වා පහත වැටුණි. ඊට ප්‍රධාන වශයෙන් සාමාන්‍ය රක්ෂණ උප අංශයේ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ වල ඉහළ යෑම හේතු විය.

රූප සටහන 3.88 **2026 වසරේ පළමු භාගය අවසානයේ සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ වත්කම්වල සංයුතිය**




මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

රූප සටහන 3.89 **උප අංශය අනුව ගෙවන ලද හිමිකම්**



මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව


රූප සටහන 3.91 **2026 වසරේ පළමු භාගය අවසන් වන විට කාණ්ඩය සහ තත්ත්වය අනුව දිට්වා සුළිකුණාටුවට අදාළ හිමිකම්**



මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව


දිට්වා සුළිකුණාටුව හේතුවෙන් සැලකිය යුතු හිමිකම් ඉල්ලීම් (claims) පැන නැගීම මධ්‍යයේ, 2026 වසරේ පළමු භාගය තුළ සාමාන්‍ය රක්ෂණ අංශයේ හිමිකම් ඉල්ලීම් සම්බන්ධ පීඩනය ඉහළ ගියේය. මූලිකවම මෝටර් රථවාහන රක්ෂණ හිමිකම් 40.8%කින් ඉහළ යෑම හේතුවෙන්, 2026 වසරේ පළමු භාගය තුළ සාමාන්‍ය රක්ෂණ හිමිකම් වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 21.4%කින් ඉහළ ගියේය. සෞඛ්‍ය රක්ෂණ හිමිකම් ඉල්ලීම් ද 3.7%කින් ඉහළ ගිය අතර, ගිනි රක්ෂණ හිමිකම් ඉල්ලීම් සැලකිය යුතු ලෙස පහළ ගියේය. මේ අතර, දිගුකාලීන රක්ෂණ හිමිකම් වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 1.5%කින් සුළු වශයෙන් ඉහළ ගියේය. 2026 වසරේ පළමු භාගය අවසන් වන විට, දිට්වා සුළිකුණාටුවට අදාළව රුපියල් බිලියන 57.0ක රක්ෂණ හිමිකම් ඉල්ලීම් ප්‍රමාණයක් ලැබී තිබූ අතර, එය 2026 වසරේ පළමු භාගය තුළ ගෙවන ලද සමස්ත සාමාන්‍ය රක්ෂණ හිමිකම් ඉල්ලීම්වල සමස්ත වටිනාකමෙන් 152.9%කට සමාන වේ. මෙම හිමිකම් ඉල්ලීම්වලින්, 44.5%ක් ගෙවා තිබූ අතර, 49.5%ක් ගෙවීමට ඉතිරිව පැවතුණි. ඉන් වටිනාකම අනුව ගත් කල, ගෙවීමට ඇති හිමිකම් ඉල්ලීම්වලින් 97.2%ක්ම මෝටර් රථවාහන නොවන ඉල්ලීම් (non-motor claims) විය. ඒ අනුව, මෙම හිමිකම් ඉල්ලීම් පියවීම මගින්, සාමාන්‍ය රක්ෂණ සමාගම්වල ප්‍රතිරක්ෂණ කාර්ය සාධනය, ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධන තත්ත්වයන් මත යම් පීඩනයක් ඇති කළ හැකිය.

රූප සටහන 3.90 **2026 වසරේ පළමු භාගයේ ගෙවන ලද හිමිකම්**



මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

රූප සටහන 3.92 **වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය**



මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

සාමාන්‍ය රක්ෂණ උප අංශය සාපේක්ෂව වඩාත් කැපී පෙනෙන ලෙස පහත වැටීමත් සමඟ 2026 වසරේ පළමු භාගය තුළ රක්ෂණ අංශයේ ලාභදායීත්වය පහළ ගියේය. සාමාන්‍ය රක්ෂණ උප අංශයේ 2025 වසරේ පළමු භාගයේ 8.6%ක් ලෙස පැවති වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය 2026 වසරේ පළමු භාගය වන විට 7.1% දක්වා පහත වැටුණු අතර,

විශේෂ සටහන 03

ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය තුළ කෘත්‍රිම බුද්ධිය භාවිතයට ගැනීම

ගෝලීය මූල්‍ය සේවා කර්මාන්තය තුළ කෘත්‍රිම බුද්ධිය (AI) වේගයෙන් භාවිතයට ගැනෙන අතර එම වේගවත් ව්‍යාප්තිය අබණ්ඩ අධීක්ෂණයට ලක්ව ඇත. ප්‍රධාන වශයෙන්ම, හවුල් තාක්ෂණ මගින් ඇති කරන පරිමාණ බලපෑම් හරහා, සයිබර් අවදානම, මෙහෙයුම්මය ගැටලුවක සිට මූල්‍ය පද්ධති ස්ථායීතාවයේ මූලික ගැටලුවක් දක්වා ඉහළ නැංවීමට කෘත්‍රිම බුද්ධිය දායක වෙමින් පවතී.[1] මෙම පසුබිම යටතේ මහ බැංකුව විසින් 2025 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු සියල්ලම ආවරණය වන පරිදි, කෘත්‍රිම බුද්ධිය භාවිතය, පාලනය, අවදානම් කළමනාකරණය, දත්ත සූදානම සහ උපායමාර්ගික ප්‍රමුඛතා පිළිබඳව සමීක්ෂණයක් පවත්වන ලදී.[2] කෙසේ වෙතත්, කෘත්‍රිම බුද්ධිය වේගයෙන් විකාශනය වීම හේතුවෙන්, වත්මන් තත්ත්වය යම් තරමකට වෙනස් විය හැකිය. මෙම විශේෂ සටහන මගින් මූලික සොයා ගැනීම්[3] සාරාංශ කරන අතර, බලපත්‍රලාභී බැංකුවල සයිබර් ආරක්ෂණ ඔරොත්තු දීමේ හැකියාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, ඇතිවිය හැකි පද්ධතිමය බලපෑම් සමඟ මතුවන අවදානම් පරීක්ෂා කරනු ලබයි.

බලපත්‍රලාභී බැංකු තුළ කෘත්‍රිම බුද්ධිය භාවිතයට ගැනීමේ වත්මන් තත්ත්වය

සමස්තයක් ලෙස, බලපත්‍රලාභී බැංකුවලින් 69%ක් කිසියම් ආකාරයක කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ ක්‍රියාකාරකම් ආරම්භ කර ඇතත්, ඒවායේ භාවිතය තවමත් පවතින්නේ ඉතා අඩු මට්ටමකය. බලපත්‍රලාභී බැංකුවලින් 31%ක්ම කිසිදු ආකාරයක කෘත්‍රිම බුද්ධි භාවිතයක් සහ භාවිතය සඳහා ක්ෂණික සැලසුම් නොමැති බව වාර්තා වී ඇති අතර, 21%ක් ගවේෂණාත්මක හෝ ශක්‍යතා අධ්‍යයන අදියරේ පසුවන අතර, 17%ක් නියමු ව්‍යාපෘති සංවර්ධනය කරමින් පවතින බවත් වාර්තා වී ඇත. තවද, 31%ක් සජීවී යෙදවුම් වෙත ද එයින් 10%ක් සීමිත ක්ෂේත්‍රවල ද, 17%ක් බහු කාර්යයන් සඳහා ද, 4%ක් පුළුල් ඒකාබද්ධ කිරීමක් සහිතව ද ක්‍රියාත්මක කර ඇත. කිසිදු බැංකුවක් කෘත්‍රිම බුද්ධිය මුල් කරගත් ආකෘතියක් ක්‍රියාත්මක කරන බව වාර්තා කර නැත.


දැනට පවතින කෘත්‍රිම බුද්ධිය ප්‍රධාන වශයෙන් වංචා සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ අධීක්ෂණය, ණය ලකුණු ගණනය, පාරිභෝගිකයා සම්මුඛ වන chatbot, ලේඛන සැකසීම සහ අභ්‍යන්තර ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ යෙදවුම් වටා කේන්ද්‍රගත වී ඇත. වේගවත් සේවා සැපයීම, නිරන්තරයෙන් සේවා ලබා ගැනීමට ඇති හැකියාව සහ අඩු සේවා පිරිවැය ආදිය ප්‍රධාන පාරිභෝගික ප්‍රතිලාභ ලෙස හඳුනාගෙන ඇති අතර, කෘත්‍රිම බුද්ධිය භාවිතය පිළිබඳ පැහැදිලි ලෙස දැනුවත් කිරීම විශ්වාසය ගොඩනැංවීමේ ප්‍රධානම පියවර ලෙස හඳුනාගෙන ඇත. පාරිභෝගික සේවා සහ අභ්‍යන්තර දැනුම් කළමනාකරණය සඳහා උත්පාදක කෘත්‍රිම බුද්ධි (Generative AI) යෙදවුම් භාවිතයට ගැනෙමින් පවතී.

යහපාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග


කෘත්‍රිම බුද්ධිය සඳහා වන යහපාලන ව්‍යුහයන් තවමත් ක්‍රියාත්මක කිරීමේ මූලික අදියරයන්හි පවතී. බලපත්‍රලාභී බැංකුවලින් 23%ක් පවතින අවදානම් කමිටු සමඟ ඒකාබද්ධකරණය හරහා කෘත්‍රිම බුද්ධිය කළමනාකරණය කරන අතර, ඊට සමාන ප්‍රතිශතයක් අන්තර්කාර්ය සාධක කණ්ඩායම් හරහා සිදු කරයි. මේ අතර, 8%ක් අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කෘත්‍රිම බුද්ධි අධීක්ෂණ කමිටුවක් පිහිටුවා ඇති අතර, 15%ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ කෘත්‍රිම බුද්ධි මෙහෙයුම් කමිටුවක් පිහිටුවා ඇත. බලපත්‍රලාභී බැංකුවලින් 17%ක කෘත්‍රිම බුද්ධි පාලන කටයුතු ස්ථාපිත කිරීමට නියමිතව තිබේ.

අවදානම් තක්සේරු කිරීමේ ක්‍රමවේද ද ඒ හා සමාන අසමානතාවක් පෙන්වයි. තාක්ෂණික, මෙහෙයුම්මය, අනුකූලතා සහ ආකෘති අවදානම් කෙරෙහි බැංකු විසින් වැඩි අවධානයක් යොමු කරන අතර, ණය, වෙළෙඳපොළ හා ද්‍රවශීලතා අවදානම් කෙරෙහි අවධානය යොමු කෙරෙනුයේ මද වශයෙනි. වර්තමානයේ දී කෘත්‍රිම බුද්ධිය සලකනු ලබන්නේ මූල්‍ය අවදානම් ඇති කරන සාධකයක් ලෙස නොව, තාක්ෂණික යෙදවුමක් වශයෙනි.


රූප සටහන 1 කෘත්‍රිම බුද්ධිය ක්‍රියාත්මක කිරීමේ වත්මන් තත්ත්වය



රූප සටහන 2 කෘත්‍රිම බුද්ධි යහපාලන රාමුව



රූප සටහන 3 **බාහිරින් සේවා ලබාගැනීම සහ තුන්වන පාර්ශවයේ අවදානම් කළමණාකරණය**



තුන්වන පාර්ශ්වය මත යැපීම සහ කේන්ද්‍රගතවීම

බලපත්‍රලාභී බැංකුවලින් 62%ක් ජාත්‍යන්තර තාක්ෂණ සමාගම් කිහිපයක් සමඟ හවුල්කාරිත්වයන් පවත්වන බව වාර්තා වී තිබේ. දේශීය තාක්ෂණ සමාගම් (24%), කලාපීය මූල්‍ය තාක්ෂණ සමාගම් හා විවෘත මූලාශ්‍ර විසඳුම් (එකකට 21% බැගින්), සහ පද්ධති ඒකාබද්ධකරුවන් සහ කෘත්‍රිම බුද්ධි උපදේශන ආයතන (එකකට 17% බැගින්) සමඟ වන සම්බන්ධතා සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පවතී.

කෘත්‍රිම බුද්ධි සේවා සපයන්නන් පිළිබඳ නිසි උද්‍යෝගය සහ ගිවිසුම්වල ඇති දත්ත ආරක්ෂණ අවශ්‍යතා 17%ක් ලෙස පවතින අතර, සේවා මට්ටමේ ගිවිසුම් 16%ක් ද, දත්ත සපයන්නන් වෙනස් කිරීමේ උපායමාර්ග සහ දත්ත රැගෙන යාමේ හැකියාව පිළිබඳ වගන්ති 14%ක් ද, කෘත්‍රිම බුද්ධි බාහිරින් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ සැපයුම්කරුගේ ව්‍යාපාර අඛණ්ඩතා ගිවිසුම් 13%ක් ද, සහ සැපයුම්කරුගේ මෙහෙයුම් විගණනය කිරීමට ඇති අයිතිය 10%ක් වැනි ඉතා අඩු ප්‍රතිශතයක ද පවතී. සීමිත සේවා සපයන්නන් කිහිප දෙනෙකු මත පමණක් කේන්ද්‍රගතව පැවතීම සහ ශක්තිමත් කළ යුතු ගිවිසුම්ගත පාලනයක් පැවතීම, මෙම සමීක්ෂණයේ වඩාත්ම වැදගත් සොයාගැනීම් වේ.


සයිබර් ආරක්ෂණ ඔරොත්තු දීමේ හැකියාව සහ මූල්‍ය ස්ථායිතාව සඳහා වන බලපෑම්

සයිබර් ආරක්ෂණ හා අවදානම් සම්බන්ධ ගැටලු, කෘත්‍රිම බුද්ධිය භාවිතයට ගැනීමේ දී හඳුනාගත් වැඩි වශයෙන් සඳහන් වූ අභියෝග තුන අතරට ඇතුළත් වූ අතර (ප්‍රතිචාරවලින් 15%ක්), දේශීය කෘත්‍රිම බුද්ධිය සීමිත වීම (17%) සහ ඉහළ ක්‍රියාත්මක කිරීමේ පිරිවැය (15%) ද ප්‍රධාන අභියෝග ලෙස හඳුනාගෙන ඇත. මෙම අවධානයට සාධාරණ පදනමක් ඇත.

ප්‍රධාන පද්ධතිමය අවදානම මතු වන්නේ නව ප්‍රහාරක ක්‍රම නිසා නොව, පුළුල් ලෙස භාවිත වන තාක්ෂණයන් හරහා අවදානම් හඳුනා ගැනීමට සහ ඒවායින් අයුතු ප්‍රයෝජන ගැනීමට කෘත්‍රිම බුද්ධිය මගින් ඉඩ සලසන වේගය, වාර ගණන සහ පුළුල් බව නිසාය. කෘත්‍රිම බුද්ධිය මගින් අනිසි ක්‍රියාවල යෙදෙන්නන්ගේ ක්‍රියාකාරකම් 2024 සහ 2025 අතර කාලය තුළ දී 89%කින් ඉහළ ගොස් ඇති අතර අතරමැදි ජාලයක් තුළ ප්‍රහාරකයන්ට පද්ධතිය හරහා ගමන් කිරීමට ගතවන සාමාන්‍ය කාලය 65%කින් අඩු වී විනාඩි 29ක් දක්වා පහත වැටී ඇති බව ක්ෂේත්‍ර දත්ත මගින් පෙන්වා දෙයි.[4] සයිබර් ප්‍රහාර හඳුනාගෙන ඒවා සහ පාලනය කිරීම සඳහා ඇති කාල රාමුව යන්ත්‍රමය ක්‍රියාකාරී වේගය දක්වාම ළඟා වෙමින් පවතී.

මෙම ක්‍රියාවන් බලපත්‍රලාභී බැංකු වෙත සෘජුවම බලපායි. කෘත්‍රිම බුද්ධිය මගින් පිරිවැය අඩු කරන අතර බැංකු සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් වෙත එල්ල වන ප්‍රහාරවල බලපෑම ඉහළ නංවයි. උත්පාදක කෘත්‍රිම බුද්ධි ආකෘති මගින් මනා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවක් සහිත වංචනික විද්‍යුත් තැපැල් පණිවිඩ හුවමාරු කිරීමට සහ ව්‍යාපාරික විද්‍යුත් තැපැල් ආකෘති සකස් කිරීමට හැකි වන අතර, කෘත්‍රිමව නිර්මාණය කළ හඬ සහ වීඩියෝ මගින් ගනුදෙනුකරුවන් සහ

රූප සටහන 4 **කෘත්‍රිම බුද්ධියට අනුගතවීමේ දී මුහුණ දුන් ප්‍රධාන ගැටලු**



ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ලෙස පෙනී සිටීමට ඉඩ සලසයි. මෙය දුරස්ථ බඳවා ගැනීම්, වීඩියෝ මත පදනම් වූ ගනුදෙනුකරු හඳුනාගැනීම් සහ ගෙවීම් අනුමත කිරීමේ පාලනයන්ට තර්ජනයක් වේ. මෙම තත්ත්වය තුළ, දේශීය සිල්ලර ගෙවීම් මාධ්‍යවල පවත්නා වංචා රටාවන් සම්බන්ධයෙන් මතු වෙමින් පවතින අවදානමක් නිරීක්ෂණය කිරීමට හැකිය.

කෘත්‍රිම බුද්ධිය භාවිතයත් සමඟ සයිබර් ප්‍රහාරවලට නිරාවරණය වීමේ ඉඩකඩ ද පුළුල් කරයි. ආකෘති අවසාන ලක්ෂ්‍ය (model endpoints), යෙදුම් වැඩසටහන් අතුරුමුහුණත් (application programming interfaces), පුහුණු දත්ත ගබඩා සහ දෛශික දත්ත සමුදායන් (vector databases) සාම්ප්‍රදායික පරිමිති පාලනයන්ගෙන් (conventional perimeter controls) බැහැරව පිහිටා ඇති අතර, කෘත්‍රිම බුද්ධිය වෙත ව්‍යාජ උපදෙස් ලබා දීම (prompt injections), හානිකර දත්ත එකතු කිරීම පුහුණුව (training data poisoning) සහ ආකෘති ප්‍රතිනිර්මාණය (model inversion) වැනි කෘත්‍රිම බුද්ධි පද්ධතිවලට ආවේණික වූ ප්‍රහාරක ක්‍රම දැනට පවත්නා පාලන මගින් ආවරණය කරනු නොලැබේ. තවද, බැංකු කාර්ය මණ්ඩලය විසින් අනුමැතියකින් තොරව පොදු උත්පාදක කෘත්‍රිම බුද්ධි මෙවලම් භාවිත කිරීම මගින්, බැංකුවේ පාලන සීමාවෙන් පිටතට රහස්‍ය දත්ත යොමු වීමට තවත් මාර්ගයක් නිර්මාණය කරයි.

මූල්‍ය ස්ථායීතාව සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිතය මගින් අවදානම් නිරාවරණය කේන්ද්‍රගත වෙයි. බැංකු විසින් එකම සීමිත වළාකුළු (cloud) සහ ආකෘති සපයන්නන් පිරිසක් මත යැපෙන විට, තනි සැපයුම්කරුවකුට සිදුවන ප්‍රහාරයක් හෝ බිඳ වැටීමක් තනි ආයතනයකට පමණක් සීමා නොවී, ආයතන පුරා එකවර බලපාන පොදු ආකාරයේ අසාර්ථකත්වයක් බවට පත් වේ. දියුණු ආර්ථිකයන් සමඟ එකම ගෝලීය ඩිජිටල් යටිතල පහසුකම් භාවිත කළ ද, අඩු ආරක්ෂක සම්පත්, වඩාත් සීමිත අධීක්ෂණ ධාරිතාව සහ මෘදුකාංග ආරක්ෂක යාවත්කාලීන කිරීම් සිදු කරන කාල පරතරයන් (patching cycles) දිගු වන කුඩා සැපයුම්කරුවන් මත වැඩි වශයෙන් රඳා පැවතීම හේතුවෙන් නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් විෂමාකාරී ලෙස මෙම අවදානමට නිරාවරණය වී ඇත. මෙය හඳුනාගත් දුර්වලතා නිවැරදි නොකර ඒවා විවෘතව පවතින කාල පරාසය දීර්ඝ කරයි. ශ්‍රී ලංකාව සඳහා මෙය ප්‍රායෝගික අනතුරු ඇඟවීමකි.

මෙම අවදානම් නිරාවරණයන් සමනය කරමින්, කෘත්‍රිම බුද්ධිය මගින්, අසාමාන්‍ය පරිශීලක රටා හඳුනාගැනීම (anomaly detection), හැසිරීම් විශ්ලේෂණය (behavioral analytics) සහ ස්වයංක්‍රීය වර්ගීකරණය (automated triage) හරහා ආරක්ෂක හැකියාවන් ශක්තිමත් කරයි. එබැවින්, ආදායම් උපයන කාර්යයන් සඳහා කෘත්‍රිම බුද්ධියට ආයෝජනය කරන බැංකු, ඊට සමානුපාතිකව වේගවත් ස්වයංක්‍රීය ආරක්ෂණ ක්‍රමවේදය (machine speed defense) සඳහා ද ආයෝජනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. වළක්වාගැනීම පමණක් තවදුරටත් ප්‍රමාණවත් නොවන අතර ආරක්ෂක බිඳ වැටීමක් සිදු වූ විට බලපෑම් පරාසය සීමා කිරීම සහ පැතිරීම පාලනය කිරීම සඳහා ඛණ්ඩනය කිරීම (segmentation), කිසිදු පරිශීලකයකු, උපාංගයක් හෝ ජාලයක් විශ්වාස නොකිරීම (zero trust architecture), විධිමත් ප්‍රවේශ පාලනය (disciplined access control) සහ සැලසුම් මගින් ආරක්ෂිත වීමේ භාවිතයන් ඔරොත්තු දීමේ හැකියාව සඳහා අත්‍යවශ්‍ය වේ.

නියාමන ප්‍රවේශය හා ඉදිරි ගමන

ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් දැනට පවත්නා නියාමන රාමුව මගින් ප්‍රමාණවත් ආවරණයක් ලබා දෙයි.

- තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ 2021 අංක 16 දරන බැංකු පනත් විධාන මගින් පාලනය, තොරතුරු ආරක්ෂණය, තුන්වන පාර්ශ්වීය අවදානම සහ ව්‍යාපාර අඛණ්ඩතාව සඳහා අවශ්‍යතා නියම කරනු ලබයි.
- 2027 වසරේ ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන, බලපත්‍රලාභී ව්‍යාපාරවල ව්‍යාපාරික කටයුතු බාහිරින් ලබාගැනීම පිළිබඳ 2026 අංක 01 දරන බැංකු පනත් විධාන මගින්, බාහිරින් ලබාගෙන ඇති සහ වලාකුළු පදනම් කරගත් (cloud-based) කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගවීම, නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීම, විගණන අයිතිවාසිකම් සහ ඉවත් වීම් සැලසුම්කරණය ශක්තිමත් කරයි.
- 2025 අංක 02 දරන චක්‍රලේඛය තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂක සිදුවීම් වාර්තා කිරීම අනිවාර්ය කරයි.
- 2022 අංක 09 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනත, ආකෘති සංවර්ධනයේදී භාවිත කරන පුද්ගලික දත්ත පාලනය කරයි.

නියාමන නිශ්චිතභාවය, වලාකුළු (cloud) සහ යටිතල පහසුකම් සහාය සහ ධාරිතා ගොඩනැංවීම බැංකු විසින් සිය මූලික අවශ්‍යතා ලෙස හඳුනාගෙන තිබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ වගවීම, ආකෘති ලැයිස්තු සහ කාල සීමා තහවුරු කිරීම (lifecycle validation), ප්‍රතිඵලාත්මක තීරණ සඳහා මානව අධීක්ෂණය සහ පැහැදිලි කළ හැකි බව ආවරණය කරමින්, කෘත්‍රිම බුද්ධිය ආරක්ෂිතව සහ වගකීමෙන් යුතුව අනුගමනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීමේ කටයුතුවල මහ බැංකුව නිරතව සිටී. ජාත්‍යන්තර නිර්දේශවලට අනුකූලව, අධීක්ෂණ කටයුතු මගින් තීරණාත්මක කෘත්‍රිම බුද්ධි සහ වලාකුළු (cloud) මත යැපීම් හඳුනා ගැනීම හා ඒවායේ විකල්ප භාවිතය, කෘත්‍රිම බුද්ධිය පදනම් කරගත් තර්ජන අවස්ථා සයිබර් අනුකරණ අභ්‍යාසවලට ඇතුළත් කිරීම සහ පරීක්ෂණ කටයුතු කෘත්‍රිම බුද්ධි පාලන පරිසරය දක්වා පුළුල් කිරීම සිදු කරනු ලැබේ.

නිගමනය

ශ්‍රී ලංකාවේ බැංකු අංශය තුළ කෘත්‍රිම බුද්ධිය අනුගමනය කිරීමේ අභිප්‍රාය පරාසයක විහිදී පවතින නමුත්, ක්‍රියාත්මක කිරීම, පාලනය සහ තුන්වන පාර්ශ්වීය පාලනයන් සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාත්මක විය යුතුය. එබැවින්, පරිමාණයෙන් පුළුල් වීමට පෙර නියාමන අපේක්ෂාවන් ස්ථාපිත කිරීම සඳහා පවතින අවස්ථාව තවදුරටත් විවෘතව පවතී. සයිබර් ආරක්ෂක ඔරොත්තු දීමේ හැකියාව යනු බැඳී පවතින සීමාවකි; එනම්, අනාවරණය කර ගැනීම දියුණු කරන එම තාක්ෂණයම ප්‍රහාරකයන් ශක්තිමත් කරන අතර, බාහිර

සැපයුම්කරුවන් ස්වල්පයක් මත යැපීම ද කේන්ද්‍රගත කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය ශක්තිමත් කිරීම, කෘත්‍රිම බුද්ධි සේවා සපයන්නන් භාවිතයට ගිවිසුම්ගත පාලනයක් පවත්වා ගැනීම, යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම, සිදුවීම් වාර්තා කිරීමේ විධිමත් බව සහ කෘත්‍රිම බුද්ධිය සඳහා විශේෂිත වූ තර්ජනවලට ගැළපෙන පරිදි සකස් කරන ලද ඔරොත්තු දීමේ හැකියාව පරීක්ෂා කිරීම, කෘත්‍රිම බුද්ධිය භාවිතයෙන් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍ය වනු ඇත.

1 Adrian, T., T. Gaidosch, M. Moretti, M. Qureshi and R. Ravikumar (2026), Artificial Intelligence and Cybersecurity in the Financial Sector, IMF Note 2026/005, June; Financial Stability Board, The Financial Stability Implications of Artificial Intelligence (November 2024); Monetary Authority of Singapore, Artificial Intelligence Model Risk Management: Observations from a Thematic Review (December 2024); and Reserve Bank of India, FREE-AI Committee Report (August 2025).

2 මෙම විමර්ශනය සියලුම බලපතලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත යොමු කරන ලද අතර, එමගින් ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය, භාවිත අවස්ථා, පාලනය, අවදානම් කළමනාකරණය, දත්ත සූදානම, ව්‍යාපාරික එකඟතා, පාරිභෝගිකයාට වන බලපෑම සහ අනාගත උපායමාර්ගික ප්‍රමුඛතා ආවරණය කළේය. වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්නම් මිස, ප්‍රතිඵලයන් බලපතලාභී බැංකු 29හි කොටසක් ලෙස ප්‍රකාශ කරනු ලැබේ.

3 මෙම සටහනේ සාකච්ඡා කර ඇති සොයාගැනීම් විමර්ශන ප්‍රතිචාරවලින් ලබාගත් ඒවා වන අතර, ඒවා අත්‍යවශ්‍යයෙන්ම මහ බැංකුවේ අදහස් ප්‍රකාශ නොකරයි.


4 CrowdStrike (2026), Global Threat Report, as cited in IMF Note 2026/005' ප්‍රහාරයන් පැතිර යාමේ කාලය මගින් මනිනු ලබන්නේ, මූලාරම්භයේ සිට ජාලය තුළ පැතිරී යාම සිදුවීම දක්වා ගත වන කාල පරාසයයි.

එම කාල සීමාව තුළම හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 20.2% සිට 17.4% දක්වා පහළ ගියේය. කෙසේ වෙතත්, දිගුකාලීන රක්ෂණකරුවන්ට වඩා ඉහළ ලාභදායීතාවයක් සාමාන්‍ය රක්ෂණකරුවන් විසින් අඛණ්ඩව වාර්තා කළහ. මේ අතර, 2025 වසරේ පළමු භාගයේ දී පිළිවෙළින් 3.2%ක් සහ 17.2%ක් ලෙස පැවති දිගුකාලීන රක්ෂණ උප අංශයේ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය, 2026 වසරේ පළමු භාගය වන විට පිළිවෙළින් 3.0% සහ 16.8% දක්වා සුළු වශයෙන් පහත වැටුණි. දිට්වා සුළිකුණාටුවට අදාළ හිමිකම් හේතුවෙන් ප්‍රතිරක්ෂණ කාර්ය සාධනය මත ඇති විය හැකි පීඩනය මධ්‍යයේ, විශේෂයෙන්ම සාමාන්‍ය රක්ෂණකරුවන්ගේ ලාභදායීත්වයේ අඛණ්ඩ මන්දගාමී වීම අවධානයට ලක්විය යුතු කරුණකි.

රක්ෂණ උප අංශ දෙකෙහිම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත, සලකා බලන කාල සීමාව තුළ සුළු පහත වැටීම් වාර්තා කළ ද, නියාමන සීමාවන්ට වඩා ඉහළ මට්ටමක අඛණ්ඩව පැවතුණි. සාමාන්‍ය රක්ෂණ උප අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 2025 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට පැවති 296.6%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට 286.2%ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණු අතර, දිගුකාලීන රක්ෂණ උප අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය ද 2025 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට පැවති 344.9%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට 313.1%ක් දක්වා අඩුවිය. කෙසේ වෙතත්, අංශ දෙකෙහිම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත අඛණ්ඩව 120.0%ක අවශ්‍ය අවම නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත ඉක්මවා පැවතුණි.


2026 වසරේ පළමු භාගය අවසන් වන විට, බැංකු සහ රක්ෂණ අංශ අතර අන්තර්සම්බන්ධතාව, ප්‍රධාන වශයෙන්ම රක්ෂණ ආයතන විසින් තමන් සතු අරමුදල් බැංකු තුළ තැන්පත් කිරීම මත රඳා පැවතිණි. 2026 වසරේ පළමු භාගය අවසන් වන විට, රක්ෂණ අංශය විසින් බැංකුවල පවත්වාගෙන යනු ලැබූ තැන්පතු ප්‍රමාණය 23.4%කින් වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් වැඩි වී රුපියල් බිලියන 171.2ක් දක්වා ඉහළ ගියේය. එසේ වුවද, රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ආයතන වෙත බැංකු විසින් ලබා දී ඇති ණය මුදල් පෙර වසරේ අනුරූප කාල සීමාවට සාපේක්ෂව වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 9.6%කින් අඩු වී රුපියල් බිලියන 9.9ක් දක්වා පහත වැටිණි. ඒ අනුව, රක්ෂණකරුවන් බැංකු අංශයට අරමුදල් සපයන ශුද්ධ සැපයුම්කරුවන් ලෙස අඛණ්ඩව කටයුතු කළ අතර,

රූප සටහන 3.93 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය




මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

රූප සටහන 3.94 රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ආයතන සඳහා බැංකු අංශයේ ණය ලබාදීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3.95 බැංකු සමඟ ඇති රක්ෂණ අංශයේ තැන්පතු



මූලාශ්‍රය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

රූප සටහන 3.96 ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධති ස්ථායිතාව කෙරෙහි බලපාන සයිබර් තර්ජන පිළිබඳ සාරාංශය



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රක්ෂණකරුවන් වෙත බැංකුවල ඍජු ණය නිරාවරණය සාපේක්ෂව සීමිත මට්ටමක පැවතුණි. කෙසේ වෙතත්, දේශගුණික අවදානම අංශ අතර අන්තර්සම්බන්ධතාව සමඟ අන්තර්ක්‍රියා කරනුයේ කෙසේද යන්න දිට්වා සුළිකුණාටුව මගින් පෙන්නුම් කරන ලදී. ව්‍යසනයන්ට අදාළව ඇති වූ විශාල හිමිකම් ඉල්ලීම් හේතුවෙන්, ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් ප්‍රතිපූර්ණ මුදල් හිමිවන තෙක් එම හිමිකම් පියවීමට රක්ෂණකරුවන්ට තමන් සතු මුදල් සහ බැංකු තැන්පතු භාවිත කිරීමට සිදුවිය හැකිය. 2026 වසරේ පළමු භාගය අවසන් වන විට රක්ෂණ අංශයේ තැන්පත් වර්ධනයෙහි පහත වැටීම සඳහා රක්ෂණ සමාගම්වල මෙම ඉහළ ද්‍රවශීලතා භාවිතය යම් ප්‍රමාණයකට හේතු වූ බව සැලකිය හැකිය.

3.4 මූල්‍ය ආයතනවල සයිබර් තර්ජන සහ මෙහෙයුම්වල ශක්තිමත්භාවය

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය පුරා ඩිජිටල්කරණය අඛණ්ඩව වේගයෙන් ප්‍රසාරණය වෙමින් පවතින පසුබිමක, සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීම සඳහා මෙහෙයුම් සහ සයිබර් ආරක්ෂාව සම්බන්ධ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම වැදගත් වේ. මූල්‍ය ආයතන විසින් ඩිජිටල් මූල්‍ය සේවා සහ ගෙවීම් ක්‍රමවේද අඛණ්ඩව පුළුල් කරමින්, මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීමේ හැකියාව, කාර්යක්ෂමතාව සහ මූල්‍ය සේවා පහසුකම් වැඩිදියුණු කර ඇත. කෙසේ වුවද, ඉහළ යන ඩිජිටල්කරණය, පුළුල් වන අන්තර්සම්බන්ධතාව සහ තාක්ෂණය මත මෙන්ම තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් මත රඳා පැවතීම ඉහළ යෑම හේතුවෙන් මූල්‍ය පද්ධතිය, සයිබර් හා මෙහෙයුම් අවදානම්වලට නිරාවරණය වීමේ හැකියාව ද ඉහළ යා හැකිය. පද්ධතිමය වැදගත්කමක් ඇති මූල්‍ය ආයතනයකට හෝ තීරණාත්මක මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකමකට බලපාන සැලකිය යුතු සයිබර් තර්ජන ආශ්‍රිත සිදුවීමක් හේතුවෙන් අත්‍යවශ්‍ය මූල්‍ය සේවා සැපයීමට බාධා වීමටත්, ගෙවීම් සහ පියවීම කටයුතු අඩාල වීමටත්, මූල්‍ය පද්ධතිය කෙරෙහි පවතින විශ්වාසය දුර්වල වීමටත් හැකියාවක් පවතී.

සයිබර් ප්‍රහාර, රැන්සම්වෙයාර් (ransomware), පෞද්ගලික දත්ත සොරාගැනීම් (phishing), රහසිගත තොරතුරු අනාවරණය කිරීමට පෙළඹවීම් (social engineering) සහ තෙවන පර්ශ්වයන්ගෙන් ඇතිවිය හැකි අවදානම් ඇතුළුව විකාශනය වෙමින් පවතින සයිබර් තර්ජනවලට ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය අංශය පුරා සයිබර් තර්ජනවලට ඔරොත්තු දීමේ හැකියාව අධීක්ෂණය කිරීමේ රාමුව ශක්තිමත් කරන ලදී. නියාමන සහ අධීක්ෂණ ක්‍රියාමාර්ග මුලපිරීම් මගින් සයිබර් අවදානම් පාලනය ශක්තිමත් කිරීම, සයිබර් තර්ජන ආශ්‍රිත සිදුවීම් වාර්තා කිරීම ඉහළ නැංවීම, තීරණාත්මක වන පද්ධති නවීකරණය කිරීම, තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් අධීක්ෂණය ශක්තිමත් කිරීම සහ සයිබර් තර්ජනවලට ඔරොත්තු දීමේ හැකියාව මෙන්ම ව්‍යාපාරවල අඛණ්ඩතාව සහ ආපදා ප්‍රතිසාධන වැඩපිළිවෙළ ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම පියවරවල අරමුණ වන්නේ මූල්‍ය පද්ධතියේ සූදානම සහ මෙහෙයුම්වල ශක්තිමත්භාවය වැඩිදියුණු කිරීම, ඩිජිටල්කරණය ආශ්‍රිතව මතු වන අවදානම් අවම කිරීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට සහාය වීමයි.


ඩිජිටල් වංචා සහ පෞද්ගලික දත්ත සොරාගැනීම් ආශ්‍රිත සිදුවීම් ඉහළ අගයක් ගන්නා බව නියාමන අධිකාරිය වෙත වාර්තා වූ සිදුවීම්වලින් පෙන්නුම් කරයි. බොහෝ සිදුවීම් ව්‍යාපාර කෙරෙහි ඍජුව බලපෑම් නොකළ ද, ව්‍යාපාරයේ කීර්තිනාමයට හානි සිදුවීමට ඇති හැකියාව, විශේෂයෙන්ම පාරිභෝගික විශ්වාසය පළුදු වීම ප්‍රධාන ගැටලුවක් ලෙස

පවතී. මේ අතර, අත්‍යවශ්‍ය ඩිජිටල් මූල්‍ය සේවා වෙත අඛණ්ඩව ප්‍රවේශ වීමේ හැකියාව සහ මෙහෙයුම්වල ශක්තිමත්භාවය පවත්වාගෙන යාමේ වැදගත්කම ද වාර්තා වූ පද්ධති බිඳ වැටීම් සහ පද්ධතිවලට බාධා එල්ලවීම් මගින් අවධාරණය කරයි.

මාර්ගගත බැංකු වංචා, පෞද්ගලික දත්ත සොරා ගැනීම, රහසිගත තොරතුරු අනාවරණය කිරීමට පෙළඹවීම් සහ වංචනික අයෝජන ක්‍රම ඉහළ යෑම හමුවේ, අදාළ බලධාරීන් සහ කර්මාන්ත පාර්ශ්වකරුවන් විසින් වංචා වැළැක්වීමේ ක්‍රමවේද සහ පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාමාර්ග ශක්තිමත් කරන ලදී. උසස් සත්‍යාපන යාන්ත්‍රණ හරහා ගනුදෙනුවල ආරක්ෂාව ඉහළ නැංවීම, මතුවන වංචා ආශ්‍රිත අවදානම් හඳුනාගැනීමට සහ වැළැක්වීමට විදුලි සංදේශ සේවා සපයන්නන් සමඟ පවතින සහයෝගීතාව වර්ධනය කිරීම, වංචාවලට කඩිනමින් ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණ හරහා පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම සහ ඩිජිටල් මූල්‍ය සේවා සඳහා වඩාත් ආරක්ෂිත ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම මුලපිරීම් මගින් ඩිජිටල් මූල්‍ය සේවා සම්බන්ධයෙන් පවතින මහජන විශ්වාසය ශක්තිමත් කිරීම මෙන්ම ඩිජිටල් ගෙවීම් ක්‍රමවේද ආරක්ෂිතව භාවිත කිරීම සඳහා සහාය වීම අරමුණු කරයි.

ඉදිරි කාලය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී, මූල්‍ය ආයතන, ගෙවීම් පද්ධති, තාක්ෂණික සේවා සපයන්නන් සහ අනෙකුත් වැදගත් සේවා සපයන්නන් අතර පවතින අන්තර්සම්බන්ධතාව ඉහළ යෑම හේතුවෙන් අඛණ්ඩව සුපරීක්ෂාකාරී ලෙස කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙහෙයුම්මය බාධාවන්ගෙන් ඇතිවිය හැකි අහිතකර බලපෑම් පාලනය කිරීම සහ අත්‍යවශ්‍ය මූල්‍ය සේවාවල අඛණ්ඩතාව සුරක්ෂිත කිරීම සඳහා සයිබර් තර්ජන හමුවේ මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව, තොරතුරු හුවමාරු කර ගැනීමේ පහසුකම්, තෙවන පාර්ශ්වීය අවදානම් කළමනාකරණය සහ සම්බන්ධීකරණය කරන ලද ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම වැදගත් වනු ඇත.

4 පරිච්ඡේදය
කුටුම්බ සහ සමාගම් අංශ



මූල්‍ය ආයතන සමඟ පවතින සමීප සබඳතා සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා දක්වන දායකත්වය හේතුවෙන් කුටුම්බ සහ සමාගම් යන අංශ[1] මූල්‍ය පද්ධතිය තුළ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. කුටුම්බ අංශය පරිභෝජන සහ ඉතුරුම් සඳහා සහාය දක්වන අතර සමාගම් අංශය නිෂ්පාදන, ආයෝජන සහ රැකියා නියුක්තිය සඳහා දායකත්වය සපයයි. මූල්‍ය පද්ධතියේ ප්‍රධාන ණයගැනුම්කරුවන් වශයෙන් ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය සහ ණයසේවාකරණය සඳහා ඇති හැකියාව, මූල්‍ය ආයතනවල වත්කම්වල ගුණාත්මකභාවය සහ ලාභදායීත්වය කෙරෙහි සෘජුවම බලපායි. කුටුම්බ ආදයම් හෝ සමාගම් ඉපැයීම්වල අහිතකර වර්ධනයන් තුළින් ණය අලාභ ඉහළ යෑමට සහ ණය ලබාදීම් සීමා කිරීමට ඉඩ ප්‍රස්ථාව පවතින අතර, එමගින් ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි ද පුළුල් බලපෑම් ඇති විය හැකිය. ඒ අනුව, කුටුම්බ සහ සමාගම් අංශවලින් මූල්‍ය පද්ධති ස්ථායීතාව කෙරෙහි ඇති විය හැකි අවදානම් කල්තියා හඳුනා ගැනීම සඳහා එම අංශවල පවතින දුර්වලතා ඇගයීම වැදගත් වේ.

ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනයත් සමඟ ඉහළ යන ණය සඳහා වන ඉල්ලුම පෙන්නුම් කරමින්, 2026 වසරේ පළමු භාගය තුළ කුටුම්බ[2] සහ ආයතනික[3] අංශ වෙත ලබාදුන් ණය ප්‍රමාණය අඛණ්ඩව වර්ධනය විය. පසුගිය වසර දෙකක කාලය පුරා සිදුවූ අඛණ්ඩ ණය වර්ධනයෙන් අනතුරුව, 2026 වසරේ දෙවන කාර්තුවේ දී කුටුම්බ අංශයේ ණය ප්‍රසාරණය තරමක් මන්දගාමී වුව ද, එය තවදුරටත් ඉහළ අගයක පැවතුණි. ආයතනික අංශයේ ණය ද ශක්තිමත් වර්ධනයක් වාර්තා කළ අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් බැංකු ණය ලබාදීම් සහාය විය. මෙම ඉහළ ණය වර්ධනය තුළින් මූල්‍ය අතරමැදිකරණය ශක්තිමත් වුව ද එහි වේගය, සංයුතිය සහ ණයවල ගුණාත්මකභාවය අඛණ්ඩව අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාව ද එමගින් පිළිබිඹු වේ. මේ අතර, 2026 වසරේ පළමු භාගයේ දී කුටුම්බ අංශයේ ණයගැනුම්කරුවන්ගේ ණය අවදානම තවදුරටත් පහළ ගිය අතර, බහුතර ණයගැනුම්කරුවන් පිරිසක් ණය ශ්‍රේණිගත කිරීම්වල අඩු අවදානම් කාණ්ඩවලට අයත් විය. ආයතනික අංශයේ ණයගැනුම්කරුවන්ගේ ණය අවදානම ද සමස්තයක් ලෙස යහපත් මට්ටමක පැවති අතර, ණය නිරාවරණයන් හි වැඩි කොටසක් අඩු අවදානම් කාණ්ඩයන් හි පැවතුණි. කෙසේ වුව ද, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ණයගැනුම්කරුවන්ගේ ණය අවදානම් තත්ත්වය බැංකු අංශයට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවති අතර, මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම සම්බන්ධයෙන් සලකා බලන කල ඒ පිළිබඳව නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. දැඩි මුදල් තත්ත්වයන් සහ මෑත කාලීනව හඳුන්වා දුන් වටිනාකම මත ණය අනුපාතය[4] හේතුවෙන් විශේෂයෙන් කුටුම්බ අංශයේ ණය වර්ධනය ඉදිරියේ දී ක්‍රමයෙන් මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුව ද, ණය ආපසු ගෙවීමේ කාර්යසාධනය සහ ණයගැනුම්කරුවන්ගේ ණය ගුණාත්මකභාවය සම්බන්ධයෙන් මෑතක දී වාර්තා වූ හිතකර වර්ධනයන්, එම අංශ දෙකෙහිම ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීමට සහාය වනු ඇත.

හිතකර ව්‍යාපාර තත්ත්වයන් පෙන්නුම් කරමින්, 2026 වසරේ පළමු භාගය තුළ දී ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශය සැලකිය යුතු පිරිවැටුම් වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් මෝටර් රථවාහන, විදුලිබල හා බලශක්ති සහ නිෂ්පාදන යන ක්ෂේත්‍ර දායක වූ අතර අදාළ ක්ෂේත්‍රයන්ට විශේෂිත වූ හිතකර වර්ධනයන් සහ වැඩිදියුණු වූ ව්‍යාපාරික තත්ත්වයන් මෙම වර්ධනය තුළින් පිළිබිඹු විය. පිරිවැටුම් වර්ධනය වුව ද, 2026 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සමස්ත ශුද්ධ ලාභය පසුගිය වසරට සාපේක්ෂව පහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, මධ්‍යස්ථ ශුද්ධ ලාභය සහ බොහෝ සමාගම්වල ලාභ ඉහළ යෑමෙන් පෙන්නුම් කෙරෙන පරිදි, ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල මූලික ලාභදායීත්ව තත්ත්වයන් හි වර්ධනයක් දක්නට ලැබුණි. සමස්ත ලාභදායීත්වයේ සිදු වූ පහත වැටීමට මූලික වශයෙන් ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශයේ සමාගම් කිහිපයක් පමණක් දායක විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රධාන ලාභදායීත්ව දර්ශකවල පහත වැටීමක් සිදු වූ අතර, මෙම කාලසීමාව තුළ දී සමස්ත පොලී ආවරණ අනුපාතය පහළ යෑමත් සමඟ ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල සමස්ත ණයසේවාකරණ හැකියාව ද අඩු විය. කෙසේ වුව ද, ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශය සිය පොලී වගකීම් පියවීම සඳහා ප්‍රමාණවත් ලාභයක් උපයා ගැනීමට සමත් වූ බව පෙන්නුම් කරමින් සමස්ත පොලී ආවරණ අනුපාතය එකට වඩා ඉහළ මට්ටමක පැවතුණි. සමස්තයක් වශයෙන් මිශ්‍ර ලාභදායීත්ව ප්‍රවණතා පැවතිය ද ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශය ශක්තිමත්ව පැවතුණු අතර, සමාගම් බොහෝ ප්‍රමාණයක් මූල්‍ය ආයතන වෙත ඇති සමස්ත ණය අවදානම් සීමා කරමින් හිතකර ණයසේවාකරණ තත්ත්වයන් පවත්වාගෙන ගියේය.

---

1 මෙම පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර ඇති දත්ත, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙන් (CRIB) සහ කොළඹ කොටස් හුවමාරුවෙන් (CSE) ලබාගත් තොරතුරු මත පදනම් වේ. එබැවින්, මෙම පරිච්ඡේදය මගින් වාර්තා කර ඇති දත්ත, මූල්‍ය ආයතන විසින් මහ බැංකුව වෙත මූල්‍ය තොරතුරු වාර්තා කරනු ලබන "මූල්‍ය තොරතුරු ජාල වාර්තාකරණ පද්ධතියේ" (FinNet) දත්ත මත පදනම් වූ 3 වන පරිච්ඡේදය සමඟ සෘජුවම සැසඳිය නොහැක.

2 මෙම විශ්ලේෂණයේ ඉදිරිපත් කර ඇති කුටුම්බ අංශයේ ණය, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙන් ලබාගත් සමස්ත ණය මත පදනම් වන අතර ඊට ජාතික හැඳුනුම්පත් අංකය හෝ ගුවන් ගමන් බලපත්‍ර අංකය හරහා හඳුනාගත් පුද්ගලයින් විසින් ලබාගත් ණය සහ අත්තිකාරම් ඇතුළත් වේ. එමෙන්ම ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඇතුළුව කුටුම්බයන්ට අයත් නෛතිකව ස්ථාපිත නොකළ ව්‍යවසායන් හරහා පුද්ගලයින් විසින් ව්‍යාපාරික කටයුතු සඳහා ලබාගන්නා ලද ණය ද මෙයට ඇතුළත් විය හැකිය.

3 ආයතනික අංශයේ ණය සඳහා, ව්‍යාපාරික ආයතන ලෙස ලියාපදිංචි වී ඇති ආයතන විසින් ලබා ගන්නා ලද ණය සහ අත්තිකාරම් මෙන්ම රජය සතු ව්‍යවසායන් සහ රජය වෙත ලබා දෙන ලද මූල්‍ය පහසුකම් ද ඇතුළත් වේ.

4 වටිනාකම මත ණය අනුපාතය පිළිබඳ වැඩිදුර තොරතුරු 5 වන පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇත.

4.1. කුටුම්බ සහ ආයතනික අංශවල අවදානම් ඇගයීම

මෙම උප පරිච්ඡේදය මගින්, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙන් ලබාගත් සමස්ත ණය තොරතුරු[5] මත පදනම්ව, කුටුම්බ සහ ආයතනික අංශවල ඇති විය හැකි මූල්‍ය අවදානම් ඇගයීමට ලක් කරයි.

කුටුම්බ අංශයේ ණය පිළිබඳ අවදානම් ඇගයීම

2026 වසරේ පළමු භාගයේ දී කුටුම්බ අංශය වෙත ලබාදුන් ණය ප්‍රමාණයෙහි කැපී පෙනෙන වර්ධනයක් වාර්තා වුව ද, 2026 වසරේ දෙවන කාර්තුවේ දී එම වර්ධන වේගය සුළු වශයෙන් මන්දගාමී විය. විධිමත් මූල්‍ය අංශයේ සමස්ත ණය ලබාදීම්වලින්[6] 41.8%ක් වූ කුටුම්බ අංශයේ ණය, 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 25.4%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, එය 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී වාර්තා වූ 14.8%ක වර්ධනයට වඩා සැලකිය යුතු ඉහළ අගයකි. පසුගිය වසර දෙකක කාලය තුළ කුටුම්බ අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය අඛණ්ඩව ඉහළ ගිය ද, 2026 වසරේ පළමු කාර්තුව අවසානයේ දී පැවති 28.0%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී 25.4%ක් දක්වා පහත වැටුණි. කෙසේ වෙතත්, කුටුම්බ අංශයේ සමස්ත ණය ප්‍රසාරණය අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතුණු අතර ඒ සඳහා බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන[7] යන දෙඅංශයම දායක විය. ඒ අතුරින්, බැංකු අංශය, කුටුම්බ අංශය වෙත ණය ලබා දීමේ ප්‍රධානම මූලාශ්‍රය වූ අතර 2026 වසරේ දෙවන කාර්තුව අවසන් වන විට බැංකු අංශය විසින් කුටුම්බ අංශය වෙත ලබා දී ඇති ණය සිය සමස්ත ණය කළඹෙන් 62.5%ක් විය. කුටුම්බ අංශය වෙත ණය ලබාදීම කෙරෙහි බැංකු නොවන මූල්‍ය ආයතන දක්වන නැඹුරුව පෙන්නුම් කරමින් පසුගිය වසරට සාපේක්ෂව බැංකු නොවන මූල්‍ය ආයතන මගින් මෙම අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය ද වර්ධනය විය. ඉදිරියේ දී, දැඩි මුදල් තත්ත්වයන් සහ මෝටර් රථ මූල්‍යකරණය හා රන් ඇපකර මගින් සුරක්ෂිත කරන ලද ණය[8] සම්බන්ධයෙන් වන වටිනාකම මත ණය අනුපාත ක්‍රියාත්මක කිරීම වැනි සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති තුළින් කුටුම්බ අංශයේ ණය ප්‍රසාරණය ක්‍රමයෙන් මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුව ද, ගෙවුණු කාර්තු හතර තුළ එක් එක් කාර්තුවේ දී අඛණ්ඩව 20% ඉක්මවූ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කිරීමත් සමඟ ණය ප්‍රමාණයෙහි ඉහළ ප්‍රසාරණයක් පෙන්නුම් කිරීම හේතුවෙන් කුටුම්බ අංශයේ ණයබර සහ ණයසේවාකරණ හැකියාව වඩාත් සමීපව අධීක්ෂණය කිරීම මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීමෙහිලා වැදගත් වේ.

කුටුම්බ අංශය වාර්තා කළ අඛණ්ඩ ණය ප්‍රසාරණයත් සමඟ එම අංශයේ ණයබර ඉහළ ගිය ද එය එහි දිගුකාලීන සාමාන්‍යයට[9] වඩා අඩු මට්ටමක පැවතුණි. කුටුම්බ අංශයේ

5 දත්ත සංසන්දනය කිරීමේ අරමුණින්, උකස් ණය (හෝ රන් ඇපකර මගින් සුරක්ෂිත කර ඇති ණය) සහ බැංකු ඇපකර හා ණයවර ලිපි ඇතුළු ශේෂ පත්‍රයට බැහැර අයිතමයන් මෙම විශ්ලේෂණයට ඇතුළත් කර නොමැත. කෙසේ වුව ද, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ දත්තවලට කල්බදු (ලීසිං) ණය කළඹට අදාළව උපයා නොගත් පොලී ඇතුළත් වන අතර තනි පුද්ගල පාරිභෝගිකයින්ගේ කපා හරින ලද ණය ද ඇතුළත් විය හැකිය.


6 විධිමත් මූල්‍ය අංශයේ ණය ලබාදීම් අතරට බලපත්‍රලාභී බැංකු, මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු (ලීසිං) ආයතන විසින් ලබාදෙන ණය ඇතුළත් වේ.

7 බැංකු නොවන මූල්‍ය ආයතන අතරට මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු (ලීසිං) සමාගමක් ඇතුළත් වේ. මෙම විශේෂිත කල්බදු (ලීසිං) සමාගමෙහි ලියාපදිංචිය 2026 වසරේ ජූනි මාසයේ දී අවලංගු කරන ලදී.

8 රන් ඇපකර මගින් සුරක්ෂිත කරන ලද ණය සම්බන්ධ වටිනාකම මත ණය අනුපාත අවශ්‍යතා දැඩි කිරීම කුටුම්බ ණය වර්ධනය මන්දගාමී කිරීම සඳහා දායක වනු ඇතැයි අපේක්ෂා කළ ද, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය තවමත් උකස් කිරීම් පිළිබඳ දත්ත සිය දත්ත සමුදායට ඇතුළත් කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටීම සහ සියලුම මූල්‍ය ආයතන විසින් එම දත්ත මෙතෙක් පූර්ණ වශයෙන් වාර්තා නොකිරීම හේතුවෙන් වත්මන් විශ්ලේෂණය මගින් රන් ඇපකර මගින් සුරක්ෂිත කරන ලද ණය ආවරණය නොකෙරේ.


9 දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කුටුම්බ අංශය වෙත ලබාදුන් ණය ප්‍රමාණයෙහි දිගුකාලීන සාමාන්‍යය ලෙස 2021 වසරේ පළමු කාර්තුවේ සිට මේ දක්වා අගයන්ගේ සාමාන්‍යය භාවිත කෙරේ.

රූප සටහන 4.1 කුටුම්බ අංශයේ ණය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

රූප සටහන 4.2 කුටුම්බ අංශයේ ණය සංයුතිය (%)




මූලාශ්‍රය: ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

රූප සටහන 4.3 **කුටුම්බ අංශයේ ණය (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)**



මූලයන්: ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රූප සටහන 4.5 **කුටුම්බ අංශයේ ණය ගුණාත්මකභාවය**



මූලය: ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

ණයබර පිළිබඳ දර්ශකයක් වන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කුටුම්බ අංශයේ ණය අනුපාතය[10], 2024 වසර මැද භාගයේ සිට අඛණ්ඩව වර්ධනය විය.


පළාත් මට්ටමින් සැලකූ විට කුටුම්බ අංශයේ ණය වැඩි වශයෙන් බස්නාහිර පළාත තුළ ව්‍යාප්තව පැවතුණි. කුටුම්බ අංශයේ සමස්ත ණය ප්‍රමාණයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් බස්නාහිර පළාත සතු වූ අතර, සියලුම පළාත් අතරින් ඉහළම ඒක පුද්ගල කුටුම්බ ණය ප්‍රමාණය වාර්තා කිරීමට ද බස්නාහිර පළාත සමත් විය. ඉතිරි ණය ප්‍රමාණය අනෙකුත් පළාත් අතර බෙදී ගිය අතර, උතුරු පළාත ඉන් අවම ප්‍රතිශතය වාර්තා කළේය. මෙම ප්‍රවණතාව අඛණ්ඩව පැවතීම තුළින් අනෙකුත් පළාත්වල මූල්‍ය අන්තර්ගතභාවය සහ කුටුම්බ ආදායම් මට්ටම කෙරෙහි බලපෑම් ඇති විය හැකිය.

කුටුම්බ අංශය වෙත ලබාදුන් ණය අඛණ්ඩව ප්‍රසාරණය වීම මධ්‍යයේ, 2026 වසරේ පළමු භාගයේ දී එම අංශයේ නියමිත පරිදි ණය ආපසු ගෙවීම් තවදුරටත් වැඩිදියුණු විය. කුටුම්බ අංශයේ සමස්ත ණය ප්‍රමාණයෙන් බහුතරයක් හිඟ ගෙවීම් නොමැති ණය කාණ්ඩයට අයත් වූ අතර, එහි ප්‍රතිශතය පසුගිය වසරේ පැවති 65.0%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව වන විට 67.7%ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන යන දෙඅංශයෙහිම ණය ආපසු ගෙවීමේ පවතින යහපත් කාර්යසාධනය පෙන්නුම් කරමින්, හිඟ ගෙවීම් සහිත ණය ප්‍රතිශතය පහත වැටුණි. කෙසේ වෙතත්, කුටුම්බ අංශයේ ණය අඛණ්ඩව ප්‍රසාරණය වීම, සමස්ත ණයගැනුම්කරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව කෙරෙහි මේ වන තෙක් අහිතකර ලෙස බලපා නොමැති බව ඔවුන්ගේ ණය ආපසු ගෙවීමේ ප්‍රවණතා තුළින් මනාව පිළිබිඹු වේ.

බරිත සාමාන්‍ය ක්‍රිබ් අගය[11] (CRIB score) **මගින් මනිනු ලබන කුටුම්බ අංශයේ ණයගැනුම්කරුවන්ගේ ණය විශ්වාසනීයත්වය** (creditworthiness) **2026 වසරේ පළමු**

10 කුටුම්බ අංශය වෙත ලබා දී ඇති ණය ප්‍රමාණය, අඛණ්ඩව පසුගිය කාර්තු හතරක නාමික දළ දේශීය නිෂ්පාදිතයේ එකතුවෙන් බෙදීම මගින් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කුටුම්බ අංශයේ ණය ගණනය කෙරේ.


රූප සටහන 4.4 **කුටුම්හ අංශයේ ණය - පළාත් අනුව ව්‍යාප්තිය (2026 ජූනි අවසන් වන විට,%)**



මූලය: ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය


11 ක්‍රිබ් අගය යනු ණය ඉතිහාසය වැනි පරාමිතීන් මත පදනම්ව ණයගැනුම්කරුවන් ඇගයීම සඳහා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් ගණනය කරනු ලබන ශ්‍රේණිගත කිරීමකි. මෙම අගය 250 සිට 900 දක්වා පරාසයක පවතී. 250-500 දක්වා ණය ලකුණු පරාසයක පවතින ණයගැනුම්කරුවන් ඉතා ඉහළ අවදානම් කාණ්ඩය ලෙසත්, 500-550 දක්වා ඉහළ අවදානම් කාණ්ඩය ලෙසත්, 550-580 දක්වා මධ්‍යස්ථ අවදානම් කාණ්ඩය ලෙසත්, 580-610 දක්වා අඩු අවදානම් කාණ්ඩය ලෙසත්, 610-900 දක්වා ඉතා අඩු අවදානම් කාණ්ඩය ලෙසත් සලකනු ලැබේ. මහ බැංකුව විසින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙන් ලැබෙන එක් එක් අවදානම් කාණ්ඩයේ ණයගැනුම්කරුවන් සංඛ්‍යාව සහ එක් එක් අවදානම් කාණ්ඩයේ සාමාන්‍යය ක්‍රිබ් අගය මත පදනම්ව සාමාන්‍ය බරිත ක්‍රිබ් අගය ගණනය කරනු ලැබේ.

රූප සටහන 4.6 **කුටුම්බ අංශයේ ණයගැනුම්කරුවන්ගේ සාමාන්‍ය ක්‍රිබ් අගය**



මූලයන්: ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගණනය කිරීම්

රූප සටහන 4.7 **සමස්ත බරිත සාමාන්‍ය ක්‍රිබ් අගය**




මූලයන්: ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගණනය කිරීම්

භාගයේ දී තවදුරටත් වර්ධනය වුව ද සමස්ත ණය අවදානම ඉහළ අවදානම් කාණ්ඩයේම පැවතුණි. බරිත සාමාන්‍ය ක්‍රිබ් අගය, පසුගිය වසරේ අනුරූප කාර්තුවේ වාර්තා වූ 511.6ක සිට 2026 වසරේ දෙවන කාර්තුවේ දී 538.2ක් දක්වා ඉහළ ගිය අතර මෙමගින් ක්‍රමයෙන් වැඩිදියුණු වන කුටුම්බ අංශයේ ණයගැනුම්කරුවන්ගේ ණය විශ්වාසනීයත්වය නිරූපණය විය. බැංකු අංශයේ ණයගැනුම්කරුවන් සාපේක්ෂ වශයෙන් ඉහළ ණය විශ්වාසනීයත්වයක් පෙන්නුම් කළ අතර, 2026 වසරේ දෙවන කාර්තුව අවසානයේ දී සාමාන්‍ය ක්‍රිබ් අගය 557.2 දක්වා ඉහළ යෑමත් සමඟ බැංකු අංශය සාමාන්‍ය අවදානම් කාණ්ඩය තුළ ස්ථානගත විය. කෙසේ වෙතත්, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ණයගැනුම්කරුවන්ගේ ක්‍රිබ් අගය මෑත කාර්තු කිහිපය තුළම අඛණ්ඩ වර්ධනයක් වාර්තා කළ ද තවදුරටත් ඉතා ඉහළ අවදානම් කාණ්ඩයේ රැඳෙමින් 497.4ක පහළ සාමාන්‍ය අගයක් වාර්තා කළේය. තවද, එක් එක් කාණ්ඩවල සාමාන්‍ය ක්‍රිබ් අගය ද සමස්තයක් ලෙස ඉහළ ගිය අතර, කුටුම්බ අංශයේ ණයගැනුම්කරුවන්ගේ ණය විශ්වාසනීයත්වය පුළුල් වශයෙන් වර්ධනය වී ඇති බව එමගින් පෙන්නුම් කෙරිණි. 2025 වසරේ දෙවන කාර්තුව සහ 2026 වසරේ දෙවන කාර්තුව අතර කාලය තුළ මධ්‍යස්ථ අවදානම් කාණ්ඩය හැර අනෙක් සියලුම අවදානම් කාණ්ඩවල බරිත සාමාන්‍ය ක්‍රිබ් අගයන් ඉහළ ගිය අතර, සමස්තයක් ලෙස, මෙම ප්‍රවණතා මගින් විවිධ අවදානම් මට්ටම්වල ණයගැනුම්කරුවන්ගේ ණය විශ්වාසනීයත්වයේ යම් වර්ධනයක් සිදු වී ඇති බව ද පෙන්නුම් කෙරිණි.

ණය අවදානම් කාණ්ඩ අනුව කුටුම්බ අංශයේ ණයගැනුම්කරුවන්ගේ ව්‍යාප්තිය සැලකූ විට බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන යන අංශ අතර පැහැදිලි වෙනස්කම් දක්නට ලැබුණි. බැංකු අංශය තුළ, කුටුම්බ අංශයේ ණයගැනුම්කරුවන්ගෙන් බහුතරයක් ඔවුන්ගේ


රූප සටහන 4.8 **2025 දෙවන කාර්තුව හා 2026 දෙවන කාර්තුව අතර ක්‍රිබ් අගයන්ගේ විචලනය**



ඉහළ ක්‍රිබ් අගයන් මගින් අඩු ණය අවදානමක් නිරූපණය කෙරේ.


මූලයන්: ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගණනය කිරීම්

රූප සටහන 4.9 **කුටුම්බ ණයගැනුම්කරුවන්ගේ ණය අවදානම් ව්‍යාප්තිය (2026 ජූනි අවසන් වන විට)**



මූලය: ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

රූප සටහන 4.10 **ආයතනික අංශයේ ණය**



මූලය: ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

ක්‍රිඩ් අගය මත පදනම්ව අඩු සහ ඉතා අඩු අවදානම් කාණ්ඩවලට අයත් වූ අතර, එමගින් ඔවුන්ගේ අඩු ණය අවදානම් තත්ත්වයන් පෙන්නුම් කෙරිණි. කෙසේ වෙතත්, බැංකු අංශයේ ණයගැනුම්කරුවන්ගෙන් 24.1%ක් ඉහළ සහ ඉතා ඉහළ අවදානම් යන කාණ්ඩවලට අයත් වීම මගින් සාපේක්ෂව දුර්වල ණය ශ්‍රේණිගත කිරීම් සහිත සැලකිය යුතු පිරිසක් බැංකු අංශය තුළ ද සිටින බව ඉස්මතු වේ. මේ අතර, බැංකු නොවන මූල්‍ය ආයතන අංශය සාපේක්ෂව ඉහළ අවදානම් සහිත ණයගැනුම්කරුවන්ගෙන් සමන්විත විය. එම අංශයේ ණයගැනුම්කරුවන්ගෙන් 52.4%ක් ඉහළ සහ ඉතා ඉහළ අවදානම් කාණ්ඩ නියෝජනය කළ අතර, 31.6%ක් පමණක් අඩු සහ ඉතා අඩු අවදානම් කාණ්ඩවලට අයත් විය. සමස්තයක් ලෙස, අවදානම් කාණ්ඩ අනුව කුටුම්බ අංශයේ ණයගැනුම්කරුවන්ගේ ව්‍යාප්තිය බොහෝ දුරට ස්ථායීව පැවතුණි. කෙසේ වුව ද, බැංකු අංශයට සාපේක්ෂව, බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ඉහළ අවදානම් සහිත ණයගැනුම්කරුවන් විශාල පිරිසකගෙන් සමන්විත වීම මූල්‍ය පද්ධති ස්ථායීතාව සම්බන්ධයෙන් සැලකීමේ දී අඛණ්ඩව අවධානය යොමු කළ යුතු කරුණකි.


ආයතනික අංශයේ ණය පිළිබඳ අවදානම් ඇගයීම

2026 වසරේ පළමු භාගයේ දී ආයතනික අංශය වෙත ලබා දුන් ණය සැලකිය යුතු මට්ටමින් අඛණ්ඩව ප්‍රසාරණය විය. සමස්ත මූල්‍ය අංශයේ ණය සැපයුමෙන් 58.2%ක් වූ ආයතනික අංශයේ ණය, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ 16.3%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයට සාපේක්ෂව, 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට 24.9%කින් වර්ධනය විය. 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට ආයතනික අංශයේ පවතින සමස්ත ණය ප්‍රමාණයෙන් 96.2%ක් බැංකු අංශය විසින් ලබා දී ඇති අතර, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ දායකත්වය ඉතා සුළු මට්ටමක පැවතුණි.

ණය ලබාදීම් අඛණ්ඩව ප්‍රසාරණය වුව ද, 2026 වසරේ පළමු භාගය තුළ ආයතනික අංශයේ ණය ආපසු ගෙවීම් තත්ත්වයන් යහපත් මට්ටමක පැවතුණි. හිඟ ගෙවීම් නොමැති ණය සමස්ත ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස, පසුගිය වසරේ පැවති 75.2%ක අගයේ සිට 2026 වසරේ දෙවන කාර්තුව වන විට 79.2%ක් දක්වා වර්ධනය වූ අතර, එම කාලය තුළ හිඟ ගෙවීම් සහිත ණය ප්‍රමාණය පහත වැටුණි. ආයතනික අංශයේ ණයවල අඛණ්ඩ ප්‍රසාරණය, ණයගැනුම්කරුවන්ගේ ණය ගුණාත්මකභාවය පහළ යෑම කෙරෙහි සමස්තයක් ලෙස බලපා නොමැති බව මෙම වර්ධනයන් මගින් පෙන්නුම් කරයි.


බැංකු අංශයේ ණයගැනුම්කරුවන්ගේ ණය අවදානම් ව්‍යාප්තිය බැංකු නොවන මූල්‍ය ආයතන අංශයට වඩා හිතකර මට්ටමක පැවතුණි. බැංකු අංශයේ ආයතනික ණයගැනුම්කරුවන් ප්‍රධාන වශයෙන්ම අඩු සහ ඉතා අඩු අවදානම් කාණ්ඩවලට අයත් වූ අතර, 21.6%ක් ඉහළ සහ ඉතා

රූප සටහන 4.11 **ආයතනික අංශයේ ණය සංයුතිය (%)**



මූලය: ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

රූප සටහන 4.12 ආයතනික අංශයේ ණය ගුණාත්මකභාවය



මූලයඃ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

ඉහළ අවදානම් කාණ්ඩවලට අයත් විය. එසේ වුව ද, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ණයගැනුම්කරුවන්ගෙන් 53.9%ක් ඉහළ සහ ඉතා ඉහළ අවදානම් කාණ්ඩවලට අයත් වූ අතර, අඩු සහ ඉතා අඩු අවදානම් කාණ්ඩවලට අයත් වූයේ 32.3%ක් පමණි. සමස්තයක් ලෙස, ආයතනික අංශයේ ණයගැනුම්කරුවන්ගෙන් 67.6%ක් අඩු සහ ඉතා අඩු අවදානම් කාණ්ඩ යටතේ පැවතීමෙන් ණයගැනුම්කරුවන්ගේ අවදානම් තත්ත්වය ස්ථාවර මට්ටමක පැවති බව පෙන්නුම් කරයි.

4.2. ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල අවදානම් ඇගයීම


මෙම උප පරිච්ඡේදය මගින්, මූල්‍ය නොවන සමාගම් අංශයේ ඇති විය හැකි අවදානම් සහ එමගින් මූල්‍ය ස්ථායීතාව කෙරෙහි ඇති විය හැකි බලපෑම ඇගයීමට ලක් කෙරේ. 2026 වසරේ ජූනි මස අග වන විට කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත සමාගම් 204ක මූල්‍ය කාර්යසාධනය මෙම ඇගයීමට පදනම් වේ. මූල්‍ය නොවන සමාගම් අංශය නියෝජනය කිරීම සඳහා ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් භාවිත කරනු ලබන අතර, එමගින් එම අංශයේ මතු වෙමින් පවතින අවදානම් සහ දුර්වලතා පිළිබඳව ද, ඒවා මූල්‍ය පද්ධතියට සම්ප්‍රේෂණය විය හැකි ආකාරය පිළිබඳව ද අවබෝධයක් ලබා දේ.

2026 වසරේ පළමු භාගය තුළ ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල මූල්‍ය කාර්යසාධනය

හිතකර ව්‍යාපාර තත්ත්වයන් පෙන්නුම් කරමින්, ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශය 2026 වසරේ පළමු භාගයේ පිරිවැටුම කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. පසුගිය වසරේ පළමු භාගයේ වාර්තා වූ 7.6%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයට සාපේක්ෂව, ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල පිරිවැටුම 2026 වසරේ පළමු භාගයේ දී 22.0%කින් වර්ධනය විය. තවද, හිතකර ව්‍යාපාර තත්ත්වයන් මධ්‍යයේ සමස්තයක් ලෙස පිරිවැටුම් වර්ධනය වූ බව පිළිබිඹු කරමින් පසුගිය වසරේ දී පිරිවැටුමෙහි වර්ධනයක් වාර්තා කළ 59.8%ක මූල්‍ය නොවන සමාගම් ප්‍රමාණය, 2026 වසරේ පළමු භාගය වන විට 67.2% දක්වා ඉහළ ගියේය.


2026 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ මෙම පිරිවැටුම් වර්ධනයට මෝටර් රථවාහන, විදුලිබල හා බලශක්ති, සහ නිෂ්පාදන යන අංශ ප්‍රධාන වශයෙන් දායක විය. ආනයන සීමා ලිහිල් කිරීමෙන් අනතුරුව මෝටර් රථවාහන ආශ්‍රිත ව්‍යාපාර තත්ත්වයන්වල සිදු වූ වර්ධනය හේතුවෙන්, මෝටර් රථවාහන අංශය සමස්ත පිරිවැටුම් වර්ධනයට විශාලතම දායකත්වය ලබා දුන් අතර, 138.9%ක ඉහළම වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් ද වාර්තා කළේය. අයහපත් භූ දේශපාලනික තත්ත්වයන් මධ්‍යයේ බලශක්ති

රූප සටහන 4.13 ආයතනික ණයගැනුම්කරුවන්ගේ ණය අවදානම් ව්‍යාප්තිය (2026 ජූනි අවසන් වන විට)




මූලයඃ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

රූප සටහන 4.14 මූල්‍ය නොවන සමාගම්වල පිරිවැටුම සහ පිරිවැටුමෙහි වර්ධනය




මූලයඃ කොළඹ කොටස් හුවමාරුව

රූප සටහන 4.15 **පිරිවැටුමෙහි වර්ධනයක් වාර්තා කළ මූල්‍ය නොවන සමාගම් ප්‍රතිශතය**



මූලයා: කොළඹ කොටස් හුවමාරුව

රූප සටහන 4.17 **මූල්‍ය නොවන සමාගම්වල ශුද්ධ ලාභය හා ශුද්ධ ලාභයෙහි වර්ධනය**



මූලයා: කොළඹ කොටස් හුවමාරුව


මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, විදුලිබල හා බලශක්ති අංශය ද පිරිවැටුම් වර්ධනය සඳහා සැලකිය යුතු ලෙස දායක විය. මේ අතර, සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ, ඉදිකිරීම් හා ඉංජිනේරු අංශය හැර අනෙක් සියලුම අංශ, සමස්ත පිරිවැටුම් වර්ධනයට ධනාත්මක ලෙස දායක වෙමින් ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශයේ වාර්තා වූ කැපී පෙනෙන පිරිවැටුම් වර්ධනයට සහාය විය.

2026 වසරේ පළමු භාගය තුළ සමස්ත ලාභදායීත්වයෙහි පහළ යෑමක් වාර්තා වුව ද, ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල කාර්යසාධනයෙහි හිතකර තත්ත්වයන් පෙන්නුම් කරමින්, මධ්‍යස්ථ ශුද්ධ ලාභය වර්ධනය විය. 2025 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ 65.2%ක[12] වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ සමස්ත ශුද්ධ ලාභය 6.1%කින් පහත වැටුණි. ශුද්ධ ලාභයේ වාර්ෂික වර්ධනයක් වාර්තා කළ මූල්‍ය නොවන සමාගම් ප්‍රමාණය පෙර වසරේ පැවති 56.4% සිට 55.9% දක්වා මෙම වසරේ දී සුළු වශයෙන් පහත වැටුණ ද මූල්‍ය නොවන සමාගම් බහුතරයක් වාර්ෂික ශුද්ධ ලාභ වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, සමස්ත ශුද්ධ ලාභයේ පහළ යෑම තුළින්, මූල්‍ය නොවන සමාගම් බහුතරයක් විසින් ලබාගත් ලාභ වර්ධනයන්ට සාපේක්ෂව ප්‍රධාන පෙළේ සමාගම් කිහිපයක් විසින් වාර්තා කරන ලද සෘණාත්මක වර්ධනයන් ප්‍රබල වූ බව පෙන්නුම් කෙරේ.

ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශයේ මෙහෙයුම් ලාභදායීත්වය 2026 වසරේ පළමු භාගයේ දී සුළු වශයෙන් පහත වැටුණි. පසුගිය වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ 33.4%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයට සාපේක්ෂව,


12 2025 වසරේ පළමු භාගයේ දී ශුද්ධ ලාභයේ දක්නට ලැබුණු කැපී පෙනෙන වර්ධනයට, විවිධාංගීකරණය වූ සමාගම් (Diversified Holdings) අංශයේ එක් සමාගමක් විසින් එම කාලසීමාවේදී එක් වරක් පමණක් ඉපැයූ අසාමාන්‍ය ලාභය හේතු විය.

රූප සටහන 4.16 **පිරිවැටුම් වර්ධනයට විවිධ ක්ෂේත්‍රයන් හි දායකත්වය**




මූලයා: කොළඹ කොටස් හුවමාරුව

රූප සටහන 4.18 **ශුද්ධ ලාභයේ වර්ධනයක් වාර්තා කළ මූල්‍ය නොවන සමාගම් ප්‍රතිශතය**




මූලයා: කොළඹ කොටස් හුවමාරුව

රූප සටහන 4.19 **මූල්‍ය නොවන සමාගම්වල පොලී, බදු, ක්ෂයවීම් හා ක්‍රමක්ෂයට පෙර ඉපැයීම් සහ එහි වර්ධනය**



මූලය: කොළඹ කොටස් හුවමාරුව

රූප සටහන 4.20 **ශුද්ධ ලාභයේ විචලනයන් සඳහා බලපෑ සාධක**



මූලය: කොළඹ කොටස් හුවමාරුව

2026 වසරේ අනුරූප කාලසීමාව තුළ පොලී, බදු, ක්ෂයවීම් හා ක්‍රමක්ෂයට පෙර ඉපැයීම් (EBITDA) 0.4%කින් සුළු වශයෙන් පහත වැටුණි. මෙම සුළු පහළ යෑම මධ්‍යයේ වුව ද, ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල සමස්ත මෙහෙයුම් ලාභදායීත්වයේ පහත වැටීම සැලකිය යුතු මට්ටමින් සිදු නොවූ බව පෙන්නුම් කරමින්, 2026 වසරේ පළමු භාගයේ දී මධ්‍යස්ථ පොලී, බදු, ක්ෂයවීම් හා ක්‍රමක්ෂයට පෙර ඉපැයීම් වල වර්ධනය ධන අගයක පැවතුණි. මෙහෙයුම් ලාභදායීත්වයේ මන්දගාමී වීම මූල්‍ය නොවන සමාගම් තුළින් විශාල වශයෙන් දක්නට නොලැබුණ ද, ඇතැම් දුර්වල සමාගම්වල ඉපැයීම් සඳහා ඇති පීඩනය මගින් ඔවුන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව දුර්වල විය හැකි අතර, එය මූල්‍ය අංශයේ ණය අවදානම ඉහළ යෑමට දායක විය හැකිය.


2026 වසරේ පළමු භාගයේ දී ශුද්ධ ලාභයේ සිදු වූ පහත වැටීමට ඉහළ විකුණුම් පිරිවැය සහ මෙහෙයුම් වියදම් ප්‍රධාන වශයෙන් දායක විය. පිරිවැටුම් වර්ධනය ලාභදායීත්වය කෙරෙහි රුපියල් බිලියන 199.0ක ධනාත්මක බලපෑමක් ඇති කළ ද, විකුණුම් පිරිවැයෙහි සිදුවූ රුපියල් බිලියන 152.3ක වැඩිවීම තුළින් එම බලපෑම බොහෝ දුරට අවම විය. ඉහළ බෙදාහැරීම්, පරිපාලන සහ වෙනත් මෙහෙයුම් පිරිවැය සාමූහික ලෙස ශුද්ධ ලාභය රුපියල් බිලියන 52.3කින් අඩු වීමට දායක විය. මේ අතර, ඉහළ මෙහෙයුම් වියදම්, මූල්‍ය පිරිවැය සහ බදු හේතුවෙන් ඇති වූ අහිතකර බලපෑම් අවම කිරීමට මූල්‍ය ආදායමෙන් සහ වෙනත් ආදායම්වලින් ලැබුණු ධනාත්මක දායකත්වයන් ප්‍රමාණවත් නොවීය. ඒ අනුව, සමස්ත ශුද්ධ ලාභය 2025 වසරේ පළමු භාගයේ පැවති රුපියල් බිලියන 145.7 සිට 2026 වසරේ පළමු භාගයේ දී රුපියල් බිලියන 136.8 දක්වා පහත වැටුණි.

සමස්ත ලාභදායීත්ව දර්ශක තරමක් දුර්වල වීමත් සමඟ 2026 වසරේ පළමු භාගය තුළ ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අතර විෂම ලාභදායීත්වයක් පැවතුණි. මෙම කාලසීමාවේ දී, ශුද්ධ ලාභ ආන්තිකය සහ හිමිකම් මත ප්‍රතිලාභය කැපී පෙනෙන ලෙස පහත වැටුණු අතර, දළ ලාභ ආන්තිකය සහ වත්කම් මත ප්‍රතිලාභය ද යම් මට්ටමකින් පහළ ගියේය. මේ අතර, වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ යෑම මධ්‍යයේ, ණය සාමාන්‍යයෙහි ප්‍රතිශතයක් ලෙස මූල්‍ය පිරිවැයෙහි සමස්ත අගය මෙන්ම මධ්‍යස්ථ අගය ද සුළු වශයෙන් ඉහළ ගියේය. ලාභදායීත්වය අඩුවීමත් සමඟ මූල්‍ය පිරිවැය ඉහළ යෑම තුළින් මූල්‍යමය වශයෙන් දුර්වල ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල ණයසේවාකරණ හැකියාව තවදුරටත් සීමා විය හැකිය.

මූල්‍ය නොවන සමාගම් අංශයේ ණය විශ්වාසනීයත්වය


සමස්ත ලාභදායීත්වය මන්දගාමී වීමත් සමඟ, ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල ණයසේවාකරණ හැකියාව ද මන්දගාමී වූ අතර තෝලන තත්ත්වයන් (leverage

රූප සටහන 4.21 **ලාභදායීත්ව දර්ශක**



මූලය: කොළඹ කොටස් හුවමාරුව

රූප සටහන 4.22 ණය සාමාන්‍යයෙහි ප්‍රතිශතයක් ලෙස මූල්‍ය පිරිවැය



මූලයන්: කොළඹ කොටස් හුවමාරුව, ශ්‍රී ලංකා මහ බැංකුව


රූප සටහන 4.24 පොලී ආවරණ අනුපාතය අනුව මූල්‍ය නොවන සමාගම්වල ව්‍යාප්තිය



මූලය: කොළඹ කොටස් හුවමාරුව

conditions) සුළු වශයෙන් වැඩිදියුණු විය. 2025 වසරේ පළමු භාගයේ 4.2ක්ව පැවති පොලී ආවරණ අනුපාතය 2026 වසරේ පළමු භාගයේ දී 3.7ක් දක්වා පහත වැටුණු අතර එමගින් ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වල මෙහෙයුම් ආදායම් මගින් සිය පොලී වගකීම් පියවීමට ඇති හැකියාවෙහි යම් අඩු වීමක් පෙන්නුම් කෙරිණි. තවද, ණය වගකීම් වලට සාපේක්ෂව ශුද්ධ ලාභය ද පහත වැටුණි. ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශය තුළ තෝරන ලද තත්ත්වයන්ගේ සුළු වැඩිදියුණු වීමක් පෙන්නුම් කරමින් ණය හිමිකම් අනුපාතය ද පහත වැටුණි. කෙසේ වෙතත්, ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් සමස්තයක් ලෙස සිය පොලී වගකීම් පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් මෙහෙයුම් ආදායම් උත්පාදනය කර ඇති බව පෙන්නුම් කරමින්, සමස්ත පොලී ආවරණ අනුපාතය අඛණ්ඩව එකට වඩා ඉහළ මට්ටමක පැවතුණි.

රූප සටහන 4.23 මූල්‍ය නොවන සමාගම්වල ප්‍රධාන මූල්‍ය කාර්යසාධන දර්ශක




මූලය: කොළඹ කොටස් හුවමාරුව

එක් එක් සමාගම් මට්ටමින් සලකා බැලීමේදී, 2026 වසරේ පළමු භාගය තුළ ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වලින් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් පොලී ආවරණ අනුපාතය එකට වඩා අඩු මට්ටමක පැවතුණි. සමස්ත පොලී ආවරණ අනුපාතය අඩු වීමත් සමඟ, 2025 වසරේ පළමු භාගයේ දී 33.8%ක්ව පැවති එකට වඩා අඩු පොලී ආවරණ අනුපාතයක් වාර්තා කළ සමාගම්වල ප්‍රතිශතය 2026 වසරේ පළමු භාගයේ දී 37.7% දක්වා ඉහළ ගියේය. ඒ අනුව, ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම්වලින් තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් සිය පොලී පිරිවැය සම්පූර්ණයෙන්ම පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් පොලී හා බදු පෙර ඉපැයීම් (EBIT) උත්පාදනය කර නොතිබුණි. පොලී ආවරණ අනුපාතයෙහි අගය එක හෝ ඊට වැඩි සමාගම්වල ප්‍රතිශතය 66.2% සිට 62.3% දක්වා පහළ ගිය ද, එවැනි සමාගම් තවදුරටත් බහුතරය නියෝජනය කළේය. මූල්‍යමය වශයෙන් දුර්වලතා සහිත ඇතැම් මූල්‍ය නොවන සමාගම් අතර පහළ ණයසේවාකරණ තත්ත්වයන් පැවතිය ද බොහෝ සමාගම් තම පොලී වගකීම් පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් පොලී හා බදු පෙර ඉපැයීම් අඛණ්ඩව ජනනය කිරීමට කටයුතු කළේය.


ව්‍යාපාරයේ ස්වභාවය අනුව වර්ගීකරණය කරන ලද එක් එක් ක්ෂේත්‍රවල පොලී ආවරණ අනුපාතයන් තුළින් මූල්‍ය නොවන සමාගම් අංශයේ ණයසේවාකරණ තත්ත්වයන්හි පවතින වෙනස්කම් තවදුරටත් ඉස්මතු විය. පොලී වගකීම්වලට සාපේක්ෂව ශක්තිමත් ඉපැයුම් පෙන්නුම් කරමින්, ආහාර, පාන හා දුම්කොළ සහ දේපළ වෙළෙඳාම් යන ක්ෂේත්‍ර ඉහළම පොලී ආවරණ අනුපාත වාර්තා කළේය. කෙසේ වෙතත්, සමස්ත පොලී සහ බදු පෙර ඉපැයීම් ප්‍රමාණය, පොලී පිරිවැය සම්පූර්ණයෙන්ම ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවන බව පෙන්නුම් කරමින්, වෙළෙඳ හා බෙදාහැරීම් ක්ෂේත්‍රය අඩුම පොලී ආවරණ අනුපාතය වාර්තා කළ අතර, එකට වඩා අඩු අනුපාතයක් වාර්තා කළ එකම අංශය ද මෙය විය. සාපේක්ෂව දුර්වල පොලී ආවරණ තත්ත්වයන් වෙනත්

රූප සටහන 4.25 **ක්ෂේත්‍ර අනුව පොලී ආවරණ අනුපාතය**



මූලයඃ කොළඹ කොටස් හුවමාරුව

රූප සටහන 4.26 **ක්ෂේත්‍ර අනුව මූල්‍ය නොවන සමාගම්වල මූල්‍ය කාර්යසාධන දර්ශක**




මූලයඃ කොළඹ කොටස් හුවමාරුව

ක්ෂේත්‍ර කිහිපයක ද දක්නට ලැබුණු අතර, එමගින් ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශයේ ඇතැම් අංශ තුළ ණයසේවාකරණය අභියෝගාත්මක බව පෙන්නුම් කරයි.

ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් අංශයේ විවිධ ක්ෂේත්‍රවල පොලී ආවරණ තත්ත්වයන් හි නිරීක්ෂණය වූ වෙනස්කම් සඳහා එම ක්ෂේත්‍රවල ලාභදායීත්ව සහ තෝලන පිළිබඳ දර්ශක බොහෝ දුරට දායක විය. ආහාර, පාන හා දුම්කොළ සහ දේපළ වෙළෙඳාම් යන අංශ විසින් ණය වගකීම්වලට සාපේක්ෂව ඉහළම ශුද්ධ ලාභය මෙන්ම, සාපේක්ෂව අඩු ණය හිමිකම් අනුපාත ද වාර්තා කළ අතර එමගින් ඔවුන්ගේ පොලී ආවරණ තත්ත්වයන් තවදුරටත් ශක්තිමත් විය. එසේ වුව ද, වෙළෙඳ සහ බෙදාහැරීම් ක්ෂේත්‍රය විසින් ණය වගකීම්වලට සාපේක්ෂව සෘණ ශුද්ධ ලාභයක් වාර්තා කළ අතර, එය එම අංශයේ පොලී ආවරණ අනුපාතය එකට වඩා අඩුවෙන් පැවතීම හා අනුකූල විය. සාපේක්ෂව ඉහළ මූල්‍ය අවදානමක් පෙන්නුම් කරමින්, ඉදිකිරීම් හා ඉංජිනේරු අංශය ණය වගකීම්වලට සාපේක්ෂව අඩු මට්ටමක ශුද්ධ ලාභයක් සමඟ ඉහළම ණය හිමිකම් අනුපාතය වාර්තා කළේය. සමස්තයක් ලෙස, අභියෝගාත්මක ණයසේවාකරණ තත්ත්වයන් සාපේක්ෂ වශයෙන් දුර්වල ක්ෂේත්‍ර කිහිපයක් තුළ පමණක් කේන්ද්‍රගතව පැවති බව මෙම දර්ශක මගින් පෙන්වා දෙයි.

5 පරිච්ඡේදය

මූල්‍ය ස්ථායීතාව සඳහා වන ප්‍රතිපත්ති



ආර්ථිකය තුළ ණය වේගයෙන් වර්ධනය වන පසුබිමක 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ නම් කරන ලද සාර්ව විවක්ෂණ අධිකාරිය ලෙස මහ බැංකුව විසින් සලකා බලන කාලය තුළ දී අනෙකුත් විවක්ෂණශීලී පියවර සමඟින් සාර්ව විවක්ෂණ මෙවලම් ද ක්‍රියාත්මක කරන ලදී. බලපත්‍රලාභී බැංකු හා මුදල් සමාගම් මඟින් ලබා දෙන මෝටර් රථ ආශ්‍රිත ණය පහසුකම් සහ රන් ඇපකර මත ලබා දෙන ණය ඉහළ යෑම මෙන්ම අදාළ ඇපකරවල වටිනාකම් ද වෙනස් වීම හේතුවෙන්, ණයගැනුම්කරුවන් පාදක කරගත් සාර්ව විවක්ෂණ ප්‍රතිපත්ති තවදුරටත් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය විය. ඒ අනුව, රන් ඇපකර මත ණය ලබා දීම වඩා විවක්ෂණශීලීව සිදු කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, මහ බැංකුව විසින් 2026 මාර්තු මාසයේ දී බලපත්‍රලාභී බැංකු හා මුදල් සමාගම් වෙත රන් ඇපකර මත ණය ලබා දීමේ අවදානම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වූ ඉදිරි මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. ඉන් අනතුරුව, මෝටර් රථ ආශ්‍රිත ණය සහ රන් ඇපකර මත ණය ලබා දීම අඛණ්ඩව වේගයෙන් වර්ධනය වීමට ප්‍රතිචාර වශයෙන්, අධික ණය ගැනීම් සීමා කිරීම, ණයගැතියන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ පද්ධතිමය අවදානම් අවම කිරීම සඳහා මහ බැංකුව තවදුරටත් සාර්ව විවක්ෂණ පියවර ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, 2026 වසරේ මැයි මාසයේ දී මහ බැංකුව විසින් රන් ඇපකර මඟින් සුරක්ෂිත කර ඇති ණය පහසුකම් සඳහා 70%ක වටිනාකම මත උපරිම ණය සීමාවක් (Loan to Value Limit) හඳුන්වා දෙන ලදී. තවද, 2025 නොවැම්බර් මාසයේ දී සහ 2026 වසරේ මැයි මාසයේ දී මහ බැංකුව විසින් මෝටර් රථවාහන ණය සඳහා වන වටිනාකම මත උපරිම ණය අනුපාතිකය අඩු කරන ලදී. මෙම සංශෝධන මඟින් විවක්ෂණශීලී ක්‍රමවේද තවදුරටත් ශක්තිමත් කිරීමට අමතරව, මෝටර් රථවාහන සඳහා වන වටිනාකම මත ණය අනුපාත රාමුව සරල කිරීම මඟින් එහි මෙහෙයුම් කාර්යක්ෂමතාව ද ඉහළ නංවන ලදී.

සාර්ව විවක්ෂණ ප්‍රතිපත්තිවලට අමතරව, මූල්‍ය පද්ධති ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව විසින් විවක්ෂණශීලී නියාමන සහ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, සාර්ව විවක්ෂණ ප්‍රතිපත්ති දැඩි කරමින්, මහ බැංකුව විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතා සඳහා අදාළ වන රන් ඇපකර මත ලබා දෙන ඇතැම් ණය පහසුකම් සඳහා මින් පෙර වූ ශූන්‍ය අවදානම් බර තැබීම ඉවත් කර, බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම් විසින් රන් ඇපකර මත ලබා දෙන ණය සඳහා වන අවදානම් මත බර තැබීම් ඉහළ නංවන ලදී. කුඩා පරිමාණයේ බැංකු ඒකාබද්ධ කිරීම හරහා වඩාත් ශක්තිමත්, ඔරොත්තු දෙන සහ තිරසර බැංකු අංශයක් ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව විසින් බැංකු අංශය ඒකාබද්ධ කිරීමේ රාමුව හඳුන්වා දෙන ලදී. තවද, මුදල් සමාගම් අංශය තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යයනය මැඩපැවැත්වීමේ අවශ්‍යතාවන්ට අනුකූල වීම ශක්තිමත් කිරීමේ අඛණ්ඩ උත්සාහයන් තවදුරටත් පුළුල් කිරීම සහ නව විධාන කිහිපයක් හඳුන්වා දීම හරහා මුදල් සමාගම් අංශය සඳහා වන නියාමන රාමුව තවදුරටත් වැඩිදියුණු කරන ලදී. තවද, බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම් අංශවල අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම, ආයතනික ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම, මෙහෙයුම් ශක්තිමත්භාවය සහ සුමට ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීම සඳහා සලකා බලනු ලබන කාලසීමාව තුළ දී විවිධ නියාමන රැසක් හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලදී.

තවද, ප්‍රතිපත්ති, අධීක්ෂණ සහ මූල්‍ය පාරිභෝගිකයින් පදනම් කරගත් මූලපිරීම් මාලාවක් හරහා මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව, කාර්යක්ෂමතාව සහ අන්තර්ගතභාවය ශක්තිමත් කිරීමට මහ බැංකුව අඛණ්ඩව කටයුතු කළේය. ඩිජිටල් ගෙවීම් ක්‍රමවල ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ වංචා ආශ්‍රිත අවදානම් පිළිබඳ මහජන දැනුම්වත්භාවය ඉහළ නැංවීම මඟින් මූල්‍ය පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා මහ බැංකුව විසින් තවදුරටත් ප්‍රතිපත්තිමය මූලපිරීම් ක්‍රියාත්මක කරන ලදී. මූල්‍ය ආයතනවල අර්බුද ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සහාය වීම පිණිස ශ්‍රී ලංකාවේ නිරාකරණ ක්‍රමවේදය ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුවේ ප්‍රයත්නයක් ලෙස බලපත්‍රලාභී මූල්‍ය ආයතන සඳහා නිරාකරණ සැලසුම් ක්‍රමිකව සකස් කරමින් පවතී. බලගැන්වූ වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය, නියාමන අධීක්ෂණය, පැමිණිලි කළමනාකරණය සහ මූල්‍ය පාරිභෝගික දැනුම්වත් කිරීම් සඳහා වන මූලපිරීම් හරහා මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමට මහ බැංකුව අඛණ්ඩව කටයුතු කළේය. මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා මහ බැංකුව ගනු ලබන ප්‍රයත්නයේ කොටසක් ලෙස, මූල්‍ය සාක්ෂරතාව සහ යහපත් මූල්‍ය කළමනාකරණ පිළිවෙත් පිළිබඳ මහජන දැනුම්වත්භාවය අඛණ්ඩව ප්‍රවර්ධනය කරන ලදී. තවද, සලකා බලන කාලසීමාව තුළ විවිධ නියාමන, අධීක්ෂණ සහ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හරහා ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යයනය මැඩපැවැත්වීමේ රාමුව ශක්තිමත් කිරීමට මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය අඛණ්ඩව කටයුතු කළේය.

ගෝලීය අවිනිශ්චිතතා ඉහළ යෑම, වෙනස් වෙමින් පවතින භූදේශපාලනික සහ සාර්ව මූල්‍ය අවදානම් මෙන්ම දේශීය මූල්‍ය පද්ධතිය තුළ අවදානම් තත්ත්වයන් වර්ධනය වීම මධ්‍යයේ වුව ද, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහ ඔරොත්තු දීමේ හැකියාව සුරක්ෂිත කිරීම සඳහා මහ බැංකුව අඛණ්ඩව කැප වී සිටියි. ඒ අනුව, මතුවෙමින් පවතින අවදානම් අවම කර ගැනීමට සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා වෙළෙඳපොළ වර්ධනයන්, ගෝලීය සහ දේශීය සාර්ව ආර්ථික හා මූල්‍ය තත්ත්වයන් සමීපව නිරීක්ෂණය කරමින් ඒ අනුව සාර්ව විවක්ෂණ ප්‍රතිපත්ති ස්ථාවරය සකස් කරමින් සුදුසු විවක්ෂණශීලී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමට මහ බැංකුව අඛණ්ඩව කටයුතු කරනු ඇත.


5.1 ස්ථායීතාව සඳහා වන සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති

මෝටර් රථවාහන මූල්‍යකරණය සඳහා අදාළ වන වටිනාකම මත උපරිම ණය සීමා අඩු කිරීම සහ රන් ඇපකර මත ලබා දෙන ණය පහසුකම් සඳහා වන වටිනාකම මත උපරිම ණය සීමා හඳුන්වා දීම මගින් මහ බැංකුව සලකා බලනු ලබන කාලසීමාව තුළ සිය සාර්ව විචක්ෂණ ස්ථාවරය දැඩි කළේය. වාහන හා රන් ඇපකර මත ලබා දෙන ණයවල සැලකිය යුතු වැඩිවීමත් සමඟ බලපත්‍රලාභී බැංකු හා මුදල් සමාගම්වල ණය වර්ධනය වේගවත්ව සිදුවෙමින් පැවති පසුබිමක මෙම පියවර ගන්නා ලදී. පද්ධතිමය අවදානම් වර්ධනය වීම අවම කිරීම සහ මූල්‍ය ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා කාලෝචිත සාර්ව විචක්ෂණ පියවර ගැනීමේ අවශ්‍යතාව ඉස්මතු කරමින්, බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම් අංශවල සමස්ත ණය වර්ධනය සලකා බලන කාලය තුළ පෙර පැවති අගයන්වල සාමාන්‍යයට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඇපකර මත ලබා දෙන ණය වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ, මෝටර් රථවාහන සම්බන්ධ ණය[1] සහ රන් ඇප මත ලබා දෙන ණය, මූල්‍ය අංශයේ[2] සමස්ත ණය ප්‍රමාණයෙන් 2024 වසර අවසානයේ පැවති 19.6% සිට 2026 වසරේ ජූනි අවසානය වන විට 24.9% දක්වා ඉහළ ගියේය. ඒ අනුව මූල්‍ය අංශයේ ණයවලින් ආසන්න වශයෙන් හතරෙන් එකක් පමණ මෙම ඇපකර වෙත කේන්ද්‍රගත විය. නියාමනය වන මූල්‍ය ආයතනවල ණය කළඹ තුළ මෙවැනි නිරාවරණ සංකේන්ද්‍රණය වීම, සමස්ත ණය ප්‍රමාණයට සාපේක්ෂව

1 මෝටර් රථ ආශ්‍රිත ණය සඳහා, මුදල් සමාගම් විසින් ලබා දෙන මූල්‍ය කල්බදු, කුලී පදනම මත මිලදී ගැනීමේ පහසුකම් සහ මෝටර් රථ ණය මෙන්ම, දත්ත සීමාවන් හේතුවෙන් මෝටර් රථවාහන මූල්‍යකරණය සඳහා ආදේශකයක් ලෙස භාවිත කරනු ලබන බලපත්‍රලාභී බැංකුවල කල්බදු කළඹ ද ඇතුළත් වේ. ඒ අනුව, බැංකු අංශයේ කල්බදු දත්ත සඳහා වාහන නොවන අරමුණු සඳහා ලබා දුන් කල්බදුවල කුඩා ප්‍රතිශතයක් ද ඇතුළත් විය හැකිය.

2 මෙම විශ්ලේෂණයේ අරමුණ සඳහා, මූල්‍ය අංශය යනු බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම් වේ.

රූප සටහන 5.2
මූල්‍ය අංශයේ මෝටර් රථවාහන ආශ්‍රිත ණය සහ රන් ඇපකරයක් මගින් සුරක්ෂිත කළ ණය සංකේන්ද්‍රණය




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

එම නිරාවරණ ඉහළ වේගයකින් වර්ධනය වීම සහ අදාළ ඇපකරවල වටිනාකම්වල සිදුවන වෙනස්කම් සඳහා එම නිරාවරණ සංවේදී වීම යන කරුණු හේතුවෙන්, සාර්ව විචක්ෂණ අධීක්ෂණය සහ ණයගැතියන් පාදක කරගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය විය.


සලකා බලනු ලබන කාල සීමාව තුළ රන් ඇපකර මත ලබා දෙන ණය සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය අංශයේ සමස්ත ණය ප්‍රමාණයෙන් රන් ඇපකර මත ලබා දුන් ණය ප්‍රමාණය 2024 වසරේ අග පැවති 9.8% සිට 2026 වසරේ ජූනි මස අවසානය වන විට 12.0% දක්වා ඉහළ ගිය අතර, එමගින් මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවල ණය කළඹ තුළ රන් ඇපකර මත ලබා දුන් ණය සඳහා ලැබෙන වැදගත්කම ක්‍රමයෙන් වැඩි වීම පෙන්නුම් කරයි. රන් ඇපකර මත ලබා දෙන ණයෙහි

රූප සටහන 5.1
මූල්‍ය අංශයේ සමස්ත ණය වර්ධනය




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 5.3
මූල්‍ය අංශයේ මෝටර් රථවාහන ආශ්‍රිත ණය සහ රන් ඇපකරයක් මගින් සුරක්ෂිත කළ ණය වර්ධනය



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 5.4 **ගෝලීය රන් මිලෙහි සිදු වූ වෙනස්වීම්**



මූලාශ්‍රය: ලෝක බැංකුව

මෙම සීඝ්‍ර වර්ධනය, ගෝලීය රන් මිලෙහි අඛණ්ඩ ඉහළ යෑම සමඟ සමපාත වූ අතර මෙම මිල වැඩි වීම ඇපකර වටිනාකම් ඉහළ යෑම සඳහා දායක වෙමින් රන් ඇපකර මත ලබා දෙන ණය වර්ධනය වීම සඳහා සහාය විය. ඉහළ යන රන් මිල මගින් ඇපකර ආවරණය ශක්තිමත් වුව ද, මූල්‍ය ආයතන තුළ මෙවැනි ණය නිරාවරණයන් වැඩි වශයෙන් සංකේන්ද්‍රණය වීම මගින් රන් මිලෙහි සිදුවිය හැකි අහිතකර වෙනස්වීම් සහ ණයගැනුම්කරුවන්ගේ ණය ආපසු ගෙවීමේ අවදානම කෙරෙහි මූල්‍ය අංශයේ සංවේදීතාව තීව්‍ර විය.

2025 වසර පුරා ගෝලීය රන් මිල ක්‍රමානුකූලව ඉහළ ගිය ද, 2026 වසරේ ජනවාරි මස අග සිට ඉහළ මිල අස්ථාවරත්වයක් මතුවීම හේතුවෙන්, ණයගැනුම්කරුවන් මෙන්ම ණය ලබාදෙන්නන් යන දෙපාර්ශ්වයටම රන් ඇපකර වටිනාකම සම්බන්ධයෙන් ඉහළ අවිනිශ්චිතතාවකට මුහුණ දීමට සිදු වූ අතර, එමගින් ශක්තිමත් අවදානම් පාලන ක්‍රියාමාර්ගවල අවශ්‍යතාව මතු විය. ගෝලීය රන් මිලෙහි සිදුවන ශීඝ්‍ර උච්චාවචනය සහ රන් ඇපකර මත ණයෙහි වේගවත් ප්‍රසාරණය හේතුවෙන් ඇති වන අවදානම් හඳුනාගෙන, ඇපකර වටිනාකම් තක්සේරු කිරීමේ දී ප්‍රවේශම්සහගත ක්‍රමවේදයන් අනුගමනය කිරීම සහ ශක්තිමත් අවදානම් කළමනාකරණ පියවර තුළින් රන් ඇපකර මත ණය ලබා දීමේ දී ඉහළ විචක්ෂණශීලී බවකින් ක්‍රියා කිරීමට බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම්වලට නියම කරමින්, මහ බැංකුව 2026 වසරේ මාර්තු මාසයේ දී "රන් ඇපකර මත ණය ලබාදීමේ දී අවදානම් කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ" නිකුත් කළේය.[3] මෙම අධීක්ෂණ ක්‍රියාවලිය මත පදනම්ව, අධික ණය ගැනීම් අවම කිරීම, ණයගැනුම්කරුවන් පාදක කරගත් ආරක්ෂක ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සහ රන් මිලෙහි අහිතකර වෙනස්වීම් හමුවේ නියාමනය වන ආයතනවල ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ අරමුණින්, රන් ඇපකර මත ලබා දෙන ණය පහසුකම් සඳහා 70%ක වටිනාකම මත උපරිම ණය සීමාවක් මහ බැංකුව විසින් 2026 වසරේ මැයි 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි හඳුන්වා දෙන ලදී. වටිනාකම මත ණය අනුපාතික සීමාවන් හඳුන්වා දීම මගින්, අධික අවදානම් දැරීම පාලනය කිරීමටත්, රන් ඇපකර මත ලබා දෙන ණයෙහි වේගවත් වර්ධනය හේතුවෙන් ඇති වන අවදානම් ගොඩනැගීම අවම කිරීමටත් හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරිණි.[4]

2025 මුල් භාගයේ දී මෝටර් රථවාහන ආනයන සීමා ලිහිල් කිරීමත් සමඟම, ඉල්ලුම ක්ෂණිකව ඉහළ යෑම හේතුවෙන් මෝටර් රථවාහන ආශ්‍රිත ණය සඳහා පැවති ඉල්ලුම ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, මෝටර් රථ ආශ්‍රිත ණය, මූල්‍ය අංශයේ සමස්ත ණය වර්ධන වේගය අභිබවමින් ඉහළ වේගයකින් වර්ධනය විය. මූල්‍ය අංශයේ සමස්ත ණය ප්‍රමාණය තුළ මෝටර් රථ ආශ්‍රිත ණයවල ප්‍රතිශතය 2024 වසරේ දෙසැම්බර් මාසයේ පැවති 9.8% සිට 2026 වසරේ ජූනි මස අවසානය වන විට 12.9% දක්වා ඉහළ ගියේය. මෝටර් රථවාහන ආශ්‍රිත ණයවල වේගවත් ප්‍රසාරණය සහ එම ණය කේන්ද්‍රගතවීම ඉහළ යෑම, පද්ධතිමය අවදානම් ගොඩනැගීමට හේතු වූ අතර, ඒ සඳහා වඩාත් සුපරීක්ෂාකාරී සාර්ව විචක්ෂණ අධීක්ෂණයක අවශ්‍යතාව පැන නැගිණි.

මෙම තත්ත්වය හමුවේ, අධික ණය ගැනීම පාලනය කිරීම, ණයගැනුම්කරුවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සහ මෝටර් රථවාහන මූල්‍යකරණයේ වේගවත් ප්‍රසාරණය හේතුවෙන් මතුවන පද්ධතිමය අවදානම් අවම කිරීමේ අරමුණින්, මහ බැංකුව විසින් 2025 වසරේ නොවැම්බර් සහ 2026 වසරේ මැයි යන මාසවල අවස්ථා දෙකක දී අදාළ වටිනාකම මත ණය අවශ්‍යතා ශක්තිමත් කරන ලදී.[5] මෙම අනුක්‍රමික ප්‍රතිපත්තිමය පියවර මගින් වාණිජ කාණ්ඩයේ නව වාහන[6] සඳහා ලබා දී ඇති වටිනාකම මත උපරිම ණය අනුපාතය 80% සිට 60% දක්වා ද, අනෙකුත් වාහන කාණ්ඩවල නව වාහන සඳහා 40% දක්වා ද අඩු කරන ලද අතර, භාවිත කළ වාහන[7] සඳහා වන සීමාව 70% සිට 60% දක්වා අඩු කරන ලදී.

3 රන් ඇපකර මත ණය අවදානම් කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ: https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/msd_letter_to_ceos_of_banks_20260311_e.pdf

4 ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 2026 අංක 02 දරන විධානය: https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/CBSL_Act_Directions_No_2_of_2026_e.pdf


5 ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 2025 අංක 03 දරන විධානය: https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/CBSL_Act_Directions_No_3_of_2025_e.pdf
ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 2026 අංක 01 දරන විධානය: https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/CBSL_Act_Directions_No_1_of_2026_e.pdf

6 නව වාහන යන්නෙන් අදහස් වන්නේ ලියාපදිංචි නොකළ වාහන සහ පළමු ලියාපදිංචි කිරීමෙන් පසු ශ්‍රී ලංකාව තුළ වසරකට අඩු කාලයක් භාවිත කර ඇති වාහනයි.

7 භාවිත කළ වාහන යනු පළමු ලියාපදිංචි කිරීමෙන් පසු ශ්‍රී ලංකාව තුළ වසරකට වැඩි කාලයක් භාවිත කර ඇති වාහනයි.

රූප සටහන 5.5

මෝටර් රථවාහන සම්බන්ධ වටිනාකම් මත ණය රාමුව ක්‍රමයෙන් දැඩි කිරීම සහ සරල කිරීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීමට අමතරව, මහ බැංකුව විසින් මෝටර් රථවාහන සම්බන්ධයෙන් වන වටිනාකම මත ණය අනුපාත රාමුව සරල කිරීමට ද පියවර ගන්නා ලදී. 2025 වසරේ නොවැම්බර් මස සිදු කළ සංශෝධනයේ කොටසක් ලෙස, නව වාහන සඳහා වූ රාමුව බහු කාණ්ඩ ව්‍යුහයක සිට පුළුල් කාණ්ඩ දෙකකින් සමන්විත සරල කළ රාමුවක් බවට පත් කරන ලදී. පසුව සිදු කරන ලද සංශෝධන මගින්, එම සරල ව්‍යුහය පවත්වා ගෙන යමින් අදාළ ණය සීමාවන් තවදුරටත් දැඩි කරන ලදී. මෙලෙස එම රාමුව සරල කිරීම මගින් විනිවිදභාවය වැඩිදියුණු කිරීම, නියාමනය වන ආයතන අතර අනුකූලතාව ඉහළ නැංවීම, මෙහෙයුම් සංකීර්ණත්වය අඩු කිරීම, සහ ණයගැනුම්කරුවන් පාදක කරගත් සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති මෙවලමක් ලෙස වටිනාකම මත ණය අනුපාතයේ ඵලදායීතාව ශක්තිමත් කෙරිණි. තවද, සලකා බලන කාලය තුළ බලපත්‍රලාභී බැංකු විසින් මුදල් සමාගම් වෙත ලබා දී ඇති ණය ප්‍රමාණයෙහි කැපී පෙනෙන වැඩිවීමක් ද මහ බැංකුව විසින් නිරීක්ෂණය කරන ලදී. මෝටර් රථවාහන මූල්‍යකරණය සඳහා ණය ලබා දීම වේගවත් වීම මධ්‍යයේ මුදල් සමාගම්වල මූල්‍යකරණ අවශ්‍යතා ඉහළ යෑම ප්‍රධාන වශයෙන් මෙමගින් පිළිබිඹු කරයි. එවැනි අරමුදල් සම්පාදනය මගින් ණය අතරමැදිකරණයට සහාය වුව ද, එය බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම් අතර අන්තර් සම්බන්ධතාව ඉහළ නංවන ලද අතර, එමගින් මූල්‍ය පද්ධතිය තුළ අවදානම් සම්ප්‍රේෂණය වීම තවදුරටත් තීව්‍ර වීමේ හැකියාවක් පවතී. එබැවින්, මතුවිය හැකි දුර්වලතා හෝ පද්ධතිමය අවදානම් කඩිනමින් හඳුනාගෙන ඒවාට නිසි පිළියම් යෙදීම තහවුරු කිරීම සඳහා මහ බැංකුව විසින් මෙම වර්ධනයන් අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි.

පද්ධතිමය අවදානම් අවම කිරීමේ සහ බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ සිය උත්සාහයන්හි කොටසක් ලෙස, මහ බැංකුව විසින්, සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතිය කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇති කිරීමේ හැකියාව සහිත බැංකු නිරන්තර ඇගයීමට ලක් කරනු ලබයි. 2025 වසරේ අප්‍රේල් මාසයේ දී නිකුත් කරන ලද, පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු සඳහා වන නිර්නායකවලට අනුකූලව, 2025 වසර අවසාන වන විට පැවති විගණනය කරන ලද දත්ත භාවිතා කරමින් 2026 වසරේ දී පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකුවල වාර්ෂික ඇගයීම් සිදු කළ අතර, එම ඇගයීම මගින් දැනට පවත්නා පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු පහක ලැයිස්තුව තවදුරටත් යෝග්‍ය බව තහවුරු කෙරිණි.

5.2 බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ ප්‍රතිපත්ති

අවදානම් කළමනාකරණය, අනුකූලතාවය ශක්තිමත් කිරීම සහ යහපාලන ක්‍රමවේදයන් ප්‍රවර්ධනය කරන අතරම බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත්

කිරීම සඳහා මහ බැංකුව විසින් විචක්ෂණශීලී නියාමන රැසක් සහ ප්‍රතිපත්තිමය පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදී. මෙම ප්‍රයත්නයන් හි කොටසක් ලෙස, බැංකුවේ ස්වභාවය, පරිමාණය, ව්‍යුහය, සංකීර්ණත්වය, සහ අන්තර් සම්බන්ධතාව සලකා බලමින් ප්‍රතිසාධන සැලසුම් (Recovery Plans) සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද ප්‍රතිසාධන සැලසුම් මහ බැංකුව වෙත යොමු කරන ලෙසට බලපත්‍රලාභී බැංකුවලට නියම කරමින්, බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 2025 අංක 01 දරන විධානය නිකුත් කරන ලදී. තවද, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රජය සතු ව්‍යවසායන් වෙනුවෙන් ණයවර ලිපි විවෘත කිරීමේ දී, මූල්‍ය ප්‍රකාශනවල එවැනි බැඳීම් හෙළිදරව් කිරීමට යටත්ව, අයවැය ප්‍රතිපාදන සහ කාලීන පියවීම් සහතික කරමින් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද පොරොන්දු ලිපි, අනුමත සුරැකුම්පත් ලෙස දක්වමින්, "බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්ව සඳහා ලබා දී ඇති අනුග්‍රහයන් සඳහා වන අනුමත සුරැකුම්පත්" යන 2024 අංක 04 දරන බැංකු පනත් නිර්ණයට සංශෝධනයක් නිකුත් කරන ලදී. 2025 වසර අග භාගයේ ඇති වූ සුළිකුණාටු සහ ගංවතුර තත්ත්වයන් හි අහිතකර බලපෑම් හේතුවෙන්, එම සුළිකුණාටු සහ ගංවතුර තත්ත්වයන් මගින් ආදායම හෝ ව්‍යාපාර ඍජුවම බලපෑමට ලක් වූ පුද්ගලයින්ට සහ ව්‍යාපාරවලට සහන සලසන ලෙස ඉල්ලා සිටීමින් මහ බැංකුව විසින් සියලුම බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. මීට අමතරව, මූල්‍ය ආයතන අධීක්ෂණය, නියාමනය, අර්බුද කළමනාකරණය සහ නිරාකරණය යන ක්ෂේත්‍රවල තොරතුරු හුවමාරු කර ගැනීම සහ සහයෝගිතාව වැඩිදියුණු කිරීම මෙන්ම කුසලතා සංවර්ධනය සහ තාක්ෂණික සහාය ලබාදීම යන අරමුණු ඇතිව, මහ බැංකුව ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය සමඟ 2025 වසරේ දෙසැම්බර් 01 වන දින අවබෝධතා ගිවිසුමකට එළැඹෙන ලදී.

මූල්‍ය ස්ථායීතාව සහ ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම මගින් රටේ වත්මන් ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ගමන්මග සඳහා පහසුකම් සැලසීමේ අරමුණින්, මහ බැංකුව විසින් 2025 වසරේ ඔක්තෝබර් මාසයේ දී බැංකු අංශයේ ඒකාබද්ධකරණය සඳහා වන රාමුව හඳුන්වා දෙන ලදී. අනතුරුව, 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී, දේශීයව සංස්ථාපනය කළ කුඩා පරිමාණ බැංකුවලට යෝජිත අර්ධවාර්ෂික ඇගයීම් යාන්ත්‍රණය පිළිබඳව මහ බැංකුව විසින් දැනුම් දුන් අතර, සුදුසු ඒකාබද්ධතා උපායමාර්ග අනුගමනය කිරීම සඳහා 2026 ජනවාරි 23 වන දින බලපත්‍රලාභී බැංකු වෙත එම ඒකාබද්ධකරණ රාමුව නිකුත් කරන ලදී. මෙම රාමුව මගින් රුපියල් බිලියන 400කට වඩා අඩු වත්කම් ඇති, දේශීයව සංස්ථාපනය කරන ලද කුඩා පරිමාණ බලපත්‍රලාභී බැංකු සඳහා සමානුපාතික ඇගයීම් සහ ඒකාබද්ධතා යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලබයි. මෙම රාමුව යටතේ, එවැනි ආයතන ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දර්ශක මත පදනම්ව අර්ධවාර්ෂිකව තක්සේරු කරනු ලබන අතර, නියමිත ප්‍රමිතීන් අබණ්ඩව සපුරාලීමට අපොහොසත් වන බලපත්‍රලාභී බැංකු ඒකාබද්ධ කිරීම නිර්දේශ කරනු ඇත. මෙම රාමුව තුළින් ඒකාබද්ධකරණ උපායමාර්ග ඉදිරිපත් කරනු ලබන අතර, ආයතනික වර්ධනය සඳහා සහාය වීමට, පාලනය ශක්තිමත් කිරීමට, තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීමට, ප්‍රාග්ධනය සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමට මෙන්ම නියාමන අනුමත කිරීම්, මානව සම්පත් කළමනාකරණය, තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව සහ වෙළෙඳපොළ හැසිරීම වැනි ප්‍රධාන කරුණු සඳහා පුළුල් මාර්ගෝපදේශ යෝජනා කර ඇත. ඒ අනුව, 1988 අංක 30 දරන බැංකු (සංශෝධිත) පනත යටතේ, මහ බැංකුව විසින් ඒකාබද්ධතා යෝජනා ඇගයීමට ලක් කරනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවල දී නියාමන මාර්ගෝපදේශ ලබා දෙමින් අදාළ අනුමැතීන් ලබා දෙනු ඇත. තවද, බැංකු අංශය ඒකාබද්ධ කිරීම මගින් මූල්‍යමය හා මෙහෙයුම් වශයෙන් ශක්තිමත් බැංකු බිහිවීම සඳහා පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ මගින් බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහ ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කරන අතර ආර්ථිකයේ සෑම කොටසකටම ප්‍රතිලාභ ලැබෙන සහ තිරසර වර්ධනය සඳහා සහාය වනු ඇත. මෑතකදී, ශ්‍රී ලංකා රජය විසින් රජය සතු බලපත්‍රලාභී විශේෂිත කුඩා බැංකු දෙකක් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, ශ්‍රී ලංකාවේ බැංකු අංශයේ ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් එවැනි මුලපිරීම් සඳහා මහ බැංකුව විසින් පහසුකම් සලසා ඇත.

එයට අමතරව, සලකා බලනු ලබන කාලසීමාවේ දී බැංකු අංශය තුළ ආයතනික ඔරොත්තු දීමේ හැකියාව, මෙහෙයුම් ශක්තිමත්භාවය සහ අවදානම් හඳුනා ගැනීම වැඩිදියුණු කිරීම සඳහා ඉලක්කගත නියාමන මුලපිරීම් ක්‍රියාත්මක කරන ලදී. නව ව්‍යාපාර කටයුතු හේතුවෙන් බැංකු අංශයේ ඇති වූ වර්ධනයන් මෙන්ම ඩිජිටල්කරණය කළ ව්‍යාපාර ක්‍රියාවලි හා මෙහෙයුම්වල සිදු වූ වර්ධනයන් සැලකිල්ලට ගෙන, බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සම්බන්ධව බාහිර සේවා ලබා ගැනීම සඳහා වඩාත් ශක්තිමත් සහ විචක්ෂණශීලි රාමුවක් අනුගමනය කිරීම තහවුරු කිරීමේ අරමුණින්, මහ බැංකුව විසින් 2026 වසරේ මාර්තු මාසයේදී "බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු සම්බන්ධව බාහිර සේවා ලබාගැනීම" සම්බන්ධයෙන් 2026 අංක 01 දරන බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. තවද, 2026 අංක 02 දරන "බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා" පිළිබඳ බැංකු පනත් විධානය මගින් රන් ඇපකර මත ලබා දෙන ණය පහසුකම් සඳහා පෙර පැවති අවදානම මත ශූන්‍ය බර තැබීම වෙනුවට අදාළ වටිනාකම මත ණය අනුපාතයට අනුව වෙනස් වන අවදානම මත අවදානම් බරක් ලැබෙන පරිදි අවදානම මත බර තැබීමේ ක්‍රමවේදය සංශෝධනය කරනු ලැබීය.

අර්ථලාභී හිමිකරුවන් හඳුනා ගැනීම, ඇගයීම සහ අධීක්ෂණය කිරීම සහතික කරනු පිණිස මහ බැංකුව 2026 අංක 03 දරන බලපත්‍රලාභී බැංකුවල අර්ථලාභී හිමිකාරිත්වය පිළිබඳ බැංකු පනත් විධානය නිකුත් කරන ලදී. මීට අමතරව, බලපත්‍රලාභී බැංකුවල මෙහෙයුම් අලාභ සිදුවීම් (operational loss events) යුහුසුළුව හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ කළමනාකරණය කිරීම සහතික කරමින් බලපත්‍රලාභී බැංකු තුළ මෙහෙයුම් අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම උදෙසා, මහ බැංකුව විසින් 2026 අංක 04 දරන "බලපත්‍රලාභී බැංකුවල මෙහෙයුම් අලාභ සිදුවීම් හඳුනාගැනීම, වාර්තා කිරීම සහ කළමනාකරණය කිරීම" පිළිබඳ බැංකු පනත් විධානය ද නිකුත් කර ඇත.

බැංකු පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා, මහ බැංකුව විසින් සලකා බලන කාලසීමාව තුළ කලින් කලට වෙනත් නියාමන පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදී. එම රෙගුලාසි අතර 2024 අංක 03 දරන "බලපත්‍රලාභී වාණිජ බැංකුවල ජංගම බැංකු ඒකක පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ" පිළිබඳ චක්‍රලේඛයට සිදු කරන ලද සංශෝධනයක් සහ "බලපත්‍රලාභී බැංකු සඳහා වන වාර්ෂික බලපත්‍ර ගාස්තු" පිළිබඳ බැංකු පනත් නිර්ණය ඇතුළත් වේ. එයට අමතරව, බැංකු අංශයේ සුරක්ෂිත බව, ශක්තිමත්භාවය සහ ඔරොත්තුදීමේ හැකියාව වැඩිදියුණු කරමින්, කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී බැංකු සඳහා වන විධාන සහ බලපත්‍රලාභී බැංකු සඳහා වන ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ පිළිබඳ විධාන, බලපත්‍රලාභී බැංකුවල තිරසර මූල්‍ය කටයුතු පිළිබඳ විධාන, බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මිනුම්කරණය සඳහා වන බැංකු පනත් විධානයට අදාළ සංශෝධන සහ බලපත්‍රලාභී බැංකුවල සුදුසුකම් ලත් බාහිර විගණකවරුන් සඳහා වන මාර්ගෝපදේශ ඇතුළු යෝජිත රෙගුලාසි කිහිපයක් නුදුරු අනාගතයේ දී නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.

5.3 මුදල් සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් සඳහා අදාළ ප්‍රතිපත්ති

අවදානම් කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ප්‍රමිතීන් හඳුන්වා දීම, නෛතික රාමුවට කරන ලද සංශෝධන සහ වැඩිදියුණු කරන ලද අධීක්ෂණ ප්‍රවේශයන් හා ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම හරහා මුදල් සමාගම් අංශය සඳහා වන නීතිමය, නියාමන සහ අධීක්ෂණ රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදී. ඒ අනුව, මුදල් සමාගම් නියාමනය සහ අධීක්ෂණය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව, අනවසර මුදල් ව්‍යාපාර විමර්ශනය කිරීම සහ නඩු පැවරීම, සහ ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගැනීමට හැකියාවක් නොමැති මුදල් සමාගම් ඇවර කිරීම යන කරුණු මූලික වශයෙන් සැලකිල්ලට ගනිමින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත සඳහා යෝජිත සංශෝධන හරහා මුදල් සමාගම් අංශය සඳහා වූ නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, අදාළ කාලය තුළ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය, මුදල් සමාගම් සඳහා වන ප්‍රතිසාධන සැලසුම්, මුදල් සමාගම්වල අර්ථලාභී හිමිකරුවන් ඇගයීම, මුදල් සමාගම් අංශයේ ව්‍යුහාත්මක වෙනස්කම්, තැන්පත් සහ ණය උපකරණ මත වන උපරිම පොලී අනුපාතික සංශෝධනය කිරීම, රන් ඇපකර මගින් සුරක්ෂිත කර ඇති සුළු පරිමාණ ගනුදෙනුකරුවන්ගේ හිමිකම් (retail claims) සඳහා අදාළ වන ණය අවදානම මත බර තබන ලද වත්කම් ගණනය කිරීමේ ක්‍රමවේදය සංශෝධනය යනාදිය සම්බන්ධයෙන් විධාන කිහිපයක් මහ බැංකුව විසින් නිකුත් කරන ලදී. තවද, 2025 වසරේ අග භාගයේ ඇති වූ සුළිකුණාටු හා ගංවතුර හේතුවෙන් ව්‍යසනයට පත්ව ආදායම් හෝ ව්‍යාපාර ඍජුවම බලපෑමට ලක් වූ පුද්ගලයන්ට හෝ ව්‍යාපාරවලට සහන ක්‍රියාමාර්ග සපයන ලෙස සියලු මුදල් සමාගම්වලට නියම කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. තවද, මතුවෙමින් පවතින අවදානම් සහ දුර්වලතාවලට මුහුණ දීම සඳහා නියාමනය වන ආයතන ප්‍රමාණවත් මූල්‍ය ස්වාරක්ෂක පවත්වා ගෙන යෑම සහතික කරන අතරම මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩපැවැත්වීමේ අවශ්‍යතා සමඟ අනුකූල වීම, මුදල් සමාගම් අංශයේ අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පිළිවෙත් ශක්තිමත් කිරීම කෙරෙහි ඉහළ අවධානයක් ලබා දෙන ලදී.

ක්‍රමවත් ඒකාබද්ධකරණ වැඩසටහනක් තුළින් මුදල් සමාගම් අංශයේ ඔරොත්තු දීමේ හැකියාව හා දිගුකාලීන ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව අඛණ්ඩව කටයුතු කරන ලදී. වඩාත් ඔරොත්තු දීමේ හැකියාවක් සහිත මුදල් සමාගම් අංශයක් ඇති කිරීම අරමුණු කරගනිමින් ඒකාබද්ධකරණ සැලැස්මෙහි දෙවන අදියර සඳහා වන සංශෝධිත රාමුව 2025 මාර්තු 31 දින සිට 2028 මාර්තු 31 දක්වා වසර තුනක ක්‍රියාත්මක කිරීමේ කාලසීමාවක් සහිතව 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලදී. මහ බැංකුව විසින් ලබා දුන් වාර්තාකරණ ආකෘතිය භාවිත කරමින්, 2025 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි මුදල් සමාගම් විසින් සෑම කාර්තුවක් තුළදීම ස්වයං ඇගයීම් ලකුණු ඉදිරිපත් කරමින් සිටී. වාර්තා කරන ලද ලකුණු මත පදනම්ව, නියමිත සීමාවට වඩා අඩු ලකුණු ලබාගත් මුදල් සමාගම් සඳහා ඒකාබද්ධකරණ වැඩපිළිවෙළෙහි දක්වා ඇති නිර්ණායකයන්ට සහ අපේක්ෂාවන්ට අනුකූල වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමේ වැදගත්කම අවධාරණය කරමින් සුදුසු අධීක්ෂණ නිවේදන නිකුත් කරන ලදී.

මුදල් සමාගම් සඳහා ක්‍රියාත්මක කරන ලද නියාමන මූලපිරීම්වලට අමතරව, බැංකු නොවන අනෙකුත් මූල්‍ය ආයතනවල ඔරොත්තුදීමේ හැකියාව හා අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීමට ඉලක්කගත පියවරයන් හඳුන්වා දෙන ලදී. බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සඳහා ශක්තිමත් ණය අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීමට නියම කරමින්, ණය අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් විධානයක් නිකුත් කිරීම හරහා බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සඳහා වූ අවදානම් කළමනාකරණ රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදී. එයට අමතරව, ප්‍රාථමික අලෙවිකාර සමාගම් අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා, ඇතිවිය හැකි අවදානම් හා අනපේක්ෂිත අලාභ අවශෝෂණය කරගැනීමට මූල්‍ය ස්වාරක්ෂකයක් සැපයීමේ අරමුණින් අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ විධානයක් නිකුත් කරන ලදී.

5.4 ගෙවීම් හා පියවීම් සම්බන්ධ ප්‍රතිපත්ති

වඩාත් ආරක්ෂිත, කාර්යක්ෂම සහ ඵලදායී ගෙවීම් පණිවුඩ හුවමාරුවක් තහවුරු කිරීම සඳහා, ලෝක අන්තර් බැංකු මූල්‍ය තොරතුරු සන්නිවේදන සංගමය (SWIFT) විසින් සිය පරිශීලක ප්‍රජාව සඳහා නියම කරන ලද ISO20022 ගෙවීම් පණිවුඩකරණ ප්‍රමිතිය මහ බැංකුව විසින් සාර්ථකව ක්‍රියාවට නංවන ලදී. ලෝක අන්තර් බැංකු මූල්‍ය තොරතුරු සන්නිවේදන සංගමයෙහි ISO20022 ප්‍රමිතිය අනුගමනය කිරීම මගින් වඩා විස්තරාත්මක හා ව්‍යුහගත ලෙස ගෙවීම් තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට හැකි වැඩිදියුණු කළ, නම්‍යශීලී ගෙවීම් පණිවුඩ සන්නිවේදිකරණ ප්‍රමිතියක් කරා වන ගෝලීය සංක්‍රාන්තියේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. එමගින් මානව මැදිහත්වීම් සහ සැකසුම් දෝෂ අවම කිරීම, විනිවිදභාවය සහ පහසුවෙන් සොයාගැනීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම, සහ දේශසීමා හරහා සිදුවන ගෙවීම්වලට අදාළ වංචා හඳුනාගැනීම සහ අවදානම් කළමනාකරණය කිරීමට පහසුකම් සලසමින්, ස්වයංක්‍රියකරණය සහ අන්තර් ක්‍රියාකාරීත්වය පහසු කරනු ලබයි. තවද, ශ්‍රී ලංකාවේ ක්ෂණික ගෙවීම් පද්ධතිය වන විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Electronic Fund Transfer Switch - CEFTS) සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common ATM Switch - CAS) හා සම්බන්ධ ණය අවදානම් වඩා හොඳින් කළමනාකරණය කර ගැනීම සඳහා 2026 වසරේ ජූනි 01 වන දා සිට අවදානම් අවම කිරීමේ නව යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදී. 2026 අංක 04 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය මගින් ස්ථාපනය කරන ලද නව යාන්ත්‍රණය මගින් තත්කාලීන දළ පියවීම් පද්ධතියේ (RTGS) සාමාජිකයන් වන විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජිකයන්ට 2026 වසරේ ජූනි මස 01 වන දා සිට බලපැවැත්වෙන පරිදි තත්කාලීන දළ පියවීම් පද්ධතියේ අදාළ ශුද්ධ හර සීමාවට මෙන්ම අදාළ පියවීම් ඇපකර වටිනාකමට (Settlement Guarantee Amount) අනුකූල වීමට නියම කළේය.

ඩිජිටල් ගෙවීම් මාධ්‍ය සම්බන්ධ මූල්‍ය වංචා සහ රැවටිලි ක්‍රියා ඉහළ යෑම සැලකිල්ලට ගනිමින් ඩිජිටල් ගෙවීම් ක්‍රමවල ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ වංචා සම්බන්ධ අවදානම් පිළිබඳ මහජන දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම මගින්, පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති මූලපිරීම් ගන්නා ලදී. ජංගම ගෙවීම් යෙදවුම් සඳහා ශක්තිමත් පාරිභෝගික හඳුනා ගැනීම් සහ සත්‍යාපනය කිරීමේ අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම සහ අබණ්ඩ මහජන දැනුම්වත් කිරීමේ මූලපිරීම් සමඟ 2025 වසරේ මැද භාගයේ ශීඝ්‍ර ලෙස ඉහළ ගොස් තිබූ ඩිජිටල් ගෙවීම් මාධ්‍ය සම්බන්ධව වාර්තා වූ වංචා සහ රැවටිලි ක්‍රියා පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. තවද, ලංකාපේ (LankaPay) පොද්ගලික සමාගම විසින් පවත්වාගෙන යනු ලබන සුළු පරිමාණ ගෙවීම් පද්ධති සඳහා මධ්‍යගතව ක්‍රියාත්මක වන වංචා කළමනාකරණ පද්ධතියක් ලබාගැනීම සඳහා වන කටයුතු මේ වන විට සූදානම් කරමින් පවතින අතර, එය ඩිජිටල් ගෙවීම්වලට අදාළ වංචා අවදානම අවම කිරීමට උපකාරී වනු ඇත.

5.5 තැන්පතු රක්ෂණය සහ මූල්‍ය ආයතනවල නිරාකරණ සම්බන්ධ ප්‍රතිපත්ති

මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ නිරාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. ඒ අනුව, ආයතනික අර්බුද ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සහාය වීම සඳහා බලපත්‍රලාභී මූල්‍ය ආයතන සඳහා නිරාකරණ සැලසුම් ක්‍රමානුකූලව වැඩිදියුණු කරමින් පවතී. නිරාකරණ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වනු පිණිස බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ ස්ථාපනය කරන ලද මූල්‍ය ස්ථායීතා අරමුදල (Financial Stability Fund), එහි මෙහෙයුම් රාමුව සංවර්ධනය කිරීමත් සමඟ ක්‍රියාවට නංවා ඇත. තවද, නිරාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව විසින් ස්වාධීන ව්‍යාත්තීය තක්සේරුකරුවන්ගේ මණ්ඩලයක් පිහිට වූ අතර, බැංකු (විශේෂ විධිවිධාන) පනත අනුව බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම් නිරාකරණය කිරීමේ දී ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳව දැනුම්වත් කිරීමේ සැසියක් පවත්වන ලදී. එයට අමතරව, නිරාකරණය සඳහා පාර්ශ්වකරුවන්ගේ සූදානම වැඩිදියුණු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම්වල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් සඳහා දැනුම්වත් කිරීමේ සැසි ද පවත්වන ලදී. නිරාකරණ රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමට සහ ප්‍රධාන නිරාකරණ මූලපිරීම් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් පත්

කරන ලද ජාත්‍යන්තර සහ ජාතික උපදේශකවරුන් සමඟ සම්බන්ධ වී වැඩ මෙහෙයුමක නිරත වෙමින් තාක්ෂණික සහාය ලබා ගැනීමට සහ නිරාකරණ රාමුව ජාත්‍යන්තර යහභාවිතාවන් සමඟ අනුකූල කිරීමට මහ බැංකුව අඛණ්ඩව කටයුතු කළේය.

සලකා බලන කාලසීමාව තුළ ප්‍රතිපත්තිමය, ආයතනික හා මෙහෙයුම් වැඩිදියුණු කිරීම් හරහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ මෙහෙයුම් සූදානම සහ ඵලදායීත්වය තවදුරටත් ශක්තිමත් කෙරිණි. අර්බුද කාලවල දී මහා පරිමාණ වශයෙන් හෝ එකවර සිදු කරන ගෙවීම් කළමනාකරණය කිරීමේ දී ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින්, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ කාර්යසාධනය මත පදනම් වූ කොන්දේසියක් ලෙස, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා හදිසි තත්ත්වයන් සඳහා වන සැලැස්මක් සංවර්ධනය කරන ලදී. වන්දි මුදල් ගෙවීමේ දී එක් නියෝජිත බැංකුවක් මත අධික ලෙස යැපීම අවම කිරීම සහ වන්දි ගෙවීම් ඵලදායී ලෙස බෙදා හැරීම සහතික කිරීම සඳහා, පුළුල් ශාඛා ජාලයක් සහ ප්‍රමාණවත් සම්පත් සහිත බලපත්‍රලාභී බැංකුවලින් සමන්විත පිළිගත් නියෝජිත බැංකු සංචිතයක් පිහිටුවීමට පියවර ගන්නා ලදී. නිරාකරණ තීරණවලට සහාය වීම සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි සම්පත් භාවිත කිරීමට ව්‍යුහගත රාමුවක් සැපයීමේ අරමුණින් සහ නිරාකරණ පියවරක් ලෙස සාමාජික ආයතනයක වත්කම් සහ වගකීම් පැවරීම පහසු කිරීම සඳහා මූල්‍ය ආධාර සැපයීම පිළිබඳ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රතිපත්තිය අදාළ කාලසීමාව තුළ ස්ථාපිත කරන ලදී. තවද, තැන්පතු රක්ෂණ රාමුව ජාත්‍යන්තර යහභාවිතාවන් සහ තැන්පතු රක්ෂණකරුවන්ගේ ජාත්‍යන්තර සංගමයේ (International Association of Deposit Insurers) ඵලදායී තැන්පතු රක්ෂණ පද්ධති සඳහා වන මූලික ප්‍රතිපත්ති සමඟ අනුකූල වීම සඳහා, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ, රජයේ පසුබල (backstop) අරමුදල් විධිවිධාන පිළිබඳව මුදල් අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම ඇතුළු ප්‍රතිපත්තිමය සහ ආයතනික පියවර රාශියක් හඳුන්වා දෙන ලදී.

5.6 මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධ ප්‍රතිපත්ති

වඩාත් බලගැන්වූ වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය, **නියාමන අධීක්ෂණය, පැමිණිලි කළමනාකරණය සහ මූල්‍ය පාරිභෝගික දැනුම්වත් කිරීමේ මුලපිරීම් හරහා මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීම මහ බැංකුව විසින් අඛණ්ඩව සිදු කරන ලද අතර, එමගින් නියාමනය කරන ලද මූල්‍ය අංශය තුළ මූල්‍ය පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම ප්‍රවර්ධනය කරන ලදී.** 2026 වසරේ පළමු භාගය තුළ, මෙම ක්ෂේත්‍රවලින් ලැබුණු සැලකිය යුතු පාරිභෝගික පැමිණිලිවලට ප්‍රතිචාරයක් ලෙස, බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම් විසින් ලබා දෙන කාලීන ණය (Term Loans) කලින් පියවීමේ ක්‍රියාමාර්ග සහ බලපත්‍රලාභී බැංකුවල පරාටේ (Parate) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ තේමාත්මක සමාලෝචන සිදු කිරීම හරහා අධීක්ෂණ රාමුව තවදුරටත් පුළුල් කරන ලදී. තවද, විතැන් වෙළෙඳපොළ කටයුතු අධීක්ෂණ රාමුව වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව විසින් වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය සඳහා වන ප්‍රධාන අවදානම් දර්ශක පුවරුවක් සකස් කරන ලදී. පැමිණිලි හැසිරවීමේ රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, මූල්‍ය පාරිභෝගිකයන්ට ප්‍රමිතිගත ඩිජිටල් වේදිකාවක් හරහා ඉලෙක්ට්‍රොනිකව පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකි මාර්ගගත පැමිණිලි කළමනාකරණ පද්ධතියක් 2026 මාර්තු මස 15 වන දින හඳුන්වා දෙන ලදී. දත්ත මත පදනම් අධීක්ෂණය ශක්තිමත් කිරීමට සහ පැමිණිලි අධීක්ෂණය වැඩිදියුණු කිරීමට මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව පාරිභෝගික පැමිණිලි උපකාරක පුවරුවක් (Dashboard) සැකසීමේ වැඩ කටයුතු ආරම්භ කර ඇත. එයට සමගාමීව, පැමිණිලි වර්ගීකරණයේ සහ විශ්ලේෂණයේ සංගත බව සහ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා සවිස්තරාත්මක පරිශීලක මාර්ගෝපදේශයක් සකස් කරමින් පවතින අතරම, පවත්නා පැමිණිලි වර්ගීකරණ රාමුව විධිමත් කිරීම සඳහා ද මූලපිරීම් සිදු කෙරිණි. තවද, මූල්‍ය පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව හා විශ්වසනීයත්වය ආරක්ෂා කිරීමේ තම වගකීමට අනුකූලව, තහනම් යෝජනා ක්‍රම හඳුනා ගැනීමට, විමර්ශනය කිරීමට සහ වැළැක්වීමට දරන උත්සාහයන් තවදුරටත් ශක්තිමත් කරමින්, ඉලක්කගත අධ්‍යාපනික සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් හරහා මූල්‍ය පාරිභෝගික දැනුම්වත්භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී.

5.7 මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යයනය මැඩපැවැත්වීම හා සම්බන්ධ ප්‍රතිපත්ති

2026 වසරේ ජූනි මාසයෙන් අවසන් වූ වසර තුළ, නියාමන, අධීක්ෂණ හා ප්‍රතිපත්ති මුලපිරීම් ගණනාවක් හරහා ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව ශක්තිමත් කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය අඛණ්ඩව කටයුතු කළේය. බලයලත් වෙළෙඳුන්/පරිසීමිත වෙළෙඳුන්, ත්‍රස්තවාදයට මුදල් සැපයීම, සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම සහ ශ්‍රී ලංකාව තුළ සිදුවන විදේශිකයන් සම්බන්ධිත වංචා කටයුතුවලට අදාළ සැක කටයුතු ගනුදෙනු හඳුනා ගැනීම ආවරණය කරමින්, වාර්තාකරණ ආයතනවලට මතුවන අවදානම් සහ සැක කටයුතු ක්‍රියාකාරකම් හඳුනා

ගැනීම සඳහා සහාය වීමට මූල්‍ය බුද්ධි ඒකකය විසින් අදාළ කාලය තුළ අවදානම් දර්ශක හයක් නිකුත් කරන ලදී. මීට අමතරව, 2024/25 ජාතික මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යයන පිළිබඳ අවදානම් තක්සේරුවට (National Risk Assessment 2024/25) අනුකූල වන පරිදි ආයතනික අවදානම් තක්සේරු සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම, සම්බාධකවලට ලක් වූ පුද්ගලයින් සහ ආයතන සම්බන්ධව දත්ත සමුදාය පරීක්ෂා කළ බවට සහතික කිරීම සහ මූල්‍ය කාර්යසාධක බලකාය විසින් ඉහළ අවදානම් සහිත බලප්‍රදේශ ලෙස හඳුනා ගන්නා ලද බලප්‍රදේශ සඳහා නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතික්‍රියාමාර්ග යොදාගැනීම පිළිබඳව මෙම කාලසීමාව තුළ චක්‍රලේඛ තුනක් නිකුත් කරන ලදී.

සිය අධීක්ෂණ හා බලාත්මක කිරීමේ ප්‍රයත්නයන් හි කොටසක් ලෙස, 2026 වසරේ ජූනි මාසයෙන් අවසන් වූ වසර තුළ මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූල නොවීම පිළිබඳව මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් ඇතුළු ආයතන 20කට මූල්‍යමය දඩ පැනවීය. තවද, මූල්‍ය බුද්ධි ඒකකයේ සම්බන්ධීකරණයෙන් රටෙහි මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යයන අවදානම් ඇගයීමට ලක් කරන ශ්‍රී ලංකාවේ තුන්වන ජාතික අවදානම් තක්සේරුව 2024/25 මෙම කාලය තුළ සම්පූර්ණ කෙරිණි. මේ අතර, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, රටෙහි ප්‍රධානම මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නීති, එනම්, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත, 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සංශෝධනය කරන ලදී. ඒ අනුව, 2026 අංක 16 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත, 2026 අංක 17 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත සහ 2026 අංක 18 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත යන ප්‍රධාන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වූ ප්‍රධාන නීති තුනකට අදාළ සංශෝධන 2026 අගෝස්තු 4 වන දින ගරු කථානායකතුමන් විසින් සහතික කරන ලදී.

ශ්‍රී ලංකාව දැනට මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිෆික් කණ්ඩායම (Asia Pacific Group) විසින් පවත්වනු ලබන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යයනය මැඩපැවැත්වීමේ රාමුව පිළිබඳ තුන්වන අන්‍යෝන්‍ය ඇගයීම (Mutual Evaluation) සිදු කරමින් සිටී. ශ්‍රී ලංකාවේ අවදානම් සහ සන්දර්භය පිළිබඳව වාර්තාව මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිෆික් කණ්ඩායම වෙත ඉදිරිපත් කිරීමත්, පසුව තාක්ෂණික අනුකූලතා වාර්තාව සහ ඵලදායීතා වාර්තාව ඉදිරිපත් කිරීමත් සමඟ අන්‍යෝන්‍ය ඇගයීම් ක්‍රියාවලිය ආරම්භ විය. 2026 වසරේ ඔක්තෝබර්-නොවැම්බර් කාලසීමාව තුළ එහි ස්ථානීය පරීක්ෂණ පැවැත්වීමට නියමිත වේ. රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකෙහිම ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කිරීම මෙම ස්ථානීය පරීක්ෂණයේ දී ධනාත්මක ප්‍රතිඵලයක් අත්කර ගැනීම සඳහා තීරණාත්මක වනු ඇත. මෙහි දී හිතකර ප්‍රතිඵලයක් අත්පත් කරගැනීමට අපොහොසත් වීම මගින් මූල්‍ය කාර්යසාධක බලකාය (FATF) විසින් ශ්‍රී ලංකාව අහිතකර ලෙස ලැයිස්තුගත කළ හැකි අතර, එමගින් ශ්‍රී ලංකාවට ආර්ථික හා මූල්‍යමය බලපෑම් ඇති විය හැකිය.

5.8 මූල්‍ය අන්තර්ගතභාවය සම්බන්ධ ප්‍රතිපත්ති

මූල්‍ය අන්තර්ගතභාවය සම්බන්ධයෙන් මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාමාර්ගවල කොටසක් ලෙස, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයේ පළමු අදියරේ කාලසීමාව අවසානයේ සිදු කරනු ලබන ඇගයීම සහ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික සමීක්ෂණය, මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වූ සන්ධානයේ (Alliance for Financial Inclusion) සහයෝගය ඇතිව ආරම්භ කරන ලද අතර, එය 2026 වසරේ මැද භාගය වන විට අවසන් කරන ලදී. කාලසීමාව අවසාන ඇගයීමේ සහ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සමීක්ෂණයේ සොයාගැනීම් මෙන්ම සාක්ෂි මත පදනම් වූ තොරතුරු, පාර්ශ්වකරුවන්ගේ පුළුල් උපදේශන ක්‍රියාවලියක් හරහා, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයේ දෙවන අදියර සකස් කිරීම සඳහා යොදාගැනීමට අපේක්ෂිතය. තවද, ආයතනික හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම, ජාතික මූල්‍ය සාක්ෂරතා විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සහ ඵලදායී සන්නිවේදන මාධ්‍ය හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින්, ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028) ක්‍රියාත්මක කිරීම වසර පුරා අඛණ්ඩව සිදු විය. ජාතික මූල්‍ය සාක්ෂරතා විෂයමාලාව එළිදැක්වීමට සහාය වීමේ ප්‍රයත්නයන් හි කොටසක් ලෙස විෂය මාලාවේ අන්තර්ගතය ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. පහසු වේගයකට අනුව ඉගෙනීම, ඇගයීම් සහ සහතික කිරීම් ඇතුළත් පරිශීලක හිතකාමී ඩිජිටල් වේදිකාවක සහාය ඇතිව පුළුල් ප්‍රවේශය සහ ක්‍රීඩාවාරකරණය (gamification) හරහා වඩාත් ආකර්ෂණීය හා අන්තර්ක්‍රියාකාරී ඉගෙනුමක් ප්‍රවර්ධනය කරන අතරතුර මෙම මුලපිරීම මඟින් මූල්‍ය සාක්ෂරතාව ඇති කිරීම සඳහා පිරිවැය කාර්යක්ෂම සහ නව්‍ය ප්‍රවේශයක් සැපයීම අරමුණු කරයි. අදාළ පාර්ශ්වකරුවන්ගේ සහයෝගයෙන්, ළමුන්, තරුණ ප්‍රජාව, කාන්තාවන්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්

සහ අනෙකුත් අවදානමට ලක්විය හැකි කාණ්ඩ ඉලක්ක කරගනිමින්, මූල්‍ය සාක්ෂරතා පිළිබඳ තොරතුරු සකස් කිරීම හා ව්‍යාප්ත කිරීම සහ පුහුණුකරුවන්ගේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා වන උත්සාහයන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම ප්‍රයත්නයන් හි කොටසක් ලෙස, මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් මූල්‍ය කළමනාකරණ භාවිත පිළිබඳ මහජන දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා මහ බැංකුව විසින් 2025 වසරේ ඔක්තෝබර් මාසයේ දී "මූල්‍ය සාක්ෂරතා මාසයක්" දියත් කරන ලදී. පුළුල් මහජන සහභාගීත්වයක් ඇති කිරීමටත් දැනුවත්ව මූල්‍ය තීරණ ගැනීමේ වැදගත්කම අවධාරණය කිරීමටත් එම මාසය පුරාවටම මුද්‍රිත, ඩිජිටල් සහ සමාජ මාධ්‍ය ඔස්සේ මෙන්ම සජීවීව ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් හරහා ද පුළුල් පරාසයක දැනුම්වත් කිරීමේ සහ අධ්‍යාපනික වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, ප්‍රාදේශීය මට්ටමින් දැනුම්වත් කිරීමේ සැසි, මූල්‍ය සාක්ෂරතා දින උත්සව සහ ප්‍රාදේශීය සමුළු පවත්වමින්, මහ බැංකුවේ ප්‍රාදේශීය නියෝජනය ශක්තිමත් කිරීමට සහ ප්‍රජාව තුළ මූල්‍ය සාක්ෂරතාව ශක්තිමත් කිරීමට දායක වීම සඳහා ප්‍රාදේශීය කටයුතුවල නිරත වන ප්‍රධාන අංශය ලෙස මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල අඛණ්ඩව කටයුතු කරන ලදී.

5.9 මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 70(2)(ඈ) වගන්තියට අනුකූලව, 2026 වසරේ ජූනි මාසයෙන් අවසන් වූ මාස 12ක කාලය තුළ මූල්‍ය පද්ධති ස්ථාවරත්වයට අහිතකර ලෙස බලපෑ හැකි ආර්ථිකයේ වර්ධනයන් මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව (Financial System Oversight Committee) විසින් ඇගයීමට ලක් කරන ලදී. මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව විසින් මෙම කාලසීමාව තුළ රැස්වීම් පහක් පවත්වන ලද අතර, එහි දී මූල්‍ය පද්ධති ස්ථායීතාවට අදාළ පුළුල් පරාසයක කරුණු සාකච්ඡා කරන ලදී. මෙම සාකච්ඡා මගින් මූල්‍ය පද්ධතිය තුළ ඇති අවදානම් සහ දුර්වලතා පිළිබඳව කමිටුවේ අධීක්ෂණයට ලක් වූ අතර, සලකා බලනු ලබන කාලසීමාව තුළ මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව විසින් නිර්දේශ නිකුත් කරනු නොලැබීය.

තවද, රක්ෂණ අංශයේ වර්ධනයන් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම සඳහා සලකා බලන ලද කාලසීමාව තුළ මහ බැංකුව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (Insurance Regulatory Commission of Sri Lanka) අතර ගිවිසුමකට අත්සන් තබන ලදී. සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස මහ බැංකුව, සිය සාර්ව විචක්ෂණ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කරගැනීම සහතික කිරීම සඳහා, මූල්‍ය අංශයේ අදාළ නියාමන ආයතන සමඟ ඵලදායී සහයෝගීතාවක් පවත්වා ගෙන යෑම අවශ්‍ය වේ. ඒ අනුව, මෙම ගිවිසුම මූල්‍ය අංශය තුළ පවතින පද්ධතිමය අවදානම් තක්සේරු කිරීමට අදාළ තොරතුරු සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම මගින්, මහ බැංකුවේ සාර්ව විචක්ෂණ අධීක්ෂණය සහ ප්‍රතිපත්ති සම්පාදනය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

5.10 තිරසර මූල්‍ය පිළිබඳ ප්‍රතිපත්ති

වසර තුළ, මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ තිරසර මූල්‍යකරණය වැඩිදියුණු කිරීම සඳහා පුළුල් වැඩපිළිවෙලක් ඇතුළත් තිරසර මූල්‍ය පෙරදැක්ම 2.0 ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කළ අතර, මූල්‍ය අංශය සඳහා දේශගුණයට අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කුසලතා සංවර්ධනය කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් සමඟ ද සම්බන්ධ වෙමින් කටයුතු කරන ලදී. තිරසර මූල්‍ය පෙරදැක්ම 2.0 ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ වන ප්‍රධාන මුලපිරීමක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ (International Finance Corporation) සහයෝගය ඇතිව තිරසර මූල්‍ය වර්ගීකරණය (Sustainable Finance Taxonomy) සකස් කිරීමේ කටයුතුවල ප්‍රගතියක් ලබා ඇති අතර, එය 2027 වසරේ මුල් භාගයේ දී දියත් කිරීමට අපේක්ෂා කරයි. මෙම යාවත්කාලීන කරන ලද වර්ගීකරණය මගින් උපායමාර්ගික ප්‍රමුඛතාවලට අනුකූලව සහ තිරසර මූල්‍ය පෙරදැක්ම 2.0 යටතේ ආවරණය කිරීමට අපේක්ෂිත අංශවලට අදාළව තිරසර ආර්ථික ක්‍රියාකාරකම්වල විෂය පථය පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ. යුරෝපා සංගමයේ හරිත ප්‍රතිසාධන පහසුකම (Green Recovery Facility) යටතේ ලබා දුන් තාක්ෂණික සහාය ඇතිව, දැනට ක්‍රියාත්මක හරිත මූල්‍ය වර්ගීකරණය දියත් කිරීම සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීමේ සහ දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ ක්‍රියාකාරකම් මාලාවක් පවත්වන ලදී. දේශගුණික අවදානම් ඉහළ ගොස් ඇති පසුබිමක් තුළ, දේශගුණයට අදාළ ප්‍රතිපත්ති සහ සම්මත ක්‍රියාමාර්ග දේශීය සන්දර්භය තුළ වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව දේශීය හා ජාත්‍යන්තර සංසඳ සමඟ එක්ව කටයුතු කළේය. වසර තුළ සිදු කරන ලද මෙම සම්බන්ධීකරණයන්ට, රාජ්‍ය අංශයේ ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීම මෙන්ම, මූල්‍ය අංශයේ නියාමකයින්, මූල්‍ය ආයතන සහ කාර්මික සංගම් ඇතුළු මූල්‍ය අංශයේ පාර්ශ්වකරුවන් සමඟ පැවති සාකච්ඡා ද ඇතුළත් විය. අදාළ ක්ෂේත්‍රයේ කටයුතු කරන ආයතනික අංශයේ වාණිජ මණ්ඩල සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් ආරම්භ කරන ලද විවිධ ප්‍රතිපත්ති සාකච්ඡා සහ පාර්ශ්වකරුවන්ගේ උපදේශන සඳහා ද මහ බැංකුව සහභාගී විය. තවද, 2026 වසර තුළ දේශගුණය සහ තිරසරභාවය පිළිබඳ ජාත්‍යන්තර දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන් වෙත මහ බැංකුව සහභාගී වූ අතර, සාමාජික රටක් ලෙස තිරසර මූල්‍යය සඳහා වන ජාත්‍යන්තර වේදිකාව (International Platform for Sustainable Finance), තිරසර බැංකුකරණය සහ මූල්‍ය ජාලය (Sustainable Banking and Finance Network) සහ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන සන්ධානය වැනි ගෝලීය සහයෝගීතා ජාල වෙත ද දායකත්වය ලබා දෙන ලදී.

මූල්‍ය අංශය සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ප්‍රතිපත්ති වෙනස්කම් සහ නියාමන ක්‍රියාමාර්ග[1]

සාර්ව විවක්ෂණ අධීක්ෂණය

2025 නොවැම්බර් 07	මෝටර් රථවාහන මිලදී ගැනීම හෝ පරිහරණය කිරීම සඳහා ලබා දී ඇති ණය පහසුකම් සඳහා අදාළ වන උපරිම වටිනාකම් මත ණය අනුපාත සංශෝධනය කරමින් මහ බැංකු පනතේ 105(1) වගන්තිය යටතේ බලපත්‍රලාභී බැංකු, මුදල් සමාගම් සහ ලියාපදිංචි මූල්‍ය කල්බදු ආයතන වෙත "මෝටර් රථවාහන සම්බන්ධයෙන් ලබා දෙන ණය පහසුකම් සඳහා වන වටිනාකම් මත ණය අනුපාත" පිළිබඳ 2025 අංක 03 දරන මහ බැංකු පනතේ විධානය නිකුත් කරන ලදී. ඒ අනුව, මෙම විධානය නිකුත් කිරීමත් සමග 2025 අංක 02 දරන මහ බැංකු පනතේ විධාන අවලංගු කරන ලදී.
2026 මැයි 24	මෝටර් රථවාහන මිලදී ගැනීම හෝ පරිහරණය කිරීම සඳහා ලබා දී ඇති ණය පහසුකම් සඳහා අදාළ වන උපරිම වටිනාකම් මත ණය අනුපාත සංශෝධනය කරමින් මහ බැංකු පනතේ 105(1) වගන්තිය යටතේ බලපත්‍රලාභී බැංකු, මුදල් සමාගම් සහ ලියාපදිංචි මූල්‍ය කල්බදු ආයතන වෙත "මෝටර් රථවාහන සම්බන්ධයෙන් ලබා දෙන ණය පහසුකම් සඳහා වන වටිනාකම් මත ණය අනුපාත" පිළිබඳ 2026 අංක 01 දරන මහ බැංකු පනතේ විධානය නිකුත් කරන ලදී. ඒ අනුව, මෙම විධානය නිකුත් කිරීමත් සමග 2025 අංක 03 දරන මහ බැංකු පනතේ විධාන අවලංගු කරන ලදී.
	රන් ඇපකරයක් මගින් සුරක්ෂිත ණය පහසුකම් සඳහා අදාළ වන උපරිම වටිනාකම මත ණය අනුපාතය හඳුන්වා දෙමින් මහ බැංකු පනතේ 105(1) වගන්තිය යටතේ "රන් ඇපකර මගින් සුරක්ෂිත ණය පහසුකම් සඳහා වටිනාකම් මත ණය අනුපාතය" පිළිබඳ 2026 අංක 02 දරන මහ බැංකු පනතේ විධානය බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී.

මූල්‍ය ආයතන

බලපත්‍රලාභී බැංකු

2025 ජූලි 17	රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රජය සතු ව්‍යවසායන් වෙනුවෙන් බලපත්‍රලාභී බැංකු විසින් ණයවර ලිපි විවෘත කිරීමේදී, ශ්‍රී ලංකා රජයේ මූල්‍ය ප්‍රකාශනවල එවැනි බැඳීම් හෙළිදරව් කිරීමට යටත්ව, අයවැය ප්‍රතිපාදන සහ කාලීන පියවීම් සහතික කරමින් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාරගැනීමේ ලිපි, අනුමත සුරැකුම්පත් ලෙස දක්වමින්, "බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්ව සඳහා ලබා දී ඇති අනුග්‍රහයන් සඳහා වන අනුමත සුරැකුම්පත්" යන 2024 අංක 04 දරන බැංකු පනත් නිර්ණයට සංශෝධනයක් නිකුත් කරන ලදී.
2025 සැප්තැම්බර් 17	බලපත්‍රලාභී බැංකුවල ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීමේ අරමුණින් 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ, බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රතිසාධන සැලසුම් සකස් කළ යුතු බව දන්වමින් බැංකු (විශේෂ විධිවිධාන) පනත් නියෝගයන් නිකුත් කරන ලදී. ඒ අනුව, මේ සම්බන්ධයෙන් මීට ඉහත දී පැවති බැංකු පනත් විධාන අවලංගු කරන ලදී.
2025 දෙසැම්බර් 02	ජංගම බැංකු ඒකකවල කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පූර්ව අනුමැතිය ලබාගැනීම සම්බන්ධයෙන් 2024 අංක 03 දරන "බලපත්‍රලාභී වාණිජ බැංකුවල ජංගම බැංකු ඒකක පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ" යන චක්‍රලේඛය සංශෝධනය කරන ලදී.
2025 දෙසැම්බර් 05	මෑත කාලීන සුළිසුළං සහ ගංවතුර ආපදා තත්ත්වයන් හේතුවෙන් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට ඇති වූ අහිතකර බලපෑම් සැලකිල්ලට ගනිමින්, බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන්ට ඵලදායී ලෙස සහන සැලසීමේ අවශ්‍යතාව සලකා බලමින්, "මෑත කාලීන සුළිසුළං සහ ගංවතුර හේතුවෙන් ඇතිවූ ආපදා තත්ත්වයන්ගෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හා ව්‍යාපාර සඳහා සහන සැලසීම" යන චක්‍රලේඛය නිකුත් කරන ලදී. එමගින්, තම ආදායම හෝ ව්‍යාපාර කටයුතු වලට සෘජු බලපෑම් සිදු වූ පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා සහන සලසන ලෙස සියලුම බලපත්‍රලාභී බැංකුවලින් ඉල්ලා සිටින ලදී.
2025 දෙසැම්බර් 10	2026 වසර සඳහා අදාළ වන සංශෝධිත බලපත්‍ර ගාස්තු ව්‍යුහය දක්වමින් "වාර්ෂික බලපත්‍ර ගාස්තු" යන බැංකු පනත් නිර්ණය නිකුත් කරන ලදී.

1 මේ සඳහා 2025 වසරේ ජූලි 01 වැනි දින සිට 2026 වසරේ ජූලි 31 වැනි දින දක්වා ක්‍රියාත්මක කරන ලද මූල්‍ය අංශයේ ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

2026 මාර්තු 25	නව ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ ඩිජිටල්කරණය කරන ලද ව්‍යාපාර ක්‍රියාවලීන් හා මෙහෙයුම්වල දියුණුව හේතුවෙන් බැංකු අංශයේ ඇති වී තිබෙන දියුණුව සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සම්බන්ධව බාහිර සේවා ලබා ගැනීම සඳහා වඩාත් ශක්තිමත් සහ විචක්ෂණශීලි රාමුවක් අනුගමනය කිරීම තහවුරු කිරීමේ අරමුණින් "බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර මෙහෙයුම් බාහිරින් ලබා ගැනීම" පිළිබඳ බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.
2026 මැයි 27	රන් සුරැකුම් මත පදනම් වූ නිරාවරණයන්ට අදාළ වන අවදානම මත බර තැබීම් සංශෝධනය කරමින්, 2016 අංක 01 දරන "බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා" පිළිබඳ විධානය සංශෝධනය කරන ලදී.

මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්

2025 ජූලි 04	නේෂන් ලංකා ෆිනෑන්ස් පී එල් සී ආයතනය අබණ්ඩ ව 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන කඩ කිරීම/පටහැනිව කටයුතු කිරීම සිදු කරන ලදී. එබැවින්, නව තැන්පතු ද ඇතුළු ව කුමන ආකාරයෙන් හෝ මහජන අරමුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් සීමා පනවන ලදී. තව ද, 2025 ජූලි 04 වන දින සිට බලපැවැත්වෙන පරිදි, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන යටතේ නියාමන ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. ඒ අනුව සමාගම සඳහා අද්මිනිස්ත්‍රාසිවරයෙකු පත් කරන ලදී.
2025 ජූලි 05	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරගෙන යනු ලබන විමර්ශන කටයුතු තව දුරටත් සිදුකරගෙන යාම සඳහා, ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි ප්‍රකාරව, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2025 ජූලි 05 වන දා සිට බලපැවැත්වෙන වන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා, තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදී.
2025 අගෝස්තු 20	බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල ක්‍රියාකාරකම්හි ස්වභාවය, පරිමාව සහ සංකීර්ණත්වයට අනුකූල වන පරිදි ණය අවදානම් හඳුනාගැනීම, මැනීම, නිරීක්ෂණය සහ පාලනය සඳහා ණය අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීමට බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වලට නියෝග කරමින් බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සඳහා "ණය අවදානම් කළමනාකරණය" පිළිබඳ විධානයක් නිකුත් කරන ලදී.
2025 සැප්තැම්බර් 16	ඇතිවිය හැකි අවදානම් සහ අනපේක්ෂිත අලාභ අවශෝෂණය කරගැනීම සඳහා මූල්‍ය ස්වාරක්ෂකයක් සැපයීම මගින් ප්‍රාථමික අලෙවිකාර සමාගම් අංශයේ ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීම උදෙසා "ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා" පිළිබඳ විධානය නිකුත් කරන ලදී.
2025 නොවැම්බර් 07	ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ උපායමාර්ගයක්, ප්‍රතිපත්ති සහ ක්‍රමවේද, පාලන ව්‍යුහයක් සහ ද්‍රවශීලතා අවදානම් හඳුනාගැනීමට, පරිමානය කිරීමට, නිරීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට, පාලනයට සහ අවම කිරීම සඳහා වන ඵලදායී ක්‍රියාවලියක් සකස් කිරීම හරහා මුදල් සමාගම්වල කඩිනම් ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කරන ලෙස නියම කරමින් "ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය" පිළිබඳ විධානය නිකුත් කරන ලදී.
	මුදල් ව්‍යාපාර පනත සඳහා යෝජිත සංශෝධන පිළිබඳ පොදු ජනතාවගේ සහ පාර්ශ්වකරුවන්ගේ, නිරීක්ෂණ, අදහස් සහ යෝජනා ලබා ගැනීම උදෙසා මහජන අදහස් විමසීම සඳහා යොමු කරන ලදී[2].
2026 ජනවාරි 05	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරගෙන යනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදුකරගෙන යාම සඳහා, ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි ප්‍රකාරව, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2026 ජනවාරි 05 වන දා සිට බලපැවැත්වෙන වන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදී.
2026 ජනවාරි 09	මෑත කාලීන ව ඇති වූ දිට්වා සුළිකුණාටුව සහ ගංවතුර ආපදා තත්ත්වයන් හේතුවෙන් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට ඇති වූ අහිතකර බලපෑම් සැලකිල්ලට ගනිමින් සහ බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ට ඵලදායී ලෙස සහන සැලසීමේ අවශ්‍යතාව සලකා බලමින්, තම ආදායම හෝ ව්‍යාපාරවලට ඍජු බලපෑම් සිදු වූ පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා සහන සලසන ලෙස සියලුම මුදල් සමාගම් වෙතින් ඉල්ලා සිටිමින්, "මෑත කාලීන සුළිකුණාටු සහ ගංවතුර ආපදා හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා සහන සැලසීම" පිළිබඳ චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2026 ජනවාරි 12	මුදල් සමාගම් විසින් තැන්පතු සහ ණය උපකරණ සඳහා පිරිනැමිය හැකි උපරිම පොලී අනුපාතිකයන් සංශෝධනය කිරීම සඳහා විධානයක් නිකුත් කරන ලදී.

2 පොදු ජනතාවගේ සහ පාර්ශ්වකරුවන්ගේ නිරීක්ෂණ, අදහස් සහ යෝජනා මුදල් ව්‍යාපාර පනතේ යෝජිත සංශෝධනයන්ට නිසි පරිදි ඇතුළත් කරන ලදී. මේ වන විට මෙම සංශෝධනයන්ට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ.

2026 පෙබරවාරි 16	මුදල් සමාගම් විසින් දැඩි ආතති තත්ත්වයන්හී දී ඇති විය හැකි මූල්‍ය බලපෑම් කල් ඇතුව හඳුනා ගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීම මගින් මුදල් සමාගම්හි මෙහෙයුම් කටයුතුවල ස්ථායීතාව හා අඛණ්ඩතාව සුරක්ෂිත කිරීම සහ මුදල් සමාගම් බිඳ වැටීම සහ නිරාකරණය කිරීමට සිදුවන අවස්ථාවන් වැළැක්වීම සඳහා ඵලදායී සහ විස්තීර්ණ ප්‍රතිසාධන සැලසුම් සකස් කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම නියම කරමින් "මුදල් සමාගම් සඳහා ප්‍රතිසාධන සැලසුම්" පිළිබඳ විධානය නිකුත් කරන ලදී.
2026 මාර්තු 17	අපරාධකරුවන් හෝ ඔවුන්ගේ ආශ්‍රිතයන් මුදල් සමාගම්වල සැලකිය යුතු හෝ පාලන අයිතියක් පවත්වාගෙන යාම (හෝ අර්ථලාභී අයිතිකරු/අයිතිකරුවන් වීම) වැළැක්වීම සඳහා සහ මුදල් සමාගම්වල හිමිකාරිත්වය සහ පාලන ව්‍යුහයන්ගේ විනිවිදභාවය තහවුරු කර ගැනීම සඳහා, මුදල් සමාගම්වල අර්ථලාභී අයිතිකරු/අයිතිකරුවන් පිළිබඳ ප්‍රමාණවත්, නිවැරදි සහ යාවත්කාලීන තොරතුරු හඳුනා ගැනීම සහ පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය කරමින් "මුදල් සමාගම්වල අර්ථලාභී අයිතිකරුවන් තක්සේරු කිරීම" පිළිබඳ විධානය නිකුත් කරන ලදී.
2026 මැයි 27	මුදල් සමාගම්වල ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතා තීරණය කිරීමේ අරමුණින්, රන් ඇප මත ලබාදෙන පුද්ගලික ණය පහසුකම සඳහා අදාළ වන ණය අවදානම මත අවදානම් බරිත වත්කම් ප්‍රමාණය ගණනය කිරීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම සඳහා විධානයක් නිකුත් කරන ලදී.
2026 ජුනි 10	2010 අංක 02 දරන මූල්‍ය කල්බදු (වාර්තා කිරීමේ අවශ්‍යතා) විධානය සමඟ අනුගත වීමට අඛණ්ඩ ව අසමත්වීම, බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සඳහා වන ප්‍රධාන සැලැස්ම මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවනු ලැබ ඇති අවශ්‍යතා සපුරාලීම සඳහා වරින් වර කාලසීමා දීර්ඝ කිරීම් කිහිපයක් ලබා දී තිබියදීත් එම ඒකාබද්ධ කිරීමේ සැලැස්මට අනුකූල වීමට අපොහොසත් වීම සහ සිය ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවල තිරසාරභාවය සහතික කිරීම සඳහා සුදුසු සැලැස්මක් සකස් කිරීමට අපොහොසත් වීම හේතුවෙන්, 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු (සංශෝධිත) පනතේ 9(1)(ඊ) වගන්තිය ප්‍රකාරව, 2026 ජුනි 10 වන දා සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ් ආයතනයේ ලියාපදිංචිය අවලංගු කරන ලදී.
2026 ජූලි 03	නේෂන් ලංකා ෆිනෑන්ස් පී එල් සී ආයතනයේ මූල්‍ය තත්ත්වයෙහි අඛණ්ඩ පිරිහීම සහ එම තත්ත්වයෙහි සමාගම තවදුරටත් ක්‍රියාත්මක වීම තැන්පත්කරුවන් සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ට තවදුරටත් අහිතකර ලෙස බලපානු ඇති බව සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව, නේෂන් ලංකා ෆිනෑන්ස් පී එල් සී ආයතනය වෙත මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කර තිබූ බලපත්‍රය බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 66 (2) වගන්තිය ප්‍රකාරව, 2026 ජූලි 03 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව බැංකු (විශේෂ විධිවිධාන) පනතේ V කොටසේ ප්‍රතිපාදන ප්‍රකාරව සමාගම ගණන් බේරා වසා දැමීමට කටයුතු කිරීමටත් තීරණය කරන ලදී.
2026 ජූලි 05	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරගෙන යනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදුකරගෙන යාම සඳහා, ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි ප්‍රකාරව, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා පනවා තිබූ අත්හිටුවීම, 2026 ජූලි 05 වන දා සිට බලපැවැත්වෙන වන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

රක්ෂණ[3]

2025 ජූලි 21	"තිරසර සංවර්ධන අරමුණු, පාරිසරික, සමාජයීය සහ පාලන මූලධර්ම සහ තිරසර මූල්‍ය මුලපිරීම් යන මූලික අංග රක්ෂණ ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වූ රාමුවක් ස්ථාපිත කිරීම" පිළිබඳ මාර්ගෝපදේශ රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී.
2025 ජූලි 25	"මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ වැඩසටහන" පිළිබඳ මාර්ගෝපදේශ, රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත නිකුත් කරන ලදී.
2025 අගෝස්තු 15	2019.07.24 දින නිකුත් කරන ලද අංක 19 දරන විධානය සහ 2020.06.03 දින නිකුත් කරන ලද අංක 19 (සංශෝධිත) දරන විධානය සංශෝධනය කරමින්, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතෙහි 96(අ) වගන්තියට අනුව, "රක්ෂණ තැරැව්කරුවන් විසින් අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුකූල වීම" පිළිබඳ 2025 අංක 03 දරන විධානය රක්ෂණ තැරැව්කරුවන් වෙත නිකුත් කරන ලදී.
2025 සැප්තැම්බර් 01	"මෝටර් රථ අනතුරුවල තෙවන පාර්ශ්වීය වින්දිතයන් සඳහා මරණය හෝ ස්ථිර ආබාධිතභාවය සඳහා වන විකල්ප වන්දි යෝජනා ක්‍රමය" පිළිබඳ 2025 අංක 01 දරන චක්‍රලේඛය, සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී.
2025 ඔක්තෝබර් 12	රක්ෂණ නිෂ්පාදන සැලසුම් කිරීමේ සිට වන්දි හිමිකම් පියවීම දක්වා වූ රක්ෂණ ක්‍රියාවලිය පුරාම රක්ෂණ ඔප්පු හිමියන්ට සාධාරණ ලෙස සැලකීම තහවුරු කිරීම සඳහා රක්ෂණකරුවන් විසින් අනුගමනය කළ යුතු අවම ප්‍රමිතීන් ස්ථාපිත කිරීම පිණිස, "රක්ෂණකරුවන්ගේ වෙළඳපොළ හැසිරීම" පිළිබඳ මාර්ගෝපදේශ රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී.

3 ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ගන්නා ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වේ.

2025 ඔක්තෝබර් 28	රක්ෂණ ඔප්පු හිමියන්ගේ අභිලාෂ සුරක්ෂිත කිරීමේ අරමුණින්, ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ඔප්පුවලට අදාළ ලේඛනවල ප්‍රධාන කරුණු සරල භාෂාවෙන් අඩංගු රක්ෂණ නිෂ්පාදන තොරතුරු ලේඛනයක් සකස් කිරීම සඳහා වන රාමුවක් ස්ථාපිත කරමින්, "රක්ෂණ නිෂ්පාදන තොරතුරු ලේඛනය" පිළිබඳ 2025 අංක 04 දරන විධානය ක්ෂේත්‍රය වෙත නිකුත් කරන ලදී.
2025 ඔක්තෝබර් 30	2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2019 අංක 01 දරන රක්ෂණකරුවන්ගේ (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම) නීති, රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව, නීති ක්‍රියාත්මක කිරීමේ පියවර කාර්යක්ෂම, සමානුපාතිකව, අධෛර්යවත් කරවන, අබණ්ඩ සහ කාලෝචිත බව තහවුරු කිරීම සඳහා, "මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමේ රීතිවලට අනුකූල නොවන ආයතන සඳහා බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග" පිළිබඳ 2025 අංක 02 දරන චක්‍රලේඛය ක්ෂේත්‍රය වෙත නිකුත් කරන ලදී.
2025 නොවැම්බර් 17	2023.09.09 දිනැති 2023 අංක 01 දරන චක්‍රලේඛයේ විධිවිධාන සංශෝධනය කරමින් සහ සාමාන්‍ය රක්ෂණ ප්‍රතිපත්ති සඳහා වාරික ගෙවීම සම්බන්ධයෙන් වන අවශ්‍යතා නියම කරමින්, "සාමාන්‍ය රක්ෂණ ඔප්පුවල වාරික ගෙවීම" පිළිබඳ 2025 අංක 03 දරන චක්‍රලේඛය සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී.
2025 දෙසැම්බර් 05	රක්ෂණලාභීන්ට සහ අපේක්ෂිත රක්ෂණලාභීන්ට නිකුත් කරනු ලබන සියලුම ලේඛනවල, මූලික වාරිකය, වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් රක්ෂණාවරණ වාරිකය, අමතර ආවරණ හෝ අනුමත කිරීම් සඳහා වන වාරික මෙන්ම, රක්ෂණ ඔප්පුව සඳහා අදාළ වන අනෙකුත් සියලුම ඔප්පු ගාස්තු වර්ග (ස්ථාවර සහ විචල්‍ය ගාස්තු වර්ග ඇතුළුව) යන සියලුම වාරික වර්ග වෙන වෙනම හෙළිදරව් කිරීම සඳහා, "වාරික සහ අනෙකුත් ගාස්තු හෙළිදරව් කිරීම" පිළිබඳ 2025 අංක 05 දරන විධානය සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී.
2025 දෙසැම්බර් 08	2024 සහ 2025 මූල්‍ය වර්ෂ සඳහා මෙතෙක් ප්‍රකාශයට පත් නොකළ හෝ බෙදා හැර නොමැති ලාභාංශ කිසිවක් ප්‍රකාශයට පත් කිරීමෙන් හෝ බෙදා හැරීමෙන් වැළකී සිටින ලෙස නියම කරමින් සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත "දිට්වා සුළි කුණාටුව" පිළිබඳ 2025 අංක 06 දරන විධානය නිකුත් කරන ලදී. දිට්වා සුළි කුණාටුව හේතුවෙන් උද්ගතව ඇති ජාතික තත්ත්වය හමුවේ, රක්ෂණකරුවන් තම අවදානම් නිරාවරණයේ පූර්ණ අවදානම මෙතෙක් සම්පූර්ණයෙන් තක්සේරු කර නොමැති බැවින් මෙම පියවර ක්‍රියාත්මක කරන ලදී.
	"සාමාන්‍ය රක්ෂණ ප්‍රතිපත්ති සඳහා වාරික ගෙවීමේ අවශ්‍යතා" පිළිබඳ 2025 අංක 03 දරන චක්‍රලේඛයේ දක්වා ඇති කාලසීමාවන් දීර්ඝ කරමින්, "සාමාන්‍ය රක්ෂණ ඔප්පු සඳහා වාරික ගෙවීම" පිළිබඳ 2025 අංක 04 දරන චක්‍රලේඛය සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී.
2026 ජනවාරි 12	රක්ෂණකරුවකුගේ හෝ රක්ෂණ තැරැව්කරුවකුගේ ප්‍රධාන නිලධාරියා සමාගමේ ඉහළ ම ශ්‍රේණියේ විධායක නිළධාරියා විය යුතු බව සහ එම ව්‍යාපාරවල සමස්ත කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමඟ කරන සියලුම සන්නිවේදන කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කිරීම තහවුරු කිරීම සඳහා වගකිව යුතු බවත් නියම කරමින්, "රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ප්‍රධාන නිලධාරීන්" පිළිබඳ 2026 අංක 01 දරන විධානය ක්ෂේත්‍රය වෙත නිකුත් කරන ලදී.
2026 පෙබරවාරි 20	විනිවිදභාවය තහවුරු කිරීම සහ නොමඟ යවන සුළු තොරතුරුවලින් මහජනතාව ආරක්ෂා කිරීම සඳහා සියලුම රක්ෂණ ආශ්‍රිත දැන්වීම් සම්බන්ධයෙන් අනිවාර්ය ප්‍රමිතීන් ස්ථාපනය කරමින්, "දැන්වීම්" පිළිබඳ 2026 අංක 02 දරන විධානය ක්ෂේත්‍රය වෙත නිකුත් කරන ලදී.
2026 මාර්තු 03	මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩපැවැත්වීම සඳහා අනුගත වීමට අපොහොසත් වන රක්ෂණකරුවන් සහ රක්ෂණ තැරැව්කරුවන් සඳහා අවදානම පදනම් බලාත්මක කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කරමින්, "මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩපැවැත්වීම සඳහා අනුගත නොවීම සඳහා බලාත්මක කිරීමේ ක්‍රමවේදය" පිළිබඳ 2026 අංක 01 දරන චක්‍රලේඛය ක්ෂේත්‍රය වෙත නිකුත් කරන ලදී.
2026 මාර්තු 11	රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, පාලන කටයුතුවල නියැලෙන ප්‍රධාන පුද්ගලයින් සහ ප්‍රතිලාභී හිමිකරුවන් යන අයගේ සුදුසුකම්, නිපුණතාවය, අඛණ්ඩතාව සහ මූල්‍ය ශක්තිමත්භාවය පිළිබඳ ව අඛණ්ඩ ව ඇගයීම් සිදු කිරීම මගින් තහවුරු කර ගැනීමටත්, අදාළ වෙනස්කම් හෝ පත්වීම් සිදු කර වැඩ කරන දින 14ක් ඇතුළත හෝ යම් පුද්ගලයෙකුගේ යෝග්‍යතාවයට සැලකිය යුතු ලෙස බලපෑ හැකි තත්ත්වයන් මතු වූ විට වාර්ෂිකව අභ්‍යන්තර ස්වයංතක්සේරු වාර්තා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමටත් රක්ෂණකරුවන් වෙත නියම කරමින්, "රක්ෂණකරුවන්ගේ පුද්ගලයින්ගේ යෝග්‍යතාවය" සම්බන්ධ 2026 අංක 03 දරන විධානය නිකුත් කරන ලදී.
2026 මාර්තු 31	සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියැලී සිටින, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සහ බැංකු, මුදල් සමාගම් සහ කල්බදු සමාගම් අතර අන්තර් ක්‍රියාකාරීත්වය නියාමනය කරමින්, "බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ බලපත්‍රලාභී කල්බදු සමාගම්" සම්බන්ධ 2026 අංක 04 දරන විධානය ක්ෂේත්‍රය වෙත නිකුත් කරන ලදී.
	මෝටර් රථ රක්ෂණ ආවරණය ආරම්භ වන දින සිට රක්ෂණ වාරික ගෙවීම සඳහා දින 30ක ණය කාලසීමාවක් ලබා දීමට සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත අවසර ලබා දෙමින්, "මෝටර් රථවාහන රක්ෂණ ප්‍රතිපත්ති සඳහා වාරික ගෙවීම" පිළිබඳ 2026 අංක 05 දරන විධානය සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී.

2026 අප්‍රේල් 02	ජාතික ඩිජිටල්කරණ මූලපිරීම් සහ මහජන ආරක්ෂාව ශක්තිමත් කිරීම සමඟ අනුකූල වෙමින් මෝටර් රථවාහන රක්ෂණ නවීකරණය කිරීමේ ප්‍රයත්නයන්හි කොටසක් ලෙස, 2026 වසරේ මැයි 01 වන දින සිට බලාත්මක වන පරිදි රක්ෂණ ඔප්පු හිමිකරුවන්ට ඩිජිටල් මෝටර් රථවාහන රක්ෂණ කාඩ්පත් පමණක් නිකුත් කිරීමට නියෝග කරමින් සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත 2026 අංක 06 දරන විධානය නිකුත් කරන ලදී.
2026 අප්‍රේල් 10	කිසිඳු ආකාරයක වෙනස්කමකින් තොරව තමන් කැමති ඕනෑම තැරැව්කරුවෙකු හෝ රක්ෂණ නියෝජිතයෙකු තෝරා ගැනීමට රක්ෂණලාභියාට ඇති අයිතිය සුරක්ෂිත කරමින්, බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ බලපත්‍රලාභී කල්බදු සමාගම් මගින් ජනනය කරනු ලබන රක්ෂණ යොමු කිරීම් ලියාපදිංචි රක්ෂණ තැරැව්කරුවන් හරහා පමණක් භාරගත යුතු බව රක්ෂණ සමාගම්වලට නියෝග කරමින්, 2026 අංක 04 දරන විධානය ක්ෂේත්‍රය වෙත නිකුත් කරන ලදී.
2026 අප්‍රේල් 17	මෝටර් රථ රක්ෂණ ප්‍රතිපත්ති යටතේ රක්ෂණය කරනු ලබන පුද්ගලයන්ට සම්පූර්ණ වාරිකය ගෙවීම සඳහා ප්‍රතිපත්තිය ආරම්භ වන දින සිට දින 30ක් දක්වා වූ ණය කාලසීමාවක් ලබා දිය හැකි බව දන්වමින්, 2026 අංක 05 දරන විධානය සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී.
2026 මැයි 06	වාර්ෂික ප්‍රතිලාභවල නියාමන වාර්තාකරණ ආකෘතිවල සාමාන්‍ය රක්ෂණ/ දිගු කාලීන රක්ෂණ සඳහා වන අනුකූලතා සහතිකය (ආ) සංශෝධනය කරමින්, 14 වන නිර්ණය සඳහා කරන ලද සංශෝධන රක්ෂණ සමාගම් වෙත යොමු කරන ලදී.
2026 මැයි 07	ප්‍රධාන නිලධාරීන් සඳහා අදාළ වන අවශ්‍යතා සංශෝධනය කරමින් සහ 2026 අංක 01 දරන විධානයේ 3 වන අයිතමය ප්‍රතිස්ථාපනය කරමින්, 2026 අංක 07 දරන විධානය ක්ෂේත්‍රය වෙත නිකුත් කරන ලදී.
	කාර්තුමය ප්‍රතිලාභවල නියාමන වාර්තාකරණ ආකෘතිවල අනුකූලතා සහතිකය (ආ) සංශෝධනය කරමින්, 12 වන නිර්ණය සඳහා කරන ලද සංශෝධන රක්ෂණ සමාගම් වෙත යොමු කරන ලදී.
2026 ජූනි 01	විදේශීය ප්‍රතිරක්ෂණ තැරැව්කරුවන්ට සිය බලප්‍රදේශවල සිටම රක්ෂණකරුවන් හෝ තැරැව්කරුවන් සඳහා ප්‍රතිරක්ෂණ ව්‍යාපාර සෘජුවම යෙදවිය හැකි බවත්, ශ්‍රී ලංකාව තුළ ටෙන්ඩර් හෝ ලංසු කැඳවීමේ රැස්වීම්වලට හුදෙක් සහභාගීවීම ශ්‍රී ලංකාව තුළ තැරැව්කාර ව්‍යාපාරයක් සිදු කිරීමක් ලෙස නොසැලකෙන බවත් පැහැදිලි කරමින්, "ප්‍රතිරක්ෂණ ව්‍යාපාර පිහිටුවීම" පිළිබඳ සංශෝධිත නියමයන් සහ කොන්දේසි රක්ෂණ ක්ෂේත්‍රය වෙත නිකුත් කරන ලදී.

මූල්‍ය වෙළඳපොළ

මුදල් වෙළඳපොළ

2026 මාර්තු 24	2026 අංක 01 දරන "සංචිත අවශ්‍යතා" පිළිබඳ රීති, අංක 2481/09 දරන ගැසට් (අති විශෙෂ) නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.
2026 මාර්තු 27	ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පවත්වාගෙන යා යුතු සංචිත අවශ්‍යතාව (අවශ්‍ය සංචිත) ගණනය කිරීම සහ පවත්වාගෙන යෑම සම්බන්ධයෙන්, 2026 අංක 01 දරන "සංචිත අවශ්‍යතාව සඳහා වූ මෙහෙයුම් උපදෙස්" චක්‍රලේඛය බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලදී.

ප්‍රාග්ධන වෙළඳපොළ[4]

2026 ජනවාරි	පිළිගත් ඉරියා විද්වතුන්ගේ සංචිතය පුළුල් කිරීම, සුකුක් (Sukuk) නිෂ්පාදන සහ සුදු ලැයිස්තුගත දර්ශක (Whitelist Indices) ප්‍රකාශයට පත් කිරීමට පෙර ඒවා සහතික කිරීම සඳහා අවශ්‍ය ඉරියා විද්වතුන් සංඛ්‍යාව තුනෙහි සිට දෙකක් දක්වා අඩු කිරීම, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අදාළ මාර්ගෝපදේශ සංශෝධනය කිරීම සහ අදාළ විධාන නිකුත් කිරීම ඇතුළු, ඉරියා අනුකූල ණය නිෂ්පාදන සහ සුදු ලැයිස්තුගත දර්ශකවලට අදාළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී.
2026 පෙබරවාරි	කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, සුකුක් (Sukuk) නිෂ්පාදන සහ සුදු ලැයිස්තුගත කොටස් දර්ශක සඳහා ඉරියා අනුකූලතා සහතික කිරීමේ සංශෝධිත අවශ්‍යතා හඳුන්වා දෙමින් සහ පිළිගත් ඉරියා විද්වතුන් සඳහා අදාළ මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීම නියම කරමින්, කොළඹ කොටස් හුවමාරුව, වෙළෙඳපොළ ආයතන, වෙළෙඳපොළ අතරමැදියන්, සහ පිළිගත් ඉරියා විද්වතුන් වෙත විධාන නිකුත් කරන ලදී.

4 සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වේ.

2026 ජූනි	අතථ්‍ය වත්කම් (Virtual Assets) සහ අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් පිළිබඳ අනුකමිටුවෙහි සාමාජිකයන් ලෙස සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව නියෝජනය කිරීම i. මූල්‍ය කාර්යසාධක බලකායේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට සහායවීම සඳහාත් අතථ්‍ය වත්කම්වල වැඩිවන වැදගත්කම හා ඒ හා සම්බන්ධ අවස්ථා හා අවදානම් සැලකිල්ලට ගනිමින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන ජාතික සම්බන්ධීකාරක කමිටුවේ ප්‍රතිපත්ති නියාමනය යටතේ අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් පිළිබඳ අනුකමිටුවක් ස්ථාපනය කරන ලදී. ii. ඒ අනුව, අතථ්‍ය වත්කම් සහ අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සඳහා නියාමන රාමුවක් හඳුන්වාදීම සඳහා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සන්දේශයක් සකස් කරන ලදී.
	ශ්‍රී ලංකාව තුළ හරිත, සමාජීය, තිරසාරභාවය සහ තිරසාරභාවය හා සම්බන්ධිත (GSS+) මූල්‍ය මුලපිරීම් සඳහා ජාතික සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා කොමිෂන් සභාවේ එකඟතාව ලබා ගන්නා ලදී.
2026 ජූලි	ලැයිස්තුගත ආයතන සඳහා XBRL වාර්තාකරණය හඳුන්වා දීමට සහාය වීමේ අරමුණින්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් වෙළඳපොළ සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.

මූල්‍ය යටිතල පහසුකම්

ගෙවීම් සහ පියවීම්

2025 දෙසැම්බර් 23	2025 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි, 2025 අංක 01 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන රෙගුලාසි සඳහා සංශෝධන නිකුත් කරන ලදී. සංශෝධිත රෙගුලාසි මගින් මුදල් පැවරීම් සේවාවල නිරත දේශීය හා විදේශීය සපයන්නන් එම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝගයන්හි නියාමන සහ අධීක්ෂණ රාමුව යටතේ ලියාපදිංචි වීම නියම කරයි.
2026 ජනවාරි 20	ඩිජිටල් ගෙවීම් භාවිතය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, 2026 පෙබරවාරි 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි "ජස්ට්පේ" (JustPay) සඳහා අදාළ ගනුදෙනුකරුවන්ගේ ගනුදෙනු සීමාවන් සහ ගාස්තු සංශෝධනය කරන ලදී. ඒ අනුව, එක් ගනුදෙනුවක් සඳහා වන උපරිම සීමාව රු.50,000/- සිට රු.150,000/- දක්වා ඉහළ නංවන ලදී. එයට අමතරව, රු.8,001/- සිට රු.150,000/- දක්වා වටිනාකමින් යුතු ගනුදෙනු සඳහා, ගනුදෙනුකරුගෙන් අය කරනු ලබන ගාස්තුව එක් ගනුදෙනුවක් සඳහා රු.20/-ක් ලෙසත්, වෙළෙඳුන්ගෙන් අය කරනු ලබන ගාස්තුව එක් ගනුදෙනුවක් සඳහා රු.40/-ක් ලෙසත් නියම කරන ලදී.
2026 මාර්තු 13	LANKAQR කේතය භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ එහි ඵලදායී භාවිතය වැඩිදියුණු කිරීමේ අරමුණින්, රු. 5,000/- දක්වා පුද්ගලයන් අතර (P2P) සිදුවන මුදල් හුවමාරු කිරීම් සඳහා පහසුකම් සැලසෙන පරිදි, LANKAQR කේතය මත පදනම් වූ පහසුකම් පුළුල් කරන ලදී. එයට අමතරව, 2026 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි, වෙළෙඳුන් විසින් ඉදිරිපත් කරනු ලබන LANKAQR කේතය මත පදනම් වූ ගෙවීම් සඳහා අදාළ වෙළෙඳ වට්ටම් අනුපාතය (Merchant Discount Rate - MDR) සහ LANKAQR කේතය භාවිතයෙන් රු.5,000/- හෝ ඊට අඩු වටිනාකමක් සහිත පුද්ගලයන් අතර (P2P) අරමුදල් හුවමාරු කිරීම් සඳහා අදාළ ගාස්තුව ඉවත් කරන ලදී.
	2026 මාර්තු 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධතියක් ක්‍රියාත්මක කරන ආයතනයක, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සියලුම සාමාජිකයින්, මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකායේ නිර්දේශ ඇතුළු අදාළ නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීම තහවුරු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්ෂිකව ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.
2026 මැයි 25	"ලංකාපේ" (LankaPay) පුද්ගලික සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) සහ ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS) සඳහා අදාළ වූ ගෙවීම් සහ පියවීම් වගකීම් කළමනාකරණය කිරීමේ පහසුකම (Liability Manager functionality) 2026 ජූනි 01 දින සිට අත්හිටුවන ලදී. 2026 ජූනි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, තත් කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගිවන්නන් වන CEFTS සහ CAS හි සියලුම සහභාගිවන්නන් විසින් අනුකූල විය යුතු ශුද්ධ හර සීමාව (Net Debit Cap) සහ පියවීමේ ඇපකර මුදල (Settlement Guarantee Amount) මත පදනම් වූ ණය අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. මෙම යාන්ත්‍රණය මගින් CEFTS සහ CAS හා සම්බන්ධ බහුපාර්ශ්වීය ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම සහතික කිරීම අරමුණු කෙරේ.
2026 ජූනි 17	2026 ඔක්තෝබර් 01 දින සිට බලාත්මක වන පරිදි, රු.25/- ක උපරිම ගනුදෙනු ගාස්තුවකට යටත්ව, LANKAQR කේතය හරහා සිදු කෙරෙන පුද්ගලයන් අතර (P2P) මුදල් හුවමාරු කිරීම් සඳහා වන ගනුදෙනුවක උපරිම වටිනාකම රු.50,000/- දක්වා වැඩි කරන ලදී.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

2025 සැප්තැම්බර් 10	2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(1)(අ) වගන්ති යටතේ තොරතුරු වාර්තා කිරීම පිළිබඳ 2025 අංක 04 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී.
2025 සැප්තැම්බර් 11	2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(1)(අ) වගන්ති යටතේ තොරතුරු වාර්තා කිරීම පිළිබඳ 2025 අංක 05 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී.
	2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(1)(අ) වගන්ති යටතේ තොරතුරු ඉල්ලීම සම්බන්ධ 2025 අංක 06 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී.
	2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(1)(අ) වගන්ති යටතේ තොරතුරු වාර්තා කිරීම සම්බන්ධ 2025 අංක 07 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී.
2025 දෙසැම්බර් 16	"බලපත්‍රලාභී අලෙවිකරුවන් සහ පරිසීමිත අලෙවිකරුවන් සම්බන්ධ සැක කටයුතු ගනුදෙනු හඳුනා ගැනීම" පිළිබඳ 2025 අංක 03 දරන අවදානම් දර්ශක නිකුත් කරන ලදී.
2026 මාර්තු 11	"වාර්තා කරන ආයතන සඳහා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම" පිළිබඳව 2026 අංක 01 දරන අවදානම් දර්ශක නිකුත් කරන ලදී.
	නීතිය බලාත්මක කිරීමේ ආයතන සඳහා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම" පිළිබඳව 2026 අංක 02 දරන අවදානම් දර්ශක නිකුත් කරන ලදී.
2026 මාර්තු 13	මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය පිළිබඳ 2024/25 වසර සඳහා වන ජාතික අවදානම් ඇගැයීමට අනුකූලව "ආයතනික අවදානම් තක්සේරු කිරීම් සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම" පිළිබඳව 2026 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2026 මැයි 12	"වාර්තා කරන ආයතන සඳහා සමූල ඝාතක අවි සංගුනනය මූල්‍යනය" පිළිබඳ 2026 අංක 03 දරන අවදානම් දර්ශක නිකුත් කරන ලදී.
	"නියාමකයින් සහ නිසි බලධාරින් සඳහා සමූල ඝාතක අවි සංගුණනය මූල්‍යනය කිරීම" පිළිබඳ 2026 අංක 04 දරන අවදානම් දර්ශක නිකුත් කරන ලදී.
2026 මැයි 15	"විදේශිකයන් විසින් ශ්‍රී ලංකාවේ සිදුකරනු ලබන වංචාකාරී ක්‍රියාකාරකම්" පිළිබඳ 2026 අංක 5 දරන අවදානම් දර්ශක නිකුත් කරන ලදී.
2026 මැයි 22	"සම්බාධක ලත් පුද්ගලයින්ට/ආයතනවලට එරෙහිව දත්ත සමුදාය පිරික්සීම සහතික කිරීම" පිළිබඳ 2026 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2026 ජූලි 07	මූල්‍ය කාර්ය සාධක බලකාය (FATF) විසින් ඉහළ අවදානමක් සහිත බලප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇති රාජ්‍යයන් සම්බන්ධයෙන් "ප්‍රවර්ධිත නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ (EDD) ක්‍රියාමාර්ග සහ ප්‍රතිපියවර ක්‍රියාවට නැංවීම" පිළිබඳ 2026 අංක 03 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2026 ජූලි 09	මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට අනුව විශේෂ බහුතරයකින් ද, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ජන්ද විමසීමකින් තොරව සංශෝධන සහිතව සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත ජන්ද විමසීමකින් තොරව සංශෝධන රහිතව පාර්ලිමේන්තුවේදී සම්මත විය.

විදේශ විනිමය කළමනාකරණය

2025 දෙසැම්බර් 18	2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ නිකුත් කරන ලද 2025 ජුනි 20 දිනැති නියෝගය මගින් විදේශ විනිමය රටින් පිටතට ගලායාම් පිලිබඳ පනවන ලද සීමාවන් කිහිපයක් ලිහිල් කරමින්, එම පනතේ 22 වැනි වගන්තිය යටතේ නියෝගයක්, 2025 දෙසැම්බර් 18 දිනැති අංක 2467/67 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.
2026 ජනවාරි 30	භාණ්ඩ අපනයනකරුවන්ට, ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන විදේශ මුදලින් නම් කරන ලද ණය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සඳහා, ආපසු ගෙන්වා ගන්නා ලද අපනයන ආදායම භාවිතා කිරීමට අවසර දෙමින්, මහ බැංකු පනතේ විධිවිධාන යටතේ 2026 අංක 01 දරන "අපනයන ආදායම් ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" පිළිබඳ රීති නිකුත් කරන ලද අතර, 2026 ජනවාරි 03 දිනැති අංක 2473/30 දරන අති විශෙෂ ගැසට් පත්‍රය යටතේ පළ කරනලදී. පාර්ලිමේන්තු අනුමැතිය ලැබීමෙන් අනතුරුව, මෙම රීති 2026 මාර්තු 03 දින සිට බලාත්මක විය.

2026 මාර්තු 03	ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද විදේශ මුදල්වලින් නම් කරන ලද ණය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස, 2026 අංක 01 දරන "පුද්ගලික විදේශ විනිමය ගිණුම් (PFCAs)" පිළිබඳ විධාන නිකුත් කරන ලදී.
	ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද විදේශ මුදල්වලින් නම් කරන ලද ණය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස, 2026 අංක 02 දරන "ව්‍යාපාරික විදේශ විනිමය ගිණුම් (BFCAs)" පිළිබඳ විධාන නිකුත් කරන ලදී.
	ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද විදේශ මුදල්වලින් නම් කරන ලද ණය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස, 2026 මාර්තු 03 දිනැති, 2026 අංක 03 දරන "කොළඹ වරාය නගර ආයෝජන ගිණුම - ආයෝජිත (CPCIA-Investee)" පිළිබඳ විධාන නිකුත් කරන ලදී.
	ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද විදේශ මුදල්වලින් නම් කරන ලද ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් නම් කරන ලද නියෝජිතයන් විසින් සිදු කරනු ලබන ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම පිණිස, "විශේෂ විදේශ විනිමය ගිණුම - නම් කරන ලද නියෝජිත (SFCA-DA)" පිළිබඳ 2026 මාර්තු 03 දිනැති, 2026 අංක 04 දරන විධාන නිකුත් කරන ලදී.
2026 ජූනි 09	2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ 2026 අංක 02 දරන "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම" පිළිබඳ රීති නිකුත් කරන ලද අතර, ඒවා 2026 ජූනි 09 දිනැති අංක 2492/10 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී. එමගින් බලයලත් ගෙවීම් සිදු කිරීමෙන් පසු ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා ලද අපනයන ආදායම්වල ඉතිරි මුදල අනිවාර්යයෙන්ම දේශීය මුදල් බවට පරිවර්තනය කිරීම සඳහා වන කාලසීමාව මාස තුනක සිට මාසයක් දක්වා අඩු කරනු ලැබීය. පාර්ලිමේන්තු අනුමැතිය ලැබීමෙන් අනතුරුව, මෙම රීති 2026 ජූනි 10 දින සිට බලාත්මක විය.
2026 ජූනි 18	ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයින් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ආයෝජන නියාමනය සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වැනි වගන්තිය යටතේ, 2026 අංක 01 දරන "විදේශ විනිමය (ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් කරනු ලබන විදේශ ආයෝජන)" පිළිබඳ රෙගුලාසි, නිකුත් කරන ලද අතර, 2026 ජූනි 18 දිනැති අංක 2493/36 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ පළ කරන ලදී.
	විගාමිකයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටතට අරමුදල් ප්‍රේෂණය කිරීම නියාමනය සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වැනි වගන්තිය යටතේ, 2026 අංක 02 දරන "විදේශ විනිමය (විගාමිකයන් විසින් විදේශ රට වලට අරමුදල් ප්‍රේෂණය කිරීම)" පිළිබඳ රෙගුලාසි නිකුත් කරන ලද අතර, 2026 ජූනි 18 දිනැති අංක 2493/37 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලදී.
	2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද, 2025 දෙසැම්බර් 18 දිනැති නියෝගය මගින් පනවන ලද විදේශ විනිමය රටින් පිටතට ගලායාම් පිලිබඳ සීමාවන් කිහිපයක් ලිහිල් කරමින්, එම පනතේ 22 වැනි වගන්තිය යටතේ නියෝගයක්, 2026 ජූනි 18 දිනැති අංක 2493/38 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

තැන්පතු රක්ෂණය හා නිරාකරණය

2025 ජූලි 04	2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සඳහා නිරාකරණ ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කරමින් නිරාකරණ අධිකාරිය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම සමාගම සඳහා අද්මිනිස්ත්‍රාසිකරුවෙකු පත් කරන ලදී.
2025 අගෝස්තු 06	බලපත්‍රලාභී මූල්‍ය ආයතනවල නිරාකරණ ක්‍රියාවලීන් සඳහා ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන්ගෙන් සමන්විත මණ්ඩලයක් පත් කරන ලදී.
2025 සැප්තැම්බර් 17	අසාර්ථක වෙමින් පවතින මූල්‍ය ආයතනවලට කාලෝචිතව මැදිහත්වීම පහසු කිරීම සඳහා මුදල් සමාගම් සඳහා නිරාකරණ නිර්ණායක සකස් කරන ලදී.
2025 දෙසැම්බර් 15	"ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි සාමාජිකත්වය සහ තැන්පතු රක්ෂණාවරණය ලබා ගැනීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කිරීම" පිළිබඳව බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ 2025 අංක 02 දරන විධානයන් නිකුත් කිරීම.
2026 මාර්තු 20	බලපත්‍රලාභී බැංකු සඳහා නිරාකරණ සැලසුම් සකස් කිරීමේදී අවශ්‍ය වන නිරාකරණ දත්ත ආකෘති ඉදිරිපත් කිරීමෙන් විදේශීය බැංකු නිදහස් කරමින්, බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ 2026 අංක 02 දරන "බලපත්‍රලාභී බැංකුවලට අදාළ නිරාකරණ සැලසුම් සඳහා වන දත්ත සටහන් සම්බන්ධව බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 2024 අංක 01 දරන විධානයන්ට සිදු කළ සංශෝධන" පිළිබඳ විධාන නිකුත් කරන ලදී.

2026 අප්‍රේල් 01	බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී සමාගම වෙත පත් කරන ලද අද්මිනිස්ත්‍රාසිකරුගේ කාලය තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.
2026 අප්‍රේල් 20	ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි සාමාජික ආයතන සතු තැන්පතු වර්ග පිළිබඳ යාවත්කාලීන තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම සහ සාමාජික ආයතන අධීක්ෂණය කිරීම ශක්තිමත් කිරීමේ අරමුණින්, එම ආයතන වල තැන්පතු වර්ග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඔවුන්ට දැනුම් දෙමින් බැංකු (විශේෂ විධිවිධාන) පනතෙහි 44(13) වගන්තිය යටතේ උපදෙස් අංක 01/2026 නිකුත් කරන ලදී.
2026 අප්‍රේල් 23	නිරාකරණ ක්‍රියාමාර්ගයක් ලෙස සාමාජික ආයතනයක වත්කම් සහ වගකීම් පැවරීමට පහසුකම් සැලසීම සඳහා මූල්‍ය සහාය ලබාදීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රතිපත්ති සම්පාදනය කරන ලදී.
	පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ආයතන ඇතුළු සාමාජික ආයතනයක අනපේක්ෂිත බිඳ වැටීමකට මෙන්ම, සාමාජික ආයතන කිහිපයක් එකවර බිඳ වැටීමකට හෝ දරුණු මූල්‍ය අර්බුද පවතින අවස්ථාවලට කඩිනමින් හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය වෙනුවෙන් හදිසි අවස්ථාවලදී ක්‍රියාත්මක කිරීම සඳහා සැලැස්මක් සකස් කරන ලදී.
2026 මැයි 11 - මැයි 22	බලපත්‍රලාභී බැංකුවක බලපත්‍රය අවලංගු කළ අවස්ථාවකදී, වන්දි ගෙවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා පවතින මෙහෙයුම් සූදානම සහ එය කඩිනමින් ආරම්භ කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා ගෙවීම් අනුකරණ අභ්‍යාසයක් (Payout Simulation Exercise) පවත්වන ලදී.
2026 ජූලි 03	බැංකු (විශේෂ විධිවිධාන) පනතෙහි 66(2) වගන්තිය ප්‍රකාරව, මූල්‍ය ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී සමාගම වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී සමාගමෙහි රක්ෂිත තැන්පත්කරුවන්ට වන්දි ගෙවීම් ආරම්භ කරන ලදී.
2026 ජූලි 04	බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී සමාගම වෙත පත් කරන ලද අද්මිනිස්ත්‍රාසිකරුගේ කාලය තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.

මූල්‍ය පාරිභෝගික සබඳතා

2025 නොවැම්බර් 18	SGO ආයතනය විසින් තහනම් යෝජනා ක්‍රම පවත්වා ඇති බවට නිර්ණය කරන ලදී.
2026 පෙබරවාරි 11	සියලු බලපත්‍රලාභී බැංකු සහ සියලු බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙත වාර්ෂික සඵල පොලී අනුපාතිකය (Annual Effective Rate of Interest) අනාවරණය කිරීම සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කරන ලදී.
2026 පෙබරවාරි 24	ICAN Advertising පුද්ගලික ආයතනය විසින් තහනම් පිරමීඩ යෝජනා ක්‍රම පවත්වා ඇති බවට නිර්ණය කරන ලදී.
2026 ජූලි 01	Infinity Rover පුද්ගලික ආයතනය විසින් තහනම් පිරමීඩ යෝජනා ක්‍රම පවත්වා ඇති බවට නිර්ණය කරන ලදී.

සටහන 1

මූල්‍ය සාධනීයත්ව දර්ශක - බැංකු අංශය

		2021 (%)	2022 (%)	2023 (%)	2024 (%)	2025* (%)	2026 ජූනි** (%)
1.	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව						
1.1	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (අ)	16.5	16.2	11.8	17.8	19.2	18.2
1.2	පළමු ස්ථර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (ආ)	13.2	13.2	15.2	16.7	15.9	14.8
1.3	හිමිකම් ප්‍රාග්ධනයට හා සංචිතවලට සාපේක්ෂව ශුද්ධ අක්‍රීය ණය (ඇ)	11.5					
1.4	හිමිකම් ප්‍රාග්ධනයට හා සංචිතවලට සාපේක්ෂව ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය (ඈ)		44.0	40.9	31.5	23.7	21.2
1.5	හිමිකම් ප්‍රාග්ධනයට හා සංචිතවලට සාපේක්ෂව ණය ලබා ගැනීම්	148.9	117.1	79.1	62.9	71.4	74.4
1.6	සමස්ත වත්කම්වලට සාපේක්ෂව හිමිකම් ප්‍රාග්ධනය හා සංචිත	8.7	8.2	8.7	9.3	9.5	9.7
2.	වත්කම්වල ගුණාත්මකභාවය						
2.1	සමස්ත ණය සහ අත්තිකාරම්වලට සාපේක්ෂව අක්‍රීය ණය (ඉ)	4.5					
2.2	සමස්ත ණය සහ අත්තිකාරම්වලට (ඊ) සාපේක්ෂව අදියර 3 යටතේ පවතින ණය (ඊ)		11.3	12.8	12.3	9.7	9.1
2.3	සමස්ත ණය සහ අත්තිකාරම්වලට සාපේක්ෂව ශුද්ධ අක්‍රීය ණය (ඇ)	1.7					
2.4	සමස්ත ණය සහ අත්තිකාරම්වලට (ඊ) සාපේක්ෂව ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය (ඈ)		6.2	6.5	5.5	4.0	3.5
2.5	සමස්ත ණය සහ අත්තිකාරම්වලට සාපේක්ෂව සමස්ත වෙන්කිරීම් (උ)	3.4					
2.6	සමස්ත වෙන්කිරීම් ආවරණ අනුපාතය (උ෧)	75.8					
2.7	සමස්ත ණය හානිකරණ ආවරණ අනුපාතය (එ)		7.9	8.6	8.5	7.3	7.1
2.8	විශේෂිත වෙන්කිරීම් ආවරණ අනුපාතය (ඒ)	64.0					
2.9	අදියර 3 යටතේ පවතින ණය හානිකරණ ආවරණ අනුපාතය (ඔ)		45.2	49.0	54.1	58.5	61.3
2.10	සමස්ත වත්කම්වලට සාපේක්ෂව සමස්ත වෙන්කිරීම් (උ)	2.1					
2.11	සමස්ත වත්කම්වලට සාපේක්ෂව සමස්ත ණය හානිකරණ (ඕ)		4.7	4.7	4.5	4.1	4.2
2.12	සමස්ත වත්කම්වලට සාපේක්ෂව සමස්ත ණය සහ අත්තිකාරම්	61.9	58.3	54.0	51.8	55.8	58.6
2.13	සමස්ත වත්කම්වලට සාපේක්ෂව ආයෝජන	29.1	30.5	35.8	41.0	37.7	34.3
2.14	සාමාන්‍ය වත්කම්වලට සාපේක්ෂව සමස්ත ආදායම (ක)	8.1	12.2	13.8	10.5	10.7	11.2
2.15	සාමාන්‍ය වත්කම්වලට සාපේක්ෂව ශුද්ධ පොලී ආදායම (ග)	3.2	3.9	3.5	4.1	4.3	4.4
2.16	සාමාන්‍ය වත්කම්වලට (ජ) සාපේක්ෂව මෙහෙයුම් ආදායම (ච)	4.2	5.3	4.5	4.4	5.4	5.8
3.	ඉපැයීම් හා ලාභදායීත්වය						
3.1	හිමිකම් මත ප්‍රතිලාභය - බදු පසු (ට)	14.5	10.4	11.5	17.4	16.9	17.5
3.2	වත්කම් මත ප්‍රතිලාභය - බදු පෙර (ඩ)	1.6	0.9	1.5	2.6	2.5	2.5
3.3	වත්කම් මත ප්‍රතිලාභය - බදු පසු (ත)	1.2	0.8	1.0	1.6	1.6	1.7
3.4	සමස්ත ආදායමට සාපේක්ෂව පොලී ආදායම	87.8	88.1	92.6	96.9	89.5	87.3
3.5	සමස්ත ආදායමට සාපේක්ෂව ශුද්ධ පොලී ආදායම	40.2	31.8	25.4	39.3	40.0	39.5
3.6	සමස්ත ආදායමට සාපේක්ෂව පොලී නොවන ආදායම	12.2	11.9	7.4	3.1	10.5	12.7
3.7	සමස්ත ආදායමට සාපේක්ෂව පොලී නොවන වියදම් (මෙහෙයුම් වියදම්)	22.0	13.7	13.3	19.2	19.1	19.1
3.8	පොලී නොවන වියදම්වලට සාපේක්ෂව කාර්යමණ්ඩල වියදම්	45.2	53.5	50.8	54.3	53.8	52.4
3.9	සමස්ත ආදායමට සාපේක්ෂව කාර්යමණ්ඩල වියදම්	9.9	7.3	6.7	10.4	10.3	10.0
3.10	සමස්ත ආදායමට සාපේක්ෂව වෙන් කිරීම් ගැස්තු	6.7					
3.11	සමස්ත ආදායමට සාපේක්ෂව ණය හානිකරණ ගැස්තු		19.9	6.1	-6.8	2.3	4.9
3.12	සමස්ත ආදායමට සාපේක්ෂව සමස්ත පිරිවැය (ද)	69.5	70.0	80.5	76.9	68.6	66.9
3.13	කාර්යක්ෂමතා (මෙහෙයුම් වියදම්) අනුපාතය (න)	48.1	31.4	40.5	45.3	37.8	36.6
3.14	ශුද්ධ පොලී ආන්තිකය (ප)	3.4	4.0	3.7	4.4	4.3	4.4
4.	ද්‍රවශීලතාව						
4.1	සමස්ත වත්කම්වලට සාපේක්ෂව ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම් (සියලු මුදල්)	19.7	18.5	32.2	38.6	33.8	29.5
4.2	රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය	221.0	217.8	340.9	349.9	283.3	272.5
4.3	සියලු මුදල් ඒකක සඳහා වන ද්‍රවශීලතා ආවරණ අනුපාතය	176.2	191.2	288.4	313.8	249.6	229.7
5.	වත්කම් / අරමුදල් ව්‍යුහය						
5.1	සමස්ත වත්කම්වලට සාපේක්ෂව තැන්පතු	76.4	78.8	81.5	81.1	79.9	79.2
5.2	සමස්ත වත්කම්වලට සාපේක්ෂව ණය ලබා ගැනීම්	13.1	9.6	6.9	5.8	6.8	7.2
5.3	බාහිර අරමුදල්වලට (බ) සාපේක්ෂව ප්‍රාග්ධනය	9.9	9.3	9.8	10.7	11.0	11.3
5.4	තැන්පතුවලට සාපේක්ෂව ණය ලබා දීම්	82.7	73.9	66.3	63.9	69.9	74.0
5.5	තැන්පතු සහ ණය ගැනීම්වලට සාපේක්ෂව ණය ලබා දීම්	70.6	65.9	61.1	59.6	64.4	67.8
5.6	තැන්පතු සහ ණය ගැනීම් හා ප්‍රාග්ධනයට සාපේක්ෂව ණය ලබා දීම්	64.2	60.3	55.7	53.8	58.0	61.0

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

* සංශෝධිත

** තාවකාලික

(අ) අවදානම් මත බර තැබූ වත්කම්වලට සාපේක්ෂව නියාමන ප්‍රාග්ධන අනුපාතය
(ආ) අවදානම් මත බර තැබූ වත්කම්වලට සාපේක්ෂව මූලික ප්‍රාග්ධන අනුපාතය
(ඇ) අත්හිටවූ පොලී සහ විශේෂ ප්‍රතිපාදන අඩු කළ පසු අක්‍රීය ණය
(ඈ) භාවිතා නොකළ ණය සීමා ද ඇතුළුව සහ අදියර 3 යටතේ පවතින ණය හානිකරණ අඩු කළ පසු
(ඉ) අත්හිටවූ පොලී ඉවත් කළ පසු
(ඊ) භාවිතා නොකළ ණය සීමා ද ඇතුළුව
(උ) විශේෂිත ණය අලාභ ප්‍රතිපාදන සහ සාමාන්‍ය ණය අලාභ ප්‍රතිපාදන
(උ෧) අත්හිටවූ පොලී අඩු කළ අක්‍රීය අත්තිකාරම් සඳහා විශේෂ ප්‍රතිපාදන සහ සාමාන්‍ය ප්‍රතිපාදනවල අනුපාතය
(එ) සමස්ත ණය හා ලැබිය යුතු දෑ වලට සාපේක්ෂව සමස්ත ණය හානිකරණ අනුපාතය
(ඒ) අත්හිටවූ පොලී අඩු කළ අක්‍රීය අත්තිකාරම් සඳහා විශේෂ ප්‍රතිපාදනවල අනුපාතය
(ඔ) අදියර 3 යටතේ පවතින ණයවලට සාපේක්ෂව අදියර 3 යටතේ පවතින ණය හානිකරණ අනුපාතය
(ඕ) කේවල ණය හානිකරණ සහ සාමූහික ණය හානිකරණ

(ක) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස සමස්ත ආදායම (වාර්ෂික පදනමට ගළපන ලද)
(ග) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ශුද්ධ පොලී ආදායම (වාර්ෂික පදනමට ගළපන ලද)
(ච) මෙහෙයුම් ආදායම්වලට (දළ ආදායම), ශුද්ධ පොලී ආදායම සහ පොලී නොවන ආදායම් ඇතුළත් වේ
(ජ) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් ආදායම (වාර්ෂික පදනමට ගළපන ලද)
(ට) සාමාන්‍ය හිමිකම්වල ප්‍රතිශතයක් ලෙස බදු පසු ලාභය (වාර්ෂික පදනමට ගළපන ලද)
(ඩ) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස බදු පෙර ලාභය (වාර්ෂික පදනමට ගළපන ලද)
(ත) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස බදු පසු ලාභය (වාර්ෂික පදනමට ගළපන ලද)
(ද) පොලී ආදායම සහ පොලී නොවන ආදායමට සාපේක්ෂව පොලී වියදම් සහ පොලී නොවන වියදම් අනුපාතය
(න) දළ ආදායමට සාපේක්ෂව මෙහෙයුම් වියදම්වල අනුපාතය
(ප) සාමාන්‍ය වත්කම්වලට සාපේක්ෂව ශුද්ධ පොලී ආදායම් අනුපාතය (වාර්ෂික පදනමට ගළපන ලද)
(බ) තැන්පතු සහ ණය ලබා ගැනීම්

සටහන 2

මූල්‍ය සාධනීයත්ව දර්ශක - බලපත්‍රලාභී වාණිජ බැංකු

		2021 (%)	2022 (%)	2023 (%)	2024 (%)	2025* (%)	2026 ජූනි** (%)
1.	**ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව**						
1.1	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (අ)	16.7	16.0	18.3	20.1	19.0	18.1
1.2	පළමු ස්ථර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (ආ)	13.2	13.1	15.1	16.6	15.6	14.6
1.3	හිමිකම් ප්‍රාග්ධනයට හා සංචිතවලට සාපේක්ෂව ශුද්ධ අක්‍රීය ණය (ඇ)	9.9					
1.4	හිමිකම් ප්‍රාග්ධනයට හා සංචිතවලට සාපේක්ෂව ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය (ඈ)		43.5	40.2	29.7	22.8	20.2
1.5	හිමිකම් ප්‍රාග්ධනයට හා සංචිතවලට සාපේක්ෂව ණය ලබා ගැනීම්	154.6	118.0	75.0	61.4	71.9	75.6
1.6	සමස්ත වත්කම්වලට සාපේක්ෂව හිමිකම් ප්‍රාග්ධනය හා සංචිත	9.0	8.6	9.0	9.6	9.8	10.0
2.	**වත්කම්වල ගුණාත්මකභාවය**						
2.1	සමස්ත ණය සහ අත්තිකාරම්වලට සාපේක්ෂව අක්‍රීය ණය (ඉ)	4.3					
2.2	සමස්ත ණය සහ අත්තිකාරම්වලට (ඊ) සාපේක්ෂව අදියර 3 යටතේ පවතින ණය (උ)		11.5	13.0	12.2	9.7	9.1
2.3	සමස්ත ණය සහ අත්තිකාරම්වලට සාපේක්ෂව ශුද්ධ අක්‍රීය ණය (ඇ)	1.4					
2.4	සමස්ත ණය සහ අත්තිකාරම්වලට (ඊ) සාපේක්ෂව ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය (ඈ)		6.5	6.9	5.8	3.9	3.4
2.5	සමස්ත ණය සහ අත්තිකාරම්වලට සාපේක්ෂව සමස්ත වෙන්කිරීම් (උ)	3.4					
2.6	සමස්ත වෙන්කිරීම් ආවරණ අනුපාතය (උආ)	80.4					
2.7	සමස්ත ණය හානිකරණ ආවරණ අනුපාතය (එ)		8.2	8.9	8.7	7.4	7.3
2.8	විශේෂිත වෙන්කිරීම් ආවරණ අනුපාතය (ඒ)	67.9					
2.9	අදියර 3 යටතේ පවතින ණය හානිකරණ ආවරණ අනුපාතය (ඔ)		46.2	50.1	56.0	60.0	63.0
2.10	සමස්ත වත්කම්වලට සාපේක්ෂව සමස්ත වෙන්කිරීම් (උ)	2.2					
2.11	සමස්ත වත්කම්වලට සාපේක්ෂව සමස්ත ණය හානිකරණ (ඕ)		5.1	5.0	4.7	4.3	4.4
2.12	සමස්ත වත්කම්වලට සාපේක්ෂව සමස්ත ණය සහ අත්තිකාරම්	64.5	59.9	55.6	52.9	57.1	59.9
2.13	සමස්ත වත්කම්වලට සාපේක්ෂව ආයෝජන	26.6	28.5	33.8	39.8	36.2	32.8
2.14	සාමාන්‍ය වත්කම්වලට සාපේක්ෂව සමස්ත ආදායම (ක)	7.9	12.2	13.7	10.3	10.6	11.2
2.15	සාමාන්‍ය වත්කම්වලට සාපේක්ෂව ශුද්ධ පොලී ආදායම (ග)	3.1	4.0	3.6	4.1	4.2	4.3
2.16	සාමාන්‍ය වත්කම්වලට (ජ) සාපේක්ෂව මෙහෙයුම් ආදායම (ච)	4.2	5.6	4.7	4.4	5.4	5.9
3.	**ඉපැයීම් හා ලාභදායීත්වය**						
3.1	හිමිකම් මත ප්‍රතිලාභය - බදු පසු (ට)	13.8	11.0	11.8	17.8	16.8	17.6
3.2	වත්කම් මත ප්‍රතිලාභය - බදු පෙර (ඩ)	1.6	1.0	1.6	2.7	2.5	2.5
3.3	වත්කම් මත ප්‍රතිලාභය - බදු පසු (ත)	1.2	0.9	1.1	1.6	1.6	1.7
3.4	සමස්ත ආදායමට සාපේක්ෂව පොලී ආදායම	86.3	86.9	92.1	96.8	88.6	86.2
3.5	සමස්ත ආදායමට සාපේක්ෂව ශුද්ධ පොලී ආදායම	39.7	32.7	26.4	39.5	39.4	38.8
3.6	සමස්ත ආදායමට සාපේක්ෂව පොලී නොවන ආදායම	13.7	13.1	7.9	3.2	11.4	13.8
3.7	සමස්ත ආදායමට සාපේක්ෂව පොලී නොවන වියදම් (මෙහෙයුම් වියදම්)	22.2	13.4	13.2	19.1	18.9	18.6
3.8	පොලී නොවන වියදම්වලට සාපේක්ෂව කාර්යමණ්ඩල වියදම්	43.6	51.4	48.4	52.0	51.9	49.8
3.9	සමස්ත ආදායමට සාපේක්ෂව කාර්යමණ්ඩල වියදම්	9.7	6.9	6.4	9.9	9.8	9.3
3.10	සමස්ත ආදායමට සාපේක්ෂව වෙන් කිරීම් ගාස්තු	7.3					
3.11	සමස්ත ආදායමට සාපේක්ෂව ණය හානිකරණ ගාස්තු		21.8	6.6	-8.3	2.5	5.6
3.12	සමස්ත ආදායමට සාපේක්ෂව සමස්ත පිරිවැය (ද)	68.8	67.5	78.8	76.4	68.0	66.1
3.13	කාර්යක්ෂමතා (මෙහෙයුම් වියදම්) අනුපාතය (න)	48.2	29.2	38.3	44.7	37.1	35.4
3.14	ශුද්ධ පොලී ආන්තිකය (ප)	3.3	4.1	3.8	4.3	4.2	4.3
4.	**ද්‍රවශීලතාව**						
4.1	සමස්ත වත්කම්වලට සාපේක්ෂව ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම් (සියලු මුදල්)	17.2	17.3	31.1	38.0	32.6	28.2
4.2	රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය	216.3	213.1	346.1	351.0	276.0	267.4
4.3	සියලු මුදල් ඒකක සඳහා වන ද්‍රවශීලතා ආවරණ අනුපාතය	162.7	190.5	285.4	311.0	240.7	221.7
5.	**වත්කම් / අරමුදල් ව්‍යුහය**						
5.1	සමස්ත වත්කම්වලට සාපේක්ෂව තැන්පතු	75.1	77.9	81.3	80.6	79.4	78.7
5.2	සමස්ත වත්කම්වලට සාපේක්ෂව ණය ලබා ගැනීම්	14.1	10.1	6.7	5.9	7.1	7.6
5.3	බාහිර අරමුදල්වලට (බ) සාපේක්ෂව ප්‍රාග්ධනය	10.3	9.7	10.2	11.1	11.3	11.6
5.4	තැන්පතුවලට සාපේක්ෂව ණය ලබා දීම්	87.6	76.9	68.4	65.5	71.9	76.2
5.5	තැන්පතු සහ ණය ගැනීම්වලට සාපේක්ෂව ණය ලබා දීම්	73.7	68.1	63.1	61.1	66.0	69.5
5.6	තැන්පතු සහ ණය ගැනීම් හා ප්‍රාග්ධනයට සාපේක්ෂව ණය ලබා දීම්	66.9	62.0	57.3	55.0	59.3	62.3

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

* සංශෝධිත
** තාවකාලික

(අ) අවදානම් මත බර තැබූ වත්කම්වලට සාපේක්ෂව නියාමන ප්‍රාග්ධන අනුපාතය
(ආ) අවදානම් මත බර තැබූ වත්කම්වලට සාපේක්ෂව මූලික ප්‍රාග්ධන අනුපාතය
(ඇ) අත්හිටවූ පොලී සහ විශේෂ ප්‍රතිපාදන අඩු කළ පසු අක්‍රීය ණය
(ඈ) භාවිතා නොකළ ණය සීමා ද ඇතුළුව සහ අදියර 3 යටතේ පවතින ණය හානිකරණ අඩු කළ පසු
(ඉ) අත්හිටවූ පොලී ඉවත් කළ පසු
(ඊ) භාවිතා නොකළ ණය සීමා ද ඇතුළුව
(උ) විශේෂිත ණය අලාභ ප්‍රතිපාදන සහ සාමාන්‍ය ණය අලාභ ප්‍රතිපාදන
(උආ) අත්හිටවූ පොලී අඩු කළ අක්‍රීය අත්තිකාරම් සඳහා විශේෂ ප්‍රතිපාදන සහ සාමාන්‍ය ප්‍රතිපාදනවල අනුපාතය
(එ) සමස්ත ණය හා ලැබිය යුතු දෑ වලට සාපේක්ෂව සමස්ත ණය හානිකරණ අනුපාතය
(ඒ) අත්හිටවූ පොලී අඩු කළ අක්‍රීය අත්තිකාරම් සඳහා විශේෂ ප්‍රතිපාදනවල අනුපාතය
(ඔ) අදියර 3 යටතේ පවතින ණයවලට සාපේක්ෂව අදියර 3 යටතේ පවතින ණය හානිකරණ අනුපාතය
(ඕ) කේවළ ණය හානිකරණ සහ සාමූහික ණය හානිකරණ

(ක) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස සමස්ත ආදායම (වාර්ෂික පදනමට ගළපන ලද)
(ග) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ශුද්ධ පොලී ආදායම (වාර්ෂික පදනමට ගළපන ලද)
(ච) මෙහෙයුම් ආදායම්වලට (දළ ආදායම), ශුද්ධ පොලී ආදායම සහ පොලී නොවන ආදායම් ඇතුළත් වේ
(ජ) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් ආදායම (වාර්ෂික පදනමට ගළපන ලද)
(ට) සාමාන්‍ය හිමිකම්වල ප්‍රතිශතයක් ලෙස බදු පසු ලාභය (වාර්ෂික පදනමට ගළපන ලද)
(ඩ) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස බදු පෙර ලාභය (වාර්ෂික පදනමට ගළපන ලද)
(ත) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස බදු පසු ලාභය (වාර්ෂික පදනමට ගළපන ලද)
(ද) පොලී ආදායම සහ පොලී නොවන ආදායමට සාපේක්ෂව පොලී වියදම් සහ පොලී නොවන වියදම් අනුපාතය
(න) දළ ආදායමට සාපේක්ෂව මෙහෙයුම් වියදම්වල අනුපාතය
(ප) සාමාන්‍ය වත්කම්වලට සාපේක්ෂව ශුද්ධ පොලී ආදායම් අනුපාතය (වාර්ෂික පදනමට ගළපන ලද)
(බ) තැන්පතු සහ ණය ලබා ගැනීම්

සටහන 3

මූල්‍ය සාධනීයත්ව දර්ශක - බලපත්‍රලාභී විශේෂිත බැංකු

		2021 (%)	2022 (%)	2023 (%)	2024 (%)	2025* (%)	2026 ජූනි** (%)
1.	**ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව**						
1.1	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (අ)	14.6	18.5	20.1	22.9	22.7	19.9
1.2	පළමු ස්ථර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (ආ)	12.0	14.8	16.8	19.8	20.3	17.9
1.3	හිමිකම් ප්‍රාග්ධනයට හා සංචිතවලට සාපේක්ෂව ශුද්ධ අක්‍රීය ණය (ඇ)	27.6					
1.4	හිමිකම් ප්‍රාග්ධනයට හා සංචිතවලට සාපේක්ෂව ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය (ඈ)		50.3	49.6	53.5	35.7	33.4
1.5	හිමිකම් ප්‍රාග්ධනයට හා සංචිතවලට සාපේක්ෂව ණය ලබා ගැනීම්	93.6	106.4	129.5	81.4	64.8	58.8
1.6	සමස්ත වත්කම්වලට සාපේක්ෂව හිමිකම් ප්‍රාග්ධනය හා සංචිත	6.4	5.6	5.9	6.5	7.2	7.4
2.	**වත්කම්වල ගුණාත්මකභාවය**						
2.1	සමස්ත ණය සහ අත්තිකාරම්වලට සාපේක්ෂව අක්‍රීය ණය (ඉ)	6.5					
2.2	සමස්ත ණය සහ අත්තිකාරම්වලට (ඊ) සාපේක්ෂව අදියර 3 යටතේ පවතින ණය (ඊ)		9.0	10.6	12.9	10.2	9.2
2.3	සමස්ත ණය සහ අත්තිකාරම්වලට සාපේක්ෂව ශුද්ධ අක්‍රීය ණය (ඇ)	4.1					
2.4	සමස්ත ණය සහ අත්තිකාරම්වලට (ඊ) සාපේක්ෂව ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය (ඈ)		6.4	7.3	8.8	6.0	5.4
2.5	සමස්ත ණය සහ අත්තිකාරම්වලට සාපේක්ෂව සමස්ත වෙන්කිරීම් (උ)	2.8					
2.6	සමස්ත වෙන්කිරීම් ආවරණ අනුපාතය (උ1)	43.8					
2.7	සමස්ත ණය හානිකරණ ආවරණ අනුපාතය (එ)		4.3	5.5	6.1	5.7	5.3
2.8	විශේෂිත වෙන්කිරීම් ආවරණ අනුපාතය (ඒ)	37.5					
2.9	අදියර 3 යටතේ පවතින ණය හානිකරණ ආවරණ අනුපාතය (ඔ)		31.4	34.0	34.5	40.8	40.6
2.10	සමස්ත වත්කම්වලට සාපේක්ෂව සමස්ත වෙන්කිරීම් (උ)	1.2					
2.11	සමස්ත වත්කම්වලට සාපේක්ෂව සමස්ත ණය හානිකරණ (ඕ)		1.9	2.4	2.6	2.4	2.4
2.12	සමස්ත වත්කම්වලට සාපේක්ෂව සමස්ත ණය සහ අත්තිකාරම්	44.0	45.4	42.0	43.2	44.6	46.6
2.13	සමස්ත වත්කම්වලට සාපේක්ෂව ආයෝජන	46.5	46.8	51.3	51.7	50.5	48.3
2.14	සාමාන්‍ය වත්කම්වලට සාපේක්ෂව සමස්ත ආදායම (ක)	9.0	11.5	14.7	12.1	11.5	11.3
2.15	සාමාන්‍ය වත්කම්වලට සාපේක්ෂව ශුද්ධ පොළී ආදායම (ග)	3.9	2.8	2.6	4.5	5.1	5.2
2.16	සාමාන්‍ය වත්කම්වලට (ඡ) සාපේක්ෂව මෙහෙයුම් ආදායම (ච)	4.1	2.9	3.1	4.8	5.4	5.5
3.	**ඉපැයීම් හා ලාභදායීත්වය**						
3.1	හිමිකම් මත ප්‍රතිලාභය - බදු පසු (ට)	21.5	3.4	7.7	12.4	18.0	17.1
3.2	වත්කම් මත ප්‍රතිලාභය - බදු පෙර (ඩ)	1.7	0.3	0.4	1.4	2.1	2.2
3.3	වත්කම් මත ප්‍රතිලාභය - බදු පසු (ත)	1.3	0.2	0.4	0.8	1.3	1.2
3.4	සමස්ත ආදායමට සාපේක්ෂව පොළී ආදායම	97.4	98.6	97.0	97.7	97.0	97.1
3.5	සමස්ත ආදායමට සාපේක්ෂව ශුද්ධ පොළී ආදායම	43.7	24.1	17.8	37.3	44.4	45.9
3.6	සමස්ත ආදායමට සාපේක්ෂව පොළී නොවන ආදායම	2.6	1.4	3.0	2.3	3.0	2.9
3.7	සමස්ත ආදායමට සාපේක්ෂව පොළී නොවන ව්‍යදම් (මෙහෙයුම් ව්‍යදම්)	20.5	16.7	14.0	19.7	20.9	23.4
3.8	පොළී නොවන ව්‍යදම්වලට සාපේක්ෂව කාර්යමණ්ඩල ව්‍යදම්	55.7	67.2	67.8	70.3	67.8	70.6
3.9	සමස්ත ආදායමට සාපේක්ෂව කාර්යමණ්ඩල ව්‍යදම්	11.4	11.2	9.5	13.9	14.2	16.5
3.10	සමස්ත ආදායමට සාපේක්ෂව වෙන් කිරීම් ගාස්තු	3.0					
3.11	සමස්ත ආදායමට සාපේක්ෂව ණය හානිකරණ ගාස්තු		3.4	2.6	4.1	1.3	-0.9
3.12	සමස්ත ආදායමට සාපේක්ෂව සමස්ත පිරිවැය (ද)	74.3	91.2	93.2	80.1	73.5	74.7
3.13	කාර්යක්ෂමතා (මෙහෙයුම් ව්‍යදම්) අනුපාතය (න)	47.3	65.4	67.2	49.7	44.1	48.0
3.14	ශුද්ධ පොළී ආන්තිකය (ප)	4.1	2.8	2.6	4.6	5.1	5.2
4.	**ද්‍රවශීලතාව**						
4.1	සමස්ත වත්කම්වලට සාපේක්ෂව ඉහළ ගුණාත්මක බවින් යුතු ද්‍රවශීල වත්කම් (සියලු මුදල්)	37.4	27.9	40.4	43.9	44.7	41.4
4.2	රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය	235.3	235.3	313.2	342.4	340.4	307.2
4.3	සියලු මුදල් ඒකක සඳහා වන ද්‍රවශීලතා ආවරණ අනුපාතය	240.4	194.5	308.1	336.5	330.9	296.9
5.	**වත්කම් / අරමුදල් ව්‍යුහය**						
5.1	සමස්ත වත්කම්වලට සාපේක්ෂව තැන්පතු	85.7	85.9	83.7	85.4	84.6	84.4
5.2	සමස්ත වත්කම්වලට සාපේක්ෂව ණය ලබා ගැනීම්	6.1	6.0	7.7	5.3	4.7	4.4
5.3	බාහිර අරමුදල්වලට (බ) සාපේක්ෂව ප්‍රාග්ධනය	7.2	6.1	6.5	7.2	8.1	8.4
5.4	තැන්පතුවලට සාපේක්ෂව ණය ලබා දීම්	52.5	52.9	50.2	50.6	52.7	55.2
5.5	තැන්පතු සහ ණය ගැනීම්වලට සාපේක්ෂව ණය ලබා දීම්	49.0	49.5	46.0	47.6	49.9	52.5
5.6	තැන්පතු සහ ණය ගැනීම් හා ප්‍රාග්ධනයට සාපේක්ෂව ණය ලබා දීම්	45.7	46.6	43.2	44.4	46.2	48.4

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

* සංශෝධිත

** තාවකාලික

(අ) අවදානම් මත බර තැබූ වත්කම්වලට සාපේක්ෂව නියාමන ප්‍රාග්ධන අනුපාතය
(ආ) අවදානම් මත බර තැබූ වත්කම්වලට සාපේක්ෂව මූලික ප්‍රාග්ධන අනුපාතය
(ඇ) අත්හිටවූ පොළී සහ විශේෂ ප්‍රතිපාදන අඩු කළ පසු අක්‍රීය ණය
(ඈ) භාවිතා නොකළ ණය සීමා ද ඇතුළුව සහ අදියර 3 යටතේ පවතින ණය හානිකරණ අඩු කළ පසු
(ඉ) අත්හිටවූ පොළී ඉවත් කළ පසු
(ඊ) භාවිතා නොකළ ණය සීමා ද ඇතුළුව
(උ) විශේෂිත ණය අලාභ ප්‍රතිපාදන සහ සාමාන්‍ය ණය අලාභ ප්‍රතිපාදන
(උ1) අත්හිටවූ පොළී අඩු කළ අක්‍රීය අත්තිකාරම් සඳහා විශේෂ ප්‍රතිපාදන සහ සාමාන්‍ය ප්‍රතිපාදනවල අනුපාතය
(එ) සමස්ත ණය හා ලැබිය යුතු දෑ වලට සාපේක්ෂව සමස්ත ණය හානිකරණ අනුපාතය
(ඒ) අත්හිටවූ පොළී අඩු කළ අක්‍රීය අත්තිකාරම් සඳහා විශේෂ ප්‍රතිපාදනවල අනුපාතය
(ඔ) අදියර 3 යටතේ පවතින ණයවලට සාපේක්ෂව අදියර 3 යටතේ පවතින ණය හානිකරණ අනුපාතය
(ඕ) කේවල ණය හානිකරණ සහ සාමූහික ණය හානිකරණ

(ක) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස සමස්ත ආදායම (වාර්ෂික පදනමට ගළපන ලද)
(ග) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ශුද්ධ පොළී ආදායම (වාර්ෂික පදනමට ගළපන ලද)
(ච) මෙහෙයුම් ආදායම්වලට (දළ ආදායම), ශුද්ධ පොළී ආදායම සහ පොළී නොවන ආදායම් ඇතුළත් වේ
(ඡ) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් ආදායම (වාර්ෂික පදනමට ගළපන ලද)
(ට) සාමාන්‍ය හිමිකම්වල ප්‍රතිශතයක් ලෙස බදු පසු ලාභය (වාර්ෂික පදනමට ගළපන ලද)
(ඩ) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස බදු පෙර ලාභය (වාර්ෂික පදනමට ගළපන ලද)
(ත) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස බදු පසු ලාභය (වාර්ෂික පදනමට ගළපන ලද)
(ද) පොළී ආදායම සහ පොළී නොවන ආදායමට සාපේක්ෂව පොළී ව්‍යදම් සහ පොළී නොවන ව්‍යදම් අනුපාතය
(න) දළ ආදායමට සාපේක්ෂව මෙහෙයුම් ව්‍යදම්වල අනුපාතය
(ප) සාමාන්‍ය වත්කම්වලට සාපේක්ෂව ශුද්ධ පොළී ආදායම් අනුපාතය (වාර්ෂික පදනමට ගළපන ලද)
(බ) තැන්පතු සහ ණය ලබා ගැනීම්

සටහන 4

මූල්‍ය සාධනීයත්ව දර්ශක - මුදල් සමාගම් අංශය[1]

		2021 මාර්තු (%)	2022 මාර්තු (%)	2023 මාර්තු (%)	2024 මාර්තු (%)	2025 මාර්තු* (%)	2026 මාර්තු** (%)	2026 ජූනි** (%)
1.	**ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව**							
1.1	අවදානම් මත බර තැබූ වත්කම්වලට සාපේක්ෂව නියාමන ප්‍රාග්ධනය	14.8	17.3	22.0	21.9	20.9	20.4	19.3
1.2	අවදානම් මත බර තැබූ වත්කම්වලට සාපේක්ෂව පළමු ස්ථර ප්‍රාග්ධනය	13.6	15.8	20.7	21.0	20.0	18.5	17.3
1.3	සමස්ත වත්කම්වලට සාපේක්ෂව නියාමන ප්‍රාග්ධනය	15.0	16.3	18.9	18.7	17.8	17.0	16.3
1.4	හිමිකම්වලට සාපේක්ෂව ණය ලබා ගැනීම් (වාර ගණන)	1.1	1.1	0.7	0.6	0.7	1.8	1.8
1.5	නියාමන ප්‍රාග්ධනයට සාපේක්ෂව ආයෝජන දේපළ	16.6	16.9	17.3	18.0	18.5	13.2	13.1
1.6	නියාමන ප්‍රාග්ධනයට සාපේක්ෂව ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය	15.6	9.2	43.2	37.5	20.0	11.9	15.3
1.7	වත්කම්වලට සාපේක්ෂව ගැලපීම්වලින් පසු පළමු ස්ථර ප්‍රාග්ධනය (හෝලන අනුපාතය)	13.7	14.8	17.8	18.0	17.1	15.5	14.6
2.	**වත්කම්වල ගුණාත්මකභාවය**							
2.1	සමස්ත ණය සහ අත්තිකාරම් සඳහා දළ අදියර 3 යටතේ පවතින ණය	11.3	9.0	15.9	14.7	8.6	4.5	5.1
2.2	සමස්ත ණය සහ අත්තිකාරම් සඳහා ශුද්ධ අදියර 3 යටතේ පවතින ණය	2.8	1.8	10.6	9.4	4.5	2.4	3.0
2.3	සමස්ත ණය හා අත්තිකාරම් සඳහා ණය හානිකරණ	7.2	6.3	7.6	7.0	5.5	3.1	3.2
2.4	අදියර 3 යටතේ පවතින ණය සඳහා වන ණය හානිකරණ ආවරණ අනුපාතය	64.0	69.6	33.3	35.7	47.4	45.8	41.0
3.	**ඉපැයීම් හා ලාභදායීත්වය**							
3.1	වත්කම් මත ප්‍රතිලාභය (වාර්ෂික පදනමට ගළපන ලද)	3.1	5.3	3.8	5.5	6.6	6.2	5.7
3.2	හිමිකම් මත ප්‍රතිලාභය (වාර්ෂික පදනමට ගළපන ලද)	12.8	20.8	9.4	12.9	15.2	17.3	15.6
3.3	පොලී වියදමට සාපේක්ෂව පොලී ආදායම්	204.2	252.1	171.2	185.3	237.1	238.5	217.9
3.4	බදු පසු ලාභයට සාපේක්ෂව ශුද්ධ පොලී ආදායම	381.3	213.5	407.3	321.4	289.7	280.6	346.4
3.5	ශුද්ධ පොලී ආදායමට සාපේක්ෂව මෙහෙයුම් පිරිවැය	70.6	63.6	62.8	60.7	58.1	55.3	53.9
3.6	සාමාන්‍ය වත්කම්වලට සාපේක්ෂව ශුද්ධ පොලී ආදායම (වාර්ෂික පදනමට ගළපන ලද)	7.4	8.0	8.5	10.0	10.7	9.9	10.4
3.7	පොලී ආදායමට සාපේක්ෂව ශුද්ධ පොලී ආදායම	51.0	60.3	41.6	46.0	57.8	58.1	54.1
3.8	සමස්ත ආදායමට සාපේක්ෂව ශුද්ධ පොලී ආදායම	43.1	50.0	38.7	42.0	52.7	52.4	50.0
3.9	සමස්ත ආදායමට සාපේක්ෂව පොලී නොවන ආදායම	15.6	17.2	6.8	8.7	8.8	9.7	7.5
3.10	සමස්ත පිරිවැයට සාපේක්ෂව පොලී නොවන වියදම	42.4	49.2	29.4	33.2	45.3	43.0	37.0
3.11	කාර්යක්ෂමතා අනුපාතය (ණය හානිකරණ ගලපන ලද)	62.4	49.1	58.6	52.4	48.6	47.1	49.8
3.12	ආදායමට පිරිවැය අනුපාතය	81.7	67.0	82.8	76.8	67.6	67.4	72.8
4.	**ද්‍රවශීලතාව**							
4.1	සමස්ත වත්කම්වලට සාපේක්ෂව ද්‍රවශීල වත්කම්	8.9	9.8	14.0	14.8	11.8	8.9	8.5
4.2	තැන්පතු හා ණය ලබා ගැනීම්වලට සාපේක්ෂව ද්‍රවශීල වත්කම්	12.6	14.1	19.2	21.0	16.7	11.5	10.9
4.3	පැවතිය යුතු ද්‍රවශීල වත්කම්වලට සාපේක්ෂව අතිරික්ත/හිඟ ද්‍රවශීල වත්කම්	160.5	76.6	125.4	140.8	99.3	66.1	58.5
4.4	සමස්ත ණය ලබා ගැනීම්වලට සාපේක්ෂව ශුද්ධ ණය ලබා දීම්	375.5	337.4	412.2	488.7	438.2	249.5	243.9
5.	**වත්කම් / අරමුදල් ව්‍යුහය**							
5.1	සමස්ත වත්කම්වලට සාපේක්ෂව ණය ලබා ගැනීම්	20.2	22.6	17.3	14.1	17.1	32.1	32.9
5.2	තැන්පතුවලට සාපේක්ෂව ණය	149.9	159.9	138.3	132.4	147.9	184.1	185.8
5.3	තැන්පතු හා ණය ලබා ගැනීම්වලට සාපේක්ෂව ණය ලබා දීම්	110.0	111.3	105.6	105.8	112.2	107.3	106.9
5.4	සමස්ත වත්කම්වලට සාපේක්ෂව ආයෝජන	11.4	11.3	20.2	22.7	17.4	13.6	13.5

1 මුදල් සමාගම් බහුතරයක මූල්‍ය වර්ෂය සඳහා යම් වර්ෂයක අප්‍රේල් 01 සිට එළඹෙන වසරේ මාර්තු 31 දක්වා කාලය අදාළ වේ

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

* සංශෝධිත

** තාවකාලික



ISBN 978-624-6764-33-3

DESIGNED AND PRINTED BY M.D. GUNASENA AND COMPANY PRINTERS (PVT) LTD